319 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 319 - இல. 13
Volume 319 - No. 13

2025 ජුනි 06 වන සිකුරාදා
2025 யூன் 06, வெள்ளிக்கிழமை
Friday, 06th June, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 2181]

2025.05.20 දින ගරු දයාසිරි ජයසේකර මහතාගේ හැසිරීම පිළිබඳ පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පත් කළ කමිටුව: සාමාජිකයකු ආදේශ කිරීම [තීරුව 2181]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 2182]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2183-2252]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) – [ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 2261]

ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු වරුණ ලියනගේ මහතා] – පළමුවන වර කියවන ලදී [තීරුව 2261]

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) – [ගරු වරුණ ලියනගේ මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 2262]

**ශෝක ප්‍රකාශ:** [තීරු 2263- 2337]

ගරු කෝසල නුවන් ජයවීර මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු ඩොනල්ඩ් දිසානායක මහතා

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 2338-2348]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்**

இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 2181]

மாண்புமிகு தயாசிறி ஜயசேக்கர அவர்களின் 2025.05.20ஆந் திகதிய நடத்தை தொடர்பான முறைப்பாட்டினை விசாரணை செய்யும் குழு: உறுப்பினர் பதிலீடு [ப: 2181]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 2182]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2183-2252]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

இலங்கை சித்த உளவியல்சார் உயர் கற்கைநெறி திறந்த நிறுவனம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2261]

ரெட்ஸோ அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு வருண லியனகே] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2261]

இலங்கை தேசிய புகைப்படக் கலைச் சங்கம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு வருண லியனகே] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2262]

**அனுதாபத் தீர்மானங்கள்:** [ப: 2263-2337]

மாண்புமிகு கோசல நுவன் ஜயவீர

மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா

மாண்புமிகு டொனல்ட் திசாநாயக்க

மாண்புமிகு ஜே.ஆர்.பி. சூரியப்பெரும

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 2338-2348]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Sri Lanka Electricity (Amendment) Bill: Petitions to the Supreme Court [Col. 2181]

Committee to Inquire into Complaint on Behaviour of Hon. Dayasiri Jayasekara on 20.05.2025: Replacement of Member [Col. 2181]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2182]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2183-2252]

PRIVATE MEMBERS' BILLS:

Chiththa Advanced Psychological Studies Open Institute of Sri Lanka (Incorporation) – [The Hon. Hesha Withanage Ankumbura Arachchi] – Read the First time [Col. 2261]

Tredzo Development Foundation (Incorporation) – [The Hon. Waruna Liyanage] – Read the First time [Col. 2261]

National Photographic Art Society of Sri Lanka (Incorporation) – [The Hon. Waruna Liyanage] – Read the First time [Col. 2262]

VOTES OF CONDOLENCE: [Cols. 2263- 2337]

Hon. Kosala Nuwan Jayaweera

Hon. Mavai S. Senathirajah

Hon. Donald Dissanayake

Hon. J. R. P. Suriyapperuma

ADJOURNMENT QUESTIONS [Cols. 2338-2348]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ජුනි 06 වන සිකුරාදා***
*2025 யூன் 06, வெள்ளிக்கிழமை*
*Friday, 06th June, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 ජුනි 03, 04 සහ 05 දිනවල මාගේ නිවේදනයන්හි සඳහන් පෙත්සම් හතරට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව "ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### 2025.05.20 දින ගරු දයාසිරි ජයසේකර මහතාගේ හැසිරීම පිළිබඳ පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පත් කළ කමිටුව: සාමාජිකයකු ආදේශ කිරීම
### மாண்புமிகு தயாசிறி ஜயசேக்கர அவர்களின் 2025.05.20ஆந் திகதிய நடத்தை தொடர்பான முறைப்பாட்டினை விசாரணை செய்யும் குழு: உறுப்பினர் பதிலீடு
### COMMITTEE TO INQUIRE INTO COMPLAINT ON BEHAVIOUR OF HON. DAYASIRI JAYASEKARA ON 20.05.2025: REPLACEMENT OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මැයි 20 දින සභා ගර්භය තුළ දී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ දයාසිරි ජයසේකර මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මා වෙත ලද පැමිණිල්ලක් සැලකිල්ලට ගෙන, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ගරු නියෝජ්‍ය කාරක සභාපති හේමාලි වීරසේකර මහත්මියගේ සභාපතිත්වයෙන් ද, ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතාගේ සහ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගයන්ත කරුණාතිලක මහතාගේ සාමාජිකත්වයෙන් ද යුතුව මා විසින් පත් කරන ලදුව 2025 මැයි 23 දින මෙම සභාවට නිවේදනය කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ සේවය කිරීමට අධික කාර්ය බහුලත්වය හේතුවෙන් නොහැකි බව ගරු ගයන්ත කරුණාතිලක මහතා විසින් 2025 ජුනි 05 දින ලිඛිතව දැනුම් දී ඇති බැවින්, ඒ මහතා වෙනුවට එම කමිටුවේ සේවය කිරීම සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ රවුෆ් හකීම් මහතා මා විසින් පත් කරන ලද බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද 2022 වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) සියඹලාණ්ඩුව, 4 ගම්මානය, අංක 208/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්. චන්ද්‍රාවතී මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(2) ගැටමාන්න, නායකවත්ත, තරුණසේවා පාර, "ධම්මික" යන ලිපිනයෙහි පදිංචි ඩී.එස්. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බෙලිහුල්ඔය, අගලගම, අංක 88/2 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.යූ.පී. රත්නසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ඇල්පිටිය, මගුරුකඩුව, මහජන මාවත යන ලිපිනයෙහි පදිංචි ඕ.ඩබ්ලිව්. ලාල් නිශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගනේගොඩ, කැටපල යන ලිපිනයෙහි පදිංචි ආර්. චන්ද්‍රා තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ඇත්කඳුර, කීනකැටිය යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ටී.එස්. කීර්තිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### විශේෂ ආර්ථික මධ්‍යස්ථාන: විස්තර
### விசேட பொருளாதார மத்திய நிலையங்கள்: விபரம்
### DEDICATED ECONOMIC CENTRES: DETAILS

12/2024

**1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) එම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු කවරේද;

(iv) ඒවායේ ව්‍යාපාරික හා පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நிறுவப்பட்டுள்ள விசேட பொருளாதார மத்திய நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அவை நிறுவப்பட்டுள்ள இடங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி விசேட பொருளாதார மத்திய நிலையங்களை நிறுவுவதன் நோக்கங்கள் யாவையென்பதையும்;

(iv) அவற்றின் வர்த்தக மற்றும் நிருவாக நடவடிக்கைகளை ஒழுங்குமுறைப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the number of Dedicated Economic Centres that have been established in Sri Lanka;

(ii) their locations;

(iii) the purpose of establishing such Dedicated Economic Centres; and

(iv) the measures that would be adopted to regularize the business and administrative matters of such Centres?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 18කි.

(ii)

| අනු අංක | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ නම | ලිපිනය |
|---|---|---|
| 01 | නාරාහේන්පිට | අංක 44, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට, කොළඹ 05. |
| 02 | පිළියන්දල | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, පිළියන්දල, බෝකුන්දර. |
| 03 | මීගොඩ | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, පාදුක්ක පාර, මීගොඩ. |
| 04 | රත්මලාන | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, එස්. වීරසේනද සිල්වා මාවත, රත්මලාන. |
| 05 | වැලිසර | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, වැලිසර. |
| 06 | වෙයන්ගොඩ | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, වෙයන්ගොඩ. |
| 07 | දඹුල්ල | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, දඹුල්ල. |
| 08 | තඹුත්තේගම | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, තඹුත්තේගම. |
| 09 | ඇඹිලිපිටිය | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, නව නගරය, ඇඹිලිපිටිය. |
| 10 | නුවරඑළිය | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය. |
| 11 | කැප්පෙටිපොල | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, නුවරඑළිය පාර, කැප්පෙටිපොල. |
| 12 | කන්දහන්දිය | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, කන්දහන්දිය, උණුවින්න. |
| 13 | කුරුඳුවත්ත | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, කුරුඳුවත්ත. |
| 14 | අම්පාර | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, අම්පාර. |
| 15 | යාපනය | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, මඩුවිල් උතුර, චාවකච්චේරි. |
| 16 | කිලිනොච්චි | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, කිලිනොච්චි. |
| 17 | වවුනියාව | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, මදවුවායතකුලම්, වවුනියාව. |
| 18 | මඩකලපුව | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, කළුදාවල, මඩකලපුව. |

(iii)
- ගම්බද ප්‍රදේශවල නිෂ්පාදකයින්ට අලෙවි පහසුකම් සැපයීම, පාරිභෝගික ජනතාවට දැරිය හැකි මිලකට හා පහසුවෙන් භාණ්ඩ හා ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලයක් ස්ථාපනය කිරීම.
- ප්‍රාදේශීය වශයෙන් නිපදවන කෘෂි හා වෙනත් නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
- කාර්යක්ෂම හා තරගකාරී වෙළෙඳපොළ යාන්ත්‍රිකරණයට අනුබල දෙමින් අතරමැදියන්ගේ බලපෑම් අවම කරමින් සාධාරණ වෙළෙඳාම ප්‍රවර්ධනය.
- ප්‍රාදේශීය වශයෙන් විශේෂිත නිෂ්පාදන රට තුළ පුළුල් බෙදා හැරීමකට අවකාශය සැලසීම.
- භාණ්ඩ හිඟතාවන් හා අතිරික්තයන් පාලිත තත්ත්වයට ගෙන ඒම තුළින් භාණ්ඩ මිල ඉහළ යෑම වැළැක්වීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ගේ ප්‍රවාහන වියදම් හා නිෂ්පාදන නාස්ති වීම පාලනය සඳහා වූ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

(iv) විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල දැනට පවතින අඩුපාඩු හා දුර්වලතා හඳුනා ගෙන ඇති අතර, එහෙයින් එම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල එම දුර්වලතා, අඩුපාඩු මඟ හරවා ගැනීම මෙන්ම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා ව්‍යාපාරික ක්‍රියාකාරකම් සාර්ථකව හා තිරසාරව, මධ්‍යගත, නෛතික වගවීම සහිත ආයතනික සැකැස්මක් ස්ථාපනය සුදුසු බව හඳුනාගෙන ඇත.

ඒ අනුව, ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය හා විධිමත් කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මේ වන විටත් ඉදිරිපත් කර ඇති අතර, ඊට අනුමැතිය ලැබී ඇති බවත්, ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දැනුම් දෙමි.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර තුළ ඇත්තටම තිබෙනවා මගේ ප්‍රශ්නයට පිළිතුර. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමාත් පිළිගන්නවා ප්‍රායෝගිකව එම අරමුණ කරා මේ කියන ආර්ථික මධ්‍යස්ථාන 18 ගෙන යන්න පසුගිය කාල සීමාව තුළ දිගින් දිගටම කටයුතු කරලා නැහැ කියලා. අපේ රටේ වාණිජ කෘෂි කර්මාන්තයේ යෙදෙන පිරිස ඉතාම අල්පයි. සාමාන්‍ය ග්‍රාමීය කෘෂි කාර්මාන්තයේ යෙදෙන, සාමාන්‍ය ගොවිතැනක් කරන මිනිසුන්ගේ බඩු ටික තමයි ඔය ආර්ථික මධ්‍යස්ථානවලට එන්නේ. එතැනදී, නිවැරදි හා සාධාරණ මිලක් ඔවුන්ට ලබා ගන්න පුළුවන් ක්‍රමයක් අද වනතුරු රජයේ මැදිහත්වීමෙන් නිර්මාණය වෙලා නැහැ කියලා මම විශ්වාස කරනවා. මම එහෙම කියන්න හේතුව, කොළඹට එනකොට විශේෂයෙන්ම අතරමඟදී ප්‍රවාහනයේදී විශාල වශයෙන් නාස්ති වීම සහ මිල අතර වෙනස. උදාහරණයක් වශයෙන් කිව්වොත්, කැරට් කිලෝවක් රුපියල් 200ට කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයෙන් ගන්න පුළුවන් නම්, ඒක මෙහෙට එනකොට රුපියල් 700ක් වෙනවා. ඒ රුපියල් 500ක වාසිය ගන්නේ අතරමැදි වෙළෙන්දන් හෝ වෙන ජාවාරම්කාරයෝ. ඉතින් මේවායෙන් ගොවියාට නියම මිලක් ලැබෙන එක බලාපොරොත්තු වෙච්ච අරමුණක්. නමුත්, ඒක ඉටු වෙලා නැහැ. එම අරමුණ වාගේම, නාස්තියකින් තොරව ඒ නිෂ්පාදන ටික වෙළෙඳ පොළට එවා ගන්න පුළුවන් වටපිටාවක් හදන්න, ගොවීන් දිරි ගන්වන්න ක්‍රමයක් ක්‍රියාත්මක කරලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව තුළ මේ කාරණා ගැබ් වෙලා තිබෙනවාද කියලා.

ගරු ඇමතිතුමනි, මෙහි සැබෑ අරමුණ මේ කටයුතු විධිමත් කරලා ගොවියා ආරක්ෂා කිරීමයි. මේ රටේ ගොවි ජනතාව බහුතරයක් වෙසෙන ප්‍රදේශවල තිබෙන ආර්ථික මධ්‍යස්ථාන විධිමත් කරලා, ගොවියා ආරක්ෂා කරන වැඩසටහනකට යන්න කටයුතු කරනවාද, එහෙම නම් ඒ සඳහා අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලාත් මම දැන ගන්න කැමතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ බොහෝ ආර්ථික මධ්‍යස්ථාන, ඒවා ඇති කරපු අරමුණින් පරිබාහිරවයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා තමයි අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නේ, ගරු මන්ත්‍රීතුමා. අපේ රටේ ආර්ථික මධ්‍යස්ථාන 18ක් තිබෙනවා. නමුත් දැනට වැඩ කරන්නේ -පටන් අරන් තිබෙන්නේ- ඒවායින් 14යි. ආර්ථික මධ්‍යස්ථාන 4ක් තවම පටන් අරගෙන නැහැ. වවුනියාවෙන් එහා තිබෙන ආර්ථික මධ්‍යස්ථාන හතරේම කටයුතු තවම පටන් අරගෙන නැහැ. තව කිහිපයක් තිබෙනවා, ඒවා අයිති පළාත් සභාවලට. එකක් කල්පිටියේ තිබෙනවා, තව එකක් මැදවච්චියේ තිබෙනවා, තව එකක් කුරුණෑගල, වාරියපොල තිබෙනවා. ඒවා පටන් අරගෙන නැහැ. කල්පිටියේ පටන් අරගෙන තිබෙනවා. හැබැයි, ආර්ථික මධ්‍යස්ථානයක් හැටියට ඒක අපට අයිති නැහැ. ඒවා වෙන වෙන විධියට ක්‍රියාත්මක වෙනවා. මේවා එක යන්ත්‍රණයක් තුළ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවා වාගේ, සමහර ආර්ථික මධ්‍යස්ථානවලට බඩු එනකොට මිල වැඩි වීමට බලපාන හේතු ගණනාවක් තිබෙනවා. ඒ සියල්ලම හඳුනාගෙන තමයි අපි කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙතැනදී අපට කළමනාකාරිත්වය සඳහා වුණු යන්ත්‍රණයක් අවශ්‍යයි. මොකද, ඒ ආර්ථික මධ්‍යස්ථාන 14 ක්‍රියාත්මක වෙන්නේ 14 විධියකට. යන්ත්‍රණය එකයි, හැබැයි ඒගොල්ලන්ගේ capacity එක, ඒගොල්ලන්ට ලැබෙන කුලිය වෙනස්.

මෙම ආර්ථික මධ්‍යස්ථාන ඉදි කරන්න පැවැති රජයයන් මේ වන විට රුපියල් මිලියන 1,400ක් වියදම් කරලා තිබෙනවා. හැබැයි, ආණ්ඩුවට ආපහු රුපියලක්වත් ඇවිල්ලා නැහැ. ඒ වෙනුවට trusts හදලා තිබෙනවා. ඒ trust එකට ලැබෙන සල්ලි ටික තමයි වියදම් කරන්නේ. ඒ trust එක තමන්ට අදාළ විධියට වියදම් කරනවා. අවසානයට බැලුවාම, ආණ්ඩුව වෙන් කරපු සල්ලි ටිකවත් නැවත භාණ්ඩාගාරයට ලැබිලා නැහැ. ඔබතුමා අහන විධියට මේ සමස්ත ක්‍රියාවලිය ඇතුළේම අපිළිවෙළක් තිබෙනවා.

උදාහරණයක් ගත්තොත්, සාමාන්‍යයෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය අරින්නේ උදේට, ඒ වාගේම තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය අරින්නේත් උදේට. මේ දෙක තමයි එළවලු සහ පලතුරු අළෙවි කරන ලංකාවේ විශාලතම ආර්ථික මධ්‍යස්ථාන දෙක. සාමාන්‍යයෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ දවසකට කිලෝ ලක්ෂ 20ක් අළෙවි වෙනකොට, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ දවසකට කිලෝ ලක්ෂ 8ත්, 10ත් අතර ප්‍රමාණයක් අළෙවි වෙනවා. එම ආර්ථික මධ්‍යස්ථාන අද උදේ විවෘත කරලා, ඊයේ සවස කඩපු එළවලු සහ පලතුරු තමයි විකුණන්නේ. ඊට පස්සේ අද සවසට තමයි ඒ මාර්කට් එකෙන් මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට එන්නේ. ඊයේ කඩපු ඒවා අද සවස මීගොඩට ආවාම, අද දවසත් පරණ වෙලා හෙට උදේ තමයි නාරාහේන්පිටට යන්නේ. මේ විධියට අතරමැද දවස් දෙකක් ප්‍රමාද වෙනවා. ඒකත් අපි හඳුනාගෙන තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි. මේ ආර්ථික මධ්‍යස්ථාන ක්‍රියාවලිය අපි විධිමත් කරනවා. ඒ වෙළෙඳ සැල් හිමියන්ටත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, විවිධ අවස්ථාවල විවිධ විධියට මේ ක්‍රියාමාර්ග යනවා. ඒ නිසා එතැන කළමනාකරණ මණ්ඩලයක් හදනවා. ඊට උඩින් රජයේ සමාගමක් හදලා ඒ සමාගම යටතේ ඒවා විධිමත් ලෙස පරිපාලනය කරනවා. දඹුල්ල, නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානවල එළවලු මිල දැනගන්න පුළුවන් වෙන විධියට, වෙළෙඳ පොළ තත්ත්වය දැනගන්න පුළුවන් විධියට ඩිජිටල් පුවරුවක් හරහා ඒ ක්‍රියාවලිය විධිමත් කරන්න මේ සමාගම හරහා කටයුතු කරනවා. හඳුනාගෙන තිබෙන අඩුපාඩු ටික වාගේම, ප්‍රවාහනයේදී වෙන හානිය වළක්වා ගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් ඇති කරන්න ඒ අයත් එක්ක අපි සාකච්ඡා කරමින් තිබෙනවා. ලබන 09වැනි දාත් ආර්ථික මධ්‍යස්ථානවල සියලුදෙනා, සාකච්ඡාවක් සඳහා අපි කැඳවලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු, ඒ ප්‍රවාහනයේදී වෙන හානිය අවම කළාම තමයි මිල අඩු කරගන්න පුළුවන්. කාලය අඩු කරගන්න නම් එක දවසකින් එළවලු ටික එන්න ඕනෑ, මේ තැන්වලට. ඒ නිසා මේ වෙළෙඳ සැල් විවෘත කරන වෙලාව වෙනස් කරන්න වෙලා තිබෙනවා. ඒක කරනවා. ඒ වාගේම, අවිධිමත් ලෙස, විසිරුණු ක්‍රියාවලියක් ඇතුළේ මේ දිස්ත්‍රික්කවල තිබෙන ආර්ථික මධ්‍යස්ථාන විධිමත් ක්‍රියාවලියකට ගෙන ඒමට අදාළ කැබිනට් අනුමැතිය අපට ලැබිලා තිබෙනවා.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු කථානායකතුමනි, මම හිතන හැටියට පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් වෙන්න ඕනෑ. ඒ හින්දා මම මේ ප්‍රශ්නය අතුරු ප්‍රශ්නයක් විධියට අහනවා.

වත්මන් ජාතික ජන බලවේගය ආණ්ඩුව ගැන මේ රටේ තරුණ පරම්පරාව තුළ ලොකු විශ්වාසයක් තිබුණා, පරණ වැරදි ටික ආපහු නොවෙයි කියලා. මහින්දානන්ද අලුත්ගමගේ තඩු තීන්දුව පූර්වාදර්ශ තඩු තීන්දුවක් කරගෙන මේ රටේ ඉස්සරහට යන්න පුළුවන්, රාජ්‍ය දේපළ අවභාවිත කළොත් ඔබට මේකයි වෙන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, මේ වෙනකොට සමාජයේ දැඩි කථාබහට ලක් වෙන දෙයක් තමයි, ලූණු සහ හාල් ආනයනය. ඒකේ ඍජුම චෝදනාව ඔබතුමා ඉස්සරහා තිබෙනවා. මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. මේ ප්‍රශ්නය අදාළ නැහැ කියලා උත්තර නොදී ඉන්න එපා. මේක අපට ඒ ප්‍රශ්න විසඳාගන්න හොඳ වෙලාවක්. ඒ නිසා මේ සමාජයට නිවැරදි උත්තර දෙන්න. මම ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් මේ සඳහා දිනක කල් තැබීමේ විවාදයක් පවත්වන්න කියලා.

මේ වෙනකොට තාක්ෂණය දියුණුයි. අපි දන්නවා, ලූණු කිලෝවක ඉන්දියාවේ මිල කීයද කියලා. ඉන්දියාවෙන් import කරලා මෙහේට එනකොට දෙසිය ගුණයකින් මිල වැඩි වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ඇමතිතුමා කැමැති නම් උත්තර දෙයි නේ. ආයෙත් කැරට් ගැන අහලා වැඩක් නැහැ නේ, ඒකයි.

මේ සම්බන්ධයෙන් අපි කල් තැබීමේ විවාදයක් තියමු. එතකොට මේ වනකොට ඔබතුමාට තිබෙන ඍජු චෝදනා දෙකෙන් ඔබතුමාට නිදහස් වෙන්න පුළුවන්. සමාජයේ තිබෙන මේ නොගැළපීමට උත්තරයක් හොයා ගන්නත් පුළුවන්. ඒකට ඔබතුමා සූදානම් ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කළ අතුරු ප්‍රශ්නය එතුමා වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ ප්‍රශ්නයට අදාළ නොවුණත්, මම පිළිතුරක් ලබා දෙන්නම්. මේ වෙලාවේ තිබෙන ප්‍රශ්නයට අදාළ කාරණය ඔබතුමා සභාව කල් තැබීමේ යෝජනාවක් විධියට ඉදිරිපත් කරනවා නම් වඩා හොඳයි. මොකද, මේ වෙලාව කථානායකතුමාගේ කාර්යය කරගෙන යෑමට බාධාවක් වන නිසා. නමුත්, ඔබතුමා ඇසූ දේට විනාඩියකින් කරුණු කියන්නම්.

ලුණු ආනයනය සඳහා අපි වෙළෙඳ පොළ සීමා විවෘත කළා. නමුත්, ඒ ගෙන්වන අය Food Control Administration Unit එකෙන් අවසර ගන්න ඕනෑ. ආහාර සඳහා සහ ලුණු ලංකාවට ගෙන්වනකොට, ඒක තමයි පනතට අනුව තිබෙන නීතිය. මේ වනකොට මෙට්‍රික්ටොන් 268,000ක් ආනයනය කිරීම සඳහා අවසර ලබාගෙන තිබෙනවා. හැබැයි, එච්චර ගෙනෙයි කියලා අපි හිතන්නේ නැහැ. ඊයේ වනකොට මෙට්‍රික්ටොන් 16,000ක් - 15,800කට ආසන්න ප්‍රමාණයක් - ලංකාව තුළට ලුණු ඇවිල්ලා තිබෙනවා. ඒ එන ලුණු iodized salt සහ non-iodized salt. ඒ හැම ලුණු කිලෝවක්ම ඇවිල්ලා තිබෙන්නේ, රුපියල් 84ත්, 85ත් වාගේ උපරිම මිලත්, රුපියල් හැට ගණනක අවම මිලත් එක්ක, average එක රුපියල් 77කට. හැබැයි, වෙළෙඳ පොළ තුළ රුපියල් 120 සිට 280 දක්වා විකුණන්න උත්සාහ කරනවා. "මේක වැරදියි, හිඟයක් නිසා අයුතු ලාභ ලබන්න ලෑස්ති වෙන්න එපා" කියන කාරණය අපි ආනයනකරුවන්ට සෘජුව දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ ක්‍රියාවලිය තුළ පාරිභෝගිකයාට බලපෑමක් සිද්ධ වනවා නම්, ඒක නවත්වන්න අවශ්‍ය පියවර අපි ගන්නවා. මේ ගැන සභාව කල් තැබීමේ විවාදයක් ඉදිරිපත් වුණොත් තවදුරටත් ඔබතුමාට විස්තර කියන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

## මඩකලපුව, පලුකාමම් තැපැල් කාර්යාලය: ස්ථිර ගොඩනැඟිල්ලක් ලබාදීම
### மட்டக்களப்பு, பளுகாமம் தபால் அலுவலகம்: நிரந்தரக் கட்டிடத்தைப் பெற்றுக்கொடுத்தல்
### PALUKAMAM POST OFFICE, BATTICALOA: PROVISION OF A PERMANENT BUILDING

74/2024

2. **ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිවුපට්රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පලුකාමම් ප්‍රදේශයේ පිහිටා ඇති තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් නොමැති අතර එම තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) එය ඉදිකරනු ලබන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில், போரதீவுபற்று பிரதேச செயலாளர் பிரிவுக்கு உரித்தான பளுகாமம் பிரதேசத்தில் அமைந்துள்ள தபால் அலுவலகத்துக்கு நிரந்தரக் கட்டிடமொன்று இல்லையென்பதுடன், மேற்படி தபால் அலுவலகம் தற்காலிக கட்டிடமொன்றில் பேணிவரப்படுகின்றது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி தபால் நிலையத்துக்கு நிரந்தரக் கட்டிடமொன்றை நிர்மாணிக்க நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) அக்கட்டிடம் நிர்மாணிக்கப்படும் காலப்பகுதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that a permanent building has not been provided for the post office located in the Palukamam area of the Porathivupattu Divisional Secretary's Division in the Batticaloa District and is being operated in a temporary building;

(ii) if so, whether steps will be taken to construct a permanent building for the above post office; and

(iii) the time frame within which it will be constructed?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) නැත. උප තැපැල් කාර්යාලය සඳහා සුදුසු ගොඩනැඟිල්ලක් උප තැපැල් ස්ථානාධිපති විසින් සපයා ගත යුතු අතර, තැපැල් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් උප තැපැල් කාර්යාල සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම සිදු නොකෙරේ.

(iii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ඇත්තටම මෙතැන තිබෙන්නේ උප තැපැල් කාර්යාලයක්, ගරු මන්ත්‍රීතුමනි. තැපැල් කාර්යාලයක් නොවෙයි. උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමේදී උප තැපැල් ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීමේ පටිපාටියේම තිබෙනවා, උප තැපැල් කාර්යාල ස්ථානගත කිරීමට යෝග්‍ය කාර්යාලය, ඉඩ කඩ හා ස්ථානය තැපැල්පතිගේ

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

උපදෙස්වලට යටත්ව පත්වීම්ලාභියා විසින් සම්පාදනය කර ගත යුතුය කියලා. එහෙම තමයි තිබෙන්නේ. අපි බලයට එනකොට ග්‍රාමීය ප්‍රදේශවල උප තැපැල් කාර්යාලවලට රුපියල් 750ක් මාසිකව දුන්නා. නාගරිකව රුපියල් 1,500ක් දුන්නා. නමුත්, මේ මුදල ප්‍රමාණවත් නොවන නිසා තිබෙන ආර්ථික තත්ත්වය අනුව යම් වර්ගීකරණයක් කරලා ආදායම් තත්ත්වය අනුව මේ මුදල වැඩි කළා. ඒ අනුව මෙම තැපැල් කාර්යාලයක රුපියල් 50,000ට අඩු මාසික ආදායමක් තිබෙනවා නම් රුපියල් 2,000ක් ලබා දෙනවා. රුපියල් 50,000-75,000 අතර මාසික ආදායමක් තිබෙනවා නම් රුපියල් 4,000ක් ලබා දෙනවා. රුපියල් 75,000-100,000 අතර මාසික ආදායමක් තිබෙනවා නම් රුපියල් 6,000ක් ලබා දෙනවා. මාසික ආදායම රුපියල් 100,000ට වැඩි නම් රුපියල් 7,500ක් ලබා දෙනවා. දැන් මේ තැපැල් කාර්යාලය සාමාන්‍යයෙන් රුපියල් 75,000ක විතර මාසික ආදායමක් ලබන එකක්. ඒ අනුව රුපියල් 4,000-6,000 අතර දීමනාවක් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. රජයේ ඉඩමක් තිබෙන තැනක විතරයි අපි ඉදිකිරීම් කටයුතු කරන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கேள்வியைப் பொதுவாக மட்டக்களப்பு மாவட்டத்திலுள்ள தபால் நிலையங்களைப் பற்றியதாகத்தான் நான் வழங்கியிருந்தேன். ஆனால், இதிலே பளுகாமத்தைப் பற்றி மாத்திரம் குறிப்பிட்டு வந்திருக்கிறது.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களின் பதிலுக்கு நன்றி. நீங்கள் கூறும் விடயத்தை நான் ஏற்றுக் கொள்கின்றேன். ஆனால், எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில் அம்மாவட்டத்தில் உள்ள பல கிராமங்கள் இன்னும் பின்தங்கிய நிலையில் காணப்படுவதால், நகரப்புறங்களைவிட கிராமப் புறங்களில் உள்ள மக்கள் பல விடயங்களுக்கும் தபால் நிலையங்களையே நம்பியிருக்கிறார்கள். தங்களுடைய பல தேவைகளுக்குத் தபால் நிலையங்களைப் பயன்படுத்துகிறார்கள். பல விடயங்களுக்கும் கடிதங்கள்மூலம் பதில் அனுப்பும் நடவடிக்கைகள் இன்றும் வழமையாக நடைபெற்று வருகின்றன. உதாரணமாக, மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள மாங்காடு எனும் பிரதேசத்தில் ஓர் உப தபால் நிலையம் வேண்டுமெனக் கிட்டத்தட்ட 20 வருடங்களாக அங்குள்ள மக்கள் கேட்டு வருகின்றார்கள். மட்டக்களப்பில் பட்டிப்பளை, அம்பலாந்துறை போன்ற பிரதேச செயலகப் பிரிவுகளிலும் இதேபோன்ற பிரச்சினை இருக்கின்றது. கொக்கட்டிச்சோலையிலும் இதுபோன்றதொரு பிரச்சினை இருக்கின்றது. கொக்கட்டிச்சோலையில் தபால் நிலையம் இருக்கின்றது. ஆனால், அங்கு மின்சார வசதியும் இல்லை; தொலைபேசி வசதியும் இல்லை. எனவே, தபால் நிலையத்தைப் பிரதான வீதிக்குக் கொண்டுவர வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினா: மட்டக்களப்பாக இருக்கட்டும், வடக்கு, கிழக்கின் ஏனைய பகுதிகளிலாக இருக்கட்டும், ஏன் தென் பகுதியாக இருக்கட்டும், அங்கு கிராமப் புறங்களில் உள்ள தபால் நிலையங்களைத் தனியாக அடையாளப்படுத்தி, புதிதாக உப தபால் நிலையங்களை உருவாக்குவதாக இருக்கட்டும் அல்லது இருக்கின்ற தபால் நிலையங்களுக்கு வளங்களை வழங்குவதாக இருக்கட்டும், அவற்றுக்கான வசதிகளைப் பெற்றுக்கொடுப்பதற்கென விசேட வேலைத்திட்டமொன்றை உங்களுடைய அமைச்சின்கீழ் முன்னெடுப்பதற்கு வாய்ப்பு உண்டா?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ ඇත්ත අවශ්‍යතා අනුව අලුත් ස්ථානවල උප තැපැල් කාර්යාල පිහිටුවීම සඳහා සමහර ඉල්ලීම් ලැබිලා තිබෙනවා. සමහර උප තැපැල් කාර්යාල තිබෙනවා, සෑහෙන කාලයක් තිස්සේ ඒවායේ ආදායම් තත්ත්වයකුත් නැහැ, ජනතාවත් එක්ක තිබෙන සම්බන්ධතාවත් ටිකක් දුරස්. මේ සියලු කරුණු ගැන අපි සොයා බැලුවා. ඇත්තටම මෙහිදී අපි සලකන්නේ ආදායම් තත්ත්වය පමණක්ම නොවෙයි. භූගෝලීය පිහිටීම අනුවත් තිබෙන සමහර උප තැපැල් කාර්යාල පවත්වාගෙන යා යුතුයි, පාඩු ලැබුවත්. නමුත්, ඒ පිළිබඳව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් දැන් යම් සමාලෝචනයක් කරමින් පවතිනවා. එතකොට අලුත් උප තැපැල් කාර්යාල ප්‍රමාණයකුත් එකතු කරන්න අපට පුළුවන්කම ලැබේවි. මෙවර අය වැයෙනුත් අපි රුපියල් මිලියන 600ක් වෙන් කළා, තැපැල් කාර්යාල 12ක් සහ උප තැපැල් කාර්යාල 2ක් අලුතින් ඉදි කරන්නට. තවත් රුපියල් මිලියන 700ක් වෙන් කර තිබෙනවා, ඒවායේ අලුත්වැඩියා කටයුතුවලටත්. පියවරෙන් පියවර තමයි අපට මේවා කරන්න සිද්ධ වෙන්නේ. මොකද, තැපැල් දෙපාර්තමේන්තුව පාඩු ලබන තත්ත්වයක තිබෙන්නේ. භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපාදනවලින් තමයි මේ ආයතන කරගෙන යන්නේ. ඒ නිසා අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කරනවා නම්, අවශ්‍යතාවත්, දරා ගැනීමත් කියන කාරණා දෙකම සලකා බලා තමයි ඒවා ආරම්භ කරන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මගේ පළමු අතුරු ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි. අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අලුත් සභාපතිතුමාත් මේ අවස්ථාවේ මේ සභාවේ සිටිනවා. අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා මේ ඉල්ලීම් ටික ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. ඔබතුමා කියපු කාරණයකට යම් අදහසක් එකතු කරන්න මම කැමැතියි. ගරු ඇමතිතුමනි, මමත් පිළිගන්නවා, තැපැල් ක්ෂේත්‍රය දැන් කඩා වැටිලා, ඒක ලාභ ලබන ක්ෂේත්‍රයක් නොවෙයි, පාඩු ලබන ක්ෂේත්‍රයක් බවට පත්වීගෙන යනවා කියලා. මේ ආයතන සඳහා අලුතින් බඳවා ගැනීම් සිදු වෙලාත් නැහැ, පසුගිය කාලයේදී.

ඔබතුමාගෙන් මම අහන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඕස්ට්‍රේලියාව වාගේ රටක තිබෙන තැපැල් ක්ෂේත්‍රය ගත්තාම හරිම පුළුල් ක්ෂේත්‍රයක්. Australia Post කියන්නේ තැපැල් සේවාව විතරක් කරන ක්ෂේත්‍රයක් නොවෙයි, ඒක ඒ ප්‍රදේශයේම තිබෙන ප්‍රධානම convenience store එකක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ලංකාව තුළ විශාල තැපැල් කාර්යාල තිබෙන ස්ථාන ගත්තාම, ලංකාව වටේම මධ්‍යස්ථව, ඒ කියන්නේ හොඳම location එකේ තමයි අපේ තැපැල් කාර්යාල බොහොමයක් තිබෙන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ලංකාවේ තැපැල් ක්ෂේත්‍රයත් Australia Postහි තත්ත්වයට ගෙන ඒමට යම් වැඩ පිළිවෙළක් හදන්න බැරිද? ඕස්ට්‍රේලියාව වාගේ රටක් එක්ක එකතු වෙලා, ලංකාවේ තැපැල් ක්ෂේත්‍රයෙනුත් තැපැල් සේවාව විතරක් කරන්නේ නැතිව modernized postal system එකක් බවට මේ ක්ෂේත්‍රය පරිවර්තනය කරලා, ලියුම් යවන කාර්යයට එහා ගිහින් convenience store එකක් බවට අපේ තැපැල් ක්ෂේත්‍රය පරිවර්තනය කරන්න, අපට වෙන රටක ආධාරයක් ඉල්ලන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න ඔබතුමාට මොනයම් හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම බෙදා හැරීම් ජාලය හා සැපයුම් ජාලය ගත්තාම, අපේ තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල සහ සේවක ප්‍රමාණය එක්ක අපට හොඳ ජාලයක් තිබෙනවා. හැබැයි, කනගාටුවට කරුණ තමයි, ලාභ ලැබිය හැකි සේවා බොහොමයක් තැපෑලෙන් ඉවත් කර තිබීම. දැන් අපි ඒවා ක්‍රමානුකූලව තැපැල් දෙපාර්තමේන්තුවට ගෙනෙන්න තමයි උත්සාහ කරන්නේ. ඒකට බාධා වන කරුණු කිහිපයකුත් තිබෙනවා. ඒ තමයි, ඒ සඳහා අපට අවශ්‍ය වාහන බළ ඇණිය, ඒ වාගේම කාර්ය මණ්ඩලය යථාවත් නොවීම වාගේ කරුණු. ඒවාට අපි දැන් අවසර ගනිමින් ඉන්නවා. ඇත්තටම අපි බලාපොරොත්තු වෙනවා, මෙවර අපට වෙන් කරන ලද මුදල්වලින් යම් ප්‍රමාණයක් අපේ වාහන ප්‍රමාණය අලුත් කරන්න යොදා ගැනීමට. මොකද, තැපැල් කාර්යාල නවීකරණය තමයි අපේ පරමාර්ථය වෙලා තිබෙන්නේ. මේ ආයතනය ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. අනිවාර්යයෙන්ම අපි මේ ආයතනය ලාභ ලබලා පෙන්වනවා. ඒකට අවශ්‍ය සහාය තැපැල් දෙපාර්තමේන්තුවෙනුත් ලැබෙමින් පවතිනවා. ඒ අනුව තමයි උප තැපැල් කාර්යාල, තැපැල් කාර්යාල කියන ඒවාත් අපි සමාලෝචනය කරමින් පවතින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 03, ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 34 යටතේ මට රීති ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. වාචික පිළිතුරු අපේක්ෂාවෙන් මම ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය අහන්න කලින් මට ඒ සඳහා අවසර දෙන්න. ගරු කථානායකතුමා නිරන්තරයෙන්ම කියනවා, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා හොඳට කියවන්න, ස්ථාවර නියෝග 34 (1)හි තිබෙන කාරණය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියවන්න, ස්ථාවර නියෝග 33 (1) යටතේ සඳහන් වන කාරණය. එහි මෙසේ සඳහන් වෙනවා:

> "එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නගින යම් කිසි කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ඔබතුමා කියන්නේ වෙන කාරණයක්. මම කියන්න හදන්නේ වෙන එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලදී අසන අතුරු ප්‍රශ්න ගැන මේ කියන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම කියන්නේ, අපට ඕනෑම ප්‍රශ්නයක් අහන්න පුළුවන් කියලායි. ඒක ස්ථාවර නියෝග 34 (1)හි තිබෙනවා. එහි තිබෙනවා, "...අමාත්‍යවරයාගේ විශේෂ දැනුමට ගෝචර කාරණයක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙස අයැද සිටීම වේ." යනුවෙන්.

එතකොට, ඇමතිවරයාගේ විෂයය හා සම්බන්ධ විශේෂ කාරණා පිළිබඳව ඇසීමේ බලය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට මේ ස්ථාවර නියෝගවලින් දීලා තිබෙනවා. නමුත් ඔබතුමා හේෂා මන්ත්‍රීතුමාට කියනවා, වෙනත් කාරණා අහන්න එපා කියලා. ඇමතිතුමාගේ විෂයය, ඒ විෂයය නම්, ඒ විෂය පථය තුළ තිබෙන විශේෂ කාරණා ගැන ඇසීමේ අයිතිය තිබෙනවා. හැබැයි, ඇමතිතුමාට ඒකෙන් බැහැර වෙන්න පුළුවන්. නමුත්, නීති ප්‍රතිපාදනවල තිබෙන කාරණය බැහැර කරන්න දෙන්න එපා. මේ ගැන පොඩ්ඩක් අපට තේරුම් කර දෙන්න කියලා මම කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්නය, මුල් ප්‍රශ්නයට අදාළ වෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒක කොතැනද තිබෙන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 33(1) යටතේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ස්ථාවර නියෝගවල සඳහන් වනවා, "මෙම ස්ථාවර නියෝග මගින් විධිවිධාන සලසා ඇති වැඩකටයුතු සිදු කරන අවස්ථාවේදී පොදු කටයුතු පිළිබඳ ප්‍රශ්න අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ ජනාධිපතිවරයා විසින් පවරා දෙන ලද යම් විෂයයන් හා කාර්ය භාරයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය වගකීම ඇති අමාත්‍යවරයාගෙන් අසනු ලැබිය හැකිය" යනුවෙන්. ඔව්, හරි. ඒ විෂයය ගැන නේ, එතුමා ඇහුවේ. *[බාධා කිරීමක්]* ඒකට පහළිනුත්, ඉහළිනුත් ඒ ගැන කියනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. මේ ප්‍රශ්නගත කාරණයට උත්තරයක් දීලා ඉවර වෙලා ඔබතුමාට අවස්ථාව දෙන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, අපි මේ ගැටලුව විසඳා ගත්තොත්, අපටත් ප්‍රශ්නයක් නැහැ, ඔබතුමාටත් ප්‍රශ්නයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 33(1) යටතේ වැඩිදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "…. එසේ වුවද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නගින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නයත් මුල් ප්‍රශ්නයට අදාළව අහන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එම දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ අමාත්‍යවරයාගේ විෂයයට සම්බන්ධ කාරණයක්, ගරු කථානායකතුමනි. අතුරු ප්‍රශ්න දෙකක් අහන එක ගැන අපි දන්නවා. හැබැයි, ඒ අතුරු ප්‍රශ්න දෙක - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මතක තියාගන්න, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් ඇහුවාම, අතුරු ප්‍රශ්න අහන්නේ ඒ අදාළ ප්‍රශ්නය තවදුරටත් පැහැදිලි කර ගැනීමකට බව.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කොතැනද ඒ ගැන සඳහන් වන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
*ස්ථාවර නියෝග 33 - [බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන් කියන එක හරි. ඒකට අපි එකඟයි. අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ.

හැබැයි, ඔබතුමා හේෂා විතානගේ මන්ත්‍රීතුමාට කියනවා, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න කියලා. ඔබතුමා 34වන ස්ථාවර නියෝගය කියවන්න. අදාළ විෂය භාර ඇමතිවරයාගේ ඒ විෂය පථයට අදාළව ප්‍රශ්නයක් අහන්න පුළුවන් කියලා මේ නීතියේ තිබෙනවා. ඒක නිවැරදි කරලා දෙන්න. නැත්නම් ඔබතුමන්ලා, අපි මේ පාර්ලිමේන්තුවේ ගැටිලා වැඩක් නැහැ නේ. මේක ස්ථාවර නියෝගවල තිබෙන දෙයක් නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඒකයි කිව්වේ. බලන්න, ස්ථාවර නියෝග 31 සිට 37 දක්වා තිබෙන්නේ ප්‍රශ්න සම්බන්ධයෙන්. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න නොවෙයි. ඉස්සෙල්ලා මම ඒ ගැන කථා කරන්න හැදුවාම මට ඉඩ දුන්නේ නැහැ. 31වන ස්ථාවර නියෝගයේ තිබෙනවා, "මෙම ස්ථාවර නියෝග මගින් විධිවිධාන සලසා ඇති,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, 34(1)වන ස්ථාවර නියෝගයේ තිබෙනවා, "ප්‍රශ්නයක නිසි අරමුණ විය යුත්තේ,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, මම මේ කියන්නේ 31වන ස්ථාවර නියෝගය ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපේ ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කිව්ව කාරණය පැහැදිලි කර ගන්න එපා යැ. ස්ථාවර නියෝග 34(1) යටතේ මෙසේ සඳහන් වනවා:

> "ප්‍රශ්නයක නිසි අරමුණ විය යුත්තේ ප්‍රශ්නය යොමු කරනු ලබන අමාත්‍යවරයාගේ විශේෂ දැනුමට ගෝචර කාරණයක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙස අයැද සිටීම වේ. ..."

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර මේක තේරුම් ගන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ ඇමතිවරයාගේ විෂය පථයට අදාළව තමයි ඒ මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නය ඇහුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය අදාළ අමාත්‍යවරයාට විෂය ගෝචර විය යුතුයි. ඒකට අදාළව තමයි ප්‍රශ්නය අහන්න වෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඒක තීරණය කරන්න අදාළ ඇමතිතුමාට පුළුවන්. ඇමතිතුමාට තීරණය කරන්න පුළුවන්, උත්තර දෙනවා ද නැද්ද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඇමතිවරයාගේ විෂය පථයට අදාළ ප්‍රශ්නයක් නේ ඇහුවේ. ලුණු ප්‍රශ්නය එතුමාගේ විෂය පථයට අදාළයි, ගරු කථානායකතුමනි. වෙළෙඳ ඇමතිතුමාගේ විෂය පථය යටතේ තමයි ලුණු තිබෙන්නේත්. ඒ නිසා තමයි එතුමා ඒ ප්‍රශ්නය ඇහුවේ. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගවල පැහැදිලිව තිබෙනවා, අදාළ ඇමතිවරයාගේ විෂය පථයට අදාළව ප්‍රශ්න අහන්න පුළුවන් බව. අපිත් ඇමතිවරු හැටියට පිළිතුරු දීපු කාලයක් තිබුණා. මට මතකයි, මම ඉඩම් ඇමතිවරයා ලෙස හිටපු කාලයේ විපක්ෂයෙන් මුල් ප්‍රශ්නය අහලා තිබුණේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අදාළවයි.

නමුත්, අතුරු ප්‍රශ්න අහනකොට මිනින්දෝරු දෙපාර්තමේන්තුව ගැන අහනවා. ඇමතිවරයා කැමැති නම් තමන්ගේ ඒක විෂය පථය යටතේ අහන ප්‍රශ්නයක් නිසා උත්තර දෙන්න පුළුවන්කම තිබුණා. *[බාධා කිරීම්]* එහෙම තමයි සිද්ධ වුණේ. හැබැයි, විවාදයකට යන්න බැහැ. විවාදයකට යන්න විතරයි බැරි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි කරුණෙන් කරුණ වශයෙන් වාගේම සමස්තයක් ලෙසත් මේ ස්ථාවර නියෝග ගැන බලන්න ඕනෑකම තිබෙනවා. 31වන ස්ථාවර නියෝගය යටතේ තමයි ප්‍රශ්න සම්බන්ධව පටන් ගන්නේ. අපි මේක සමස්තයක් ලෙසත් තේරුම් ගන්න ඕනෑ කොටසක් තිබෙනවා. ස්ථාවර නියෝග 31, 32, 33, 34, 35, 36 සහ 37 දක්වාම තිබෙන්නේ ප්‍රශ්න පිළිබඳවයි. එතකොට සමස්තයක් ලෙස ප්‍රශ්න සම්බන්ධයෙන් මේ ස්ථාවර නියෝග 7ම අදාළ වෙනවා. ඒ වාගේම, කරුණෙන් කරුණත් අපට වෙන් කරලා ගන්න පුළුවන්. 31වන ස්ථාවර නියෝගයේ සිට තමයි ප්‍රශ්න සම්බන්ධයෙන් පටන් අරගෙන තිබෙන්නේ. ඒ යටතේ මේ කාරණය පැහැදිලි කරගෙන එනවා. එහෙම පැහැදිලි කරගෙන ඇවිල්ලා ඒකේ එක එක අවස්ථාවල තිබෙනවා, තව තවත් පැහැදිලි කරන්න ඕනෑ දේවල්, ගරු කථානායකතුමනි. උදාහරණයක් විධියට මුලින්ම 31වන ස්ථාවර නියෝගය යටතේ ගෙනෙන මේ තර්කය අදාළ කර ගත්තොත්,- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, මට මුලින්ම කියන්න ඕනෑකම තිබුණේ මෙන්න මේ කාරණයයි. අද ශෝක ප්‍රකාශ යෝජනා තිබෙන්නේ. එම ශෝක ප්‍රකාශ යෝජනාවලට අදාළ අභාවප්‍රාප්ත හිටපු ගරු මන්ත්‍රීතුමන්ලාගේ පවුල්වල ඥාතීන් දැන් කථානායක ගැලරියට ඇවිල්ලා ඉන්නවා. අපි මේ විවාදය කරමු. නමුත්, ඒ ගැනත් හිතන්න අපට වගකීමකුත් තිබෙනවා කියලා අපි හිතනවා. මොකද, මේවා අලුත් inventions නොවෙයි. මේ දේවල් පිළිබඳව ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා දන්නවා. ගරු මන්ත්‍රීතුමන්ලාට නිසි ගෞරවය ඇතුවයි මම මේ කාරණය කියන්නේ. මේ තර්කයේ කිසිම පදනමක් නැහැ. නමුත්, මේ ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව කථා කරන දවසේ වුණත් අපි ඒ ගැන වාද කරමු.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 31 යටතේ මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

> "මෙම ස්ථාවර නියෝග මගින් විධිවිධාන සලසා ඇති වැඩකටයුතු සිදු කරන අවස්ථාවේ දී පොදු කටයුතු පිළිබඳ ප්‍රශ්න අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ ජනාධිපතිවරයා විසින් පවරා දෙන ලද යම් විෂයයන් හා කාර්ය භාරයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය වගකීම ඇති අමාත්‍යවරයාගෙන් අසනු ලැබිය හැකි ය."

එතැනින් තමයි පටන් ගන්නේ. ඊළඟට ස්ථාවර නියෝග 32 (1) යටතේ මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

> "වාචික පිළිතුරක් ඉල්ලා ඇති යම් ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි පළ වූ අවස්ථාවක, එම ප්‍රශ්නය පළ වී තිබෙන්නේ යම් මන්ත්‍රීවරයකුගේ නමින් ද, කථානායකවරයා විසින් එම මන්ත්‍රීවරයා අමතනු ලැබිය යුතු අතර, එසේ අමතනු ලැබූ මන්ත්‍රීවරයා ස්වකීය ස්ථානයෙහි නැඟී සිට ප්‍රශ්නයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි දී ඇති අංකය සඳහන් කරමින් එය අසනු ලැබිය යුත්තේ ය. එවිට ප්‍රශ්නය යොමු කරනු ලැබූ අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් ඊට පිළිතුරු දෙනු ලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, ඒ විධියට ගිහිල්ලා, තවතවත් පැහැදිලි කරනවා. එහෙම තමයි පනත් හැදෙන්නේ; එහෙම තමයි ස්ථාවර නියෝග හැදෙන්නේ; එහෙම තමයි ව්‍යවස්ථා හැදෙන්නේ. මේකේ කොහෙන් හෝ කෑල්ලක් වෙනම අරගෙන මේක විස්තර කරන්න බැහැ.

අනික් කාරණය මේකයි. ගරු මන්ත්‍රීතුමා කියන ස්ථාවර නියෝගය තිබෙන්නේ "ප්‍රශ්න" කියන එක යටතේ බව බොහොම පැහැදිලියි. ඒ අනුව 34වන ස්ථාවර නියෝගයට කලින් 31වන ස්ථාවර නියෝගය තිබෙනවා. 32වන ස්ථාවර නියෝගයත් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ස්ථාවර නියෝග 33 (1) යටතේ තිබෙනවා, අතුරු ප්‍රශ්න ගැන. එහි සඳහන් වනවා, "32 ස්ථාවර නියෝගය යටතේ ...." කියලා. එතකොට අන්තර් සම්බන්ධයි.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 33 (1) යටතේ මෙසේ සඳහන් වනවා:

> "32 ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකි ය;
>
> එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නඟින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

අපි 31වන ස්ථාවර නියෝගය විතරක් ගත්තොත් එතකොට 33වන ස්ථාවර නියෝගය නැහැ. අපි 31වන ස්ථාවර නියෝගය විතරක් ගත්තොත්, එහි තිබෙන්නේ ඕනෑම මන්ත්‍රීවරයෙකුට ඕනෑම ඇමතිවරයෙකුගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන් කියායි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පුළුවන්. ඒක තමයි අපිත් කියන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම තමයි, 31වන ස්ථාවර නියෝගය විතරක් ගත්තොත්. එතකොට මේ ඔක්කොම නැහැ නේ. 31 අරගෙන ගන්නවා. *[බාධා කිරීමක්]* එහෙම ගන්න බැහැ. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* නැහැ, මට පැහැදිලි කරන්න දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඇමතිවරයා කැමැති නම් පුළුවන් නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, එහෙමත් බැහැ. ඇමතිවරයා කැමැති වුණත් -*[බාධා කිරීමක්]* එහෙම නොවෙයි මම කියන්නේ. ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* නැහැ, මට ඒක පැහැදිලි කරන්න දෙන්නකෝ. මම කියන්නේ, ව්‍යවස්ථාවක් වෙන්න පුළුවන්, පනතක් වෙන්න පුළුවන්, ඕනෑම ලියවිල්ලක සාරය තේරුම් ගන්නේ නැතුව ඒකේ කොටස් වෙනම ගත්තොත්, අපට කිසිම දෙයක් කරන්න වෙන්නේ නැහැ. 34වන ස්ථාවර නියෝගයට කලින් 31වන ස්ථාවර නියෝගය තිබෙනවා. මම ඒකයි කිව්වේ, 31වන ස්ථාවර නියෝගයට අදාළව ගත්තොත් අතුරු ප්‍රශ්න ඕනෑ තරම් අහන්න පුළුවන්. ඇයි, 33වන ස්ථාවර නියෝගය අදාළ කර ගන්නේ නැහැ නේ. ඉතින් මම මේ කියන්නේ basics, හරිද? මේ ඉතාම පැහැදිලි මූලධර්ම ලියවිල්ලක්, තේරුම් ගන්න. ඒ නිසා ගරු කථානායකතුමනි, ඉතාම පැහැදිලිව කියන්න තිබෙන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එතුමා කියන දේම නොවෙයි, අපි කියන දේත්-*[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ, ඇහුම්කන් දෙන්න. අපටත් අවස්ථාව දෙන්න ඕනෑ නේ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපටත් දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ නිසා අපි ඔබතුමාට කියන්නේ, කිසිසේත්ම, ඕනෑම ප්‍රශ්නයක් ඇමතිවරයෙකුගෙන් අහන්න බැහැ. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ අහන්න පුළුවන් ඒ විෂයයට අදාළ, ඒ අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්න විතරයි. ඇමතිවරයාගේ කැමැත්ත අකැමැත්ත මත යම් ප්‍රමාණයක් අහන්න පුළුවන්. නමුත් ඇමතිවරයෙකුට වුණත් ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා හැමදෙනාම තේරුම් ගන්න අවශ්‍යයි, සභාව මෙහෙයවීමේ කටයුත්ත ගරු කථානායකවරයා-*[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපටත් පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම මේ කථා කළේ,- *[බාධා කිරීමක්]* විනාඩියක් ඉන්න. දැන් මේක එතුමා කියන විධියටම ගනිමුකෝ. "ප්‍රශ්න" කිව්වාම එහෙම නම් මෙකේ තිබෙන්න ඕනෑ, "වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න" කියලා, මුලින්. හරි නේද? ඉස්සර වෙලා මෙකේ තිබෙන්නේ "ප්‍රශ්න". ඒ කියන්නේ අපට ඉඩක් තිබෙනවා මේ පාර්ලිමේන්තුව ඇතුළේ,- *[බාධා කිරීමක්]* ඒක තමයි අපි වෙනදා practice කරපු කාරණය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා, මේ කාරණය සම්බන්ධයෙන් මම ලබන පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී ඔබතුමන්ලාට වාර්තාවක් ලබා දෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, නැහැ, එහෙම කරන්න එපා. අපටත් මේ ගැන කියන්න අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපට මේ සභාවේ අනික් වැඩකටයුතු තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපෙත් අදහස ගන්න, ගරු කථානායකතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාරණය සම්බන්ධයෙන් මම ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී ඔබතුමන්ලාට වාර්තාවක් ලබා දෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ කාරණාව පැහැදිලි කරගෙන එපා යැ ශෝක යෝජනාවලට යන්න, ගරු කථානායකතුමනි. අපි ස්ථාවර නියෝග අනුවයි අවස්ථාව ඉල්ලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණාව සම්බන්ධයෙන් තමයි ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, මම ලබන- *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, නැහැ, අපට පැහැදිලි කර ගන්න ඕනෑ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා තනියම තීන්දු දෙන්න යන්න එපා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තනියම තීන්දු දෙන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, අධ්‍යයනය කරලා මම වාර්තාවක් දෙනවා. *[බාධා කිරීම්]* ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය අහන්න පුළුවන්. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග දෙකක් යටතේ අවස්ථාව ඉල්ලුවා. එකක්, 34වන ස්ථාවර නියෝගය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]* දැන් මම ඔබතුමාට අවස්ථාව දුන්නාම ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමා, අපි ස්ථාවර නියෝගයක් යටතේ අවස්ථාව ඉල්ලුවාම ඒකට අවස්ථාව දෙන්නේ නැත්නම්, ඔබතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපි ඉතාම ගෞරවයෙන්, මේ රීති පද්ධතිය අනුව ඔබතුමාගෙන් අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම පැහැදිලිව ඔබතුමාට, මේ සභාවට කිව්වා,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා ඒකෙන් පිට පැනලා, සභාව මෙහෙයවනවාය කියලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඉතිහාසයේ කථානායකතුමන්ලා අපිව නොමග යැව්වේ නැහැ. ගරු සභානායකතුමනි, ඔබතුමා කිව්ව කාරණය අපි පිළිගන්නවා. මට මේක පහදන්න ඉඩ දෙන්න. ඔබතුමා කිව්වා "ප්‍රශ්න" කියලා තමයි තිබෙන්නේ කියලා. ඔව්, හරි. 34වෙනි ස්ථාවර නියෝගයේ තිබෙන්නේත් "ප්‍රශ්න" කියන වචනය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ අතුරු ප්‍රශ්න අහන ආකාරය සම්බන්ධයෙන් පැහැදිලිව තිබෙනවා. ඔබතුමා ගෙදර ගිහිල්ලා ස්ථාවර නියෝග හොඳට කියවා ගන්න. මොකද, මේක හරි කරදරයක්. *[බාධා කිරීමක්]* මෙච්චර කල් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීතුමන්ලාට මේක තේරුම් ගන්න බැරි නම් බරපතළ ප්‍රශ්නයක්. කරුණාකරලා දැන් ඔබතුමාගේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපි කිව්වාට පස්සේ පොත බලලා උත්තර දෙන්න යන්න එපා. කථානායකවරයා වුණාම පොත කලින් බලන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොත බලලා තමයි කියන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපි කියනකොට පොත බලලා කියන කථානායකලා නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අපි කියනකොට පොත පෙරළලා බලලා කථානායකලා ඒවා කියන්නේ නැහැ. එහෙම කථානායකලා හිටියේ නැහැ, ඉතිහාසයේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ප්‍රශ්නය අහන්න පුළුවන්, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය අහන්න කලින්, ප්‍රශ්න පිළිබඳ සඳහන් ස්ථාවර නියෝගය ගැන මතු වුණු කාරණය ගැන වැදගත් කරුණක් කියන්න,-*[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, මම ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙනවා.

## ප්‍රධාන වරායන්: 2015 සිට ආදායම සහ වියදම
## பிரதான துறைமுகங்கள்: 2015 முதல் வருமானம் மற்றும் செலவுகள்
## MAJOR PORTS: REVENUE AND EXPENDITURE FROM 2015

95/2024

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන වරායන් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් වරායේ ආදායම හා වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වරායන් සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பிரதான துறைமுகங்கள் யாவையென்பதையும்;

(ii) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை மேற்படி ஒவ்வொரு துறைமுகத்தினதும் வருமானம் மற்றும் செலவு ஆண்டுவாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி துறைமுகங்களை அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House the -

(i) names of major ports in Sri Lanka;

(ii) income and expenditure of each of such ports in each year from 2015 up until now, separately; and

(iii) measures that have been taken to develop the said ports?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
1. කොළඹ වරාය
2. ගාල්ල වරාය
3. හම්බන්තොට වරාය
4. ත්‍රිකුණාමලය වරාය
5. ඔළුවිල් වරාය
6. කන්කසන්තුරය වරාය
7. ජේදුරු තුඩුව වරාය
8. මන්නාරම් ජැටිය
9. පුත්තලම (නොරච්චෝලය)

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වරායේ ආදායම හා වියදම වෙන් වෙන්ව ඇමුණුමෙහි දක්වා ඇත.

**SRI LANKA PORTS AUTHORITY**

**Revenue & Expnditure Details from 2015 to 2024**

(Rs. million)

**Colombo Port**

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Revenue | 99,444,162,023 | 89,227,154,761 | 94,897,251,982 | 58,714,676,731 | 50,230,841,167 | 51,742,943,578 | 49,605,849,133 | 41,325,031,659 | 39,912,936,022 | 37,214,151,236 |
| Expenditure (Before tax) | 56,845,886,834 | 50,680,148,484 | 39,584,125,611 | 33,231,622,628 | 30,618,386,281 | 36,791,162,849 | 41,841,271,416 | 27,188,535,966 | 28,666,072,702 | 32,542,991,059 |

**Trincomalee Port**

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Revenue | 2,829,789,425 | 2,490,966,264 | 2,706,837,023 | 935,829,347 | 1,050,784,318 | 1,253,626,154 | 1,053,578,020 | 1,119,603,203 | 886,119,904 | 530,418,647 |
| Expenditure (Before tax) | 1,567,125,164 | 1,348,314,577 | 1,143,664,273 | 945,813,207 | 834,607,853 | 855,621,693 | 820,160,690 | 764,241,513 | 734,189,421 | 749,972,047 |

**Galle Port**

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Revenue | 907,557,007 | 1,512,326,244 | 1,469,787,796 | 955,926,768 | 1,375,570,566 | 1,639,375,390 | 1,623,444,888 | 1,387,826,348 | 1,239,108,450 | 915,449,233 |
| Expenditure (Before tax) | 958,692,148 | 842,741,088 | 1,320,296,731 | 827,665,948 | 877,063,490 | 833,795,114 | 925,333,562 | 759,685,534 | 742,313,803 | 752,960,619 |

**Hambanthota Port**

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Revenue | - | - | - | - | - | - | - | 1,776,347,044 | 2,042,021,560 | 2,145,084,709 |
| Expenditure (Before tax) | - | - | - | - | - | - | - | 3,674,209,322 | 12,901,884,122 | 20,927,735,973 |

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමා, ආසන්න අවුරුදු කිහිපයේ ඒවා කෙටියෙන් කියන්න පුළුවන්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කොළඹ වරායේ 2024 වර්ෂයේ ආදායම බිලියන 99ක්, බදුවලට පෙර වියදම බිලියන 56ක්. තව විස්තර තිබෙනවා. 2023දී කොළඹ වරායේ ආදායම බිලියන 89යි, වියදම බිලියන 50යි. 2022 වර්ෂයේ කොළඹ වරායේ revenue එක බිලියන 94යි, වියදම බිලියන 39, බදුවලට පෙර. Trincomalee Port එකේ 2024දී ආදායම බිලියන 2.8යි, වියදම බිලියන 1.5යි. 2023දී ආදායම බිලියන 2.4යි, වියදම බිලියන 1.3යි. 2022දී ආදායම බිලියන 2.7යි, වියදම බිලියන 1.1යි.

ගාල්ල වරාය ගත්තොත්, 2024දී ආදායම රුපියල් මිලියන 907යි, වියදම මිලියන 958යි. 2023දී ආදායම බිලියන 1.5යි, වියදම මිලියන 842යි. 2022දී ආදායම බිලියන 1.4යි, වියදම බිලියන 1.3යි.

(iii) <u>කොළඹ වරාය</u>

කොළඹ වරායේ ඉල්ලුම සපුරාලීම සඳහා 2032 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ යුතු බටහිර බහලු පර්යන්තය - II සංවර්ධනය කිරීමට ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය පියවර ගෙන තිබෙනවා. අපි දැනට ඒ සම්බන්ධයෙන් ආයෝජන කැඳවීම් කරන්න තීන්දු කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඊට පසුව කොළඹ උතුරු වරාය - Colombo North Port එක- සම්බන්ධව අපි ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණයෙන් අවසන් කර තිබෙනවා. එහි මූලික තාක්ෂණික සහ feasibility study reports සකස් කිරීමේ ක්‍රියාවලියට අවුරුදු 2ක් විතර ගත වෙනවා. එය ආරම්භ කරන්න කටයුතු කරගෙන යනවා. ඊට අමතරව, කොළඹ වරායේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නැඟෙනහිර පර්යන්තයේ කටයුතුවලින් අවම වශයෙන් සියයට 50ක් අවසන් කිරීමට මේ වසර තුළදී සැලසුම් කර ක්‍රියාත්මක කරගෙන යනවා. තවත් මාස කිහිපයකින් අපි විශ්වාස කරනවා, ඒ තත්ත්වයට එන්න පුළුවන් කියලා.

<u>ගාල්ල වරාය</u>

ආයෝජන ආකෘතියක් යටතේ ගාල්ල වරාය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලැස්මක් හදා තිබෙනවා. නමුත්, ඒ සැලැස්ම අංග සම්පූර්ණ සැලැස්මක් නොවෙයි. එය පාරිසරික සහ සමාජයීය ප්‍රශ්න රාශියක් ඉස්සරහායි තිබෙන්නේ. එම නිසා දැනට එය පුළුල් වශයෙන් ක්‍රියාවට නැඟෙන එකක් විධියට නොවෙයි තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

<u>ත්‍රිකුණාමලය වරාය</u>

ත්‍රිකුණාමලය වරායට යාබදව පිහිටි අතිවිශාල ප්‍රදේශයෙහි ඉඩම් ප්‍රමාණය එහි logistics සහ අනෙකුත් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ යනාදි විධියට තමයි ත්‍රිකුණාමලය වරාය ගැන කෙටියෙන් කියන්න තිබෙන්නේ, මේ ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන්.

<u>කන්කසන්තුරය වරාය</u>

කන්කසන්තුරය වරායට අදාළව ගත්තොත්, එහි ජැටිය ගොඩනැඟීමේ කටයුතු අපි කරගෙන යනවා. එය ව්‍යාපාරික වරායක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනවලින් අසමත් වී තිබෙනවා. එහි දියකඩනය වාගේ දේවල් ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමකත් තිබෙනවා. ඒ නිසා අපි එය පුළුල් සංවර්ධන ව්‍යාපෘතියකට ලක් කර නැහැ, ගරු කථානායකතුමනි. අපි දැනට කර්මාන්ත අමාත්‍යාංශයේත්, ආයෝජන මණ්ඩලයේත් ඉල්ලීම මත කන්කසන්තුරය වරායත්, සිමෙන්ති කම්හල ආශ්‍රිතව ගොඩනඟන්න බලාපොරොත්තු වන කර්මාන්තපුරයත් සම්බන්ධ කර logistics hub එකක් විධියට දියුණු කරන්න කටයුතු කරනවා.

(ආ) පැන නොනඟී.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තර පිළිතුර මා **සභාගත*** කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර තුළ ඉතාම පැහැදිලිව තිබෙනවා, අපේ වරායවල ආදායම්, වියදම් පිළිබඳ සංඛ්‍යා. විශේෂයෙන්ම 2024 ගත්තොත්, එහි ආදායම රුපියල් බිලියන 99ක් සහ වියදම බිලියන 56ක් බව ඔබතුමා කිව්වා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් වරායවලට තිබෙන ආදායම තමයි ආනයනය සහ අපනයනයේදී බහලුවලින් ලැබෙන තීරු බදු ගාස්තු සහ වරාය ගාස්තු කියන ඒවා. හැබැයි, ගරු ඇමතිතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්නය තමයි, ඒ බහලුවලින් ලැබෙන්න තිබෙන ආදායම් වරායට අහිමි වීම. ඔබතුමන්ලාගේ කාලයේත් ඒක වෙනවා. ඒක චෝදනාවක් හැටියට සමාජයේ තිබෙනවා. එය අහිමි වන්නේ කාගේ හෝ බලපෑමක් මතයි. වරාය ගාස්තු, තීරු බදු ගාස්තු ගෙවලා නීත්‍යනුකූලව නිදහස් කරන්න තිබෙන බහලු තමන්ගේ හිතවත්කමට නිදහස් කරනවා. ඒ නිසා අපට ලැබෙන ආදායම අහිමි වෙලා තිබෙනවා. ඒක ඉතිහාසයේත් වෙලා තිබෙනවා; වර්තමානයේත් වෙලා තිබෙනවා. වරායේ රේගු නිලධාරින් පරීක්ෂා කර බලා වරායෙන් නිදහස් කරන්න තිබෙන බහලු හිතවත්කමට නිදහස් කිරීම හරහා රටට හා රටේ මහ ජනතාවට ලැබිය යුතු මුදල් අහිමි වීම කාගේ හෝ බලපෑමක් මත සිදු වෙලා තිබෙනවා. ඒක වර්තමානයේත් සිදු වනවා නම් වැරැදියි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ වැරැදි හඳුනාගෙන තිබෙනවා ද, එදා මෙදා තුර එම වැරැදි කළ පුද්ගලයන් කවුද කියලා බලා තරාතිරම නොබලා දඬුවම් දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඉදිරියේදී ඔබතුමා ක්‍රියාත්මක කරනවා ද? මොකද, ඔබතුමා හැම දාම පපුවට අත තියලා හෘදය සාක්ෂියට එකඟව කථා කරන ඇමතිවරයෙක් නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, වරායේ ආදායමට කන්ටේනර්වලින් අය කරන බදු එන්නේ නැහැ. වරායයි, රේගුවයි පටලගෙන දැහලීම ගැන, ඒක අතකට ඇත්තටම මට තිබෙන්නේ කනගාටුවක්. ඒ, මෙතුමා නොවෙන්න පුළුවන්. වරාය එකක්; රේගුව තව එකක්. වරාය ඇතුළේ රේගුව කටයුතු කරනවා. වරායේ ආදායම බිලියන 99ක් කියන කොට ඒකේ කන්ටේනර්වලින් අය කරන ඔය කියන රේගු බදු ආදායම නැහැ. එහි handling charges තිබෙනවා. අප ළඟදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා යෝජනාවක්. අපි වරායේ විවිධ සේවා සපයනවා.

2022න් පසුව ඒවායේ බදු යාවත්කාලීන කරලා තිබුණේ නැහැ. අපි ඒ tariff වැඩි කරන්න යෝජනා කර තිබෙනවා. ඒක තමයි කියන්න තිබෙන්නේ. රේගුවයි, වරායයි කියන්නේ දෙකක්.

දෙවැනි කාරණය මේකයි. කිසිම බලපෑමක් මත; ජනාධිපතිවරයාගේ හෝ ඇමතිවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ බලපෑම මත වරායේ බහලු එකක්වත් නිදහස් වෙන්නේ නැහැ. ඉතිහාසයේ එහෙම දේවල් වෙලා ඇති. එහෙම එක බහලුමක් හෝ නිදහස් කරලා නැහැ. එහෙම නිදහස් කරන්න බලයකුත් නැහැ. ඒ කාරණය තමයි මට ඒ ගැන කියන්න තිබෙන්නේ.

ඒ වාගේම, දැන් රටේ සංවාදයට ලක් කරලා තිබෙනවා, කන්ටේනර් 323ක් නිදහස් කිරීම පිළිබඳ ප්‍රශ්නයක්. බොහොම උනන්දුවෙන් ඒකට අපවත් පටලලා තිබෙනවා. මා හිතන විධියට, ඒ සම්බන්ධයෙන් දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ පටන් ගෙන තිබෙනවා. ඒ පරීක්ෂණවලින් රටට ඇත්ත එළිවෙයි කියලා මම හිතනවා. ඒ සම්බන්ධයෙන් පිළිතුර ලැබෙන එක හොඳයි. ඒ කන්ටේනර් 323 ගැන මට කියන්න තිබෙන්නේ එච්චරයි. අනෙක් කිසිම දෙයක් අපි අපේ දැනුවත්කම් මත නිදහස් කරලාත් නැහැ, කරන්නේත් නැහැ, කරන්න දෙන්නේත් නැහැ.

ඒ වාගේම, වරායේ සිදු වුණු මහා පරිමාණ දූෂණ ගැන අපි පරීක්ෂණ පටන් ගෙන තිබෙනවා. ඒ, ඊට සම්බන්ධ පුද්ගලයන් සහ අනෙකුත් දේවල් සම්බන්ධයෙන්. ඒ පිළිතුර තමයි මට ඒකට දෙන්න තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, වරායයි, රේගුවයි පිළිබඳව පැහැදිලි කර දුන්නාට. ඒක තමයි මා "වරාය ගාස්තු" කියන කාරණයත් ඒකාබද්ධ කරලා රේගුවත් සම්බන්ධ කරමින් බහලු ගාස්තු පිළිබඳව ඔබතුමාට ප්‍රකාශ කළේ. ඒ, නොදන්නාකමට නොවෙයි. මට ඕනෑ වුණා, වරායේ යම් කාර්යභාරයක් රේගුව හරහා සිදු වන,- මොකද, නැව්වලින් ගෙනැල්ලා, බහලු ගොඩ බාලා, වරායෙන් නිසි කටයුතු කරන කොට, වරායේ සාම්ප්‍රදායික සහ නීත්‍යනුකූල ක්‍රමවේදයත්, රේගුව හරහා සිදු වන වැඩ පිළිවෙළත් සම්බන්ධව විෂය භාර ඇමතිතුමා හැටියට ඔබතුමා තමයි ඉන්නේ. ඒ නිසායි මම ඒ කාරණය බද්ධ කරලා කථා කළේ. ඔබතුමා ඒක පැහැදිලි කළා.

ගරු කථානායකතුමනි, මම දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නයි හදන්නේ. ගරු ඇමතිතුමාට ස්තුති කරලායි දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න හදන්නේ. මොකද, වැරැද්දකුත් නිවැරැදි කරලා දුන්නාම පොඩි ගෞරවයක් හරි තිබෙන්න එපා යැ.

වරායේ සංවර්ධන කටයුතු පිළිබඳව ඔබතුමන්ලා කථා කළා. ඒක හොඳයි. ඊයේ අපි දැක්කා නැඟෙනහිර ජැටිය ගැන කියනවා. ඔබතුමන්ලා මේ මාසයේ 30වන දා තමයි එය විවෘත කරන්න ඉඳලා තිබෙන්නේ. හැබැයි ඔබතුමන්ලා පත් කරපු නව නිලධාරින්ගේ නොහැකියාව සහ නොදැනුවත්භාවය හරහා ඒ කටයුත්ත ප්‍රමාද වෙලා විශාල පාඩුවක් සහ තවත් වියදමක් දරන්න සිදු වන බව තමයි මාධ්‍ය මඟින් අනාවරණ වුණේ. මම හිතනවා, මීට වඩා කාර්යක්ෂමව කටයුතු කරන්න තිබුණා කියලා. තමුන්නාන්සේලා බඳවා ගත් නිලධාරින්ගේ අඩුපාඩු තමයි මාධ්‍ය සාකච්ඡා තුළින් පෙනෙන්නට තිබුණේ. ඒවා ඇත්තද, නැත්තද කියලා අපි දන්නේ නැහැ. ඇමතිවරයා හැටියට ඔබතුමා එහි සත්‍යය දන්නවා ඇති. මේ මාසයේ 30වන දා ජනසතු කරලා රටේ ආදායමට බද්ධ කරන්න තිබුණු එම ජැටිය අලුත්වැඩියා කරන්න - නවීකරණය කරන්න- බැරි වෙලා තිබෙන්නේ පැහැදිලිවම ඔබ ආණ්ඩුව ගත් තීන්දු නිසායි කියන චෝදනාව තමයි තිබෙන්නේ. ඒක සත්‍යයක් ද, අසත්‍යයක් ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. එය දේශපාලන වුවමනා මත කටයුතු කරන වෘත්තීය සමිතියකින් කරන කිසිම පදනමක් නැති චෝදනාවක්.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු කථානායකතුමනි, straddle carriers ගත්තාම, ඒවා නැව්වලින් ගෙනෙන containers ගෙනියන්න භාවිත කරන crane විශේෂයක්. ඒවා order කිරීමේදී මහා පරිමාණ වංචාවක් වෙලා තිබෙනවා. මම මේ සභාවට ඒක කියලා තිබෙනවා මීට කලින්. ඒ straddle carriers ගෙනෙද්දී වෙච්ච වංචාවක් නිසා නඩුවක් ගිහිල්ලා තිබෙනවා, ඒවායෙන් එකක් වෙනුවෙන්. ඒ නිසා අපට ඒවා 15ක් ගේන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම, මුළු ලෝකයම ඩීසල් ඒවායින් electronic ඒවාට යද්දී, electric ඒවාට යද්දී, ඩීසල් ඒවා තමයි අපි ගෙනැත් තිබුණේ.

ඒ ටෙන්ඩර් එක නතර කරන්න කියලා Cabinet Paper එකක් දානවා, 2024 අගෝස්තු මාසයේ විතර. ඒ, නතර කරන්න කියලා Cabinet Paper එකක් දාපු ටෙන්ඩර් එක 2024 සැප්තැම්බර් මාසයේ 09 හෝ 08 වාගේ දවසක නැවත දෙන්න කියලා තීන්දු කරනවා, රනිල් වික්‍රමසිංහ සහ හිටපු කැබිනට් ඇමතිවරු. ඒ අනුව සැප්තැම්බර් 09 ඒක අනුමත කරනවා. සැප්තැම්බර් 18වැනි දා වරාය Board එකෙන් ටෙන්ඩර් එක award කරන්න තීන්දු කරනවා. සැප්තැම්බර් 19 agreements අත්සන් කරනවා. සැප්තැම්බර් 21 ජනාධිපතිවරණය තිබුණා. මේ වංචාව ඩොලර් මිලියන 18ක්. අපි අනිවාර්යයෙන් ඒකට අදාළ හැමකෙනාම අධිකරණය ඉස්සරහට ගෙනියනවා. ගරු කථානායකතුමනි, නීතිපති උපදෙස් අරගෙන අපි ඒ ටෙන්ඩරය අවලංගු කළා. අපි ඒක අවලංගු කරලා අලුතින් straddle carriers ගේන්න කැබිනට් අනුමැතිය අරගෙන, දැන් ඒකට ටෙන්ඩර් call කරලා තිබෙනවා. මම හිතන විධියට, මාස 4කට වැඩියි, අපි ඒ කැබිනට් තීන්දුව අරගෙන. ගරු කථානායකතුමනි, ඔබතුමාට තේරුම් ගන්න මම පොඩ්ඩක් කියන්නම්. ගරු කථානායකතුමනි, අපි දොඹකර - cranes - හරි, මේ straddle carriers හරි, tugboats හරි මොනවා හරි ඒ වාගේ දේවල් market එකට ගිහිල්ලා ගන්න නැහැ. අපි කිව්වාම තමයි order එකට ඒවා හදන්නේ. මම ඒකයි කියන්නේ. රාජපක්ෂලා, වික්‍රමසිංහලා සහ වික්‍රමසිංහලාත් එක්ක දැන් ආණ්ඩු අටවන්න හදන උදවිය වරාය සම්බන්ධයෙන් කරලා තිබෙන අපරාධ, ජාතික ආර්ථික අපරාධ.

කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය 2023දී පටන් ගන්න තිබ්බ‍ෙ එකක්. අපි දැන් පටන් අරගෙන ඒ වැඩ කළත් ගරු කථානායකතුමනි, 2027 විතර වෙනවා, සම්පූර්ණ කරන්න. ඒ වෙනකොට වෙන රටවල වරායවල් ඒ කටයුතු පටන්ගෙන තිබෙනවා. මම මේ කරුණු කියන්නේ මේවා වෙන වෙන විධියට වර්ග කරන නිසා. ඒ අය ආර්ථික ඝාතකයෝ, ඇත්තටම. ඒ ආර්ථික ඝාතකයන්ගෙත් ගෝලයෝ තමයි අද ඇවිල්ලා ඒ හොරු ආරක්ෂා කරන ගමන් මාධ්‍ය සාකච්ඡා තියන්නේ. ඒ නිසා මට කියන්න තිබෙන දේ මෙයයි. අපි උපරිම වශයෙන් මේ වෙනුවෙන් කටයුතු කරනවා. වරාය සේවකයෝ කවුරුවත් අපි අලුතින් බඳවාගෙන නැහැ. ඒ ඉන්න කට්ටියම තමයි වැඩ කරන්නේ. ඒ කට්ටියගේ අඩුපාඩු තිබෙනවා. අපි බඳවා ගත් අයගේ කියලා විශේෂයක් නැහැ. නමුත්, අපි උපරිම වශයෙන් මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 33 යටතේ පැහැදිලි කර ගන්න පුළුවන් කියලා ඔබතුමාම කිව්වා. ඒ නිසා මට අවස්ථාව දෙන්න, පැහැදිලි කර ගැනීමක් කරගැනීමට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙක අහලා ඉවරයි. කරුණාකරලා,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමාම දැන් කිව්වා නේ පැහැදිලි කර ගැනීමක් පුළුවන් කියලා. එහෙම කියලා ඔබතුමාම දැන් නැහැ කියනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙක අහලා ඉවරයි.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමාම කියනවා, පැහැදිලි කර ගන්න පුළුවන් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අතුරු ප්‍රශ්න දෙකකින් තමයි පැහැදිලි කර ගන්නේ. ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මේ සභාව නොමඟ යන විධියේ ප්‍රකාශ නොකර ඉන්න.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

## සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම: සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
## வ/ப விமான நிலைய மற்றும் விமான சேவைகள் (இலங்கை) கம்பனி: தலைவர் மற்றும் பணிப்பாளர் சபை
## AIRPORT AND AVIATION SERVICES (SRI LANKA) LIMITED: CHAIRMAN AND BOARD OF DIRECTORS

158/2024

**4. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයාගේ නම කවරේද;

(ii) ඔහුගේ සුදුසුකම් කවරේද;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම්, මේ දක්වා දරා ඇති තනතුරු, එම පෙර තනතුරු දරන ලද ආයතනය සහ වර්තමානයේදී වෙනත් ආයතනවල දරන තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட விமான நிலைய மற்றும் விமான சேவைகள் (இலங்கை) கம்பனியினுடைய தலைவரின் பெயர் யாதென்பதையும்;

(ii) அவரது தகைமைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி கம்பனியின் பணிப்பாளர் சபை அங்கத்தவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) அந்த ஒவ்வோர் பணிப்பாளர் சபை அங்கத்தவருடைய பெயர், முகவரி, கல்வித் தகைமைகள், இதுவரை வகித்துள்ள பதவிகள், அப்பதவிகளை வகித்த நிறுவனங்கள் மற்றும் தற்போது ஏனைய நிறுவனங்களில் வகிக்கின்ற பதவிகள் என்பன வெவ்வேறாக யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the name of the Chairman of the Airport and Aviation Services (Sri Lanka) Limited;

(ii) his qualifications;

(iii) the number of members of the Board of Directors of the said company; and

(iv) the name, address, and educational qualifications of each of those Board members, the positions they have held so far, the institutions in which they had held those previous positions and the positions they currently hold in other institutions, separately?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) හර්ෂ දුමින්ද අබේවික්‍රම

(ii) a. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇලබාමා හි මැක්ස්වෙල් ගුවන් හමුදා කඳවුරේ ගුවන් විශ්ව විද්‍යාලයේ ගුවන් අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ උපාධිධරයෙකි.

b. එක්සත් රාජධානියේ ලන්ඩනයේ රාජකීය ආරක්ෂක අධ්‍යයන විද්‍යාලයේ උපාධිධරයෙකි.

c. ලන්ඩනයේ කිංග්ස් කොලේජ් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙකි.

d. ශ්‍රී ලංකාවේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ශාස්ත්‍රපති උපාධිධරයෙකි.

(iii) 08යි.

(iv) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ විස්තර වෙන් වෙන් වශයෙන් පහතින් දැක්වේ.

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් | දැරූ තනතුරු | වත්මන් තනතුර |
|---|---|---|---|---|---|
| 1. | එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) හර්ෂ දුමින්ද අබේවික්‍රම | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක | ඉහත ii යටතේ බලන්න | 1. ගුවන් හමුදාපති - ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>2. සභාපති - ලංකා බැංකුව<br>3. අධ්‍යක්ෂක - සන්ෂයින් හෝල්ඩින්ග්ස් පීඑල්සී<br>4. අධ්‍යක්ෂ - බ්‍රැන්ඩික්ස් ලංකා සමාගම | 1. වටවල වැවිලි සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂක<br>2. සන්කෙන් සමූහයේ කැපිටල් ටවර්ස් හි විධායක නොවන අධ්‍යක්ෂක<br>3. සභාපති ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |
| 2. | සිරිල් වත්තිගම මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක | 1. B.Sc<br>2.MBA FCA (වරලත් ගණකාධිකාරී)<br>3.PGD in SF CMA (Australia) | 1. උපාධිධාරී ගුරුවෘත්තිය (අධ්‍යාපන දෙපාර්තමේන්තුව)<br>2. විගණන අධිකාරී (විගණක ජෙනරාල් දෙපාර්තමේන්තුව)<br>3. අභ්‍යන්තර විගණක AASL<br>4. අභ්‍යන්තර විගණන ප්‍රධානී AASL | 1.උප සභාපති - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් | දැරූ තනතුරු | වත්මන් තනතුර |
|---|---|---|---|---|---|
| 3. | ලාල් සේනාරත්න මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක | 1.B.A උපාධිය - කැලණිය විශ්ව විද්‍යාලය (ශ්‍රීලංකාව)<br><br>2.C.B.A සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය)<br><br>3.M.AAT - ගිණුම්කරණ කාර්මික සංගමයේ සාමාජික (ශ්‍රී ලංකා)<br><br>4.C.M.A.D - සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ඩිප්ලෝමාව (ශ්‍රී ලංකාව)<br><br>5.ACCA (P1) - වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමය (ලන්ඩන්) | 1.ලිපිකරු - ලංකා විදුලිබල මණ්ඩලය (අවුරුදු 42 කට ආසන්න පළපුරුද්ද)<br><br>2.විගණන සහකාර - ලංකා විදුලිබල මණ්ඩලය<br><br>3.ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක - ලංකා විදුලිබල මණ්ඩලය<br><br>4. කළමනාකරු (විමර්ශන) - ලංකා විදුලිබල මණ්ඩලය (විශේෂ විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා)<br><br>5.විමර්ශන කළමනාකරු - ඛනිජ තෙල් පර්යන්ත සමාගම. | 1.සෙන් ඉලෙක්ට්‍රිකල් ටෙක්නොලොජීස් (පුද්) සමාගමේ සභාපති<br><br>2.අධ්‍යක්ෂක - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |
| 4. | එච් තුෂාර චාමින්ද මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක | 1.අ.පො.ස. (සා.පෙළ) - විශිෂ්ටතා 6/2<br><br>අ.පො.ස. (උසස් පෙළ) - උසස් පෙළ 3 As / 1C<br><br>2. ඔස්ට්‍රේලියානු රජයෙන් කොටස් සහ කුසලතා ශිෂ්‍යත්වයක් ලබා ගත් (1992-1997) ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිය (ගෞරව) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 1.1997-1998 පර්යේෂණ විශ්ලේෂක - CDIC සැසුන් කම්බර්බැච් කොටස් තැරැව්කරුවන් (පුද්ගලික) සමාගම<br><br>2.1998-1999 : විධායක ප්‍රතිව්‍යුහගත කිරීම කොළඹ වාණිජ (ඉංජිනේරු) සමාගම<br><br>3.1999-2010 : පුද්ගලික කළමනාකරු/ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මානව සම්පත්, ඕෂන් ලංකා (පුද්ගලික) සමාගම<br><br>4.2010-2017 : සමූහ මානව සම්පත් ප්‍රධානී රිචඩ් පීරිස් සහ සමාගම පීඑල්සී | 1.2017 - මේ දක්වා : උප සභාපති - මානව සම්පත් සියැට් (පුද්ගලික) සමාගම<br><br>2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (2024 ඔක්තෝබර් සිට මේ දක්වා)<br>පාලක මණ්ඩල සාමාජික - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (NILS)<br>(2025 ජනවාරි සිට මේ දක්වා)<br>(AASL, අපනයන සංවර්ධන මණ්ඩලය සහ NILS වෙත සපයනු ලබන සියලුම සේවාවන් සම්පූර්ණයෙන්ම ප්‍රෝ බෝනෝ පදනමක් මත වන අතර එබැවින් මෙම රජයේ ආයතනවලින් කිසිදු රැස්වීම් ගාස්තු/උප කමිටු ගාස්තු හෝ ප්‍රවාහන හෝ වෙනත් දීමනාවක් ලබා නොගනී)<br><br>3.අධ්‍යක්ෂක - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |

[ගරු බිමල් රත්නායක මහතා]

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් | දැරූ තනතුරු | වත්මන් තනතුර |
| --- | --- | --- | --- | --- | --- |
| 5. | එස් ප්‍රීමාල් ඒ ද සිල්වා මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක | 1.කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MLRHRM) කොළඹ විශ්ව විද්‍යාලය (2019)<br><br>2.ව්‍යාපාර පරිපාලන විධායක (EMBA) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (PIM-2021)<br><br>3.ජාතික පුහුණු හා සංවර්ධන ඩිප්ලෝමාව ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනය (SLITAD) | 1. උපායමාර්ග උපදේශක 2024 මැයි සිට සැප්තැම්බර් දක්වා E-Sil Route Ventures (Pvt) Limited<br><br>2. සාමාන්‍යාධිකාරී - ශ්‍රීලංකන් ගුවන් සේවය/ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය 2014 සැප්තැම්බර් - 2024 අප්‍රේල්<br><br>3. වගකියයුතු කළමනාකරු - ගුවන් යානා නඩත්තු සහ ඉංජිනේරු පුහුණු සංවිධානය/ 2014 සැප්තැම්බර් - 2024 අප්‍රේල් (මෙම තනතුර අනෙකුත් වගකීම්වලට සමගාමීව දරන ලදී)<br><br>4. හදිසි ප්‍රතිචාර අධ්‍යක්ෂ - ශ්‍රීලංකන් ගුවන් සේවය /2019 - 2024, (මෙම තනතුර අනෙකුත් වගකීම්වලට සමගාමීව දරන ලදී)<br><br>5. ගුවන් ගමන් සේවා පුහුණු ප්‍රමිති සහ මෙහෙයුම් කළමනාකරු - ශ්‍රීලංකන් ගුවන් සේවය 2011-2013<br><br>6. ආයතනික සමාජ වගකීම් ප්‍රධානියා - ශ්‍රීලංකන් ගුවන් සේවය 2011-2013 (මෙම තනතුර අනෙකුත් වගකීම්වලට සමගාමීව දරන ලදී)<br><br>7. කැබින් ආරක්ෂක කළමනාකරු - ශ්‍රීලංකන් ගුවන් සේවය 2006 - 2009<br><br>8. කැබින් කාර්ය මණ්ඩල සාමාජික - එයාර් ලංකා සහ ශ්‍රී ලංකන් ගුවන් සේවය 1988-2006 | අධ්‍යක්ෂක - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |
| 6. | කේ. එම්. පී.එන්. කරුණාරත්න මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, **කටුනායක** | 1.MBA - කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය [2006]<br><br>2.බී.එස්.සී. (ඉංජිනේරු) ගෞරව උපාධිය, දෙවන ඉහළ සාමාර්ථය - ඉලෙක්ට්‍රොනික | 1.වෙනස්කම් කළමනාකරණ ප්‍රධානී ( 201 ජූලි - 2019 පෙබරවාරි )<br><br>2.ව්‍යාපෘති කළමනාකරණ ප්‍රධානියා (මාර්තු 2017 - ජුනි 2018)<br><br>3.ව්‍යාපෘති මෙහෙයුම් අධ්‍යක්ෂ - ව්‍යාපාර නිරීක්ෂණ රේඛාව (අප්‍රේල් 2014 - මාර්තු 2017) | මිලේනියම් අයිටී එස් ඩබ්ලිව් (පුද්ගලික) සමාගම (ලන්ඩන් කොටස් හුවමාරු සමූහයේ කොටසක්) - ව්‍යාපාර මෙහෙයුම් ප්‍රධානියා (2019 පෙබරවාරි - මේ දක්වා)<br>අධ්‍යක්ෂක - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා<br>(ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් | දැරූ තනතුරු | වත්මන් තනතුර |
|---|---|---|---|---|---|
| | | | හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව - මොරටුව විශ්ව විද්‍යාලය [1999]<br><br>3.PMP, ව්‍යාපෘති කළමනාකරණ ආයතනය, ඇමරිකා එක්සත් ජනපදය (PMP # 1444048) 2011 අගෝස්තු 15 සිට | 4.ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජූලි 2012 - මාර්තු 2014)<br><br>5.Syniverse Technologies ඇමරිකා එක්සත් ජනපදය - වැඩසටහන් කළමනාකරු (ඔක්තෝබර් 2009 - ජූනි 2012)<br><br>6.Verisign Inc - ඇමරිකා එක්සත් ජනපදය වැඩසටහන් කළමනාකරු (නොවැම්බර් 2006 - ඔක්තෝබර් 2009)<br><br>7.ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය වැඩසටහන් කළමනාකරු - පුද්ගලික අංශ සංවර්ධනය (අප්‍රේල් 2005 - අප්‍රේල් 2006).<br><br>8.MilleniumIT SW (Pvt.) Ltd. නිෂ්පාදන කළමනාකරු (අප්‍රේල් 2003 - අප්‍රේල් 2005)<br><br>9.Millennium Information Technologies Ltd. කර්මාන්ත විශේෂඥ (පෙබරවාරි 2001 - මාර්තු 2003)<br><br>10.AIA Insurance Lanka PLC (කලින් ඊගල් රක්ෂණය) ඊ-වාණිජ්‍ය කළමනාකරු (අප්‍රේල් 2000 - ජනවාරි 2001) කළමනාකරණ අභ්‍යාසලාභී (අප්‍රේල් 1999 - මාර්තු 2000) | |
| 7. | වී වික්‍රමතුංග මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක | 1. LLB (නීතිවේදී උපාධිය)<br>2. කොළඹ විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය<br><br>3. ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය) | 1. අධ්‍යක්ෂක - ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව 2019 - 2025<br><br>2. අධ්‍යක්ෂක - ශ්‍රී ලංකා ධීවර සංස්ථාව 2019 | 1.වාණිජ ගුවන් නියමු (වත්මන්) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ FAA USA බලපත්‍ර 2014 සිට<br><br>2.ජ්‍යෙෂ්ඨ පරීක්ෂක (කාලගුණ විද්‍යාව) - සිවිල් ගුවන් සේවා අධිකාරිය (වත්මන්) - 2024 සිට<br><br>3. අධ්‍යක්ෂක - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා |

[ගරු බිමල් රත්නායක මහතා]

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් | දැරූ තනතුරු | වත්මන් තනතුර |
|---|---|---|---|---|---|
| | | | 4. මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය) | | (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |
| 8. | පී එම් කේ හෙට්ටිආරච්චි මහතා | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපල, කටුනායක. | 1.2012,කලා පශ්චාත් උපාධිය, ජාත්‍යන්තර සංවර්ධන ආර්ථික විද්‍යාව, ජපාන ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය.<br><br>2.2007, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, කොළඹ විශ්ව විද්‍යාලය.<br><br>3.2006, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යා ආයතනය, ටිබා, ජපානය.<br><br>4.B.Sc කළමනාකරණ උපාධිය (2වන ඉහළ සාමාර්ථය) 1998, කළමනාකරණය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.<br><br>**වෘත්තීය සුදුසුකම්:**<br><br>1.1996, බලපත්‍රලාභී විභාගය<br><br>2.ගණකාධිකාරී, වරලත් ගණකාධිකාරී ආයතනය<br><br>3. 2001, බැංකු විභාග, බැංකුකරණය, බැංකු අධ්‍යයන ආයතනය පිළිබඳ අතරමැදි සහතිකය. | 1.ලංකා ලේලන්ඩ් ලිමිටඩ්, 2015 සිට 2019 දක්වා.<br><br>2.ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, 2015 සිට 2019 දක්වා.<br><br>3.ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, 2018, මාස 2<br><br>4.ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්, 2018, මාස 2<br><br>5.ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම, 2018, මාස 2<br><br>6.පාරිභෝගික කටයුතු අධිකාරිය, 2020/01/20 සිට 2022/01/03 දක්වා.<br><br>7. ප්‍රධාන විධායක නිලධාරී (ක්‍රියාකාරී), ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) 2021.02.09 සිට 2022 ජුනි දක්වා.<br><br>8.SLINTEC, 2020/01/13 සිට 2022/01/03 දක්වා<br><br>9.HDFC බැංකුව, 2022 මාර්තු සිට 2024 නොවැම්බර් දක්වා<br><br>10.AASL 2025 ජනවාරි සිට මේ දක්වා<br>NITF 2025.01.06 සිට මේ දක්වා | අධ්‍යක්ෂ ජනරාල්, මූල්‍ය සංවර්ධන<br><br>අධ්‍යක්ෂක/ භාණ්ඩාගාර නියෝජිත - ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මෙතැන තව ප්‍රශ්න වගයක් තිබෙනවා. මේක ඔබතුමාගේ විෂය පථයට අයිති කාරණයක්, විශේෂයෙන්ම 2013 දී ඇති කරපු ප්‍රශ්නයක්. මම දැක්කා ඔබතුමා විශාල උනන්දුවක් දක්වනවා, දුම්රියට අදාළව තිබෙන ප්‍රශ්න ටික විසඳන්න. විශේෂයෙන්ම දුරකථන ඇමතුමක් දීලා කියන්න, පාර දිගේ අලි ඉන්නවා, අවධානයෙන් ඉන්න කියන කාරණා එහෙම.

මේ අනාරක්ෂිත දුම්රිය ගේට්ටු මුරකරුවන් 2,100ක් විතර ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, කරුණාකර ඔබතුමා,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇමතිතුමාගේ කැමැත්ත අහලා තමයි මේ ප්‍රශ්නය අහන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර මතක තබා ගන්න, මේ සභාව ගෙනයන්න ඕනෑ විධියක් තිබෙන බව. අතුරු ප්‍රශ්නයක් අහන්න ඕනෑ අහන ලද ප්‍රශ්නයට අදාළව විතරයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එතුමා කැමැති ද කියලා අහමු. මෙහෙම කරන්න එපා. මොකක්ද මේ කරන්නේ? මේ සභාව මෙහෙම පාලනය කරන්න එපා. මම ඉඳිආප්ප ගැන ප්‍රශ්න ඇහුවේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මම ඉස්සෙල්ලාත් මේ කාරණය මතු කළා. ස්ථාවර නියෝග 34 (2)හි සඳහන් වෙනවා, "ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් නොකර ගත යුත්තේ ය" කියලා. *[බාධා කිරීම්]* "ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් කර නොගත යුත්තේ ය." ඔබතුමා මේගොල්ලන්ට ඒක කියාදෙන්න. ඒක කියා දෙන්න. *[බාධා කිරීම්]* ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් කර නොගත යුත්තේ ය. ඒක තේරුම් ගන්න බැරි නම් කරන්න දෙයක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ වෙලාව. Sir, I am on my feet.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම අහන්නේ ඇමතිතුමා කැමතිද, නැද්ද කියලා විතරයි. ඇමතිතුමා කැමති නම් උත්තර දෙන්න කියන්න. විවාදයකට භාජන කරන්න මම ප්‍රශ්න ඇහුවේ නැහැ. මම විවාදයකට භාජන කරන්න ප්‍රශ්න ඇහුවේ නැහැ. ඇමතිතුමා කැමති නම් උත්තර දෙන්න පුළුවන්. ඇමතිතුමා කැමති නැත්නම් මම නතර කරන්නම්.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා, මේක හොඳට අහගන්න. ස්ථාවර නියෝග,- *[බාධා කිරීම්]* ඔබතුමන්ලා,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාට කථා කරන්න ඉඩ දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉන්න, මම කථා කරනකම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට,- *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, එකක් මම,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා මේ කාරණය තේරුම් ගන්න. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමන්ලා වාචික ප්‍රශ්නයක් අහද්දී අදාළ අමාත්‍යවරයාට ඔබතුමන්ලා ප්‍රශ්න යොමු කරනවා. යොමු කළාම,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මේක අර්ථනිරූපණය කරන්න එපා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි,

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අලුත් ස්ථාවර නියෝග කෙටුම්පත් කරපු කමිටුවේ සාමාජිකයෙක්, මම. මට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. මම හැම වෙලාවේම මැදිහත් නොවෙන්නේ අනවශ්‍ය ප්‍රශ්න අවශ්‍ය නැති නිසා. නමුත් එක දෙයක් තිබෙනවා. මේ ප්‍රශ්න අහන්නේ රජයේ කටයුතු පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන්ටත් පැහැදිලි කිරීම් කරගන්නයි. සම්ප්‍රදාය මොකක්ද? සම්ප්‍රදාය අනුව, විෂය භාර ඇමතිවරයාගෙන් යම් ප්‍රශ්නයක් අහනවා. ඒක එම ප්‍රශ්නයට සෘජුව අදාළ වෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඇමතිවරයා කැමති නම් උත්තර දෙනවා. ඇමතිතුමා බැහැ කියනවා නම්, එතැනින් කථාව ඉවරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම කමිටුවේ සාමාජිකයකු වෙලා හිටියා වෙන්න පුළුවන්. කරුණාකරලා මේ කාරණය මතක තියා ගන්න. මේක ස්ථාවර නියෝග 32 (1)හි විග්‍රහ කරනවා. ඔබතුමන්ලා ප්‍රශ්නයක් දෙනවා, අදාළ ඇමතිවරයාට සූදානම් වෙන්න. ඒ අදාළ ඇමතිවරයා ඒ සඳහා සූදානම් වෙන්න ඕනෑ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
උසාවියේ නඩුකාර හාමුදුරුවෝවත් ඔහොම කරන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ ප්‍රශ්නය පැහැදිලි කර ගැනීම සඳහා විතරක් අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
උත්තර දෙන්න ඇමතිතුමා කැමැතිද කියලා කියන්නකෝ. අපට එච්චරයි අවශ්‍ය. ගරු කථානායකතුමනි, ඇමතිතුමා කැමති ද කියලා කියන්න. ඇමතිතුමාට ඉඩ දෙන්නකෝ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මට තේරෙන්නේ නැහැ, ඇයි ඔබතුමන්ලාට මේ කරුණ තේරෙන්නේ නැත්තේ කියලා. විෂය පථය කිව්වාම, -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමන්ලා දැන ගන්නත් ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේ පාර්ලිමේන්තුවේ මෙහෙන් කෑල්ලක් අහලා එහෙන් අහනවාද? මගෙන් අතුරු ප්‍රශ්නයක් ඇහුවා. *[බාධා කිරීම්]* හරියට හරි. *[බාධා කිරීම්]* ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නය ඇහුවේ විෂයට අදාළව. විෂයට අදාළව අහන්න. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාට ඒ විධියට ප්‍රශ්න අහන්න ඕනෑ නම් වෙනත් ප්‍රශ්නයක් විධියට අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමන්ලාත් විපක්ෂයේ ඉඳගෙන ප්‍රශ්න ඇහුවා නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපි ඇහුවේ විෂයට අදාළව. ඔබතුමන්ලාත් විෂයට අදාළව අහන්නකෝ. විෂයට අදාළව අහන ඕනෑම ප්‍රශ්නයකට උත්තර දෙන්න අපේ ඇමතිවරු සූදානම්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට සාධාරණ රූපවාහිනී කාලයක් ලබා දෙන්න ඕනෑ නිසායි මම වාඩි වෙලා හිටියේ. මෙතුමන්ලාට සාධාරණ රූපවාහිනී කාලයක් ලබා දෙන්න ඕනෑ නේ, ගරු කථානායකතුමනි. ඒ අවශ්‍යතාව ඉෂ්ට වුණා කියලා මම හිතනවා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ඊයේ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන අවස්ථාවේදී වනඅලි දුම්රියේ ගැටී මිය යාම පිළිබඳව මමත්, මගේ නියෝජ්‍ය ඇමතිතුමාත් සැලකිය යුතු විස්තරයක් කළා. ඒකෙදි සෑහෙන කරුණු ප්‍රමාණයක් පැහැදිලි කරලා තිබෙනවා. එය ප්‍රමාණවත් කියලා මම හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තරහා ගන්නේ නැත්නම් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. *[බාධා කිරීමක්]* උදේ පාන්දර මූලග්ගින්න හැදිලා වාගේ කෑ ගහන්න එපා. එතකොට අපිත් වෙන ප්‍රශ්නයකට යනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැවතත් මම ඔබතුමාට යෝජනා කරනවා, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආතතිය වැඩි වෙනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* මගේ නොවෙයි, එතුමාගේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන් කන්ටේනර් 323ක් නිදහස් කරපු එක ගැන අර්චුනා මන්ත්‍රීතුමාත් මේ සභාවේදී කථා කළා. එතුමා කිව්වා, ප්‍රභාකරන්ගේ අවි ආයුධ ආවා කියලා. ඒවා නිදහස් කරපු කමිටුවේ සභාපතිවරයා අපේ බිමල් රත්නායක මැතිතුමා. ගරු කථානායකතුමනි, මම මේ කාරණය කියන්නේ හොඳට. ලංකාවේ වරාය කියන්නේ commercial operations සිදුවන ආයතනයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්නකෝ.

Sri Lanka Customs එකේ එවැනි තත්ත්වයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි සමහර වෙලාවට දකිනවා, ලංකාවට චොක්ලට් අරගෙන එනවා. ඒ චොක්ලට්වල නම වෙනස් කරලා ලංකාවේ විකුණනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේක අහන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, නැවත මේ අහන්නේ ඒ ප්‍රශ්නයට අදාළ කාරණයක් නොවෙයි. පැහැදිලිව, අදාළ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කරුණාකර මට අවස්ථාව දෙන්න. මම කෙටියෙන් අහන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කෙටියෙන් නොවෙයි, ප්‍රශ්නයට අදාළව අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම නම් ඔබතුමා මට අතුරු ප්‍රශ්නය ලියලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවා නේ. ඒ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මට ලියලා දෙන්න. මම ලබන සතියේ ප්‍රශ්නය යොමු කරලා අතුරු ප්‍රශ්න දෙකත් ලියලා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ දසවන පාර්ලිමේන්තුව. මේ අටවන පාර්ලිමේන්තුවවත්, නවවන පාර්ලිමේන්තුවවත් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඒක මතක තියාගන්න. මේ දසවන පාර්ලිමේන්තුව. අතුරු ප්‍රශ්න දෙක අහන්න පුළුවන් ප්‍රධාන ප්‍රශ්නයට අදාළව විතරයි. ඒක මතක තියා ගන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කොහේද එහෙම තියෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග කියවන්න.

ගරු සභානායකතුමා. *[බාධා කිරීම්]* මට තේරෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමන්ලාට සිංහල තේරෙනවාද කියලා. *[බාධා කිරීම්]* කියවන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමා ප්‍රශ්නය අහන්න කියලා කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම කියන්නේ කරුණාකර මේ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ටික ඉදිරිපත් කරන්න කියලායි. එතකොට ආණ්ඩුවට මේ තිබෙන චෝදනාවෙන් ගැලවෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, අපි මේ තොරතුරු ඉල්ලුවාම වෙනත් තොරතුරු තමයි අපට දීලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙච්චරයි. මේවා ගෙනාපු customs house agentගේ නම අපට දෙන්න; ආපු port එක ගැන තොරතුරු දෙන්න. නැත්නම් අපට මේ ප්‍රශ්නය විසඳාගන්න ලැබෙන්නේ නැහැ.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, හැම දාම මේ පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය මතු වෙනවා. ස්ථාවර නියෝග 31න් පටන් අරගෙන 37 වෙනකල්, වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අහන ප්‍රශ්නවලදී විග්‍රහ කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 34(1) මම දැන් පැහැදිලි කරන්නම්. ගරු කථානායකතුමාට මම යෝජනා කරනවා, විපක්ෂයේ මේ කණ්ඩායමට ස්ථාවර නියෝග පිළිබඳ වැඩමුළුවක් පවත්වන්න කියලා. මම දැන් ස්ථාවර නියෝග 34 (1) පැහැදිලි කරනවා. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 34(1) හි, - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට අහන්න පුළුවන් වන්නේ මේ ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් විතරමයි. එහෙම නැති වුණොත් මම ඔබතුමාව නතර කරනවා. ඔබතුමා මේ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නයක් අහනවාද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ වෙන දෙයක් නොවෙයි. ගරු ඇමතිතුමා කැමැතිද මේ දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්න? මම මේක අහන්නේ,-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, අද දිනය වෙන් වෙලා තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා වෙනුවෙන්. අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීතුමන්ලා හතරදෙනෙකුගේ පවුල්වල අය අද දින මේ ගැලරියට පැමිණ සිටිනවා. අඩුම තරමින් ඒ පවුල්වල අයට ගෞරවාන්විත වන විධියට මෙතැන හැසිරෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීම්]* මෙතැන සංදර්ශන පවත්වන්න මේ වෙලාව ගත කරන්න එපා. ඒකට අපි වෙන දවසක් යොදා ගනිමු. අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීතුමන්ලාගේ පවුල්වල අය පැමිණ සිටින අද දිනයේ - සිකුරාදා දවසේ - මේ වෙලාවේ අඩු තරමින් ඒ පවුල්වල අයට ගෞරවයක් වන විධියට හැසිරෙන්න කියා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මේ ගැලරියේ පාසල් දරුවන් සිටිනවා. ඒ දරුවන් කන් දෙක වසාගෙන සිටිනවා මම දැක්කා. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ගෞරවය වැනසෙන විධියට දේශපාලනය කරන්න එපා කියා තමයි ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටින්නේ. වෙලාව අරගෙන රටේ වැදගත් ප්‍රශ්න අහන්න. ඒවාට පිළිතුරු දෙන්න අපි සියලු දෙනා බැඳී සිටිනවා. නමුත්, අද දිනයේ - සිකුරාදා - මේ පවුල්වල අය පැමිණ සිටින්නේ ඔවුන්ගේ ඥාතීන් වෙනුවෙන්.

ශෝක ප්‍රකාශ යෝජනා වෙනුවෙන් වෙන් කර තිබෙන කාලය මේ විධියට නාස්ති කරන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි කිසිම වෙලාවක කාලය නාස්ති කළේ නැහැ. දැන් පෙරවරු 10.30යි. පෙරවරු 11.00 වනතුරු අපිට ප්‍රශ්න අහන්න පුළුවන්. අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීතුමන්ලාගේ පවුල්වල අයට තිබෙන ගෞරවය අප තුළ ඒ විධියටම තිබෙනවා. අපි එතුමන්ලා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව ගරු ඇමතිතුමාගෙන් ඇහුවේ මේකයි. මේ කන්ටේනර් 323 සම්බන්ධයෙන් විශාල අර්බුදයක් තිබෙනවා. ඒවායේ ප්‍රභාකරන්ගේ අවි ආයුධ ගෙන ආවා කියලා රටටම කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුල් ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි මේ අහන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කලින් මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව ඇහුවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා CID එකට කැඳවලා, ඒ පිළිබඳව උත්තර දෙන්න තිබෙනවා. එතුමා තමයි මට වඩා ඒ ගැන දන්නේ. ඒ නිසා එම පරීක්ෂණවලින් ඔප්පු කර ගන්න, ඔය කාරණය. ඒ පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව දැන ගන්න පුළුවන්කම ලැබෙයි. ඒ නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිහිල්ලා සාක්ෂි දුන්නා නම් හරි. *[බාධා කිරීම්]* මෙතුමා තමයි ඒවා දන්නවා කියලා කිව්වේ.

## රජය සතු සීනි සමාගම්: විස්තර
### அரச சீனிக் கம்பனிகள்: விபரம்
### STATE-OWNED SUGAR COMPANIES: DETAILS

191/2024

5. **ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ රජය සතු සීනි සමාගම් සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවායේ නම් කවරේද;
(iii) 2022 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සීනි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) රජය සතු සීනි කර්මාන්තශාලාවල මේ වනවිට විකුණා ගත නොහැකිව එක්රැස් වී ඇති සීනි ප්‍රමාණය සහ එතනෝල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;
(v) ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?
(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை அரசாங்கத்துக்குச் சொந்தமான சீனிக் கம்பனிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;
(ii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;
(iii) 2022ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட சீனியின் அளவு மற்றும் அதற்காகச் செலவிடப்பட்ட மொத்தத் தொகை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவென்பதையும்;
(iv) அரசாங்கத்துக்குச் சொந்தமான சீனிக் கம்பனிகளில் தற்போது விற்பனை செய்ய முடியாத நிலையில் தேங்கிக் கிடக்கும் சீனி மற்றும் எதனோலின் அளவு வெவ்வேறாக எவ்வளவென்பதையும்;
(v) இலங்கையில் சீனி உற்பத்தியை அதிகரிப்பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?
(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -
(i) the number of State-owned sugar companies in Sri Lanka;
(ii) the names of the factories referred to above;

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(iii) the quantity of sugar imported to Sri Lanka from the year 2022 up to now and the amount of money spent on the imports each year, separately;

(iv) quantities of unsold sugar and ethanol found accumulated in the State-owned sugar factories, separately; and

(v) measures that will be taken to increase the sugar production in Sri Lanka?

(b) If not, why?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 4කි.

(ii) 1. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
2. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
3. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම (ක්‍රියාත්මක අදියරයේ නොපවතී)
4. කන්තලේ සීනි සමාගම (ක්‍රියාත්මක අදියරයේ නොපවතී)

(iii) ඇමුණුමෙහි දක්වා ඇත.

මෙහි වැදගත්ම දේ තමයි, අපේ රටේ ජනතාව කොච්චර සීනි ආනයනය කරලා පරිභෝජනය කරනවාද කියන එක. ඒ පිළිබඳව දැන ගන්න මම කියන්නම්. 2024 අවුරුද්දේ අපි සීනි කිලෝග්‍රෑම් කෝටි 56.4ක් ආනයනය කරලා තිබෙනවා. ඒ කියන්නේ, සීනි කිලෝග්‍රෑම් මිලියන 564ක්. ඒකට අපි වියදම් කරලා තිබෙනවා, රුපියල් බිලියන 112ක්. අපිට දැනට තිබෙන වාර්තා අනුව, 2025 ජනවාරි හා පෙබරවාරි මාස දෙකේ විතරක් සීනි කිලෝග්‍රෑම් කෝටි 14ක් -මිලියන 140ක්- අපි ආනයනය කර තිබෙනවා. ඒකට වියදම් කරලා තිබෙනවා, රුපියල් බිලියන 24ක් -මිලියන 2,4757ක්. 2022 සිට 2025 ජනවාරි හා පෙබරවාරි දක්වා තොරතුරුත් ඇමුණුමෙහි දක්වා තිබෙනවා. ඇමුණුම පහතින් දැක්වේ.

(iv)

| ආයතනය | 2025.03.03 දිනට | |
|---|---|---|
| | සීනි ප්‍රමාණය | එතනෝල් ප්‍රමාණය |
| ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 6,000MT | 2,000,000l |
| සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම | 17,696 MT | 350,000l |
| එකතුව | 23,696 MT | 2,350,000l |

(v) 1. අස්වැන්න වැඩි කිරීම සඳහා නව ප්‍රදේශවල වගාව පුළුල් කිරීම.

2. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම යටතේ හෙක්ටෙයාර 1,000ක හුදෙකලා උක් බීජ තවානක් ස්ථාපිත කිරීම.

3. නව වගා ක්‍රම හඳුන්වා දීම. (උදා: Ladder, Ring-pit)

4. පහත සඳහන් ක්‍රියාමාර්ග මඟින් අස්වැන්න වැඩි කිරීම.

- ඒකාබද්ධ වල් පැළෑටි කළමනාකරණය, පළිබෝධ සහ රෝග පාලනය, ඒකාබද්ධ පාංශු පෝෂක කළමනාකරණය, වඩාත් සුදුසු ප්‍රභේද තෝරා ගැනීම, pH අගයන් සිතියම්ගත කිරීම, නිවැරදි වගා ක්‍රම භාවිතය, පොහොර අපතේ යෑම අඩු කිරීම, නව වාරිමාර්ග ක්‍රම හඳුන්වා දීම - drip irrigation, ජෛව පොහොර වැඩිදියුණු කිරීම - උදා: Golden wash, Liquid fertilizer, Biochar, Black gold, Growth promoter, Soil conditioner, Vermiwash (*Eisenia fetida),* නවෝත්පාදන හඳුන්වා දීම - යාන්ත්‍රික සිටුවීම, සයිලේජ් සකස් කිරීම, compost applicator, පාංශු කැනීම් යන්ත්‍රය, නිරවද්‍ය කෘෂි කර්මාන්තය

5. කර්මාන්තශාලා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

- දිනකට උක් ටොන් 2,500කින් ධාරිතාව වැඩි කිරීම
- සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 8 දක්වා වැඩි කිරීම

**සීනි ආනයන සංඛ්‍යාලේඛන (2022 සිට 2025 පෙබරවාරි දක්වා)**

| විස්තරය | HS CODE | වර්ෂය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2022 | | 2023 | | 2024 | | 2025 ජනවාරි හා පෙබරවාරි | |
| | | ප්‍රමාණය Kg | වටිනාකම Rs | ප්‍රමාණය Kg | වටිනාකම Rs | ප්‍රමාණය Kg | වටිනාකම Rs | ප්‍රමාණය Kg | වටිනාකම Rs |
| ශුද්ධ කළ සීනි (උක්) | 17019910 | 249,112,885 | 42,882,478,994 | 296,367,389 | 69,735,688,535 | 444,996,852 | 88,900,256,475 | 96,411,782 | 17,187,046,020 |
| | 17019920 | 186,206,094 | 32,962,022,560 | 337,615,208 | 66,215,638,379 | 48,409,004 | 9,382,337,801 | 20,166,000 | 3,303,330,141 |
| ශුද්ධ කළ සීනි (බීට්) | 17019930 | 1,127 | 191,593 | 7,606,275 | 1,934,502,758 | 72,421,800 | 13,948,552,228 | 24,487,050 | 4,267,762,994 |

සටහන: ආනයනය කරන සීනි තොග ඇතුළත් වේ. විශේෂ අරමුණු සඳහා ආනයනය කරන සීනි ඇතුළත් නොවේ.

- වසරකට සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 54,000 දක්වා වැඩි කිරීම

6. සීනි කර්මාන්තයේ තිරසරභාවය සඳහා විකුණුම් වැඩි කිරීම.
7. සීනි කර්මාන්තශාලා අලුත්වැඩියා කර නව උපාංග ලබා දීමට කටයුතු කිරීම.
8. ක්ෂේත්‍ර නිලධාරින් විසින් ගොවි මහතුන්හට උක් වගාවේ තාක්ෂණික දැනුම ලබා දෙන අතර, එමඟින් ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීම.

(ආ) අදාළ නොවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, සීනි ගැන පසුගිය කාලයේ බරපතළ විධියට කථා කළා. දැන් මෙතුමා කිව්වා, සීනි මෙට්‍රික් ටොන් 23,000ක් තිබෙනවා කියලා. අපට වාර්තා වෙලා තිබෙන විධියට දැනටමත් මේ සීනි මෙට්‍රික් ටොන් 23,000න් මෙට්‍රික් ටොන් 2,000ක් කල් ඉකුත් වෙලා.

ඉතිරි වෙලා තිබෙන සීනි මෙට්‍රික් ටොන් ප්‍රමාණයටත් දැන් අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් සීනි පාවිච්චි කරන්න පුළුවන් වන්නේ, ගබඩා කරලා තියන්න පුළුවන් වන්නේ අවුරුදු දෙකකට ආසන්න කාලයක් පමණයි. මේකට ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ මෙන්න මේ කාරණයයි. ඔබතුමන්ලා මේ ආයතනය ගත්තාට පස්සේ මේකේ කලින් හිටපු buyersලා, එහෙම නැත්නම් මේකේ බෙදා හැරීම් ජාලය වෙනස් කරලා අලුතෙන් distributorsලා දාලා යම් වැඩ පිළිවෙළකට යන්න ලැහැස්ති වුණා. ඒ නිසා හෝ වෙනත් හේතුවක් නිසා දැනට සීනි අළෙවියත්, මිලත් අඩු වෙලා තිබෙනවා. මේ තුළින් ආයතනය පාඩු ලබමින් ඉන්නවා. ඒ වාගේම molasses අළෙවියත් අඩු වෙලා තිබෙනවා, ඒවායේ මිලත් අඩු වෙලා තිබෙනවා. ඒ හරහා ආයතනය පාඩු ලබමින් තිබෙනවා. මට තිබෙන ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, එක පැත්තකින් ඔබතුමා සීනි නිෂ්පාදනය වැඩි කරනවා කියන ඉලක්කයකින් ඉන්නවා. අනෙක් පැත්තෙන්, සීනි ආනයනය රට තුළ regulate වෙලාත් නැහැ. Molasses වුවත් අපේ රටට අවශ්‍ය ප්‍රමාණය -පාවිච්චි කරන්න පුළුවන් ප්‍රමාණය- තියාගෙන තමයි අපි ආනයනය කරන්න ඕනෑ. ඒ වාගේම සුදු සීනි ආනයනයේදීත් අපේ රටේ නිෂ්පාදනය ගැන සලකා බලා තමයි අපි ආනයනය කරන්න ඕනෑ. ඒ අනුව අපි ආනයනය කරන්න ඕනෑ අපේ නිෂ්පාදන වෙළෙඳ පොළට දැමීමේ ඉඩකඩ තියාගෙනයි. මේක හරියට regulate කරපු නැති නිසා අද වන විට සීනි තොගවල අතිරික්තයක් තිබෙනවා, ඔබතුමන්ලාගේ ගබඩාවල. ඒක විකුණා ගන්න ජාලයක් නැහැ. ඔබතුමන්ලා ගෙනා ඒ අලුත් system එක අඩපණ වෙලා තිබෙනවා, අඩාළ වෙලා තිබෙනවා. දැනටමත් තිබෙන තොරතුරු අනුව සීනි මෙට්‍රික් ටොන් 2,000ක පමණ ප්‍රමාණයක් කල් ඉකුත් වෙලා තිබෙනවා. මේ තිබෙන සීනි ප්‍රමාණය කඩිනමින් අළෙවි කරන්න රජය හරහා කරනු ලබන මැදිහත්වීම මොකක්ද? මේ අර්බුදය ඔබතුමා හඳුනාගෙන තිබෙනවාද? මේ හරහා සිදු වෙලා තිබෙන අලාභයට අද ගොවියාට වන්දි ගෙවන්න, නියමිත මිලක් ගෙවන්න, ඔවුන්ගේ සුබ සාධනයට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මුදල් නැති වෙලා තිබෙනවා. ඇත්තෙන්ම කියනවා නම්, පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලාවල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. මේ අර්බුදය විසඳා ගන්න ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ විපක්ෂ නායකතුමාම ඔය ප්‍රශ්න ටික පසුගිය අඟහරුවාදා පාර්ලිමේන්තුවේ දී ඇහුවා. ඒවාට මම සවිස්තරාත්මකව උත්තර දුන්නා. මම ඒ ගැන නැවත වතාවක් ඔබතුමාට කියන්නම්. ඔබතුමා අහපු ප්‍රශ්නයේ තිබෙන වැදගත්ම කොටසට මම පිළිතුරු දෙන්නම්. අපට මෙට්‍රික් ටොන් 2,000ක හෝ 3,000ක කල් ඉකුත් වෙච්ච සීනි තොගයක් නැහැ. එහෙම කල් ඉකුත් වෙච්ච සීනි තිබෙනවා නම් තිබෙන්නේ අපට මුදල් ගෙවා සීනි මිලදී ගත් අය - අපේ buyersලා - එම තොග නිදහස් කර ගන්නේ නැතිව අපේ ගබඩාවලම තබා තිබෙන ඒවා. එහෙම තොග ප්‍රමාණයක් තිබෙන්න පුළුවන්. නමුත් ඒවා අපේ තොග නොවෙයි. ඒවා ඔවුන්ගේ සීනි තොග. අපේ ගබඩාවල ඔවුන් සීනි තොග තියලා තිබෙනවා. හැබැයි, ඔවුන් ඒවාට මුදල් ගෙවලා තිබෙන්නේ. ඔවුන් නිදහස් කරගෙන නොගිහිපු සීනි තොග තිබෙන්න පුළුවන්. හැබැයි මේ අස්වැන්න, මේ කන්නයේ අපි ගත්ත අලුත් නිෂ්පාදන. ඒවා කොහෙත්ම කල් ඉකුත් වෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් සීනි අවුරුදු දෙකක්, අවුරුදු දෙකහමාරක් විතර තියාගන්න පුළුවන්. වෙන භාණ්ඩ වාගේ සීනි කල් ඉකුත් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ තිබෙන්නේ අපේ පරණ ගැනුම්කරුවන් විසින් ගත් සීනි තොග. ඔවුන් නිදහස් කරලා ගෙනිච්චේ නැති සීනි තොග තමයි ඒ තිබෙන්නේ. ඒකට අපට ප්‍රශ්නයක් නැහැ, අපට මුදල් ගෙවලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ඔබතුමාගේ ප්‍රශ්නයට දෙන්න තිබෙන උත්තරයේ වැදගත්ම කොටස.

අනෙක් කාරණය සම්බන්ධයෙන් ගත්තොත්, අපි දැන් වෙළෙඳ පොළ සැලැස්මක් හදලා තිබෙනවා. අද සවසත් අපේ සියලුම ගැනුම්කරුවන් අපි හමු වෙනවා. අපි මේ පාර්ලිමේන්තුවටත් ඉතා පැහැදිලිව කිව්වා, අපි 200 plus VATවලට තමයි දෙන්නේ කියලා. ඊට වඩා අවමයි, අපේ මිල මට්ටම. පසුගිය කාලයේ මිල අඩුවීමක් සිද්ධ වුණා. ඒකට හේතු දෙකක් තිබෙනවා. එකක්, සුදු සීනි ආනයනය. ඒක දැන් මම කිව්වා නේ. රුපියල් බිලියන ගණනක් වියදම් කරලා මේ ආකාරයට ටොන් මිලියන ගණනක් ගෙනැල්ලා තිබෙන්නේ සුදු සීනි. ඒ වාගේම සුදු සීනි අස්සේ දාලා දුඹුරු සීනි ගෙන එන වැඩ පිළිවෙළකුත් තිබෙනවා. එක වෙලාවක Sri Lanka Customs එකේදී එවැනි සිද්ධියක් අහුවුණා. අපේ උක් පර්යේෂණ ආයතනයෙන් ගිහිල්ලා Sri Lanka Customs එකට කිව්වා, මේ ගෙනැල්ලා තිබෙන්නේ සුදු සීනි නොවෙයි, දුඹුරු සීනි කියලා. හැබැයි, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ගිහිල්ලා බලලා කිව්වා, නැහැ, මේවා සුදු සීනි හැටියට විකුණන්න කියලා. ඒ කාලයේ එවැනි දෙයක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, දුඹුරු සීනි ගේනවා, සුදු සීනි හැටියට විකුණනවා. දැන් එහෙම බැහැ. අපේ වෙළෙඳ ඇමතිතුමා එක්කත් මම දැන් කිව්වා, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ගිහිල්ලා මේවා check කරන්න ඕනෑ, උක් පර්යේෂණ ආයතනයේ සහතිකයත් එක්ක කියලා. මීට පස්සේ කරන්නේ එහෙමයි.

ඊළඟට මම ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා එක්කත් සාකච්ඡාවක් කළා. අපි දැන් එවැනි සියලුම දේවල් අල්ලනවා. මීට පස්සේ සුදු සීනි අස්සේ දුඹුරු සීනි ගේන්නත් බැහැ. හාල් මිටි අස්සේ සීනි ගේන්නත් බැහැ. ඒවා ගෙනාවොත් අපි පෞද්ගලිකවම ගිහිල්ලා අල්ලනවා. ඒක නිසා මීට පස්සේ ඒවා කරන්න බැහැ.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එතනෝල් සම්බන්ධවත් දැන් අපි තීරණයක් අරගෙන තිබෙනවා. එතනෝල් නිෂ්පාදනය කරන අපේ වැවිලි සමාගම් කිහිපයක් තිබෙනවා. ඇතිමලේ, ගල්ඔය, පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලාවල තමයි එතනෝල් හදන්නේ. අපි එතනෝල් ලීටරයක් දෙන අවම මිල රුපියල් 800යි. අපි ඒ සම්බන්ධයෙන් තීරණයක් අරන් තිබෙනවා. ඊට වඩා අඩුවට දෙන්නේ නැහැ. Distilleries company හැම එකකටම අපි කියලා තිබෙනවා, ඔයගොල්ලන් එතනෝල් ගන්නවා නම් ලීටරයක් රුපියල් 800ට ගන්න කියලා. ආනයනය කරන්න දෙන්නේත් නැහැ. එච්චරයි අපේ තීරණය. ඒ නිසා ගොවීන්ට ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. දැනටත් අපි උක් ටොන් එකක් වෙනුවෙන් ගොවීන්ට ගෙවන රුපියල් 10,000ක මුදල කිසිම විධියකින් අඩු කරලා නැහැ. සේවකයන්ට ගෙවන පඩිය අඩු කරලාත් නැහැ. සේවකයන්ට ගෙවන අනෙකුත් දීමනා අඩු කරලාත් නැහැ. ඒක නිසා මම ආයෙත් කියනවා, මෙතැන ප්‍රශ්නයක් නැති බව.

සීනිවලට ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. අපි වෙළෙඳ පොළේ සීනි හදන්නේ සියයට 8යි. හැබැයි, මම ඊයේත් ගිහිල්ලා බැලුවා කන්තලේ සීනි කර්මාන්තශාලාව. 1993දී ඒ ෆැක්ටරිය වැඩ කර කර ඉන්නකොට වසා දමා තිබෙනවා. ප්‍රේමදාස මහත්තයාගේ ලොකු ප්‍රේමදාස මහත්තයා තමයි වැඩ කර කර ඉන්න ගමන් ඒ ෆැක්ටරිය වැහුවේ. එහෙම වහලා සුමනසේකර කියලා කෙනෙකුට ඒක විකිණුවා. ඒ කෙනා වාහන ටිකත් අරන් ගියා. අද ඒ වාහනත් යකඩ බවට පත්වෙලා තිබෙන්නේ. ෆැක්ටරියේ තිබෙන ඔක්කෝම දේවල් වැඩ කර කර සිටියදී නතර කළා. ඒ වාගේ තීරණ අපි ගන්නේ නැහැ. එහෙම තීරණ ගත්තොත් ගල්ඔයට, පැල්වත්තට, සෙවනගලටත් වෙන්නේ ප්‍රේමදාස අප්පොච්චි කරපු වැඩේම තමයි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ කැමැත්ත ඇතිව මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අපේ ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාට ඇසීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමා අද පැවසුවා, එතනෝල් ලීටරයක මිල රුපියල් 800කට වැඩි කරනවා කියලා. මේක මේ වෙනතුරු පැවැති ගණන රුපියල් 550යි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රුපියල් 475යි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
රුපියල් 475යි. ඉතින් එතනෝල් ලීටරයක මිල මෙච්චර ප්‍රමාණයකින් වැඩි කළාම අතුරු ප්‍රශ්න මතු වෙනවා. විශේෂයෙන්ම ඔබතුමා මේක කරන්නේ රජයේ සීනි සමාගම්වල පාඩුව මකා ගන්නයි. නමුත් මේ වාගේ දෙයක් කරන්න ගියාම, අතුරු ප්‍රශ්න කිහිපයක් මතු වෙනවා. විශේෂයෙන්ම එතනෝල්වල මිල මෙහෙම වැඩි කළාම වෙළෙඳ පොළේ මත්පැන්වල මිලත් වැඩි වෙනවා. එතකොට අනිවාර්යයෙන්ම ඊට සාපේක්ෂව කසිප්පු නිෂ්පාදනයත් වැඩි වෙනවා. කසිප්පු නිෂ්පාදනය වැඩි වුණාම රජයට ලැබිය යුතු සුරාබදු ආදායම අඩු වෙනවා. එතකොට අපේ ආදායම් ඉලක්ක අපට සපුරා ගන්න බැරි වෙනවා. ළඟදී Public Finance Committee එකේදී සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් මම මේ ප්‍රශ්නය ඇහුවා. ඉතින් ඔබතුමා මේ අවදානම් තත්ත්වය මතක තියාගෙන තමයි මේක කරන්න ඕනෑ. එක්කෝ මුදල් අමාත්‍යාංශය එක්ක මේ ගැන කථා කරලා, මේ ඉලක්ක සපුරා ගැනීමට තිබෙන ප්‍රශ්න පිළිබඳව හරියට අවබෝධ කරගෙන මේ කටයුත්ත කරන්න. අනික් ප්‍රශ්න වහ ගන්නට එකපාරම මේ විධියට කටයුතු කළාම ඒ තුළින් තවත් ප්‍රශ්නයක් ඇති වෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණය ඉතාම වැදගත්. මම ඔබතුමාට ගොඩක් ස්තුතිවන්ත වෙනවා, ඒ කාරණය මතු කරපු එක ගැන.

හැබැයි, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. එතනෝල් ලීටරය රුපියල් 1,500ට, රුපියල් 1,700ට තිබෙනකොටත් අරක්කු බෝතලයේ මිල වෙනස් වුණේ නැහැ. අරක්කු කොම්පැනි විසින් රුපියල් 1,500ට එතනෝල් ලීටරය තිබෙනකොටත් අරක්කු බෝතලය විකිණුවා, රුපියල් 3,500ට, රුපියල් 4,000ට. එතනෝල් ලීටරය රුපියල් 475ට අඩු කරලා තිබෙනකොටත් අරක්කු බෝතලය ඒ ගණනමයි. එතකොට මොකක්ද ප්‍රශ්නය? රුපියල් 475ට එතනෝල් ලීටරයක් ගත්තාම, එතනෝල් ලීටරයකින් අරක්කු බෝතල් තුනක් හදන්න පුළුවන්. ඔබතුමා විශ්වාස කරන්න, 90-proof spirit එකෙන් හදන්න පුළුවන් අරක්කු බෝතල් තුනක්, සියයට 40ට, සියයට 35ට අඩු කරනකොට. එතකොට එතනෝල් ලීටරය රුපියල් 475ට අරගෙන අරක්කු බෝතල් තුනක් හදන්න පුළුවන් නම්, අරක්කු කොච්චර අඩු මිලකට දෙන්න පුළුවන්ද? හැබැයි, ඒ දෙන්නේත් ගල් අරක්කු බෝතලය රුපියල් 4,000ට. චාමර සම්පත් මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමාගෙන් අහගන්න විස්තරේ. මොකද, එතුමා ඒ දවස්වලත් මේකට fight කළා. අපි කියන්නේ එතනෝල් ලීටරය රුපියල් 475ට ගත්තත්, අරක්කු මිල අඩු කළේ නැත්නම් ඒගොල්ලන්ට එතනෝල් ලීටරය රුපියල් 800 වුණා කියලා පාඩු වෙන්නේ නැහැ කියලායි. මේ නිසා distillery companiesවලට පාඩු වෙන්නේත් නැහැ, අරක්කුවල මිල වැඩි කරන්න ඕනෑත් නැහැ. ඒ වාගේම මම ඔබතුමා කියන දේ පිළිගන්නවා. කසිප්පු-කරිඤ්ඤං දවසකට ලීටර් දෙලක්ෂයක් පමණ මේ රටේ පරිභෝජනයට යොදා ගන්නවා. ඒක නතර කරන්න තමයි අපි නිතරම කිව්වේ ගල්ඔයට, ඇතිමලේට වාගේ sugar නිෂ්පාදනය කරන, molasses හදන ආයතනවලට ලයිසන් එක දෙන්න කියලා, අඩු මිලට අරක්කු බෝතලයක් හදන්න. එතැන තිබෙන ප්‍රශ්නය ඒකයි. ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. මම මේ පිළිබඳව ගරු ජනාධිපතිතුමාට වාර්තාවක් ලබා දෙනවා.

මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා, -හැමෝම නොවෙයි, ඒ අයට නිසි ගෞරවය සහිතවයි මම මේ කියන්නේ- අරක්කු කොම්පැනිවලින් සල්ලි ගන්න. ඒ ගැන මම හෙට අනිද්දාට හෙළිදරව් කරනවා, හකීම් මන්ත්‍රීතුමනි. මේක පාලනය කරන්න දෙන්නේ නැත්තේ ඒ බිස්නස් එකේ ඉන්න කට්ටිය. ඔබතුමන්ලාගේ දේශපාලන චර්යාවන් අනුව ඉතිහාසයේ වෙච්ච වැරදි තිබෙනවා නේ. ඒ වැරදි ටිකක් අමාරුයි නිවැරදි කරන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ නොවෙයි,

සමාවෙන්න; ඔය පැත්තේ ඉන්න ක්‍රමය. ඔය පැත්තේ ඉන්න ක්‍රමයට වඩා මේ පැත්තේ ඉන්න ක්‍රමය වෙනස් නේ. ඒ වෙනසට තවම ගැළපෙන්න බැරි කිහිපදෙනෙක් ඉන්නවා. අන්න ඒ නිසා ඇති වෙච්ච ප්‍රශ්නයක් මේ තිබෙන්නේ. නැත්නම් මේ වැරැද්ද නිවැරදි කරන්න පුළුවන්; මේක නිවැරදි කරන්නම ඕනෑ. මේක නිවැරදි කළේ නැති වුණොත් එතනෝල් කර්මාන්තයත් ඉවරයි; සීනි කර්මාන්තයත් ඉවරයි. මට තිබෙන්නේ තීරණ දෙකෙන් එකක් ගන්න විතරයි. එක්කෝ, ගොවීන්ට ගෙවන ප්‍රමාණය අඩු කරන්න ඕනෑ, නැත්නම් එතනෝල් මිල වැඩි කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නම් ටික කියන්න. *[බාධා කිරීමක්]* නම් ටික කියමු, ගරු ඇමතිතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි කියන්නම්. භය වෙන්න එපා. *[බාධා කිරීමක්]* තේරුණාද? ගොවීන්ට ගෙවන ප්‍රමාණය අඩු කරන්න බැහැ. සේවකයින්ට ගෙවන ප්‍රමාණය අඩු කරන්න බැහැ. එහෙනම් වැඩි කරන්න තිබෙන්නේ එතනෝල් මිල. එතනෝල් ලීටරයක මිල රුපියල් 475 සිට රුපියල් 800ක් කළාය කියලා කිසි කෙනෙකුට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අරක්කු මිල වැඩි කරන්න ඕනෑත් නැහැ. අපිට support එකක් දෙන්න, චාමර සම්පත් මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමනි, South Africaවලින් එතනෝල් ලීටරයක් රුපියල් 70ට ගෙනෙන්න පුළුවන්. හැබැයි, South Africaවලින් ලීටරයක් රුපියල් 70ට ගෙනෙන එක නොවෙයි ප්‍රශ්නය. එක්කෝ බොන කෙනාට බොන්න දෙන්න ඕනෑ, නැත්නම් සීනි කර්මාන්තය දියුණු කරන්න ඕනෑ. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. South Africaවලින් එතනෝල් ගෙනාවොත් අරක්කු බෝතලයක් රුපියල් 1,500ට, 2,000ට දෙන්න පුළුවන්. එතකොට අරක්කු බොන මිනිසුන්ට හොඳයි. එහෙම කියලා සීනි කර්මාන්තශාලා ටික වහන්න බැහැ. ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුව කාලයේ එතනෝල් ලීටරයක් රුපියල් 1,200ට දුන්නේ. හැබැයි, අරක්කු බෝතලේ 2,800ට වික්කා. ඔබතුමා කියන කථාවේ ඇත්තක් තිබෙනවා. අරක්කු බෝතලයක් දැන් රුපියල් 3,600යි. එතනෝල් ලීටරයක් රුපියල් 1,200ට දුන්නත් අරක්කු බෝතලේ මිලට පාඩුවක් වෙන්නේ නැහැ. ඒ නිසා මම,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පොඩ්ඩක් අපටත් අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි. අපි කරදර කළේ නැහැ නේ. මම කථානායකතුමාට කරදර කළාද? මම මෙච්චර වෙලා පැත්තකට වෙලා වාඩි වෙලා හිටියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව පවත්වාගෙන යන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමනි, ඒ නිසා එතනෝල් ලීටරයක් රුපියල් 1,200ට හරි කමක් නැහැ දෙන්න. සීනි කර්මාන්තශාලා දෙක වහන්න එපා. සීනි කර්මාන්තශාලා ඔච්චරයි අපට ඉතුරු වෙලා තිබෙන්නේ. ඔච්චරමයි තිබෙන්නේ. කන්තලේ සීනි කර්මාන්තශාලාව වැහුවා; හැම තැනම තිබෙන ඒවා වැහුවා. දැන් රටට තිබෙන්නේ ඔච්චරයි. ඒකයි අපි ඔබතුමාට කියන්නේ. පැල්වත්ත, සෙවනගල සීනි කර්මාන්තශාලාවල ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවට පුළුවන් නම් ආනයනික සුදු සීනිවලට VAT එක පනවන්න. ගරු ඇමතිතුමනි, මම එදාත් ඔබතුමා විපක්ෂයේ ඉන්නකොට මේ කාරණය කිව්වා. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්. කර්මාන්ත ඇමතිකම භාර ගත්ත දවසේ ඔබතුමා එළියට ඇවිල්ලා කිව්වා, "චාමර, මට ප්‍රශ්නයක් නැහැ, මම ඕනෑ වෙලාවක Cabinet Paper එකක් ඉදිරිපත් කරන්නම්, ඉදිරිපත් කරන්න පුළුවන්" කියලා. ඒ නිසා ඔබතුමා ආනයනික සීනිවලට VAT එක පැනෙව්වා වාගේම රතු සීනි සඳහා VAT එක අයින් කරන්න. ආණ්ඩුව VAT එක අයින් කරන්න, රතු සීනිවලට. එතකොට මේ ප්‍රශ්නය ඉවර වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -214/2024- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 7 -223/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2015 පිහිටවූ දූෂණ විරෝධී කමිටු කාර්යාලය: විස්තර

2015இல் தாபிக்கப்பட்ட ஊழல் எதிர்ப்புக் குழு அலுவலகம்: விபரம்
ANTI-CORRUPTION COMMITTEE OFFICE ESTABLISHED IN 2015: DETAILS

390/2025

**8. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද දූෂණ විරෝධී කමිටු කාර්යාලය එවකට අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කරනු ලැබුවේද;

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

(ii) එම කමිටුව ස්ථාපිත කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සන්දේශය සහ අමාත්‍ය මණ්ඩල තීරණය ඉදිරිපත් කරන්නේද;

(iii) එම කමිටුවේ සිටි සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) දූෂණ විරෝධී කමිටු කාර්යාලය වසා දමන අවස්ථාව වනවිට එම කාර්යාලය වෙත ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(vi) පවරා තිබූ නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරන ලද පුද්ගලයාගේ නම සහ ලිපිනය කවරේද;

(ii) ඔහු අනවසරයෙන් වාහනයක් ධාවනය කර එය අනතුරකට පත් කර ඇති බව දන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் தாபிக்கப்பட்ட ஊழல் எதிர்ப்புக் குழு அலுவலகம் அப்போதைய பிரதம அமைச்சர் அலுவலகத்தின்கீழ் நிறுவப்பட்டதா என்பதையும்;

(ii) மேற்படி குழுவை நிறுவுவது தொடர்பான அமைச்சரவைப் பத்திரம் மற்றும் அமைச்சரவைத் தீர்மானத்தைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) அக்குழுவில் இடம்பெற்றிருந்த அங்கத்தவர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) அவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் வெவ்வேறாக யாவையென்பதையும்;

(v) ஊழல் எதிர்ப்புக் குழு அலுவலகம் மூடப் பட்டபோது, அந்த அலுவலகத்துக்குக் கிடைத் திருந்த முறைப்பாடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(vi) தாக்கல்செய்யப்பட்ட வழக்குகளின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அந்த ஊழல் எதிர்ப்புக் குழுவின் பணிப்பாளர் நாயகமாகப் பணியாற்றிய நபருடைய பெயர் மற்றும் முகவரி யாவை என்பதையும்;

(ii) அவர் அனுமதியின்றி வாகனத்தைச் செலுத்தி, அதனை விபத்துக்குள்ளாக்கியதை அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether the Anti-Corruption Committee Office established in 2015 was established under the Office of the then Prime Minister;

(ii) whether the Cabinet Memorandum and the Cabinet decision regarding the establishment of the aforesaid Committee will be presented;

(iii) the number of members who were at the aforesaid Committee;

(iv) the names and addresses of those members, separately;

(v) the number of complaints that had been received by the Anti-Corruption Committee Office by the time of its closure; and

(vi) the number of cases that had been filed in courts of law?

(b) Will she also inform this House -

(i) the name and address of the person who served as the Director General of the aforesaid Anti-Corruption Committee; and

(ii) whether she is aware that he had driven a vehicle without permission, causing an accident?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එවකට සිටි අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2015.01.21 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය සහ 2015.01.21 දිනැතිව එවකට හිටපු විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශයෙන් දක්වා ඇති යෝජනා පරිදි අංක අමප/15/0005/602/002 හා අමප/15/0003/615/002 හා 2015 ජනවාරි මස 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව දූෂණ විරෝධී කමිටුව ස්ථාපිත කර ඇත.

එමෙන්ම එවකට සිටි අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් "දූෂණ විරෝධී කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම හා සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම" මැයෙන් ඉදිරිපත් කරන ලද 2015.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයට අදාළ අංක අමප/15/0066/602/002 - I හා 2015.02.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර ඇත. මෙම දූෂණ විරෝධී කමිටුව හා දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති බවට නිශ්චිතවම සඳහන් නොවන නමුත් අමාත්‍ය මණ්ඩලය මඟින්

කාර්යාලය සම්බන්ධයෙන් වරින් වර ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමට අග්‍රාමාත්‍ය ලේකම් වෙත පවරා ඇත.

(ii) සන්දේශය - (ඇමුණුම 01) ලෙසත්, තීරණය (ඇමුණුම 02) ලෙසත් ඉදිරිපත් කරමි.

(iii) දූෂණ විරෝධී කමිටුව ස්ථාපිත කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කමිටු සාමාජිකයින් 14දෙනෙකු පත් කර ඇත.

(iv) ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව නම් කරන ලද කමිටු සාමාජිකයින්ගේ නාමයන් එවකට තනතුරු හෙබවූ ආකාරයෙන් ඇතුළත් කර ඇති අතර, ඔවුන්ගේ ලිපිනයන් සම්බන්ධ තොරතුරු කිසිවක් අග්‍රාමාත්‍ය කාර්යාලය සතුව මේ සම්බන්ධයෙන් පවතින ලිපි ගොනුවල ඇතුළත් නොවන අතර, ඔවුන්ගේ නම් පහත පරිදි ඉදිරිපත් කරමි.

1. අගමැති රනිල් වික්‍රමසිංහ ( සභාපති)
2. අමාත්‍ය මංගල සමරවීර
3. අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ
5. අමාත්‍ය රවුෆ් හකීම්
6. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නායක, සරත් ෆොන්සේකා
7. දෙමළ ජාතික සන්ධානය (TNA) නායක, ආර්. සම්පන්දන්
8. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන්
9. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක
10. නීතිඥ ජේ.සී. වැලිඅමුණ
11. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
12. මලික් සමරවික්‍රම
13. මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක
14. කමිටු ලේකම්

(v) දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතා විසින් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත එවන ලද 2020.01.20 දිනැති ලිපියේ සඳහන් පරිදි පැමිණිලි 475ක් සහ පරිපාලන අක්‍රමිකතා සහ වෙනත් පැමිණිලි 667ක් ලැබී ඇත. (ඇමුණුම 03)

(vi) පවරා තිබූ නඩු සම්බන්ධයෙන් තොරතුරු දැනට අග්‍රාමාත්‍ය කාර්යාලය සතු ලේඛනවල ඇතුළත් නොවේ.

(ආ) (i) දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දැරූ තැනැත්තෙක් සම්බන්ධ තොරතුරු දැනට මෙම කාර්යාලය සතුව පවතින ලිපි ගොනු තුළ ඇතුළත්ව නොමැත.

(ii) අදාළ නොවේ.

(ඇ) දූෂණ විරෝධී කමිටුව සඳහා පිහිටුවන ලද ලේකම් කාර්යාලය වෙනුවෙන් සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම මැයෙන් එවකට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2015.02.27 දිනැතිව ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල සංයුතිය සඳහා අමප/15/0168/602/002-II හා 2015.03.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. (ඇමුණුම 04) එහි ඇතුළත් කාර්ය මණ්ඩල සංයුතිය තුළ අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ඇතුළත් නොවේ. (ඇමුණුම 05)

තවද, දූෂණ විරෝධී කමිටුව සහ ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් දැනට අග්‍රාමාත්‍ය කාර්යාලය සතුව පවතින ලේඛනවල අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් පිළිබඳ කිසිදු සඳහනක් නොමැත.

ඇමුණුම් 01 සිට 05 දක්වා **සභාගත*** කරමි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමිය ඉදිරිපත් කළ තොරතුරුවලදී කියැවුණා, මේ කමිටුව අග්‍රාමාත්‍ය කාර්යාලය හරහා ස්ථාපිත කළාට අග්‍රාමාත්‍ය කාර්යාලයේ නීත්‍යනුකූල ස්ථාපිතභාවයක් මත සිද්ධ වුණේ නැති බව. නමුත් ඒ කාලයේ නඩු දැම්මා, ෆයිල් හැදුවා. ඒ සමහර නඩු තමයි දැන් ඔය ඇවිල්ලා තිබෙන්නේ. 2015 යහ පාලන ආණ්ඩුවේ ඒ දූෂණ විරෝධී කමිටුවේ -අගමැතිතුමියගේ කටින් කියැවුණු කමිටුවේ- අනුර කුමාර ජනාධිපතිතුමාගේ නමත් තිබෙනවා. ඒ වාගේම ආනන්ද විජේපාල මහත්තයාගේ නමත් තිබෙනවා. ආනන්ද විජේපාල මහත්තයා 2015 යහ පාලන ආණ්ඩුවේ දූෂණ විරෝධී කමිටුවේ -නඩු දමන කමිටුවේ- තනතුරක් දැරුවා. මට දැනගන්න වුවමනාව තිබෙන්නේ 2015දී දූෂණ විරෝධී කමිටුවට නීත්‍යනුකූලභාවයක් තිබුණාද, නැද්ද කියන එකයි.

අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් පිහිටවපු මේ දූෂණ විරෝධී කමිටුව නීත්‍යනුකූල නොවන විධියට පවත්වාගෙන ගියා වාගේ අපට පේනවා, ඔබතුමිය කිව්ව සමහර වචනවලින්. වාහනයක් ගැන මම අහලා තිබෙනවා. මම හිතන විධියට, අගමැතිතුමියට ඒක ගැන තොරතුරු දෙන්න බැහැ.ප්‍රශ්නයේ ඒ ගැන අහලා තිබෙන කොටසට උත්තරයක් ලැබුණේ නැහැ. 2015දී දූෂණ විරෝධී කමිටුවේ අයෙක් අනවසරයෙන් වාහනයක් ධාවනය කර එය අනතුරකට ලක් කර තිබෙනවා. ඒ ගැනත් ඔබතුමියගෙන් උත්තරයක් ලැබුණේ නැහැ. ඒ සම්බන්ධ පිළිතුරක් පසුව සභාගත කළත් කමක් නැහැ. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය එච්චරයි. ඔබතුමිය කියපු ටික මම දැනගත්තා. 2015 යහපාලන ආණ්ඩුවේ ඒ දූෂණ විරෝධී කමිටුවේ හිටියේ කවුද කියලා දැනගන්නයි මටත් ඕනෑ වුණේ. ඒක රට දැනගත්තොත් ඇති. ආනන්ද විජේපාල මහත්තයාත් හිටියා, අනුර කුමාර ජනාධිපතිතුමාත් හිටියා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒකේ කිසිම රහසක් නැහැ. මීට කලිනුත් අපි තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා, ගරු ආනන්ද විජේපාල මැතිතුමා එහි නිලධාරියෙක් හැටියට සේවය කළ බවට. ඒ වාගේම ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා පාර්ලිමේන්තුව තුළ ඉන්නකොටත් මේ පිළිබඳ ප්‍රකාශ ඕනෑ තරම් අවස්ථාවල කර තිබෙනවා. මේක අලුත් තොරතුරක් නම් නොවෙයි. අනික, මෙය නීති විරෝධීයි කියන එකක් මගෙන් ප්‍රකාශ වුණේ නැහැ. දැනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ තිබෙන ලිපි ගොනුවල තොරතුරු තමයි මම ඉදිරිපත් කළේ. මේක, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ කාලයේ සිද්ධ වෙච්ච දෙයක්. එතුමා ජනාධිපති වුණාට පසුව මේ ලිපි ගොනු ජනාධිපති

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හරිනි අමරසූරිය]

කාර්යාලයට හෝ වෙන තැනකට ගෙනිච්චාද කියන එක අපි දන්නේ නැහැ. දැනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ තිබෙන ලිපි ගොනුවලට අදාළ තොරතුරු තමයි මට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙන්නේ. ඒ ලිපි ගොනුවල වාහනයක් පිළිබඳව වත්, Director General කෙනෙක් පිළිබඳව වත් කිසිම තොරතුරක් නැහැ. ගරු කථානායකතුමනි, මම තොරතුරු සභාගත කළා. Director General තනතුරක් ගැන කිසිම තොරතුරක් ඒවායේ නැහැ.

## මහවැලි පුනරුද සතිය: අරමුණ සහ වැය කළ මුදල
## மகாவலி மறுமலர்ச்சி வாரம்: நோக்கம் மற்றும் செலவிடப்பட்ட தொகை
## MAHAWELI RE-AWAKENING WEEK: OBJECTIVE AND MONEY SPENT

619/2025

**9. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෑතකදී 'මහවැලි පුනරුද සතිය' නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(ii) එම වැඩසටහනේ අරමුණ කවරේද;

(iii) එම වැඩසටහන සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iv) මහවැලි ගොවීන් බල ගැන්වීම සඳහා එම වැඩසටහන යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அண்மையில் 'மகாவலி மறுமலர்ச்சி வாரம்' என்ற பெயரில் நிகழ்ச்சித்திட்டமொன்று அமுல் படுத்தப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி நிகழ்ச்சித்திட்டத்தின் நோக்கம் யாது என்பதையும்;

(iii) மேற்படி நிகழ்ச்சித்திட்டத்துக்கெனச் செலவிடப் பட்ட மொத்தப் பணத்தொகை யாது என்பதையும்;

(iv) மகாவலி விவசாயிகளை வலுவூட்டுவதற்கு மேற்படி நிகழ்ச்சித்திட்டத்தின்கீழ் எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that a programme called 'Mahaweli Punaruda Sathiya' (Mahaweli Re-awakening Week) was implemented recently;

(ii) the objective of the aforesaid programme;

(iii) the total amount of money spent on the programme; and

(iv) the measures that were implemented under the aforesaid programme to empower the Mahaweli farmers?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii)
- මහවැලි සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීම.
- ගොවි සංවිධාන ක්‍රියාකාරී ප්‍රදේශවල දරිද්‍රතාව තුරන් කිරීම.
- Clean Sri Lanka ජාතික වැඩසටහනට සමගාමීව මහවැලි කලාප තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහවැලි බලප්‍රදේශ තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ඇළ මාර්ග සහ වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.
- ප්‍රජාවට සෘජු ප්‍රතිලාභ ලබා දෙන කාලීන හා අත්‍යවශ්‍යම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ගොවි සංවිධාන බලප්‍රදේශයේ හඳුනාගත් ව්‍යාපෘති උපරිම ප්‍රජා දායකත්වය ඔස්සේ මනා විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම.
- ගොවීන් අතර සහ ගොවීන් හා නිලධාරීන් අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

(iii) රුපියල් මිලියන 52.75කි.

(iv)
- Clean Sri Lanka වැඩසටහනට සමගාමීව ශ්‍රමදාන වැඩසටහන් 485ක් ක්‍රියාත්මක කර ඇත.
- මහවැලි බලප්‍රදේශය තුළ කෘෂිකර්ම සංවර්ධනය උදෙසා වැඩසටහන් 191ක් සිදු කර ඇත.
- ධීවර හා පශු සම්පත් සංවර්ධන වැඩසටහන් 163ක් ක්‍රියාත්මක කර තිබේ.
- වාරිමාර්ග හා මාර්ග සංවර්ධන වැඩසටහන් 192ක් පැවැත්වීම.
- ගොවි සංවිධාන හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් 212ක් පවත්වා තිබේ.
- ව්‍යවසායකත්ව සංවර්ධනය උදෙසා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් 64ක් පැවැත්වීම.
- පරිසර සංරක්ෂණ වැඩසටහන් 105ක් පැවැත්වීම.
- වෛද්‍ය සායන වැඩසටහන් 34ක් පැවැත්වීම.

- මහවැලි දරුවන් මත්උවදුරරෙන් මුදා ගැනීමේ අරමුණ පෙරදැරිව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 110ක් කලාප කාර්යාල මට්ටමෙන් සිදු කර ඇත.
- මහවැලි දූවා දරුවන්ගේ ක්‍රීඩා කුසලතා ඉහළ නැංවීම උදෙසා ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් 39ක් පැවැත්වීම.
- ඉඩම් සංවර්ධන වැඩසටහන් 69ක් පවත්වා ඇත.
- කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය උදෙසා කාර්යාල කළමනාකරණ වැඩසටහන් 25ක් පවත්වා ඇත.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. "මහවැලි පුනරුද වැඩසටහන" 2025 ජනවාරි මාසයේ අනුරාධපුරයෙන් ආරම්භ කර ඊට සාපේක්ෂව මහවැලි "බී" කලාපය තුළ 2025 පෙබරවාරි මාසයේ ආරම්භ කර තිබෙනවා. ඒ වැඩසටහනට සාපේක්ෂව කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, වාරිමාර්ග හා මාර්ග සංවර්ධන වැඩසටහන්, ඉඩම් සංවර්ධන වැඩසටහන්, ධීවර සහ පශු සම්පත් වැඩසටහන් ඇතුළු තවත් වැඩසටහන් රාශියක් ආරම්භ කර තිබෙනවා. මේ වන විට මහවැලි "බී" කලාපයේ ඉඩම්ලාභීන් 10,000කට පමණ බලපත්‍ර ලබා දීලා නැහැ. මේ වැඩසටහන යටතේ ඉඩම්වලට බලපත්‍ර ලබාදෙන වැඩසටහනකුත් ක්‍රියාත්මක වුණා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, විශේෂයෙන්ම මහවැලි "බී" කලාපයේ ගොවි පවුල් සහ අනු පවුල් සඳහා ඉඩම්වලට බලපත්‍ර ලබා දෙන වැඩසටහන කඩිනමින් ආරම්භ වෙනවාද, මේ වැඩසටහන යටතේ ඒක ක්‍රියාත්මක වෙලා තිබෙනවාද, මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, "මහවැලි පුනරුද සතිය" වැඩසටහන තුළට නිශ්චිතව මහවැලි ඉඩම්වල පදිංචිකරුවන් සඳහා බලපත්‍ර ලබා දීමේ වැඩසටහනක් අපි ඇතුළත් කරලා තිබුණේ නැහැ. නමුත්, "මහවැලි පුනරුද සතිය" වැඩසටහන ඇතුළේ ඉඩම් ගැටලු විසඳීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගත්තා. අපි ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීමේ කඩිනම් වැඩසටහනක් එම වැඩසටහන තුළ ආරම්භ කළේ නැහැ. නමුත්, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය වන්නේ, මහවැලි ජනපදිකයන්ගේ ඉඩම් සඳහා බලපත්‍ර හෝ දීමනා පත්‍ර ලබා දෙන මොන යම් හෝ වැඩසටහනක් තිබෙනවාද කියන එකයි.

ඔබතුමා දන්නවා, අපිත් පිළිගන්නවා, මහවැලියෙන් ජනපදිකයන්ට ඉඩම් ඔප්පු, බලපත්‍ර දෙන එකේ අඩුවක් තිබෙන බව. ඒක විධිමත් නැහැ. කාලයක් ගත වෙලාත් මොනවත් දීලා නැහැ. නමුත්, අපි ඉඩම් අංශයේ යම් යම් වෙනස්කම් කරලා, ඒ ඉඩම්වල පදිංචි, දැනට එම ඉඩම් භුක්ති විඳින විශාල පිරිසකට බලපත්‍රයක්, ඔප්පුවක් ලබා දීමේ වැඩසටහනක් දැන් -2025 අවුරුද්දේ- ආරම්භ කරලා තිබෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

එම වැඩසටහන යටතේ කාරණා 13ක් මහවැලි කලාප දහයක ආරම්භ කරලා තිබෙනවා. මේ වෙනකොට එම වැඩසටහනේ ප්‍රගතිය මොකක්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
එම වැඩසටහන එක කලාපයක සතිය ගණනේ කලාප දහයේ සති දහයක් තමයි ක්‍රියාත්මක වුණේ. ඒකෙදි අපේ අරමුණ වුණේ ලොකු වියදමක් දරන්නේ නැතිව, නමුත් වැඩසටහන් රාශියක් සිදු කරන්න. ඉන් එකක් තමයි, නිලධාරින් සහ ජනපදිකයන් අතර සම්බන්ධතාව හදන එක. ඊළඟට, මහවැලිය තුළ පුනරුදයක්, මහවැලි ගොවි සංවිධාන තුළ පුනරුදයක් සහ මහවැලිය සහ ජනතාව අතර යම් සම්බන්ධතාවක් ගොඩනැඟීම. මහවැලියෙන් කෙරෙන වැඩසටහන් නැවත පණ ගහලා අලුත් විධියකට පටන් ගන්න තමයි අපි උත්සාහ කළේ. මේ වැඩසටහන යටතේ, මේ සති දහය තුළ වැඩසටහන් 1,689ක් කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා වියදම් වෙලා තිබෙන්නේ මිලියන 52.75යි. මම පිළිතුරේත් සඳහන් කළා, මොන වාගේ වැඩසටහන්ද කෙරිලා තිබෙන්නේ කියලා. අපි කලාප මට්ටමින් ඒකේ සමාලෝචන වාර්තාවකුත් ගෙන්වා ගත්තා. මොන වැඩද කෙරුණේ, ඒවායේ ප්‍රගතිය කොහොමද කියන කාරණා සම්බන්ධයෙන්. අපි ඒ ගැන පසු විපරම් කර තිබෙන්නේ.

## ද්විත්ව පුරවැසිභාවය හිමි තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන්: විස්තර
### இரட்டைப் பிரசாவுரிமையைக் கொண்டுள்ள தூதுவர்கள் மற்றும் உயர்ஸ்தானிகர்கள்: விபரம்
### AMBASSADORS AND HIGH COMMISSIONERS HOLDING DUAL CITIZENSHIP: DETAILS

917/2025

**10. ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ද්විත්ව පුරවැසිභාවය හිමි ඇතැම් පුද්ගලයින් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් ලෙස සේවය කරන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එවැනි තානාපතිවරුන්ගේ සහ මහ කොමසාරිස්වරුන්ගේ නම්, ඔවුන්ගේ පත්වීම් දිනයන් සහ අනෙකුත් අදාළ තොරතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහළ මට්ටමේ රාජ්‍ය තාන්ත්‍රික තනතුරු සඳහා ද්විත්ව පුරවැසිභාවය හිමි පුද්ගලයින් පත් කිරීම මඟින් බැඳියා පිළිගැටුම් ඇති වීමේ විභවයක් ඇති බව එතුමා දන්නේද;

(iv) එසේ නම්, එවැනි බැඳියා පිළිගැටුම් වැළැක්වීම/ ආමන්ත්‍රණය කිරීම සඳහා ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා]

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரட்டைப் பிரசாவுரிமையைக் கொண்டுள்ள சில குறிப்பிட்ட தனிநபர்கள் இலங்கையைப் பிரதிநிதித்துவம் செய்து தூதுவர்களாகவும் உயர்ஸ்தானிகர்களாகவும் சேவையாற்றுகின்றனர் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், அவ்வாறான தூதுவர்களதும் உயர்ஸ்தானிகர்களதும் பெயர்களையும் அவர்களின் நியமனத் திகதிகளையும் ஏனைய பொருத்தமான விபரங்களையும் வெவ்வேறாகவும்;

(iii) இரட்டைப் பிரசாவுரிமையுடைய தனிநபர்களை உயர் மட்ட இராஜதந்திரப் பதவிகளுக்கு நியமிப்பது சாத்தியமான அக்கறை முரண்பாட்டுக்கு இடமளிக்கலாம் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iv) அவ்வாறாயின், இவ்வாறான அக்கறை முரண்பாடுகளைத் தடுக்க/நிவர்த்தி செய்ய எடுக்கப்படுவதற்கு உத்தேசிக்கப்படும் நடவடிக்கைகளையும்;

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that certain individuals holding dual citizenship are serving as Ambassadors and High Commissioners representing Sri Lanka;

(ii) if so, the names of such Ambassadors and High Commissioners, their dates of appointment and other relevant details, separately;

(iii) whether he is aware that appointing of individuals with dual citizenship to high-level diplomatic positions could give rise to potential conflicts of interest; and

(iv) if so, the measures that are intended to be taken to prevent/address such conflicts of interest?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)

(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ද්විත්ව පුරවැසිභාවය හිමි තානාපතිවරුන්/ මහ කොමසාරිස්වරුන් ශ්‍රී ලංකාව නියෝජනය කරන බවට වාර්තා නොමැත.

(ii) ඉහත (i) පිළිතුර හා බැඳෙන බැවින් අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැක.

(iii) ද්විත්ව පුරවැසිභාවය හිමි පුද්ගලයකු ද්විත්ව පුරවැසිභාවය හිමි එම රාජ්‍යයටම පත් කිරීමේදී බැඳියා පිළිගැටුම් පිළිබඳ ගැටලු මතු විය හැකි වුවද එවැනි පත් කිරීමක් සිදු කර නොමැත.

(iv) අදාළ නොවේ

(ආ) පැන නොනඟී.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)

(The Hon. M. Nizam Kariapper, PC)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, Committee on High Postsහි සාමාජිකයෙක් හැටියට මෙම පිළිතුර මා දන්නා කරුණුවලට සම්පූර්ණයෙන් පටහැනි, අසත්‍ය පිළිතුරක්. මක්නිසාද, මම Committee on High Posts එකේ සිටියදී, දැනටමත් අපි ද්විත්ව පුරවැසිභාවය සහිත තැනැත්තියක අපේ තානාපති කෙනෙකු හැටියට යවා තිබෙන බව මා දන්නවා, ඩුබායි, එහෙම නැත්නම් අබුඩාබිවලට. එබැවින් කරුණාකර මේ පිළිබඳව නැවත සොයා බලා මට පිළිතුරු ලබා දෙන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා. It is completely wrong. I am very surprised and shocked! This Answer misleads Parliament. Hon. Deputy Minister, you can take some more time and answer this Question once again.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)

(The Hon. (Prof.) Ruwan Ranasinghe)

I checked on the facts that the Hon. Member mentioned, Hon. Speaker, and got to know that after the preparation of this particular Answer, there had been an appointment made, as he mentioned, to Dubai. That particular person is a citizen of Australia and since she had been appointed to Dubai, there is no conflict of interest as such in engagements.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)

(The Hon. M. Nizam Kariapper, PC)

So, why did you not say that in the first instance? My second question is this. Now, you admit that at the time you gave the Answer, not at the time that I submitted this Question, that you knew very well that there had been one person with dual citizenship appointed and then, you were able to get out of my other question under a (iv) by saying, "It does not arise." It is completely wrong! So, now, you have to explain to this House that if this particular person is a duel citizen, how she would get over this issue of conflict of interest?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)

(The Hon. (Prof.) Ruwan Ranasinghe)

I need to reiterate that at the time when they prepared the Answer and I received the printed Answer, that appointment had not been made. However, I checked with the office and put a separate note on the question whether there are any such appointments and I already mentioned that.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Sir, I will not ask any more questions. නමුත්, ගරු කථානායකතුමනි, මට එකම එක ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දෙන්න. At the time I submitted this Question, the person's nomination was there; at the time you prepared the Answer, it was there and I still go on the footing that when I put this Question, that person had already been cleared by the Committee on High Posts and given the appointment. Therefore, I reiterate that the Answer given by this particular Deputy Minister on behalf of the Minister of Foreign Affairs, is false.

Thank you.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීවරුන් ප්‍රශ්න අහලා, ඒවාට අමාත්‍යාංශවලින් උත්තර එනකොට තිබෙන තත්ත්වය තමයි අමාත්‍යවරුන්ට ප්‍රකාශ කරන්න වෙන්නේ. එහෙම නැතිනම් අපට කිසිම ප්‍රශ්නයක් නැහැ; ද්විත්ව පුරවැසියන්ද, නැද්ද කියලා බලන්න දෙයක් නැහැ. අපට හංගන්න දෙයකුත් නැහැ. අපට කියන්න තිබෙන්නේ මේකයි. සමහර ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න මාස ගණන් ගියොත්, ඒ වන විට ඒ ප්‍රශ්නය විසඳිලා තිබෙන්නත් පුළුවන්, එහෙම නැත්නම් ඒ ප්‍රශ්නය ඔඩු දුවලා තිබෙන්නත් පුළුවන්. සමහර විට, ප්‍රශ්නය අහන වෙලාව වන විට ඒ ප්‍රශ්නය නැති වෙන්නත් පුළුවන්. එම නිසා ඒක practice එකක් විධියට තේරුම් ගන්න වෙයි. ප්‍රශ්නයට පිළිතුර සම්පාදනය කරන අවස්ථාවේ තිබෙන තත්ත්වය තමයි වාර්තා කරන්න වෙන්නේ. ඒක තමයි පාර්ලිමේන්තුවේ තිබෙන යථාර්ථය සහ සාමාන්‍යයෙන් තිබෙන practice එක.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මම ගරු සභානායකතුමාට පිළිතුරක් දෙන්න හදන්නේ මෙය වැදගත් කාරණයක් වන නිසා. ප්‍රශ්නය අසන අවස්ථාවටයි අමාත්‍යවරයා පිළිතුරු දෙන්නේ. ප්‍රශ්නය අසන අවස්ථාවේ ද්විත්ව පුරවැසියෙකු තානාපති ධුරයක් දැරුවා නම්, ඒක හෙළිදරව් කරලා, පිළිතුරු දීමේදී කියන්න තිබුණා, "හැබැයි, දැන් ඒ ප්‍රශ්නය විසඳලා තිබෙනවා. අපි ඔහු අස් කළා" කියලා; එහෙම නැත්නම්, "ඔහු ඉල්ලා අස් වුණා" කියලා. නමුත්, දැන් එහෙම කිව්වේ නැහැ. එහෙම නොකියා ඉතිරි ප්‍රශ්න සම්පූර්ණයෙන් මඟ හැර ගිහිල්ලා conflict of interest කියන එක මඟ හැර යනවා. *[බාධා කිරීමක්]* මේ ගරු මන්ත්‍රීතුමා කියන විධියට ඔහු තවමත් ධුරයේ ඉන්නවා. ඒක වැරැදියි, ගරු සභානායකතුමා. වරද කාගෙන් හෝ වෙලා තිබෙනවා නම්, නැවත එවැන්නක් නොවන්නට ඒක හෙළිදරව් කළ යුතුව තිබුණා. එම නිසා ප්‍රශ්නය අහන දවසට අදාළව පිළිතුර ලබා දිය යුතුයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපට හංගන්න දෙයක් නැහැ. මේ ප්‍රශ්නය පැත්තක තියන්න. ඇමතිවරයෙකුගෙන් යම්කිසි ප්‍රශ්නයක් ඇහුවාම අපට ඒ ප්‍රශ්නය මඟ හරින්න පුළුවන් ලෙහෙසිම ක්‍රමය තමයි, ප්‍රශ්නය ඇහුවේ කවදා වුණත් ඒ දිනය බලලා එදාට තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් උත්තර දෙන එක. එහෙම නොවෙයි නේ අවශ්‍ය. ඔබතුමන්ලා ප්‍රශ්නයෙන් අහන්නේ, දැන් තිබෙන තත්ත්වය ගැන නේ. වී මිල දී ගැනීම ගැන හිතන්නකෝ. වී මිල දී ගැනීම ගැන ප්‍රශ්නය අහන වෙලාවේ සමහර විට ගොයම් කපලා නැති වෙන්නත් පුළුවන්. ඒකයි මම කියන්නේ. *[බාධා කිරීම්]* අපට මේකේ හංගන්න දෙයක් නැහැ. එම නිසා මේවා සාමාන්‍ය අවබෝධයෙන් කරගෙන යමු.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කරලා දයාසිරි මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරලා තිබුණා. ඔබතුමාගේ අවසරය ඇතුව ඒකට උත්තර දෙන්න මට පුළුවන් නම්, උත්තර දෙන්නම්. දයාසිරි මන්ත්‍රීතුමා මගේ නම කියමින් උදේ මේ සභාවේ කථා කරලා තිබුණා. මට ඒකට උත්තර දෙන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා මේ අවස්ථාවේ එය ප්‍රකාශ නොකර ඉන්න.

දෙවන වටය.

## බන්ධනාගාරවල තදබදය අවම කිරීම: ගත් පියවර
## சிறைச்சாலைகளில் நெரிசலைக் குறைத்தல்: நடவடிக்கை
## MINIMIZING PRISON CONGESTION: STEPS TAKEN

214/2024

**6. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ ඇති බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බන්ධනාගාරවල නම් කවරේද;

(iii) එම එක් එක් බන්ධනාගාරයේ මේ වන විට රඳවා ඇති සිරකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බන්ධනාගාරවල පවතින අධික තදබදය අවම කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையில் காணப்படும் சிறைச்சாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி சிறைச்சாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு சிறைச்சாலையிலும் இன்றளவில் தடுத்துவைக்கப்பட்டிருக்கும் சிறைக் கைதிகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) சிறைச்சாலைகளில் நிலவும் அதிக நெரிசலைக் குறைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) number of prisons existing in Sri Lanka at present;

(ii) names of those prisons;

(iii) number of prisoners detained in each of those prisons at present, separately; and

(iv) steps that will be taken to reduce congestion prevailing in those prisons?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1. සංවෘත බන්ධනාගාර - 04

2. රිමාන්ඩ් බන්ධනාගාර - 18

3. බන්ධනාගාර විවෘත වැඩ කඳවුරු - 10

4. බන්ධනාගාර විවෘත සිර කඳවුරු - 02

5. තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන - 02

6. තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල - 01

(ii) **ඇමුණුම** 01** මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) **ඇමුණුම 02**** මඟින් ඉදිරිපත් කර ඇත.

(iv)
- දැනට ඉඩ පහසුකම් සහිතව නව දුම්බර බන්ධනාගාරය සහ අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය ඉදි කර ඇති අතර, මේ වන විට වැලිකඩ බන්ධනාගාරය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ඉඩ පහසුකම් යටතේ ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, මාතර බන්ධනාගාරය කොටවිලවත්ත ප්‍රදේශයේ ඉඩ පහසුකම් යටතේ ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- කළුතර බන්ධනාගාරයේ පැරණි ගොඩනැඟිලි 02ක් වෙනුවට ඉඩ කඩ ඇතිව දෙමහල් ගොඩනැඟිලි 02ක් ඉදි කිරීමට අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- එළිමහන් වැඩ කඳවුරක් ලෙස පවතින වටරැක බන්ධනාගාරයේ සැක/සිරකරුවන් රැඳවීමට හැකි වන පරිදි තාප්පය සහ ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- වාරියපොළ බන්ධනාගාරයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- 1991 අංක 08 දරන රිමාන්ඩ් භාරයේ පසුවන සිරකරුවන් මුදා හැරීමේ පනත ක්‍රියාත්මක කිරීමට අදාළව නිරන්තරව රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් සම්බන්ධයෙන් අධිකරණ දැනුවත් කර, ඔවුන් ඇප මත මුදා හැරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම.
- "අම දිවි රිද්ම" වැනි පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් නැවත නැවත බන්ධනාගාරගත වීම වැළැක්වීමට කටයුතු කිරීම. එම වැඩසටහන් දීපව්‍යාප්තව කිරීමට සැලසුම් කර ඇත.
- සිරකරුවන්ගේ තදබදය අඩු කිරීම සඳහා පොදු සමාව ලබා දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය සඳහා යන්ත්‍රණයක් සකස් කිරීමේ ප්‍රධාන ඇගැයීම් තුළින් සමාව ලබා දීමේ කමිටුව නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- සියලුම බන්ධනාගාරවල ඇති පැරණි ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීමට හා නව ගොඩනැඟිලි ඉදි කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි කටයුතු කිරීමට අදාළ අංශ සමඟ සාකච්ඡා කිරීම.

(ආ) අදාළ නොවේ.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න, අත්‍යවශ්‍ය කාරණයක් ප්‍රකාශ කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන,-

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාට මේ රට තොට-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ වෙලාවේ අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා. අදාළ අවස්ථාවේදී විතරයි ඔබතුමාට නැඟී සිට කථා කරන්න පුළුවන්.

අමාත්‍යාංශ නිවේදන, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මැතිතුමා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. වැදගත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ ප්‍රශ්නය ලබා දෙන්න, ගරු ඇමතිතුමාට. *[බාධා කිරීමක්]* කමක් නැහැ, කමක් නැහැ.

ගරු කථානායකතුමනි, අපට අද දිනට නියමිත ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන්න තිබෙනවා. ඒ වාගේම, ගරු ජනාධිපතිතුමා එක්ක සාකච්ඡාවකුත් තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා මෙතැන සිටියා. ඔබතුමා ඇමතිතුමා එක්ක කථා කරන්න. එහෙම නැත්නම් ඔබතුමා press briefing එකක් තියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මම අනුරාධපුරයේ ඉඳන් ආවේ, ගරු ඇමතිතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා press briefing එකක් තියන්න. ඔබතුමාට ඔච්චර වුවමනාවක් තිබුණා නම්,- *[බාධා කිරීමක්]* නැහැ, අපි එකඟ වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර ඉඳගන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මම දැන් මේ සභාවට ඇවිල්ලා ඉන්නවා නේ. මට විනාඩියක කාලයක් විතරයි පරක්කු වුණේ. අනුරාධපුරයේ ඉඳන් මම ඇවිල්ලා ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ 9.30ට පාර්ලිමේන්තුවේ රැස්වීම පටන් ගන්නා බව ඔබතුමා දැන ගන්න ඕනෑ.

අමාත්‍යාංශ නිවේදන, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඊයේ පස් වරු 1325ට මට ලිපියක් ලැබුණා, මම ස්ථාවර නියෝග 27 (2) යටතේ 21වැනි දා සහ 22වැනි දා අහපු ප්‍රශ්නවලට පිළිතුරු අද උදේ ලබා දෙනවා කියලා. ඒ ලිපිය ලැබිලා අද උදේ ඒ ප්‍රශ්නවලට උත්තර ලබා ගන්න මා මෙහි ආවාම ප්‍රධාන වැඩකටයුතුවලට යන්න ඉස්සෙල්ලා ස්ථාවර නියෝග 27 (2) යටතේ මම අහපු ඒ ප්‍රශ්නවලට අදාළ උත්තර දෙක දෙන්න ඕනෑ. අද පිළිතුරු ලබා දෙන බව මේ ලිපියේ තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉදිරි දිනයක-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා සහ ඇමතිවරු ගණනාවක් ජනාධිපතිතුමා විසින් හදිසියේ කැඳවා තිබෙනවා, අය වැය සම්බන්ධ සාකච්ඡාවකට. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි දැනුම් දීලා තිබෙන්නේ ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරත්, විදුලිබල හා බලශක්ති ඇමතිතුමා ලබා දෙන්න ලෑස්ති වෙලා හිටපු පිළිතුරත් කියන දෙකම අද දින ලබා දෙන්න නොහැකි බව. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, බැරි වෙලාවත් අපි ප්‍රමාද වෙලා ආවා නම් අපෙන් ප්‍රශ්න කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ප්‍රමාදය සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනාදිමත් කාලයක සිට,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, අපි ඒ කාරණාව ඒ විධියට තේරුම් ගන්න ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක ප්‍රමාදය සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. හදිසි අවශ්‍යතාවක් මත-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් අසා තිබුණා, කොළඹ සිට කන්කසන්තුරේ දක්වා වූ දුම්රිය ගමන් සම්බන්ධව. මම එතුමාගෙන් කල් ඉල්ලා ගත්තා, අද දිනයේදී ඒකට පිළිතුර ලබා දෙන්න. නමුත් එතුමා සභානායක කාර්යාලයට දැනුම් දීලා තිබෙනවා, එතුමා මේ සභාවේ ඉන්න වෙලාවක ඒකට උත්තරය ලබා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, ඒ උත්තරය මා සතුව තිබෙනවා, විසඳුමකුත් එක්ක. නමුත් එතුමා ඊළඟ අවස්ථාවේ ඇවිත් ඇහුවාම උත්තරය ලබා දෙන්නම්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද point of Order එක, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ Standing Orders -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point of Order එකක්ද නඟන්නේ?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක අහන්න, ගරු කථානායකතුමනි. අපි අහන්නේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් ද ඔබතුමා නඟන්නේ?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, point of Order එකක් තමයි. ඔබතුමන්ලා ලිඛිතව දන්වා තිබෙන දෙයක් සම්බන්ධයෙන් මා අද මෙතැනට පැමිණියා. නමුත් උත්තරයක් ලැබෙන්නේ නැති නිසා මම ප්‍රශ්නයක් අහනවා. මොකද, සාමාන්‍ය ශෛලිය තමයි කථානායකතුමා ඒ ඔක්කෝම Standing Orders අනුව කරන එක.

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් ඇහුවාම සැබැවින්ම විය යුතු වන්නේ, ඒකට උත්තරයක් දීමයි. අදාළ ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්න කාලය ලබා ගත්තොත්, ඒ ප්‍රශ්නය අහපු මන්ත්‍රීවරයාට අවස්ථාව දිය යුතුයි, උත්තරය දෙනවා කියපු දිනයේදී ඒ අදාළ ඇමතිතුමා ඉන්නවාද, නැද්ද කියලා අහන්න. අද වුණේ මොකක්ද? අද දිනට උත්තර දෙනවා කියලා කිව්වා. මම කිව්වා, මට ප්‍රශ්නයක් තිබෙනවා කියලා. නමුත්, උත්තර දෙනවා කියලා කියපු නිසා තමයි මම මෙතැනට ආවේ. ඒ ගෙවුණු පැය 8 අතරතුර කියනවා, පිළිතුරු ලබා දෙන්නේ නැහැ කියලා. ස්ථාවර නියෝග 27 (2) යටතේ අහන ප්‍රශ්නයට පිළිතුර දීමට කාලය ඉල්ලීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. මොකද, ඇමතිවරුන්ට කාර්යභාරයන් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමා ඒ සම්බන්ධයෙන් ඔබතුමාට පිළිතුරක් ලබා දුන්නා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම වාර්තාවකුත් ඉදිරිපත් කළා, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ප්‍රශ්න සම්බන්ධව සහ පාර්ලිමේන්තුවේ අසන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සම්බන්ධව. අපේ ඇමතිවරු සෑම කෙනෙක්ම වාගේ ඒවාට සූදානම් වෙලා එනවා, පිළිතුරු ලබා දෙනවා.

ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ප්‍රශ්න සම්බන්ධයෙන් තිබෙන ගැටලුව ගැනත් අපි කිව්වා. ඒ අනුව, අන්තර් අමාත්‍යාංශ හෝ අතිවිශාල තොරතුරු සහිත පිළිතුරක් නම් අපට කාලයක් අවශ්‍ය වෙනවා, එසේ අද අහන ප්‍රශ්නයකට අදම උත්තර දෙන්න බැහැ. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අද පිළිතුරු ලබා දෙන්න ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා සූදානම් වී හිටියා. ඔබතුමන්ලා කවුරුත් දන්නවා මෙවැනි practice එකක් තිබෙනවා කියලා. මෙහෙම ඕනෑතරම් වෙලා තිබෙනවා. අපි ඒක තේරුම් අරගෙනයි වැඩ කරන්නේ. ඔබතුමන්ලාත් ආණ්ඩු කරලා තිබෙනවා. අද දිනයේදී හදිසියේ ගරු ජනාධිපතිතුමා මුදල් නියෝජ්‍ය ඇමතිතුමාව කැඳවා තිබෙනවා. ඒක නිසා-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. ඒ වාගේ තත්ත්වයක් සම්බන්ධයෙන් මට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපට උත්තර දෙන කොට අපෙනුත් අහන්න-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි උත්තර දෙන්න ලෑස්ති වෙලා හිටියා. ගරු කථානායකතුමනි, කරුණාකරලා මම ඉල්ලීමක් කරනවා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ ගරු සභාවේ වැඩ කටයුතු නියමිත පරිදි ඉදිරියට පවත්වාගෙන යමු.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)plan
ගරු කථානායකතුමනි, මේවා මේ පාර්ලිමේන්තුවේ ඉස්සෙල්ලාම වෙන දේවල් නොවෙයි. මේ පාර්ලිමේන්තුව පටන් ගත්තාට පසුව ඉස්සෙල්ලාම වන දෙයක් නොවෙයි මේ වෙන්නේ. අපි ඉතා පැහැදිලිව දන්නවා, අපේ හැම ඇමතිවරයෙක්ම වගකීමෙන් පිළිතුරු දෙනවා කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක හරි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එසේ කරද්දී මෙවැනි විශේෂ දෙයක් ඇති වුණාම පිළිතුරු ලබා දීමට කල් ගන්නා අවස්ථාත් තිබෙනවා. අනෙක, මන්ත්‍රීවරුන් වශයෙන් ගත්තාම, අපි පාර්ලිමේන්තුවට එන්න බැඳිලා ඉන්නවා; වෙලාවට එන්න බැඳිලා ඉන්නවා. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා එනවා කියලා තිබිලා නැවිල්ලා ඉඳලා ඔබතුමා යම් අපහසුතාවකට පත් වුණා නම් මටත් ඒකම කියන්න පුළුවන්. ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා මගෙන් අහපු ප්‍රශ්නයට උත්තරය මම ඊයේ රෑ නැවත ගෙන්වාගෙන බැලුවා. මම ඒ ප්‍රශ්නයට උත්තරය practically හැදුවා. එතුමා මගෙන් ඉල්ලන්නේ කන්කසන්තුරේ ඉඳන් එන කෝච්චිය ගල්කිස්සට ධාවනය කරවන්න කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා මට ඒක නිකම් කරන්න බැහැ කියලා. මම දුම්රිය නිලධාරීන් ගෙන්වාගෙන plan එක හදලා, ඒ ඔක්කෝම ගැන සොයා බලලා තමයි උත්තරය හදාගෙන ආවේ. මොකද, අලුත් එන්ජින් එක repair වෙන්නේ ලබන 9වැනි දාට.

අද උදේ මම ආවාම මට සභානායක ලේකම් කාර්යාලයෙන් කියනවා, හදිසි තත්ත්වයක් නිසා මන්ත්‍රීතුමාට එන්න වෙන්නේ නැහැ, වෙන දවසක උත්තර දෙන්න කියලා. එතකොට මම මොකක්ද කරන්නේ? ගරු කථානායකතුමනි, මේවා අමුතු ඒවා නොවෙයි, අලුතින්ම ලංකාවේ වෙන ප්‍රශ්න නොවෙයි. ඒක තේරුම් ගෙන වැඩ කරන්න, please.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, අපි සභාවේ වැඩ කටයුතු ටික ඉදිරියට කරගෙන යමු.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු සභානායකතුමනි, මේකට සම්ප්‍රදායක් තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ ඇමතිවරුන්ගෙන් අහන ප්‍රශ්න වැදගත්කමින් යුත් ප්‍රශ්න නිසා තමයි අහන්නේ. ඒ අහන වෙලාවට ඇමතිවරයකු නොසිටියා නම් සභානායකතුමාට ඒ පිළිතුර ලබා දීමට පුළුවන්. කලින් එහෙම උත්තර ලබා දීලා තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකටත් පුළුවන්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඒක තමයි සම්ප්‍රදාය. ඒක පිළිපදින්න, කල් දමන්නේ නැතිව.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක තීන්දු කරන්න ඕනෑ මම නොවෙයි. මට හෝ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාට උත්තරය කියවන්න පුළුවන්. නමුත්, පක්ෂ නායකයෝ තමයි ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන්නේ. එතකොට අපි හිතනවා, පක්ෂ නායකයාට අදාළ ඇමතිවරයා වගකීමෙන් උත්තර දෙන එක තමයි හරි කියලා. අපට මේක කියවලා දමන්න බැරිකමක් නැහැ. ගරු රවුෆ් හකීම් මැතිතුමා කියන විධියට කටයුතු කරන්න අපි ලෑස්තියි. අපි එහෙම කරන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඉල්ලන්නේ එක දෙයයි. මින් පසුව ඒ වාගේ දෙයක් වුණාට,- *[බාධා කිරීමක්]* හැබැයි, ඒක coordinateකරලා, මන්ත්‍රීවරයාට එන්න පුළුවන්. දැන් මම අද ආවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මට මිනිත්තු එකහමාරක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
කාරණාව දැන් කියන්න හදන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේකට අදාළ කාරණයක්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
කාරණාව කියන්න තමයි අවස්ථාව ඉල්ලුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩියක් දෙන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩි එකහමාරක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩියක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
"විනාඩියක් පමණයි" ගුවන් විදුලි වැඩසටහනක්.

ගරු කථානායකතුමනි, ඔබතුමා මා පත් කළා, දයාසිරි ජයසේකර මැතිතුමාට එරෙහිව මන්ත්‍රීවරු වගයක් ලබා දුන් පෙත්සමක් විභාග කරන්න. මම එදාම නැඟිටලා කිව්වා, මේක පූර්වාදර්ශයක් වෙයි කියලා. ඔන්විල්ලාව ඒ පැත්තට ගියොත් මේ පැත්තටත් එනවා. මම කිව්වා, මේ සිල්ලර දේවල්වලට මේ වාගේ කමිටු පත් කිරීමේ තිබෙන අවදානම. ඒ නිසා මම ඒ කමිටුවෙන් ඉල්ලා අස් වුණා.

මොකද, මීට ඉස්සෙල්ලා අපේ මනූෂ නානායක්කාර මහත්මයා විරුද්ධ පාර්ශ්වයේ ඉන්නකොට කංචන විජේසේකර මහත්මයාත් එක්ක ගැටුමක් ඇති වෙලා දෙපැත්තෙන් ඇවිල්ලා ගහ ගන්න ගිය අවස්ථාවක අපි මනූෂව යම්තම් බේරා ගත්තා. ඒ චෝදනාවට කමිටුවක් පත් කළාම, මම ඒකේ හිටියා. අපි ඒකට ගාල්ලේ ඉඳලා එනවා. නමුත් අන්තිමට වෙච්ච දෙයක් නැහැ. ඊට පස්සේ ඩයනා ගමගේ හිටපු රාජ්‍ය ඇමතිතුමියගේ ප්‍රශ්නයේදී දෙපැත්තෙන්ම පැමිණිලි ආවාම, ඒ පත් කළ කමිටුවේත් මම හිටියා. ඒ කමිටුවට තමයි දෙපැත්තේම ඒ ප්‍රශ්න විභාග කරන්න දුන්නේ. දැන් මේ කමිටුව පත් කර තිබෙනවා. මම වෙනුවට රවුෆ් හකීම් මැතිතුමාව පත් කර තිබෙනවා, එහි සාමාජිකයකු හැටියට. මම අහන්න කැමැතියි, දැන් විපක්ෂයෙනුත් එක්තරා මන්ත්‍රීවරයෙකුට විරුද්ධව දීලා තිබෙනවා,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම දුන්නා. මම දෙකක් දුන්නා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතකොට ඒ කමිටුවෙන්ම ද ඒකත් විභාග කෙරෙන්නේ? එහෙම නැත්නම් වෙනත් කමිටුවක් පත් කරනවාද, ඒක කෙරෙනවාද කියලා දැන ගන්න ආසයි. මම ඔබතුමාට ඕක කලින්ම කිව්වා, මේ සිල්ලර දේවල්වලට ඔය වාගේ කමිටු පත් කිරීමේ අවදානම ගැන. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අධිකරණ ඇමතිතුමාගේ ලොකු තාත්තාගෙන් එහෙම ඇහුවා නම් මේවා කියයි. මේවා අද ඊයේ දේවල් නොවෙයි. නමුත්, පොඩි දේවල්වලට කමිටු පත් කරගෙන කටයුතු කරන කොට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ statementsවල තිබෙන බරපතළ කරුණු නිසා තමයි ඒ කමිටු පත් කළේ, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එහෙම නම් දෙපැත්තටම සාධාරණ වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை சித்த உளவியல்சார் உயர் கற்கைநெறி திறந்த நிறுவனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### CHITHTHA ADVANCED PSYCHOLOGICAL STUDIES OPEN INSTITUTE OF SRI LANKA (INCORPORATION) BILL

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health and Mass Media for report.*

### ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ரெட்ஸோ அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### TREDZO DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
Hon. Speaker, I move,

> "That leave be granted to introduce a Bill to incorporate the Tredzo Development Foundation."

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Rural Development, Social Security and Community Empowerment for report.*

### ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை தேசிய புகைப்படக் கலைச் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### NATIONAL PHOTOGRAPHIC ART SOCIETY OF SRI LANKA (INCORPORATION) BILL

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
Hon. Speaker, I move,

> "That leave be granted to introduce a Bill to incorporate the National Photographic Art Society of Sri Lanka"

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health and Mass Media for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු කෝසල නුවන් ජයවීර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු ඩොනල්ඩ් දිසානායක මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා.

## ශෝක ප්‍රකාශ: ගරු කෝසල නුවන් ජයවීර මහතා, ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා, ගරු ඩොනල්ඩ් දිසානායක මහතා සහ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා

## அனுதாபத் தீர்மானங்கள்: மாண்புமிகு கோசல நுவன் ஜயவீர, மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா, மாண்புமிகு டொனல்ட் திசாநாயக்க மற்றும் மாண்புமிகு ஜே.ஆர்.பி. சூரியப்பெரும

## VOTES OF CONDOLENCE: HON. KOSALA NUWAN JAYAWEERA, HON. MAVAI S. SENATHIRAJAH, HON. DONALD DISSANAYAKE AND HON. J.R.P. SURIYAPPERUMA

[පූ.භා. 11.22]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ශෝක යෝජනා ඉදිරිපත් කිරීමට මම ඔබතුමාගෙන් අවසර පතනවා.

ගරු කථානායකතුමනි, මා මුලින්ම, වත්මන් පාර්ලිමේන්තුවට පත් වී මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ඉදිරිපත් කරන්න කැමතියි.

කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ජාතික ජන බලවේගය යටතේ 2024 දී පාර්ලිමේන්තුවට තේරී පත්ව තම දිස්ත්‍රික්කයට මෙන්ම රටටද සේවයක් ඉටු කළ ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මෙම අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරනවා.

හපුආරච්චිගේ ජයවීර මැතිතුමාට සහ ලොකුහපුආරච්චිගේ චන්ද්‍රානි මැතිනියට දාව 1987 වසරේදී ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා දෙහිඕවිට නාපාවලදී ජන්ම ලාභය ලැබුවා. දෙහිඕවිට, ගුරුගල්ල කනිෂ්ඨ විද්‍යාලයෙන් සහ ඇහැලියගොඩ ජාතික පාසලෙන් සිප් සතර හැදෑරූ එතුමා උසස් අධ්‍යාපනය සඳහා විවෘත විශ්වවිද්‍යාලයට පිවිසුණා. එහිදී දේශපාලන ගමන ආරම්භ කරමින් එම විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා බවටද පත්වුණා. ජනතා විමුක්ති පෙරමුණට අයත් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටුවේද සාමාජිකයෙකු වූ ඒ මහතා සමාජවාදි ශිෂ්‍ය සංගමයේ කෑගල්ල දිස්ත්‍රික් සංවිධායකවරයා බවටද පත් වුණා. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී තරුණ සංගමයේ කෑගල්ල දිස්ත්‍රික් සංවිධායකවරයා ලෙසද එතුමා මිය යනතෙක්ම කටයුතු කළා. වසර 12ක දේශපාලන දිවිය තුළ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු වූ එතුමා රුවන්වැල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාද වෙමින් ප්‍රාදේශයේ සංවර්ධන කටයුතු සඳහා ඉමහත් දායකත්වයක් ලබා දී කටයුතු කරනු ලැබුවා.

කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩිම දෙවැනි මනාප ලබා ගනිමින් පාර්ලිමේන්තුවට තේරී පත්ව තම යුග මෙහෙවර දියත් කළ ඒ මහතා ජාතික ජන බලවේග රජයේ තරුණ ,ආකර්ෂණීය දේශපාලනඥයෙකු ලෙස ප්‍රශස්ත සේවයක් කළා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මාස පහකට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ජාතික මෙහෙවරක ප්‍රබල කොටස්කරුවකු බවට පත් වන සහ දේශපාලන ක්ෂේත්‍රයේ දිගු ගමනක් යන නායකයකු වන බවට ලකුණු කෝසල නුවන් මන්ත්‍රීතුමා පෙන්වමින් සිටියා.

ගරු කථානායකතුමනි, එතුමා කෝප් කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරනු ලැබුවා. කෝප් කමිටුව තුළ එතුමාගේ කටයුතු පිළිබඳ කෝප් කමිටුවේ සභාපතිතුමා එතුමා පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවකදී දැනුවත් කළා. එසේ ගොඩ නැඟෙමින් සිටියදී වයස අවුරුදු 38ක් වැනි අඩු වයසකදී 2025 අප්‍රේල් මස හය වන දින එතුමා හදිසියේ අප අතරින් සදහටම සමුගත්තා. අභාවප්‍රාප්ත ගරු කෝසල නුවන් ජයවීර සහෝදරයා විසින් කරන ලද පොදු ජන සේවය වෙනුවෙන් අප පක්ෂය ලෙසත්, පාර්ලිමේන්තුව ලෙසත් අපේ ගරුත්වය පුද කරන අතර, එතුමාගේ දෙමවුපියන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ඉල්ලා සිටිනවා.

ගරුකථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට තේරී පත්වන හැම මන්ත්‍රීවරයෙක්ම වැදගත් අය. නමුත් කෝසල මන්ත්‍රීතුමා ගැන මට කියන්න තිබෙන්නේ එතුමා ඊතලයක් වාගේ කෙටි, උදාර ජීවිතයක් ගත කළ කෙනෙකු බවයි. එතුමා ඉතාම ජනතාවාදී, ඉතාම ප්‍රායෝගික, ජනතාව සංවිධානය කිරීමේදී පපුවේ ඇවිළගත්ත ගින්නක් තිබ්බ්ච කෙනෙක්. මම හිතන විධියට එතුමාගේ අභාවය අපට අතිවිශාල පාඩුවක්, එම දෙමාපියන්ට පවුලේ අයට වාගේම.

ගරු කථානායකතුමනි, ඊළඟට, ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව මා ඉදිරිපත් කරන්න කැමැතියි.

යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ යටතේ 1989දී පාර්ලිමේන්තුවට තේරී පත්ව තම දිස්ත්‍රික්කයට මෙන්ම රටටද සේවයක් ඉටු කළ ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මා මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරනවා. සෝමසුන්දරම් නනිතම්බි මැතිතුමාට සහ දයාල්නායකි සෝමසුන්දරම් මැතිනියට දාව 1942 වසරේ යාපනයේදී ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා ජන්ම ලාභය ලැබුවා.

කන්කසන්තුරේ නඩේස්වර විද්‍යාලයෙන් සහ යාපනය තාක්ෂණ විද්‍යාලයෙන් සිප්සතර හැදෑරූ එතුමා ඉන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මූලික උපාධිය ද ඉන් අනතුරුව ඉන්දියාවේ චෙන්නායි හි අන්නාමලෙ විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හදාරනු ලැබුවා.

1964 සිට 1966 දක්වා ද්‍රවිඩ තරුණ ශිෂ්‍ය සංවිධානයේ ලේකම් ධුරය හෙබ වූ ඒ මහතා දෙමළ එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට අනුබද්ධ තරුණ පෙරමුණ හරහා සිය දේශපාලන දිවිය ආරම්භ කරමින් දෙමළ එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට අනුබද්ධ තරුණ පෙරමුණේ ක්‍රියාකාරිකයකු ලෙස කටයුතු කළා.

2001, 2004, 2010, සහ 2015 මැතිවරණවලදී දෙමළ ජාතික සන්ධානය යටතේ යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අඛණ්ඩව පාර්ලිමේන්තුවේ සිය ආසනය තහවුරු කර ගැනීමට සමත් වූ ඒ මහතා, 2014 වසරේ සිට ඉලංකෙයි තමිල් අරසු පක්ෂයේ නායකයා ලෙසත් කටයුතු කළා. 1980 වසරේදී බවනි සේනාධිරාජා මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවන් දෙදෙනෙකුගේ සහ දියණියකගේ දයාබර පියෙකි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 24ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සමස්ත රට වැසියාටම මෙහෙයක් ඉටු කළ එතුමා, වසර 82ක් ආයු වළඳා 2025 ජනවාරි මස 29 දින අප අතරින් සදහටම සමු ගත්තා.

ගරු කථානායකතුමනි, අමතර සටහන් වශයෙන් මම මේ දේ කියන්න ඕනෑ. එතුමා දිගු කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරපු කෙනෙක්. පාර්ලිමේන්තුව තුළ එතුමා සමඟ වසර 10ක පමණ කාලයක් මටත් විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් කථා කරන්න, ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා. එතුමා විමුක්ති දේශපාලනය හරහා පාර්ලිමේන්තුවට ආපු කෙනෙක්. පාර්ලිමේන්තුවට ආපු කෙනෙකු වුණත් ඒ විමුක්ති දේශපාලනය සම්බන්ධයෙන් එතුමාට තිබුණු අරමුණු වෙනුවෙන් දිගට කටයුතු කළ කෙනෙක්. දේශපාලන වශයෙන් වෙනස්කම් තිබුණත්, ඒ අරමුණු වෙනුවෙන් දිගටම පෙනී හිටපු කෙනෙක්, එතුමා.

අභාවප්‍රාප්ත මාවෙ සේනාධිරාජා මැතිතුමාට එතුමාගේ ආගම අනුව, එතුමාගේ විශ්වාසයන් අනුව එතුමාගේ බලාපොරොත්තු ඒ ආකාරයෙන්ම ඉෂ්ට වෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ දයාබර බිරිඳ, දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂය යටතේ 1989 වර්ෂයේදී පාර්ලිමේන්තුවට තේරී පත්ව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තම දිස්ත්‍රික්කයට මෙන්ම රටටද සේවයක් ඉටු කළ ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව, ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ජේ.එම්.ඩී. ජෝන් එඩ්වින් දිසානායක මැතිතුමාට සහ මැටිල්ඩා නන්දාවතී රණසිංහ මැතිනියට දාව ඩොනල්ඩ් දිසානායක මැතිතුමා 1941 වසරේදී කොළඹදී ජන්ම ලාභය ලැබුවා. ගම්පහ සිරිකුරුස, ශ්‍රී සිද්ධාර්ථ, කොළඹ ශාන්ත ජෝසප් සහ වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලවලින් සිය අධ්‍යාපන කටයුතු හැදෑරූ එතුමා ඉන්පසුව දේශපාලනයට පිවිසියා.

1965 වසරේදී ගම්පහ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් පත් වූ ඒ මහතා 1970 වසරේදී එහි උප නගරාධිපති ධුරය ද, 1988 වසරේ දී බස්නාහිර පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රී ධුරය ද හොබවනු ලැබුවා. 1989 වසරේදී එක්සත් ජාතික පක්ෂයෙන් තරග කොට පාර්ලිමේන්තුවට තේරී පත් වූ ඒ මහතා ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක හා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධීක්ෂණ මන්ත්‍රීවරයකු වශයෙන් සුවිශාල කාර්යභාරයක් ඉටු කර තිබෙනවා. එතුමා 1968දී දෝන ඉන්ද්‍රා රණසීලි දිසානායක මැතිනිය සමඟ විවාහ වූවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු පහක් පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සමස්ත රට වැසියාටම මෙහෙයක් ඉටු කළ එතුමා අවුරුදු 84ක් ආයු වළඳා 2025 අප්‍රේල් මස 06 දින අප අතරින් සදහටම සමු ගත්තා. ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, 2010 වර්ෂයේ ජාතික ලැයිස්තුවෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ පාර්ලිමේන්තුවට තේරී පත්ව, තම දිස්ත්‍රික්කයට මෙන්ම රටටද සේවයක් ඉටු කළ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

දොන් එඩ්මන් පීරිස් සූරියප්පෙරුම මැතිතුමාට සහ දෝන යශෝධරා රාජපක්ෂ මැතිනියට දාව 1928 වසරේදී ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා ජන්ම ලාභය ලැබුවා.

දොම්පේ විද්‍යාලයෙන් සහ හංවැල්ල මධ්‍ය මහා විද්‍යාලයෙන් සිප්සතර හැදෑරූ එතුමා ඉන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිය මූලික උපාධිය හදාරා කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය හදාරනු ලැබුවා.

දේශපාලන ක්ෂේත්‍රයෙහි විවාදාත්මක චරිතයක් වූ ඒ මහතා ව්‍යක්ත කවීකයකු ද වූවා. පාර්ලිමේන්තු විවාදවලදී සිය දැනුම යොදා ගනිමින් නොපැකිළව කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කළා.

1961 වසරේදී විමලා සූරියප්පෙරුම මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවකගේ සහ දියණියකගේ දයාබර පියෙක් වූවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 5ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සමස්ත රටවැසියාටම මෙහෙයක් ඉටු කළ එතුමා වසර 96ක් ආයු වළඳා 2025 ජනවාරි මස 02 දින අප අතරින් සදහටම සමුගත්තා.

අභාවප්‍රාප්ත ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාට, එතුමා ඇදහූ ආගම අනුව නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.33]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ හතරකින් මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න භාග්‍යය ලබා, අපෙන් සදහටම වෙන් වුණු මන්ත්‍රීවරුන් සිව්දෙනෙකු ගැන ශෝක යෝජනා ඉදිරිපත් කරද්දී, අද දින මද අසනීප ගතියෙන් පසුවන නිසා මේ ශෝක යෝජනාවලට ඉදිරිපත් වෙන්න බැරි වුණු විපක්ෂ නායකතුමන් වෙනුවෙනුත්, සමගි ජන බලවේගය වෙනුවෙනුත්, පෞද්ගලිකව මගේත් සංවේගය පළ කරන්නට අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

පළමුවෙන්ම, මේ සභාව නියෝජනය කරමින් සිටියදී අපෙන් සමුගත් ගරු කෝසල නුවන් ජයවීර තරුණ මන්ත්‍රීතුමා පිළිබඳව අපේ සංවේගය පළ කළ යුතුව තිබෙනවා. එතුමා මේ සභාව නියෝජනය කළේ ඉතාම කෙටි කාලයක් නිසා අපට වැඩිපුර එතුමාට සමීප වෙලා ආශ්‍රය කරන්න ඉඩකඩක් ලැබුණේ නැහැ. නමුත්, එතුමාගේ අභාවයෙන් පසු සමකාලීනව අධ්‍යාපනය ලැබූ විද්‍යාර්ථීන්, ඒ වාගේම එතුමාගේ ගමේ හිත මිත්‍රයින්, විශේෂයෙන්ම සමාජ මාධ්‍යවල පළ කර තිබුණු තොරතුරු බොහොමයක් පරිශීලනය කළාම අපට දැනගන්න ලැබුණු දේ තමයි කෝසල නුවන් ජයවීර චරිතය තුළ ඉතා විශිෂ්ට මානව හිතවාදී මනුස්සයෙක් ජීවත් වෙලා සිටියාය කියන එක. ඒ වාගේම, ගුණවත් තරුණ මන්ත්‍රීවරයකු හැටියට මේ රට වෙනුවෙන් ඉටු කරන්න මොන තරම් විශාල බලාපොරොත්තු සමුදායක් ඒ තරුණ මන්ත්‍රීවරයාගේ හිතේ තිබෙන්න ඇද්ද කියා අපට හිතාගන්න පුළුවන්.

එතුමා ශිෂ්‍ය ජීවිතයේදීත් ඉතාම ක්‍රියාකාරී ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙක් වුණා. තරුණ සංවිධානවල හොඳ නායකයෙක් වුණා. වසර 3ක් තමන්ගේ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී ධුරය තුළින් විශාල වැඩ කොටසක් ප්‍රදේශයට කරන්න සමත් වුණා. එතුමාගේ ගමන් මාර්ගය අවසන් වුණේ පසුගිය මහ මැතිවරණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 62,000කට ආසන්න සංඛ්‍යාවක් ලබාගෙන එතුමාගේ පක්ෂයේ දෙවැනියා වශයෙන් මේ පාර්ලිමේන්තුවට පත් වීමෙන්. මේ තුනෙන් දෙකකට එහා ගිය 159ක් සිටින පිලක සීමිත පිරිසකට පමණක් ලැබෙන කෝප් කමිටුව වාගේ කමිටුවක සේවය කරන්නටත් එතුමාට භාග්‍යය ලැබුණා. එතුමාගේ සේවය තවදුරටත් ලබා ගන්නට තිබියදී තමයි අපට එතුමාව අහිමි වුණේ. එතුමා අභාවප්‍රාප්ත වුණාම, නොසිතූ වෙලාවක ඒ පුවත කණ වැකුණාම මොන තරම් ප්‍රභූවරු පිරිසක් වාගේම සාමාන්‍ය පොදු ජනතාව ඒ වෙනුවෙන් ශෝක වෙමින් ඒ අවමංගල්‍ය අවස්ථාවට සහභාගි වුණාද කියලා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මේ වාගේ අවස්ථාවල අපි බොහෝ මන්ත්‍රීවරු ගැන කථා කරනවා. අපි ඒ වෙලාවලදී කියන්නේ එතුමා වයස මේ ප්‍රමාණයේදී තමයි පාර්ලිමේන්තුවට පත් වුණේ, මෙච්චර අවුරුදු ප්‍රමාණයක් පාර්ලිමේන්තුවේ කටයුතු කළා, මිය යනකොට වයස මෙච්චරයි කියලායි. අභාවප්‍රාප්ත ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා පිළිබඳව අපට කියන්න සිද්ධ වෙන්නේ, එතුමා පාර්ලිමේන්තුවට එනකොටත් වයස අවුරුදු 38යි, පාර්ලිමේන්තුවෙන් සමු ගන්නා විටත්, දිවි ගමනට සමු දෙන විටත් වයස අවුරුදු 38යි කියලා. ඒ ගැන අවංකවම අපි කනගාටු වෙනවා. තව බොහෝ සේවාවක් රටටත්, පළාතටත් කරන්න පුළුවන්කම තිබියදී වටිනා තරුණ මන්ත්‍රීවරයෙකුගේ ජීවිතය මේ විධියට අහිමිවීම ගැන අපි කනගාටු වෙනවා. මම එතුමා පිළිබඳව කථා කරන්න මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම මුලින් කිව්වා වාගේම, අපේ ගරු විපක්ෂ නායකතුමා එතුමාගේ දේහයට අවසන් ගෞරව දක්වන්න පෞද්ගලිකවම ඒ නිවසට ගියා. අදත් එතුමා වෙනුවෙන් ඒ දෙමව්පියන්ටත්, ඥාතීන්ටත් අපේ පක්ෂයේ සංවේගයත්, පෞද්ගලිකව මගේ සංවේගයත් පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාව නියෝජනය කරපු තවත් සුවිශේෂී චරිතයක් ගැනත් අපි කථා කළ යුතුව තිබෙනවා. ඒ තමයි, අභාවප්‍රාප්ත ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා. උතුරේ වාර්ගික අර්බුදයක් තිබුණු යුගයක, අවි ආයුධවලින් ප්‍රශ්නයට විසඳුම් ලබා ගන්න පුළුවන් කියලා හිතන පිරිසකුත් සිටියදී, තවත් පිරිසක් දේශපාලන විසඳුමක් ගැන විශ්වාසය තබා තිබියදී, එවැනි අර්බුදකාරී සමයක ප්‍රජාතන්ත්‍රවාදී මාවත කෙරෙහි විශ්වාසය තැබූ උතුරෙන් බිහි වුණු බොහොම කෘතහස්ත දේශපාලනඥයෙකු හැටියටයි අපි එතුමාව දකින්නේ. එතුමා නියෝජනය කළේ උතුරේත්, දකුණේත් දේශපාලනය යා කරන ප්‍රජාතන්ත්‍රවාදී පාලම ගොඩ නඟන දේශපාලනයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා සහ අපි එක මතයක් දරපු උදවිය නොවෙයි. අපි දරපු මතයත්, එතුමා දරපු මතයත් බොහෝ වෙලාවට සමපාත වුණේ නැහැ. නමුත් සාකච්ඡා මේසයකට ඇවිල්ලා වාඩිවුණාම, සිය අදහස් පළ කිරීමේදී එතුමාට තිබුණු ආත්ම සංයමය ඉතාම ආදර්ශවත් එකක් බව මා කිව යුතුව තිබෙනවා. බාහිර ස්වරූපය ගත්තොත්, හොඳ දේහධාරී කැපී පෙනෙන පෞරුෂයක් එතුමාට තිබුණා. දෙනෝදාහක් අතර ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා කැපී පෙනුණා. ඒ, එතුමාගේ පෞරුෂය නිසා. ඊට නොදෙවෙනි ශාස්ත්‍රීය දැනුමකුත් ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා සතුව තිබුණා. අපි මේ ගරු සභාවේදී ඉතාම සුහදව එතුමාව ඇසුරු කළා. මම ඉඩම් අමාත්‍යාංශය භාර ඇමතිවරයා හැටියට ඉන්නකොට, එතුමා ඇවිල්ලා බොහොම සුහදව උතුරේ ඉඩම් ප්‍රශ්න ගැන සාකච්ඡා කරපු හැටි, ඒවාට උදවු ගත් හැටි මට මේ වෙලාවේදීත් මතක් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා ඉපදුණේ යාපනයේ. එතුමා ඒ ප්‍රදේශයේම අධ්‍යාපනය ලැබුවා. ඒ ප්‍රදේශයම නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ආවත්, කවදාවත් ගම් ප්‍රදේශය අතහැරලා කොළඹ පදිංචි වෙන්න එතුමා කල්පනා කළේ නැහැ. එතුමා ඒ ප්‍රදේශයේම තමයි පදිංචි වුණේත්, ජීවත් වුණේත්. එතුමා අවසන් හුස්ම හෙළුවේත් යාපනයේදීමයි. එතුමා කෝවිලට යමින් පූජා පවත්වමින්, තල් අතු පවුරු අතර සිට දෙමළ සංස්කෘතිය ආරක්ෂා කරන්නට හැම තිස්සේම ප්‍රයත්න දරපු නායකයෙක්. එතුමා නිරන්තරයෙන්ම තම ඡන්ද දායකයින් සමඟ සිටියා. දෙමළ ජනතාවට ඇහුම්කන් දෙමින්, ඒ අයගේ ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න විසඳන්න, උතුරේ මායිම් නිදහස් කිරීම් ගැන තර්ක කරන්න, දෙමළ ජනයාගේ දේශපාලන නිදහස වෙනුවෙන් පෙනී සිටින්න කටයුතු කරපු නායකයෙක් තමයි ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා. ඒ වාගේම එතුමා මේ ප්‍රශ්නවලදී ඉන්දියාවේ මැදිහත්වීමත් අපේ රටට ලොකු ආශීර්වාදයක් කියලා හුඟක් වෙලාවට කල්පනා කළා. ඒ වාගේ විශිෂ්ට දේශපාලනඥයෙකු අපට අහිමිවීම ගැන අපේ සංවේගය පළ කරමින්, එතුමාගේ පවුලේ අයට ගරු විපක්ෂ නායකතුමාගේත්, සමගි ජන බලවේගය පක්ෂයේත්, පෞද්ගලිකව මගේත් සංවේගය මේ අවස්ථාවේදී පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාව නියෝජනය කරපු තවත් සුන්දර පුද්ගලයෙකු තමයි, අභාවප්‍රාප්ත ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා. එතුමාත්, අපිත් එක පක්ෂයක කටයුතු කළා. ඒ තමයි, එක්සත් ජාතික පක්ෂය. ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා ගම්පහ සිරි කුරුස විද්‍යාලය, ශ්‍රී සිද්ධාර්ථ කුමාර මහා විද්‍යාලය, ශාන්ත ජෝසප් විද්‍යාලය, වේයන්ගොඩ

බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය වාගේ විද්‍යාල ගණනාවක අධ්‍යාපනය ලැබුවා. එතුමා පාසල් අධ්‍යාපනයෙන් පස්සේ එංගලන්තයට ගියා. එංගලන්තයට ගිහිල්ලා කෘෂි කාර්මික යන්ත්‍ර ඉදිකිරීම් පිළිබඳ පාඨමාලාවක් හැදෑරුවා. එතුමා ලංකාවට ඇවිල්ලා ඒ ලබා ගත් දැනුම ප්‍රයෝජනයට ගත් කෙනෙක්. එතුමාට පුළුවන් වුණා, කෘෂි උපකරණ නිපදවන කර්මාන්තශාලාවක් පටන් ගන්න. "ට්‍රැක්මෝ සමාගම" කියා ඒක නම් කළා. ඒක අද කොච්චර ප්‍රසිද්ධද කියනවා නම් නුවර පාරේ යනකොට එක හන්දියක් තිබෙනවා, මිනිස්සු ඒ හන්දිය නම් කර තිබෙන්නේ - ව්‍යවහාරයට පාවිච්චි කරන්නේ- "ට්‍රැක්මෝ හන්දිය" කියලා. එතුමා ඒ තරම් විශිෂ්ට පුද්ගලයෙක්. එතුමා දේශපාලනයට පැමිණි පසු නාගරික මන්ත්‍රීකම් කළා, උප නගරාධිපතිකම් කළා, බස්නාහිර පළාත් සභාව නියෝජනය කළා, 1989දී පාර්ලිමේන්තුවටත් ආවා.

එතුමා 1989දී පාර්ලිමේන්තුවට ආවේ ගම්පහ ආසනය නියෝජනය කරමින්. ඒ වන විට ගම්පහින් අවුරුදු 17කට යූඑන්පී එකේ මන්ත්‍රීවරයෙකු ඇවිත් හිටියේ නැහැ. එතුමා ආ පසු ඒ අඩුව සම්පූර්ණ වුණා. ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක හැටියට එතුමා ලොකු කාර්යභාරයක් ඉෂ්ට කළා. කෝප් කමිටුවේ සාමාජිකයෙකු හැටියටත් එතුමා කටයුතු කළා. එතුමා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියටත් සේවය කරමින් දුම්රිය ස්ථාන සංවර්ධනය වෙනුවෙන් ලොකු කැපවීමකින් යුතුව කටයුතු කළා. යක්කල ජනතා සන්තක ප්‍රවාහන ආයතනයට -ඒ ඩිපෝ එකට- ඒ කාලයේ හැටියට බස් 16ක් ලබා දෙන්නට එතුමාට පුළුවන් වුණා. අපි ඉස්කෝලේ යන කාලයේ දැක තිබෙනවා, ඒ කහ පාට බස්. "කහ කුරුල්ලෝ" කියලා තමයි එවක සමාජය ඒ බස් හැඳින්වූයේ. එවැනි බස් 16ක් ගෙන්වා ගන්න එතුමාට පුළුවන් වුණා.

ගම්පහ මූලික රෝහලට ගැබිනි මව්වරුන් සඳහා වාට්ටු සංකීර්ණයකුත්, දැඩි සත්කාර ඒකකයක් සහ ඒකට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා දෙන්නත් එතුමා මුල් වුණා. ඒ වාගේම එතුමා විහාරස්ථානවලටත් ලොකු සේවයක් ඉෂ්ට කළා. "ඩොනල්ඩ් දිසානායක පදනම" පිහිටුවා අධ්‍යාපනය ලබන සාමණේර ස්වාමීන් වහන්සේලාට ශිෂ්‍යාධාර ලබා දෙන වැඩසටහනකුත් එතුමා ක්‍රියාත්මක කළා. ඒ වාගේම ශ්‍රී බෝධි ක්‍රීඩාංගණය හදා ගම්පහ තක්ෂිලා විද්‍යාලය ආරම්භ කරන්නත් එතුමා පුරෝගාමී වී විශාල මෙහෙවරක් ඉෂ්ට කළා. ඇත්තවශයෙන්ම එතුමා බෞද්ධයින්ට විතරක් නොවෙයි, ඉස්ලාම් භක්තිකයන්ට සහ කතෝලික ජනතාවටත් සේවය කළා, පල්ලිවලටත් උදවු කළා. එතුමා ඒ මිනිස්සුත් එක්ක ජීවත් වුණා. එතුමාට එම සේවය හොඳින් ඉෂ්ට කරන්න හොඳ භාර්යාවකුත් ලැබුණා. යසෝධරා බාලිකා විද්‍යාලයේ ගුරුවරියක් හැටියට කටයුතු කර විශ්‍රාම ගොස් සිටින ඉන්ද්‍රා දිසානායක මැතිනිය හෙවණැල්ලක් වාගේ එතුමාගේ දේශපාලන කටයුතුවලටත්, අනෙකුත් ව්‍යාපාර කටයුතුවලටත් උදවු වුණා.

එතුමා හොඳ පරිසර හිතකාමියෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා සහ අපි පරිසර දිනය නිමිත්තෙන් ඊයේ පැළ හිටෙව්වා. ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමාත් පැළ හිටවන සිරිතක්, පුරුද්දක් තිබුණු පරිසර හිතකාමී පුද්ගලයෙක්. එතුමා ළමා මධ්‍යස්ථාන ඇති කළා, පෙර පාසල් ඇති කළා, ජපන් රජය සමඟ තිබුණු සම්බන්ධතාවලින් ඒවා වැඩිදියුණු කරන්න ලොකු කාර්යභාරයකුත් ඉෂ්ට කළා. එතුමා ගම් උදා පවා ඇති කළා. එතුමාට ප්‍රේමදාස ජනාධිපතිතුමා එක්ක සමීප ආශ්‍රයක් තිබුණා. කවුරුත් ගරු කළ චරිතයක් හැටියට තමයි එතුමා ජීවත් වුණේ.

අද විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා වෙනුවෙන් විතරක් නොවෙයි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා වෙනුවෙනුත් මා මේ මොහොතේ ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමාගේ පවුලේ උදවියට සංවේගය ප්‍රකාශ කර සිටිනවා. මොකද, හර්ෂණ රාජකාරුණා මන්ත්‍රීතුමාට තානාපති කාර්යාලයක උත්සවයකට යන්න වුණු නිසා අද දින පාර්ලිමේන්තුවට එන්න බැරි වෙන බව කිව්වා. ඒ නිසා එතුමාගේ සංවේගයත් මේ මොහොතේ පළ කරන්න කියලා මගෙන් ඉල්ලීමක් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩොනල්ඩ් දිසානායක නම් ඒ වටිනා දේශපාලනඥයාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, එම මැතිනියට අපගේ සංවේගය පළ කරන ලෙස ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අද දින ශෝක ප්‍රකාශ යෝජනා යටතේ කථා කරන තවත් ජනප්‍රිය චරිතයක් තමයි, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා. ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා සුවිශේෂී දේශපාලනඥයෙක්, ඉතාම ජනප්‍රිය, චතුර කථිකයෙක්. මට මතකයි, අපි කොළඹ රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යයන් හැටියට සිටියදී බණ්ඩාරනායක මැතිනියගේ රැස්වීමක් කොහේ හෝ තිබෙනවා කිව්වොත්, ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාගේ කථාව අහන්න අපි ගිය හැටි. අපි හරිම ආසයි, ඒ කථාව අහන්න. සාමාන්‍ය මිනිහාට ගැළපෙන විධියට, හොඳට අර්ථවත්ව යමක් විග්‍රහ කරන්න පුළුවන් සහජ හැකියාවක් එතුමාට තිබුණා. එතුමා අභියෝග භාර ගත් කෙනෙක්. ඒ කාලයේ බණ්ඩාරනායක මැතිනියගේ ආසනය වුණේ අත්තනගල්ල. අත්තනගල්ලෙන් මැතිනියත් එක්ක තරග කරන්න යූඑන්පී එකෙන් එදා ඉදිරිපත් වුණේ සූරියප්පෙරුම මැතිතුමා. මැතිනියගේ ආණ්ඩුව අවුරුදු 2කින් කාලය දිගු කර ගත්තාම, 1975දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජන මතය පෙන්වන්න ඕනෑය කියා පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් වෙලා, කොළඹින් ඡන්දය ඉල්ලුවා. එතකොට සූරියප්පෙරුම මැතිතුමා හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. අභියෝගය භාර ගෙන ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් එක්ක ඡන්දය ඉල්ලන්න සූරියප්පෙරුම මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ප්‍රතිවාදියා හැටියට තරග කළා. එතුමා ඒ වාගේ චරිතයක්.

පසු කාලයේ එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් වුණා. එතුමා සුදු ඇඳුමින් තමයි හැම තිස්සේම සැරසී හිටියේ. ඒ වාගේම හරි පිළිවෙළට හිටියා. හරිම ප්‍රසන්න චරිතයක්. හැම තිස්සේම ප්‍රසන්න, පුළුල් හිනාවක් එතුමාගේ මුහුණේ දකින්න තිබුණා. එතුමා සමඟ කථා කරපු, එතුමා සමඟ ගත කරපු, ඇසුරු කරපු හැම මොහොතක්ම ප්‍රියජනක මතක සටහන් ලෙස අපේ හිත්වල තැන්පත් වෙලා පවතිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට ප්‍රධානම හේතුව තමයි, විවිධ විෂයයන් පිළිබඳව ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා සතුව පැවති ඇදහිය නොහැකි දැනුම් සම්භාරය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට ලෝක ඉතිහාසය ගැන හොඳ දැනුමක් තිබුණා; ලෝක දේශපාලනය ගැන හොඳ දැනුමක් තිබුණා; විවිධ සංස්කෘතීන් ගැන -විශේෂයෙන්ම බෞද්ධ දර්ශනය ගැන- පුදුම දැනුමක්, හසළ අවබෝධයක් එතුමා සතුව තිබුණා. තමන්ගේ දැනුම නිතරම යාවත්කාලීන කර ගන්න සමත් වූ කෙනෙක්, එතුමා. අපේ ජොෂ්ඨයන්ගේ පරපුරේ අපට ඇසුරු කරන්න හමු වූ විශිෂ්ටතම සංවේදිකයා ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාය කියලා මම විශ්වාස කරනවා. එතුමා කථා කරපු හැම වචනයකම, හැම ඉස්පිල්ලකම, පාපිල්ලකම වටිනාකමක් තිබුණා. එතුමා "දොරමඬලාව" වාගේ ජනප්‍රිය වැඩසටහන් පෝෂණය කළා; අර්ථවත් කළා. සියනෑ කෝරළයේ පරිසරයත් සමඟ ජීවත් වූ නිර්ව්‍යාජ, සරල ගැමියෙකු ඔහු තුළ හැමදාම ජීවත් වුණා කියලා අපට දකින්න ලැබුණා. බුලත් විටක රස බලන්න එතුමා බොහෝ වෙලාවට ප්‍රිය කළා. එතුමා සරල, සුන්දර මනුස්සයෙක්. එතුමා දැනුම් සම්භාරයක්; විශ්වකෝෂයක්. මම තරුණ මන්ත්‍රීවරයෙකු හැටියට ඒ කාලයේ ඉන්නකොට මම එතුමාව බොහොම ප්‍රිය කළා. දේශපාලනයේදී අපි දෙපැත්තක හිටියේ. මම එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශක හැටියට හිටපු කාලයේ මාධ්‍ය ප්‍රකාශයක් කරලා ඒක පත්තරේ පළ වුණාම එතුමා ඒක

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කියවනවා. පාර්ලිමේන්තුවේ ඉන්නකොට එතුමා සභා ගර්භයේ පිටිපස්සේම ආසනයක හිටියේ. අපි කථා කරනකොට එතුමා අහගෙන ඉන්නවා. සභා ගර්භයෙන් එළියට ආවාම ඒවා මතක තියාගෙන ඉඳලා එතුමා අපත් සමඟ ඒ ගැන කථා කරනවා. එතුමා අපට දිරිය දුන්නා. ඒ වාගේ වටිනා මනුස්සයෙක් අපට අහිමි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ජීවිතයේ අවසන් දශක කිහිපය ගැන හිතනකොට, එතුමාගේ වියෝවෙන් දේශපාලන ක්ෂේත්‍රයට වඩා ශාස්ත්‍රීය ලෝකය තුළ විශාල හිඩැසක් ඇති වෙලා තිබෙනවා කියලා තමයි මම විශ්වාස කරන්නේ. එතුමා විශ්වවිද්‍යාලවලින් ගෞරව උපාධි ලැබුවා; ආචාර්ය උපාධි ලැබුවා. එතුමා දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව වැනි විෂයයන් ගැන පොත් රාශියක් ලිව්වා. ඒ වාගේම, කොළඹ ආනන්ද විද්‍යාලයේ කීර්තිමත් ගුරුවරයෙකු හැටියටත් එතුමා කාලයක් සේවය කළා. එතුමා දක්ෂ දේශකයෙක්. එතුමාට ප්‍රධාන දේශකයා හැටියට සහභාගි වෙන්න කියලා නොයෙකුත් විහාරස්ථානවලින් ආරාධනා ලැබුණා. ඒ හැම එකකටමත් එතුමා සහභාගී වුණා. එතුමාගේ අභාවයෙන් සංවේගයට පත් වී සිටින දරුවන්ටත්, ඥාතීන්ටත් අපේ සංවේගය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා. විපක්ෂ නායකතුමාගේත්, සමගි ජන බලවේගයේත්, එතුමාව කිට්ටුවෙන් ඇසුරු කරපු, එතුමා ප්‍රිය කරපු චරිතයක් හැටියට හිටපු මගේත් පෞද්ගලික සංවේගය මේ වෙලාවේ පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර ඇති ගරු මන්ත්‍රීතුමන්ලා සිව්දෙනා ගැන අපේ ශෝකය ප්‍රකාශ කරන්න ඉඩක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එම ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාටම නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, එතුමන්ලාගේ ආගම්වලට අනුව ඒ ප්‍රාර්ථනාවන් ඉෂ්ට වෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Rauff Hakeem.

[පූ.භා. 11.50]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපගේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කළ පරිදි පක්ෂ 4ක් නියෝජනය කරමින් මේ සභා ගර්භය තුළ කටයුතු කරපු මන්ත්‍රීවරු සිව්දෙනෙකුගේ අභාවය පිළිබඳව අද ශෝකය ප්‍රකාශ කිරීමට අපට අවකාශය ලැබී තිබෙනවා. අභාවප්‍රාප්ත එම ගරු මන්ත්‍රීවරුන් අතුරින්, ඉතා මෑතකදී මෙම පාර්ලිමේන්තුවට නවකයෙකු හැටියට පැමිණ අප ජීවිතයේ අනිත්‍යභාවය සනිටුහන් කරමින් යෞවන වයසේදීම අප අතරින් වෙන් වූ ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමා පිළිබඳව මම ප්‍රථමයෙන්ම කථා කරන්න කැමතියි. එතුමාගේ එම අහිමි වීම පිළිබඳව අපි කවුරුත් කනගාටු වෙනවා. එතුමන්ගේ ජීවිත කථාව දිහා බලනකොට විශේෂයෙන්ම මම කියන්න කැමතියි, එතුමාගේ පියාණන් වන සේනං සිංඤෝ මහත්මයා වඩු කාර්මිකයෙක් බව. එවැනි පවුලකින් පැමිණ විවෘත විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ නායකයෙකු හැටියට පත් වෙන තරමට නායකත්වය හෙබවූ කෙනෙක්, එතුමා. ඒ විතරක් නොවෙයි, මාස 5ක් වැනි කෙටි කාලයක් මෙම සභා ගර්භය තුළ කටයුතු කළත්, කථා ශෛලියෙන් වාගේම විමසිලිමත්භාවයෙන් එතුමා හොඳ සටහනක් අප අතර තබා ගොස් ඇති බව පෙනී යනවා.

එතුමන්ගේ පියාණන් ඇත්තවශයෙන්ම තුන් කෝරළයේ පතාක යෝධයෙක් විධියටයි අපි දකින්නේ. අපි කවුරුත් දන්නවා, තුන් කෝරළය කියන්නේ ලංකා සම සමාජ පක්ෂයේ බලකොටුවක් බව. ඒ බලකොටුවේ තුන්කෝරළයේ පතාක යෝධයෙක් හැටියට සම සමාජ පක්ෂය නියෝජනය කරපු පියෙකුගේ පුතෙක් තමයි ඉන්පසුව ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් හැටියට ඒ වාමාංශික බලවේගයේ වෙනත් විප්ලවීය දේශපාලන ව්‍යූහයකට පැමිණියේ. හෘදයාබාධයකින් තරුණ වියේදීම අපි අතරින් වෙන් වී ගියත් එතුමා මේ සභා ගර්භය නියෝජනය කළ කෙටි කාලය තුළදී හොඳ සටහනක් තබමින් ඉටු කරපු ක්‍රියාදාමය අතිමහත්. අපි කවුරුත් දන්නවා, රුවන්වැල්ල, දැරණියගල, යටියන්තොට කියන මැතිවරණ කොට්ඨාස හැම එකකින්ම විශාල ජයග්‍රහණයක් එතුමා තමන්ගේ පක්ෂයට කෙටි කාලයක් තුළ අරගෙන දුන්නු බව. එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ පක්ෂයේ ශෝකය එම පවුලේ හැමදෙනාටම ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම අප අතරින් වෙන් වී ගිය ගම්පහ දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවත් අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ගම්පහ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු වශයෙනුත්, බස්නාහිර පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙනුත්, එක්සත් ජාතික පක්ෂ රජය සමයේ ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක හැටියටත් කටයුතු කරමින් එතුමා තමන් නියෝජනය කරපු ගම්පහ දිස්ත්‍රික්කයට මහඟු සේවාවක් ඉටු කළා. එතුමාටත් නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ පවුලේ ඥාති මිත්‍රාදීන්ටත් අපේ ශෝකය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කරපු ආකාරයට, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා කියන්නේ මේ රටේ බිහි වුණු ඉතාම දක්ෂ කර්තෘයන් අතරේ, දේශපාලනඥයන් අතරේ මුල් පෙළේ හිටපු කෙනෙක්. එහෙම තමයි අපි කවුරුත් එතුමාව දැක්කේ. මට අද වාගේ මතකයි, 1970 ගණන්වල දේශපාලන වේදිකාවල ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා ඉතා බලවත් පතාක යෝධයෙක් හැටියට කටයුතු කළ ආකාරය. එතුමාගේ කථාවලට ඇහුම්කන් දෙන්න අපි කවුරුත් ගිය කාලයක් තිබුණා. එතුමා දක්ෂ කර්තෘයෙක් විතරක් නොවෙයි. ගුවන්විදුලියේත්, රූපවාහිනියේත්, වේදිකාවේත්, මැති සබයේත්, මැරෙන මොහොත දක්වාම, මේ රටේ සියලු ප්‍රබුද්ධ මාතෘකා පිළිබඳව උගන්වපු හොඳ කර්තෘචාර්යවරයෙක් හැටියටත් අපිට එතුමාව හඳුන්වා දෙන්න පුළුවන්. කෙටි කාලයක් එතුමා ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙක් හැටියට කටයුතු කළා. ඉන්පසුව එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පිට වුණාට පස්සේ එතුමා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයට බැඳුණා කියලා තමයි අපි දන්නේ. එතුමා ආනන්ද විද්‍යාලයේ උගන්වපු කාලයේ "දේශපාලන දර්ශන විග්‍රහය" කියන කෘතිය ලිව්වා. ලෝක ඉතිහාසයත්, මාක්ස් - ලෙනින්වාදය පදනම් කර විග්‍රහ කළ මේ මාහැඟි ග්‍රන්ථය 1971 කැරැල්ල සමයේ විප්ලවවාදී තරුණයන්ට අත්පොතක් වුණා කියාත් සඳහන් වෙනවා. එවැනි නායකයෙක් තමයි, අභාවප්‍රාප්ත ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්ව පරිදි, රටේ

නායකයෝ ඉදිරිපත් වුණු මැතිවරණ කොට්ඨාසවලට එතුමා අපේක්ෂකයෙක් හැටියට ඉදිරිපත් වෙලා පරාජයට පත් වුණත්, ඒ වාගේ අභියෝග භාර ගන්නා කෙනෙකු හැටියට එතුමාට තමන්ගේ පක්ෂය විසින් නිසි තැන ලබා දුන්නා. අත්තනගල්ල ආසනයට ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟත් එතුමා තරග කළා. ඒ වාගේම එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳුණාට පස්සේ ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එක්ක කොළඹ දකුණ කොට්ඨාසයට තරග කරලා පැරදුණත්, එතුමා ඒ කාලයේ එවැනි අභියෝග භාර ගත් විශේෂ චරිතයක් හැටියට අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ගේ අභාවය පිළිබඳව මගේ කනගාටුව පළ කරන අතර, එතුමාගේ මුද්‍රිත පොත්වලට අමතරව, විවිධ පුවත්පත්, සඟරාවලට සැපයූ ලිපි ලේඛන එකතු කර නැවත පළ කරන්නේ නම් එය මහඟු බුද්ධිමය සම්ප්‍රදායක් වීම සහතික යැයි කියලාත් කවුද ලියලා තිබෙනවා මම දැක්කා. ඒ පිළිබඳවත් සඳහන් කරමින්, එතුමාගේ පවුලේ සියලුදෙනාටම ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය වෙනුවෙන් මාගේ ශෝකය පළ කර සිටිනවා.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! அனுதாபப் பிரேரணையிலே இறுதியாக, தமிழ்த் தேசியப் பரப்பிலே தனிப் பெரும் தலைவராக இருந்த தந்தை செல்வா, அண்ணன் அமிர்தலிங்கம், அண்ணன் சிவசிதம்பரம் போன்ற தமிழரசுக் கட்சியின் பெரிய தலைமைகளோடு ஆறு தசாப்த காலம் பணியாற்றி, தமிழர் தேசிய அரசியலில் மிகப் பெரும் தாக்கத்தைச் செலுத்திய தலைவர் அமரர் மாவை. சேனாதிராஜா அவர்களின் மறைவுக்கு என்னுடைய அஞ்சலியைச் செலுத்துகின்றேன். குறிப்பாக, 1960ஆம் ஆண்டில் மார்ச் மாதத்திலும், யூலை மாதத்திலுமாக இரண்டு பொதுத் தேர்தல்கள் இலங்கையில் நடைபெற்றன. இந்த இரண்டு தேர்தல்களிலும் அன்று இலங்கைத் தமிழரசுக் கட்சி 15 - 16 ஆசனங்களை வென்றெடுத்த நிலைமை காணப்பட்ட தற்குக் காரணம் 'சிங்களம் மட்டும் அரசகரும மொழி' என்று சட்டம் வந்ததுதான். அதன் காரணமாகத் தமிழ் தேசியப் பரப்பிலே வெடித்த மிகப்பெரிய புரட்சி என்பது யாவருக்கும் தெரிந்ததே. அந்தப் புரட்சியின்போது இலங்கைத் தமிழரசுக் கட்சியின் ஒரு முக்கியஸ்தராக, இளைஞர் அணித் தலைவராக இணைந்து தொடர்ந்தும் தமிழ் மக்களின் உரிமைகளுக்காகப் போராடி, கிட்டத்தட்ட 10 தடவைக்கு மேல் சிறைவாசம் அனுபவித்த ஒருவராக அண்ணன் மாவை. சேனாதிராஜா அவர்களைக் காண்கின்றோம்.

அண்ணன் மாவை. சேனாதிராஜா அவர்கள் இந்தப் பாராளுமன்றத்துக்கு முதலிலே 1989ஆம் ஆண்டிலும், பின்னர் 1999ஆம் ஆண்டிலும் தமது கட்சித் தலைவர்களுடைய மரணத்திற்குப் பிற்பாடு நியமிக்கப்பட்ட உறுப்பினராக வருகைதர நேர்ந்தது. அதற்கு முன்னர் அவர் தோற்றிய இரண்டு தேர்தல்களிலும் தோல்வியைத் தழுவ நேர்ந்தாலும் கூட, தமது கட்சித் தலைவர்களின் இறப்புக்குப் பிற்பாடு, அந்த இடத்திற்கு அவரைப் பதிலீடு செய்ததன்மூலம் எவ்வளவுதூரம் அவர் கட்சியின் முக்கியஸ்தராகக் கருதப்பட்டார் என்பது தெளிவாகின்றது. அப்படியான ஒரு தலைவரை நாம் இன்று இழந்து தவிக்கின்றோம் என்பது மாத்திரமல்ல, அவருடைய சகவாசத்தில் சுகானுபவத்தை அனுபவித்த நாங்கள் இன்றும் அவருடைய இழப்பைத் தாங்க முடியாதவர்களாக இருக்கின்றோம்.

அண்ணன் மாவை. அவர்கள் எங்களுடைய தலைவர் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்களோடு நெருங்கிப் பழகிய ஒரு நண்பராக இருந்தது மாத்திரமல்ல, 1989இலிருந்து எங்களுடைய தலைவர் 2000ஆம் ஆண்டு மரணிக்கும் வரையும் தொடர்ந்தும் எங்களுடைய தலைவரது இல்லத்திலும், அவருடைய கட்சிக் காரியாலயத்திலும் அடிக்கடி சந்தித்து, தமிழ், முஸ்லிம் உறவு சம்பந்தமான பல பிரச்சினைகள் பற்றியும், நாட்டின் தேசியப் பிரச்சினைகள் பற்றியும் நாங்கள் பேசியிருக்கின்றோம். இந்த நாட்டின் தேசியப் பிரச்சினைக் கான தீர்வைக் காண்கின்ற விடயத்திலே பல தெரிவுக் குழுக்களிலே ஒன்றாக எங்களுடைய மறைந்த தலைவரோடு இணைந்து பணியாற்றியதைப் போன்று, நான் பாராளுமன்றத் திற்குள் பிரவேசித்த 1994ஆம் ஆண்டிலேயிருந்து அவர் மரணிக்கும்வரை பல தடவை எங்களுக்குள்ளே நாங்கள் அளவளாவி இருக்கின்றோம்; பேசியிருக்கிறோம். தமிழ்த் தேசியப் பிரச்சினைக்கான தீர்வில், முஸ்லிம்களுடைய வகிபாகம் சம்பந்தமாக, முன்னேற்றகரமான கருத்துகளைக் கொண்டிருந்த ஒரு தலைவராக இருந்த அவருடைய இறப்பை எங்களுக்கும் ஒரு பேரிழப்பாக நாங்கள் கருதுகின்றோம்.

ஒருமுறை அம்பாறை மாவட்டத்திலே தமது கட்சியின் சார்பில் தேர்தலில் போட்டியிட்ட அவர், அதில் பின்னடைவைச் சந்தித்திருந்தாலும், அம்மாவட்டத்திலே உள்ள தமிழ் மக்களுடைய அபிலாஷைகளை அவரூடாக கட்சி சார்பிலே அணுகி நிறைவேற்றிக்கொள்கின்ற ஒரு வழமைதான் அம்பாறை மாவட்டத்தின் தமிழரசுக் கட்சி உறுப்பினர்களிடம் தொடர்ந்தும் இருந்து வந்திருக்கின்றது. அம்பாறை மாவட்டத்தின் தமிழ், முஸ்லிம் மக்களுக்கிடையிலான இன முறுகல்கள் மற்றும் பிரச்சினைகளின்போது அவர்கள் சார்பிலே அவர் என்னோடு பல தடவை அடிக்கடி பேசி, அவற்றைத் தீர்த்துக்கொள்வதற்கான ஆக்கபூர்வமான முயற்சி களில் ஈடுபட்டிருக்கின்றார். அந்த வகையில், எங்களோடு ஆக்கபூர்வமான கருத்துகளைப் பங்கிட்டுக் கொள்கின்ற, பரிமாறிக்கொள்கின்ற நல்லதோர் அரசியல் தலைமையை நாங்கள் இழந்து நிற்கின்றோம்.

அண்ணன் மாவை. அவர்களுடைய அரசியல் தடம் என்பது சாமானியமான ஒரு விஷயமல்ல. அவர் நீண்ட ஓர் அரசியல் பாதையைக் கொண்டிருந்தார். குறிப்பாக, 70களிலே தமிழர் களுடைய சாத்வீக அரசியல் போராட்டம், வன்முறை அரசியலாக உருவெடுத்தபோது, அன்று அதற்குத் தலைமை தாங்கிய தமீழீழ விடுதலைப் புலிகளின் ஆரம்பகாலகட்டத் தலைவராக இருந்த உமா மகேஸ்வரன் அவர்களோடும், அதற்குப் பிறகு அதே தமிழீழ விடுதலைப் புலிகளின் இராணுவப் பிரிவுத் தளபதியாக இருந்த பிரபாகரன் போன்றோரோடும் நெருங்கிய தொடர்புகளை அவர் வைத்திருந்தார். அதற்குப் பிற்பாடு அந்த வன்முறை அரசியல் என்பது வேறுவிதமாக வடிவெடுத்து, பல இடங்களிலே தமிழரசுக் கட்சியின் தலைமைகளையே அது பலிகொண்ட நிகழ்வுகள் பற்றி நாங்கள் பேசியிருக்கின்றோம். குறிப்பாக, புல்லர்ஸ் வீதியில் இருந்த இல்லத்திலே அண்ணன் அமிர்தலிங்கம், யோகேஸ்வரன் போன்ற தலைவர்கள் கொலையுண்டபோது, அன்று அதே இல்லத்திலே கீழ் மாடியிலே இருந்த அண்ணன் சிவா அவர்கள் காயங்களுடன் தெய்வாதீனமாக உயிர் தப்பியிருந்த நிகழ்வுகள் பற்றியெல்லாம் நாங்கள் அடிக்கடி பல தடவை பேசியிருக் கின்றோம். நேற்று அண்ணன் 'சிவா' அவர்களுடைய நினைவு தினமாக இருந்தது என்பதையும் இச்சந்தர்ப்பத்தில் நான் ஞாபகப்படுத்தக் கடமைப்பட்டிருக்கின்றேன்.

அதுமாத்திரமல்ல, 1983 யூலை கலவரத்திற்குப் பிற்பாடு இந்தியாவுக்கு இடம்பெயர்ந்து அகதியாகச் சென்று, அங்கும் தமிழரசுக் கட்சியின் காரியாலயத்தை அமைத்துப் பணியாற்றி, தொடர்ந்தும் தமிழ்த் தேசியப் பரப்பிலே மிகப் பெரியதோர் அழியாத தடத்தை விட்டுச்சென்ற ஓர் அரும்பெரும் தலைவராக

[ගරු රවුෆ් හකීම් මහතා]

நாங்கள் அண்ணன் மாவை. அவர்களைக் காண்கின்றோம். அந்த வகையில், அண்ணன் மாவை. அவர்களுடைய மறைவு ஒரு சாமானியமான இழப்பு அல்ல. அவருடைய இழப்பை யிட்டு எங்களுடைய அனுதாபங்களை அவருடைய குடும்பத்தாருடன் பகிர்ந்து கொண்டோம். குறிப்பாக, அவருடைய மரணத்திற்குப் பிற்பாடு இடம்பெற்ற அவருடைய இறுதிக் கிரியைகளில் என்னால் கலந்துகொள்ள முடியாது போனாலும், அடுத்த தினம் நான் அவருடைய வீடு சென்று, அவருடைய புதல்வி மற்றும் ஏனைய குடும்ப உறுப்பினர்களோடு என்னுடைய சோகத்தைப் பகிர்ந்து கொண்டேன்.

இவ்வாறான பெரும்பெரும் தலைவர்களை இழந்து தவிக்கின்ற தமிழ்ச் சமூகத்திற்கும், தமிழரசுக் கட்சியினருக்கும் மற்றும் அவரது குடும்பத்தினருக்கும் என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைப் பகிர்ந்துகொள்வதோடு, அவர் வணங்கி வழிபட்ட மாவிட்டபுரம் கந்தசுவாமி கோவிலிலே எழுந்தருளி இருக்கின்ற முருகப்பெருமானின் அருள் அவருக்குக் கிட்டட்டும்! அவருடைய ஆத்மா சாந்தியடையட்டும்! என்று பிரார்த்தித்து, என்னுடைய இந்த அனுதாப உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ramalingam Chandrasekar.

[பி.ப. 12.05]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய இந்த அனுதாபப் பிரேரணையின்மீது, விசேடமாக நான் முதலில் மாவை. சேனாதிராஜா அவர்களின் மறைவையொட்டி, அவருடைய குடும்பத்தாருக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக்கொண்டு, என்னுடைய அனுதாப உரையை ஆரம்பிக்க நினைக்கின்றேன்.

அண்ணன் மாவை. சேனாதிராஜா அவர்களோடு எனக்கு நீண்டகாலப் பழக்கம் கிடையாது. இருந்தாலும் நான் அவரை அண்ணன் என்று விளிப்பதற்குக் காரணம், நான் 2001ஆம் ஆண்டு இந்தப் பாராளுமன்றத்துக்கு பிரவேசித்த அன்றைய கால கட்டங்களில், நாட்டில் பல்வேறு விதமான போராட்டங்கள், கருத்து ரீதியான முரண்பாடுகள், இனவாத ரீதியான கோஷங்கள் போன்றவை எழுந்திருந்த நிலையில், தமிழ்ச் சமூகத்தின் சார்பாகத் தமிழ்த் தேசிய கூட்டமைப்பி லிருந்து எந்தவொரு பிரச்சினை தொடர்பாகவும் எங்களோடு சுமுகமாகக் கருத்துகளைப் பரிமாறிக்கொண்ட, அவருடைய நிலைப்பாடு வேறாக இருந்தபோதும் அந்த நிலைப்பாட்டில் இருந்து மிகவும் சாத்வீகமாகவும் positive ஆகவும் தனது கருத்துகளை முன்வைத்த ஒரு நண்பராக அமரர் மாவை. சேனாதிராஜா அவர்கள் இருந்ததேயாகும். அத்தோடு, அந்தத் தமிழ் அரசியல் பரப்பில் சாதாரண ஒரு தொண்டனாக இருந்து, தலைவனாக மாறிய ஒரு நபரும் அவரேயாகும். தனது கட்சியில் ஒரு தொண்டனாக இருந்தபோது அரசியல் ரீதியாகப் பல்வேறு இன்னல்களையும் நெருக்கடிகளையும் சந்தித்தவர் என்றால் கூட அது வேறு யாருமல்ல, மாவை. சேனாதிராசா அவர்களாகும்.

அது மாத்திரமல்ல, குறிப்பாக அந்தக் காலகட்டங்களில் நிகழ்ந்த சாத்வீகப் போராட்டங்களில் பங்குபற்றி அவர் ஏழு வருடங்களுக்கும் மேலாக மெகசின், போகம்பர உள்ளிட்ட பல சிறைச்சாலைகளில் சிறை வாழ்க்கையை அனுபவித்திருக் கின்றார். 1969ஆம் ஆண்டு முதல் 1983ஆம் ஆண்டு வரையான காலகட்டங்களில் இவ்வாறு ஏழு ஆண்டுகள் அவர் சிறையில் இருந்தார் என்று கூறப்படுகின்றது. அன்றைய காலகட்டங் களில் எங்களுடைய கட்சித் தலைவரான ரோஹண விஜேவீர உள்ளிட்ட ஆயிரக்கணக்கான இளைஞர்கள் அந்தச் சிறை களில் இருந்தார்கள். சிறைகளில் இருந்த எங்களுடைய தோழர்கள் விடுதலையான பிறகு, இளைஞர்கள் ஆயுதப் போராட்டம் அல்லது வன்முறைப் போராட்டத்தை நோக்கித் தள்ளப்படுவதற்கான காரணம் குறித்து அவர்களிடையே சிறைச்சாலையில் மிக நீண்ட கலந்துரையாடல் இடம் பெற்றதாகவும், அன்றைய காலகட்டங்களில் இந்த நாட்டில் இருந்த ஆட்சியாளர்களால் முன்னெடுக்கப்பட்ட தமிழ் மக்கள் மீதான ஒடுக்குமுறையே தமிழ் இளைஞர், யுவதிகளை ஆயுதப் போரரட்டத்தை நோக்கித் தள்ளுவதற்கு உந்துசக்தியாக இருந்தது என்றும் மாவை. சேனாதிராஜா அவர்கள் எங்களுக்குக் கூறியிருந்தார். விசேடமாக, அந்தப் போராட்டங் களில் கலந்துகொண்ட இன்றைக்கும் இருக்கின்ற பல தமிழ்த் தலைவர்களோடும் பிரபாகரன், உமா மகேஸ்வரன், சிறி சபாரத்தினம் போன்ற பெரும் ஆயுதப் போராட்டத் தலைவர் களோடும் தனது கருத்துகளைப் பரிமாறிக்கொண்ட ஒரே தலைவன் தமிழ்த் தேசிய அரசியல் பரப்பில் இருந்தாரென்றால், அது வேறு யாருமல்ல, அமரர் மாவை. சேனாதிராஜாதான்.

அண்மையில் கவிஞர் காசி ஆனந்தனால் எழுதப்பட்ட ஒரு புத்தகத்தைப் படிக்கக்கூடிய ஒரு சந்தர்ப்பம் எனக்குக் கிடைத்தது. கிட்டத்தட்ட 670 பக்கங்களைக் கொண்ட அந்தப் புத்தகத்தின் ஒரு பகுதியில் அவர் அண்ணன் மாவை. சேனாதிராஜா அவர்களது விடுதலைப் பயணம் பற்றிய விடயத்தைக் குறிப்பிட்டிருந்தார். கடல் வழிப் பயணங்கள், பல்வேறுபட்ட கஷ்டமான பயணங்கள் மற்றும் அவர் எதிர்நோக்கிய பல்வேறுபட்ட ஆபத்தான சம்பவங்கள் பற்றியெல்லாம் அதில் மிகவும் விளக்கமாக எழுதியிருந்தார். மாவை. சேனாதிராஜா அண்ணனைப் பொறுத்தமட்டில் அவர் உண்மையில் ஒரு சொகுசான அரசியல்வாதியாக அல்லது சௌகரியமான ஓர் அரசியலை அனுபவித்தவராக இருக்க முடியாது. 1942ஆம் ஆண்டில் பிறந்த அவருடைய ஆறாவது வயது காலத்தில் இலங்கையில் பிரஜாவுரிமைச் சட்டம் கொண்டுவரப்பட்டது. அடுத்ததாக வாக்குரிமைச் சட்டம் 1948இல் கொண்டுவரப்பட்டது. இந்தச் சட்டங்கள் மலையக மக்களின் பிரஜாவுரிமையையும் குடியுரிமையையும் பறிப்பதைக் கண்டவுடன், அவர் 7-8 வயதுச் சிறுவனாக மாணவனாக இருந்த தனது அந்த இளம் பருவத்திலேயே தமிழர்களுக்கு அநியாயம் நடந்திருக்கின்றது என்பதைப் புரிந்துகொள்ளக்கூடிய நிலையில் இருந்திருக்கின்றார். அதற்கு அடுத்தகட்டமாக, 1956இல் கொண்டுவரப்பட்ட தனிச் சிங்களச் சட்டம் மற்றும் 1958இல் நடைபெற்ற இனப் படுகொலை போன்ற விடயங்களால் அவருடைய சிந்தனை, அவருடைய நோக்கு என்பது விடுதலை அரசியலை நாடிச் சென்றிருக்கின்றது.

அதுமட்டுமல்லாமல், 1957ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட பண்டா - செல்வா ஒப்பந்தமானது, அது எழுதிய மை காய்வதற்கு முன்பாகவே கிழித்தெறியப்பட்டதென்று சொல்வார்கள். அதாவது, ஜே.ஆர். ஜயவர்தன அவர்கள் பாத யாத்திரையை மேற்கொண்டு இனவாதத்தைத் தூண்டியதன் காரணமாக அந்த ஒப்பந்தம் கிழித்தெறியப்பட்டதாகக் கூறப்படுகின்றது. அதுபோல், 1965ஆம் ஆண்டில் ஏற்படுத்தப்பட்ட டட்லி - செல்வா ஒப்பந்தம் கிழித்தெறியப்பட்டது. 1972ஆம் ஆண்டு இந்த நாட்டை ஒரு பௌத்த சிங்கள நாடாகக் காட்டக்கூடிய விதத்தில் சிறிமா அம்மையாரால் முதலாம் குடியரசு அரசியல்யாப்பு வரையப்பட்டது. இந்த விடயங்கள் எல்லாவற்றையும் பார்க்கும்போது, தமிழினத்துக்காகப் போராட வேண்டிய எண்ணம் அவரது மனதில் ஆழமாகப் பதிந்திருந்தது. எல்லோரும் 60 வயதாகின்றபோது ஓய்வுபெற்று விடுவார்கள் என்று சொல்வார்கள். ஆனால், அவர் தனது 19 வயதில் ஆரம்பித்த போராட்டத்தில் தனது 82 வயதுவரை, அதாவது உயிரிழக்கும் வரைக்கும் தன்னை ஒரு முக்கிய பாத்திரமாக வைத்திருந்தார்.

இப்போது இங்கு பேசிய கௌரவ சிறீதரன் அவர்களும் கௌரவ இளங்குமரன் அவர்களும் ஒரு விடயத்தைக் குறிப்பிட்டிருந்தார்கள். அதாவது, யாழ்ப்பாணத்தின் தீவகப் பகுதியானது டக்ளஸ் தேவானந்தா அவர்களது இரும்புக் கோட்டையாக இருந்த காலகட்டத்தில், அந்தப் பகுதிக்குச் சென்று அரசியல் செய்ய வேண்டுமென்ற அடிப்படையில் அங்கு சென்றபோது அவர் மோசமாகத் தாக்கப்பட்டதோடு, அவரோடு சென்ற உதவியாளர்கள் இருவர் கொல்லப்பட்டும் இருந்தார்கள். அவரது தலையில் பாரிய தாக்குதல் மேற்கொள்ளப்பட்டதனால் அன்று அவர் மரண விளிம்பில் இருந்தார். அந்தத் தாக்கத்தில் இருந்து மீண்ட பின்னரும்கூட அவர் அரசியலிலிருந்து ஓய்வுபெற்றுக்கொள்ள விரும்பவில்லையென்றால், அவர் எமது தமிழினத்தின் விடுதலைக்காக, தமிழ் மக்களின் நிம்மதியான வாழ்க்கைக்காக எந்தளவுக்குத் தன்னை அர்ப்பணித்த பெருந்தலைவராக இருந்திருக்கின்றார் என்பதைப் புரிந்துகொள்ள முடியும். உண்மையில் மூத்தவர்களையும் சரி, இளையவர்களையும் சரி, இணைத்துச் செல்லக்கூடிய ஒரு பக்குவம், முதிர்ச்சி, பண்பு அவரிடம் காணப்பட்டது. எந்தவொரு சந்தர்ப்பத்திலும் யார்மீதும் சீறிவிழும் தன்மையை அவரிடம் நான் கண்டதில்லை. அஹிம்சைக்குரிய, சாத்வீகத்துக்குரிய பண்பு அவரிடம் இருந்தது.

அதுபோன்று, ஆயுதப் போராட்டம் நடத்தப்பட்டபோது அந்தப் போராட்டத்தைக் குழப்பக்கூடாது, அந்த இயக்கங்களும் விடுதலைக்கான நோக்கோடு ஏற்படுத்தப்பட்டவை என்ற அடிப்படையில் அந்த இயக்கங்களைச் சேர்ந்தவர்களோடும் நல்ல உறவைக் கொண்டிருந்தார். சுருக்கமாகச் சொல்லப்போனால், அவர் சகலரையும் ஒற்றுமைப்படுத்துகின்ற, ஐக்கியப்படுத்துகின்ற, ஒரே அணியில் இணைக்கின்ற ஒரு சமாதானப் புறாவாக இருந்தார். அப்போதிருந்த TELO ஆக இருக்கலாம், PLOT ஆக இருக்கலாம் EPRLF ஆக இருக்கலாம் அல்லது வேறு எந்த அமைப்பாக இருந்தாலும் அந்த அமைப்புகளிலுள்ள அனைத்து இளைஞர்களும் மாவை. அண்ணன் என்றால், அவருக்கொரு தனி மரியாதை கொடுப்பார்கள். அவரிடம் சென்று கதைத்தால் ஒற்றுமையை ஏற்படுத்தலாம்; புரிந்துணர்வை ஏற்படுத்தலாம்; எல்லோருக்கும் சமமாக நீதி வழங்குவார் என்ற அடிப்படையில் சகலரும் நம்பக்கூடிய ஒரு தலைவராக இருந்தது மட்டுமல்லாமல், தமிழரசுக் கட்சியிலும் ஒரு நம்பகமான, விசுவாசமான தலைவராக அவர் இருந்திருக்கின்றார். இப்படிப்பட்ட ஒரு தலைவர் 82ஆவது வயதில் மறைந்திருந்தாலும்கூட அவருடைய இழப்பு பேரிழப்பாகவே கருதப்படுகின்றது. இங்கு பேசிய பல்வேறுபட்ட கட்சிகளைச் சேர்ந்தவர்களும்கூட அவருடைய அருமையான அந்த மனப்பாங்கை, அவருடைய பண்பைப் பாராட்டாமல் இருக்கவில்லையென்றால், அவர் சகல கட்சிகளுக்கும் பக்குவமான ஒரு நடத்தையை எடுத்துக்காட்டியிருக்கின்றார் என்பதைப் புரிந்துகொள்ள முடியும்.

இப்படிப்பட்ட ஒரு பெரிய மனிதரை, ஓர் உத்தமர் என்று சொல்லப்படக்கூடியவரை, தியாகத் தன்மையான ஓர் அரசியலை மேற்கொண்டவரை நாம் இழந்திருக்கின்றோம். இன்றைய நிலையில் அவருடைய அகவை 80ஐக் கடந்திருந்தாலும்கூட, அவரது இழப்பை நாங்கள் ஒரு பேரிழப்பாகக் கருதக்கூடிய ஒரு நிலையில் இருக்கின்றோம். இந்த இழப்பானது அவருடைய குடும்பத்திற்கு மாத்திரம் அல்ல, தமிழ்ச் சமூகத்திற்கும், தமிழ் பேசுகின்ற சமூகத்திற்கும், ஏன் இலங்கைக்கே ஓர் இழப்பாகக் கருதப்பட முடியும். எனவே, நாம் இச்சந்தர்ப்பத்தில் அன்னாரின் ஆத்மா சாந்தியடைய இறைவனை வேண்டுகின்றோம். அவரது இழப்பால் துன்புறுகின்ற அவருடைய துணைவியாரான பவானி அம்மையார், அவருடைய பிள்ளைகளான கலையமுதன், ஆரா அமுதன், தாரகா ஆகியோரது மனவேதனையைக் களைவதற்காக நான் இறைவனை வேண்டுகின்றேன். அத்தோடு, அவர்களுடைய உற்றார், உறவினர்கள் அனைவரும் மன அமைதி பெறவேண்டுமென்றும் இறைவனைப் பிரார்த்திக்கின்றேன். அவருடைய அந்தச் சேவைகளை எண்ணி, அவர்களும் அந்தப் பணியில் ஈடுபட வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக கவிஞர் காசி ஆனந்தன் சொன்ன,

> "குமுறுகின்ற குமரிக் கடல் தமிழகத்தைக் கொஞ்சுகின்றவரை
>
> வானில் விண் முகிலும் தண்மதியும் பவனி வருகின்றவரை
>
> கங்கையும் காவேரியும் கலக்கின்றவரை
>
> தமிழ் கூறும் நல் உலகம் உள்ளவரை
>
> தமிழுக்காய் உழைத்தவர்கள் தமிழ் மக்களுக்காய் உழைத்தவர்கள் சாவதில்லை"

என்ற வரிகளைக் கூறி, அமரர் மாவை. சோ. சேனாதிராஜா அவர்களுடைய இரங்கலுரையை நான் நிறைவுசெய்கின்றேன்.

அத்தோடு, இன்றைய தினம் அனுதாபப் பிரேரணையில் பெயர் குறிப்பிடப்பட்ட அமரர்கள் மாண்புமிகு டொனல்ட் திசாநாயக்க, மாண்புமிகு ஜே.ஆர்.பி. சூரியப்பெரும, மாண்புமிகு கோசல நுவன் ஜயவீர போன்றவர்களும் அவர்களது சமூகம் சார்ந்து தங்களுடைய அரசியல் பணிகளை நேர்த்தியாகச் செய்திருப்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. அதிலும் குறிப்பாக 38 வயதிலேயே தேசிய மக்கள் சக்தியின் ஓர் இளம் பாராளுமன்ற உறுப்பினராக வந்து, கவர்ச்சிகரமான அரசியலை மேற்கொண்ட மாண்புமிகு கோசல நுவன் ஜயவீர மற்றும் நீண்ட அனுபவம் கொண்ட மாண்புமிகு ஜே.ஆர்.பி. சூரியப்பெரும, மாண்புமிகு டொனல்ட் திசாநாயக்க போன்றவர்களது ஆத்மாக்களும் சாந்தியடைய வேண்டுமென்று பிரார்த்தித்து, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අශෝක සපුමල් රන්වල මැතිතුමා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 1.56]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජයසිංහ මුහන්දිරම් ඩොනල්ඩ් දිසානායක මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට කාලයක් මේ පාර්ලිමේන්තුව තුළ මහජන නියෝජනය සිදු කරමින් මීට මාස කිහිපයකට පෙර සදහටම සමු ගනු ලැබුවා. 1941 ජුලි මාසයේ 9වැනි දා උත්පත්තිය ලද එතුමාගේ ජීවිතයේ සන්ධිස්ථාන කිහිපයක්ම මම මෙසේ සඳහන් කරන්නම්. එතුමාගේ පාසල් අධ්‍යාපනය ගම්පහ සිරිකුරුස විද්‍යාලයෙන් - Holy Cross College එකෙන්, ගම්පහ ශ්‍රී සිද්ධාර්ථ විද්‍යාලයෙන්, කොළඹ ශාන්ත ජෝසප් විද්‍යාලයෙන් සහ වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් ලබා ගත්තා. ඒ ගැමි පරිසරය තුළින් තම අධ්‍යාපනය තහවුරු කරගෙන ඊට පසු කෘෂි කර්මාන්තයේ මෙවලම් එහෙම නැත්නම්, යන්ත්‍රෝපකරණ සම්බන්ධව එංගලන්තයේ විශේෂ පුහුණුවක් ලබාගෙන ලංකාවට පැමිණ 1968 මාර්තු මාසයේ 6වැනි දින රාමනායක අප්පුහාමිලාගේ දෝන ඉන්ද්‍රා රණසිංහ දිසානායක මහත්මිය සමඟ විවාහ ගිවිස ගත්තා. ඉන් පසු එතුමා ක්‍රමානුකූලව දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වුණා.

1965 වර්ෂයේදී ගම්පහ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු විධියට පළමු මහජන නියෝජනය සිදු කළ අතර ඉන් පසුව, 1970දී එහි උප නගරාධිපති ලෙස කටයුතු කළා. 1988දී ඉතාමත් දුෂ්කර වාතාවරණයක් තුළ පළාත් සභා මන්ත්‍රීවරයකු විධියට බස්නාහිර පළාත් සභාව නියෝජනය කළා. ඒ වාගේම ඒ කාල සීමාව තුළ පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස ගම්පහ දිස්ත්‍රික්කයට මහජන නියෝජිතයකු විධියට එතුමාගෙන් සිදු වෙන්න ඕනෑ කාර්ය භාරය ඉෂ්ට කළා. 1989දී ප්‍රථම වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක ධුරය ද, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධීක්ෂණ මන්ත්‍රීවරයාගේ කාර්ය භාරය මේ පාර්ලිමේන්තුව තුළ ඉෂ්ට කළා. ඒ වාගේම COPE එක නියෝජනය කරමින්, ආරක්ෂක කමිටුව නියෝජනය කරමින්, ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ තමාගේ නියෝජනය සිදු කළා.

ඒ වාගේම මේ කාලසීමාව තුළදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ ජනතාවත් සමඟ බද්ද වෙලා මහජන ක්‍රියාවලියකට මැදිහත් වෙලා කටයුතු කළා. ගම්පහ මැතිවරණ කොට්ඨාසයේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් අධ්‍යාපනය, විදුලිය, මහාමාර්ග, සෞඛ්‍ය, උදා කළ ගම්මාන, වාරිමාර්ග සංවර්ධන කටයුතුවල නියැළුණා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට ඒ වකවානුව තුළ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ජනප්‍රසාදය ඉතාම ඉහළින් දිනාගෙන; ගම්පහ දිස්ත්‍රික්කය තුළ ජනතාවගේ විශ්වාසය දිනාගෙන එවැනි මහජන ක්‍රියාකාරීත්වයකට ප්‍රවිෂ්ට වුණා. ඒ වාගේම ඒ අවස්ථාවේදී ගම්පහ ඉතා පටු පාරක්ව පැවතුණු කච්චේරි සංකීර්ණයට යාබදව තිබුණු ශ්‍රී බෝධි මාර්ගය පුළුල් කිරීමේ කටයුතුවලට මැදිහත් වුණා. ඒ අවදියේදී එවැනි පාරක් පුළුල් කරනවා කියන්නේ බොහොම දුෂ්කර කටයුත්තක්. විශාල ජනතා විරෝධයක් එනවා. ඒ විරෝධතාවලට මුහුණ දෙමින් ඒවා සමනය කරමින් ඒ පාර සංවර්ධනය කරන්න මැදිහත් වුණා.

එතුමා ශ්‍රී බෝධි ක්‍රීඩාංගණයට යාබදව දැන් පවතින තක්ෂිලා විද්‍යාලය ආරම්භ කරන්න එදා මූලික වෙලා එම කටයුත්ත ඉෂ්ට සිද්ධ කළා. එලෙස නව විද්‍යාලයක් ලෙස ගම්පහ තක්ෂිලා විද්‍යාලය ආරම්භ වෙනවා. ඉන් පසුව "ඩොනල්ඩ් දිසානායක පදනම" පිහිටුවා එතුමා ගම්පහ මැතිවරණ කොට්ඨාසයේ විහාරස්ථාන කිහිපයක්ම ප්‍රතිසංස්කරණය කළා. ඩොනල්ඩ් දිසානායක පදනම මඟින් එතුමා සාමණේර ස්වාමීන් වහන්සේලාට

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

ශිෂ්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කළා. ඒ වාගේම ගරු ඩොනල්ඩ් දිසානායක මහතාගේ ඉල්ලීම මත දේශමාන්‍ය එච්.කේ. ධර්මදාස මැතිතුමාගේ ධන පරිත්‍යාගයෙන් ගම්පහ මූලික රෝහලේ ගැබිනි මව්වරුන් සඳහා වූ වාට්ටු සංකීර්ණයක්, දැඩි සත්කාර ඒකකයක් ඉදිකරමින්, ඊට අවශ්‍ය වෛද්‍ය උපකරණ පරිත්‍යාගයක් කිරීමක්ද එදා සිදු වුණා. ඒ දවස්වල ඉතාම දුෂ්කර තත්ත්වයක පැවැති ගම්පහ රෝහලට පැමිණෙන රෝගීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් එමඟින් විශාල කාර්යභාරයක් සිද්ධ වුණා. එතුමා කඩවත, රන්මුතුගල මහා විහාරයට අනුබද්ධ NESEC පදනම පිහිටුවීමට ද මූලිකත්වය ගෙන කටයුතු කළා. එමඟින් කළුගෙඩිහේන, මාකවිට, පරකන්දෙනිය විහාරස්ථානවලට අනුබද්ධිතව එදා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ වුණා.

එතුමාගේ තරුණ අවධියේදී තවත් සුවිශේෂී ක්‍රියාවලියක් සිදු වනවා. එතුමා 1974දී එංගලන්තයට යනවා. එංගලන්තයේදී එතුමා 1975 වර්ෂයේදී එතුමාගේ වියදමින්ම "504" වර්ගයේ වාහනයක් මිලදී ගන්නවා. එංගලන්තයේ සිට සැතපුම් 9,300ක දුරක් ගෙවා ශ්‍රී ලංකාවේ තලෙයිමන්නාරම ජැටියට පැමිණෙන එතුමා තරුණ අවධියේදී ඒ පිළිබඳ වාර්තාවක් පිහිටුවන්නත් සමත් වනවා. ඒ වාගේම එතුමා රජය නියෝජනය කරමින් ජර්මනිය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, පිලිපීනය, තායිලන්තය හා සිංගප්පූරුව වැනි රටවලට ගිහිල්ලා දූත මෙහෙවරවල ද නියැළුණා. මෙන්න මෙවැනි කාර්යභාරයක් තමයි ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ එතුමාගෙන් සිදු වෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට එතුමා වෙනුවෙන් මේ අවස්ථාවේදී මාගේ ශෝකය ප්‍රකාශ කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස සිටිමින් එතුමා ඉෂ්ට කරපු ඒ කාර්යභාරයට ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මා සතුටු වන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් පෞද්ගලිකවත්, ඒ වාගේම පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන් වෙනුවෙනුත් අද මෙම අවස්ථාවට පැමිණ සිටින එතුමාගේ ඥාතීන්ට අපගේ සාතිශය ශෝකය ප්‍රකාශ කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දම්මික පටබැඳි අමාත්‍යතුමා.

[අ.භා. 2.03]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා, ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා සහ ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා යන හිටපු මන්ත්‍රීවරුන්ගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මේ අවස්ථාවේ, මම මුලින්ම කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ ගරු සභාවට පැමිණි කෝසල නුවන් ජයවීර සහෝදරයාව සිහිපත් කරන්නට කැමැතියි.

එතුමා 2024 නොවැම්බර් මාසයේ 14වැනි දා පැවැති මහ මැතිවරණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයෙන් දෙවැනි තැනට මනාප ලබමින් තමයි මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. මාස 4කුත්, දින 21ක් වැනි කාලයක් තමයි එතුමාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ගත කරන්න අවස්ථාව ලැබුණේ. පාර්ලිමේන්තුවට පැමිණ ඉතා කෙටි කාලයක් තුළදී එතුමා හදිසියේ අභාවයට පත්වුණා.

එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ගත කරපු කෙටි කාලය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයටත්, විශේෂයෙන්ම එතුමා නියෝජනය කළ රුවන්වැල්ල ආසනයටත්, දැරණියගල ආසනයටත් කැපී පෙනෙන කාර්යභාරයක් වාගේම මැදිහත් වීමක් කළා. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට COPE එක තුළ කැපී පෙනෙන කාර්යභාරයකට එතුමා අවතීර්ණ වෙමින් සිටියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරපු කෙටි කාලය තුළ ජනතා නියෝජිතයෙකු හැටියට දේශපාලන ජීවිතයේ දීප්තිමත් ගමනක් සඳහා අවශ්‍ය සියලු ලක්ෂණ විදහාපාන්න එතුමා සමත් වුණා.

1987 වසරේදී දෙහිඕවිට, නාපාවල උපත ලැබූ කෝසල නුවන් ජයවීර සහෝදරයා, ගුරුගල්ල කනිෂ්ඨ විද්‍යාලයෙන් තමයි ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරුවේ. ඉන් පසුව එතුමා ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාගෙන, විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයෙන් උසස් අධ්‍යාපනය අවසන් කළා.

එතුමා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ගත කරන කාලයේ ශිෂ්‍ය නායකයෙකු ලෙස කැපී පෙනෙන වැඩ කොටසක් ඉටු කරමින්, ශිෂ්‍යයන්ගේ සුබසාධන ප්‍රශ්න සහ අධ්‍යාපනික ප්‍රශ්න වෙනුවෙන් සුවිශේෂී මැදිහත් වීමක් කළා. ඒ නිසාම එතුමා විවෘත විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ලෙසත් තෝරා පත්කර ගත්තා. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කළ කෝසල සහෝදරයා, විශ්වවිද්‍යාල ජීවිතයෙන් අනතුරුව කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රදේශය දේශපාලන භූමිය ලෙස තෝරාගෙන දේශපාලන කටයුතු ආරම්භ කළා. ඒ කාලය තුළ එතුමා ඉතාම දක්ෂ ලෙස ජනතාව අතර දේශපාලන වැඩ කටයුතු කළා. එතුමා ජනතාවගේ ඉතාම කිට්ටුවන්තයෙක් බවට පත් වුණා. ඒ නිසාම 2018 වසරේ පැවැති පළාත් පාලන මැතිවරණයේදී එතුමා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වුණා. එසේ තේරී පත්වීමෙන් පසු දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා විශාල වැඩ කොටසක් කරන්න සමත් වුණා. දෙහිඕවිට විතරක් නොවෙයි, දැරණියගල, රුවන්වැල්ල, යටියන්තොට, බුලත්කොහුපිටිය ආදී සෑම ප්‍රදේශයකම ජනතා ප්‍රශ්න වෙනුවෙන් එතුමා මැදිහත් වුණා. ඒ නිසාම එතුමා ජනාදරයට පත් නායකයෙකු බවට පත් වුණා.

ඒ විතරක් නොවෙයි, කෝසල නුවන් ජයවීර මැතිතුමා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව තුළ සිදුවෙච්ච වංචා, දූෂණ, අකටයුතුකම්වලට එරෙහිව සභාව තුළ විශාල හඬක් නැඟුවා. ඒ වංචා, දූෂණ සහ අකටයුතුකම් නවතා දමන්න එතුමා මැදිහත් වුණා. ඒ ප්‍රදේශයේ ජනතාව අදටත් ඒ කාර්යභාරය ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. කෝසල නුවන් ජයවීර මැතිතුමා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව තුළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස එතුමාගේ වගකීම් ඉටු කරමින්, පෞද්ගලික අංශයේ සමාගමක සහකාර ඉංජිනේරුවරයෙකු ලෙසත් කටයුතු කළා.

ඉන් අනතුරුව එතුමා 2024දී මහ මැතිවරණයට ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කළා. කෝසල නුවන් ජයවීර මැතිතුමා කියන්නේ සුවිශේෂී චරිතයක්. එතුමා පරිසරයට බොහෝ ආදරය කරපු කෙනෙක්. ඒ නිසාම එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ මතු වූ පාරිසරික ගැටලුවලදී, පාරිසරික විනාශවලදී

ඒවා වැළැක්වීම සඳහා පෙරමුණ ගෙන සටන් කළා, පෙරමුණ ගෙන කටයුතු කළා. පසුගිය කාලයේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ කටු පොල් වගාව නිසා ඇති වන පාරිසරික ගැටලුවලට එරෙහිව විශාල ව්‍යාපාරයක් පැන නැඟුණා. ඒ මොහොතේ කටු පොල් වගාව නවතා දැමීම සඳහා බිහි වෙච්ච සමාජ සංවිධානවල නායකත්ව කාර්යභාරය ඉෂ්ට කළේ ගරු කෝසල නුවන් ජයවීර සහෝදරයායි. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දේශපාලනය කළ ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් පවු දේශපාලන වාසි සඳහා පරිසරය විනාශ කරන විධියේ ව්‍යාපෘති අනුමත කරද්දී, කෝසල නුවන් ජයවීර සහෝදරයා ඒ ව්‍යාපෘතිවලට එරෙහිව ජනතාව සංවිධානය කරමින් විශාල මැදිහත්වීමක් කළා. ඒ නිසාම පරිසරයට හානි ගෙන දෙන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ආපසු හරවන්නට එතුමා සමත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝසල නුවන් ජයවීර මැතිතුමා ජනතා ප්‍රශ්න කෙරෙහි විශාල අවධානයකින් යුතුව කටයුතු කළා. මට මතක් වෙනවා, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කිරීම වෙනුවෙන් වෙච්ච අරගළයේදී එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ වතු කම්කරු ජනතාව වෙනුවෙන් කැපී පෙනෙන මැදිහත්වීමක් කළ බව. සෑම වත්තකටම ගිහිල්ලා, ඒවායේ ඉන්න ඒ වතු වෘත්තීය සමිති නායකයන් හමු වෙලා, ඔවුන් එක තැනකට එකතු කරන්න එතුමා සමත් වුණා. ඔවුන් එක මතයකට අරගෙන ඒ අය අතර තිබුණු පටු වාද-භේද පැත්තකින් තියලා වතු කම්කරුවන්ගේ දෛනික වැටුප දිනා ගැනීම සඳහා අවශ්‍ය අරගළයට ඔවුන් එක්සත් කළා. එතුමා එහිදී දැවැන්ත නායකත්ව කාර්යභාරයක් කළා. ඒ විතරක් නොවෙයි, කෝසල නුවන් ජයවීර සහෝදරයා ප්‍රදේශයේ ආගමික සිද්ධස්ථානවල ආගමික නායකයන් සමඟ කරපු ගනුදෙනුව විශාල වැදගත්කමක් ලබා දීපු, කවුරුත් අගය කරපු දෙයක්. එතුමා ආගම් භේදයකින් තොරව සියලු ආගමික නායකයන් ඇසුරු කරමින් ඒ අයට අවශ්‍ය උදවු පදවු, මැදිහත්වීම්, මහ පෙන්වීම් ලබා දෙමින් කටයුතු කරපු නායකයෙක්.

ඒ විතරක් නොවෙයි, කෝසල නුවන් ජයවීර මැතිතුමා ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් ඉතාම සංවේදී පුද්ගලයකු හැටියට මැදිහත් වෙමින් කටයුතු කළා. තමන් වෙත ගැටලු අරගෙන එන කිසිදු කෙනෙකුගේ හිත රිදවන්නේ නැතුව ඒ හැම ප්‍රශ්නයකටම ඇහුම්කන් දෙන ගුණයක් එතුමා සතුව තිබුණා. එතුමා ඒ ප්‍රශ්නවලට ඇහුම්කන් දුන්නා විතරක් නොවෙයි, ඒ ප්‍රශ්න හමුවේ එතුමා සංවේදී වූ අවස්ථාත් තිබුණා. ඒ නිසාම එතුමා, එතුමා ගැන පවා නොතකා ඒ ප්‍රශ්නවලට මැදිහත් වුණා. ඇතැම් අවස්ථාවලදී එතුමාට ඒ ප්‍රශ්න සඳහා මැදිහත් වෙන්න සිදු වුණේ විවිධ තර්ජන, ගර්ජන මැද්දේ. ඇතැම් විට ජීවිත අවදානම පවා නොතකා ඒ ප්‍රශ්නවලට මැදිහත් වෙන්න එතුමා ඉදිරිපත් වුණා. එතුමා ඒ තරමම ජනතා ප්‍රශ්න කෙරෙහි සංවේදී පුද්ගලයෙක්.

ඒ විතරක් නොවෙයි, කෝසල නුවන් ජයවීර සහෝදරයා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටුව නියෝජනය කරමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ තරුණයන්ට නායකත්වය සැපයුවා. ජාතික ජන බලවේගයේ තරුණ සංගමය නියෝජනය කරමින් කෑගල්ල දිස්ත්‍රික්කයට නායකත්වය ලබා දෙමින් දිස්ත්‍රික්කයේ තරුණයන්ගේ ප්‍රශ්න වෙනුවෙන් පෙනී හිටපු නායකයකු හැටියටත් අපට එතුමා හඳුන්වන්න පුළුවන්.

කෝසල නුවන් ජයවීර සහෝදරයා ඒ ආකාරයට සමාජයීය කාර්යභාරය ඉටු කරද්දී තමන්ගේ පවුලෙ අය වෙනුවෙනුත් ඒ අවශ්‍ය සොයා බැලීම් කරන්න සමත් වුණා. එතුමාගේ පියා, මව සහ මලණුවන් දෙපළ ගැන වාගේම ඔවුන්ගේ සියලු අවශ්‍යතා ගැන සොයා බලමින් කටයුතු කළා. ඔවුන්ට අවශ්‍ය මහ පෙන්වීම ලබා දුන්නා. ඒ නිසා එතුමා ජනතාව අතර ජනප්‍රිය වුණා. ඒ වාගේම පවුලේ කටයුතුවලදීත් ඉතා සෙනෙහෙවන්ත වැඩිහිටි සහෝදරයෙක්, සෙනෙහෙවන්ත පුතණුවෙක් හැටියට ඒ පවුල වෙනුවෙන් ඉෂ්ට කරන්න තිබුණු සියලු කටයුතු නොපිරිහෙළා ඉටු කළා. කෝසල සහෝදරයා චරිතය අතින් ගත්තාම හැම පැත්තකින්ම දීප්තියෙන් බබළපු චරිතයක් බවට පත් වෙලා හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කය කියන්නේ, වාමාංශික ප්‍රගතිශීලී ව්‍යාපාරයේ සලකුණු තබපු එක සන්ධිස්ථානයක්. මේ රටේ ප්‍රථම වාමාංශික ව්‍යාපාරයේ -ලංකා සම සමාජ පක්ෂයේ- නායක ඇන්.ඇම්. පෙරේරා මැතිතුමාගේ මැතිවරණ බල ප්‍රදේශය බවට පත් වෙලා තිබුණේත් යටියන්තොට, රුවන්වැල්ල ප්‍රදේශය. කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ පියතුමන් සමසමාජ පක්ෂයට සම්බන්ධ වෙලා කටයුතු කරපු ආදරණීය පියතුමෙක්. කලක් වාමාංශික ප්‍රගතිශීලී දේශපාලනයේ තෝතැන්නක් බවට, ශක්තිමත් බල ප්‍රදේශයක් බවට පත්ව තිබුණු යටියන්තොට, රුවන්වැල්ල ප්‍රදේශය දශක ගණනාවක් තිස්සේ දක්ෂිණාංශික, ඒ වාගේම මේ රටට හානිකර ජනතා විරෝධී දේශපාලනය කරන දේශපාලනඥයන්ගේ, ඇමතිවරුන්ගේ, නියෝජ්‍ය ඇමතිවරුන්ගේ බල ප්‍රදේශයක් බවට පත් වෙලා තිබුණා. ඒ ප්‍රගතිශීලී සලකුණු තබපු රුවන්වැල්ල, දැරණියගල, යටියන්තොට ප්‍රදේශවලට නැවත වතාවක් ඒ ප්‍රගතිශීලීත්වයේ බලාපොරොත්තු ගෙනාපු, එම ප්‍රදේශවලට ඒ වාමාංශික ප්‍රගතිශීලී දේශපාලනයේ අරුණැල්ල ගෙනෙන්නට හැකියාව තිබුණු, ඒ සඳහා අවශ්‍ය ධාරිතාව, අවංකභාවය වාගේම ගුණාංග තිබුණු පුද්ගලයෙක් තමයි, කෝසල නුවන් ජයවීර සහෝදරයා කියන්නේ. කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ අභාවය ජාතික ජන බලවේගයට, මේ පාර්ලිමේන්තුවට, එතුමාගේ පවුලට, එතුමාගේ ඥාති හිතමිත්‍රාදීන්ට විතරක් නොවෙයි, මේ මුළු රටටම පාඩුවක් වන්නේ ඒ නිසායි. දිගු දේශපාලන ගමනක් තිබුණු, මේ රටේ ජනතාව වෙනුවෙන් ඉතාම හොඳ නායකත්වයක් ලබා දීමට හැකියාව තිබුණු චරිතයක් තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා කියන්නේ. එතුමා අවුරුදු 38ක් වාගේ ආයු කාලයක් වළඳමින් අඩු වයසින් අප අතරින් සමුගෙන ගියා. ඒක විශාල පාඩුවක්, දරා ගැනීමට අමාරු අඩුපාඩුවක් හැටියට මම සඳහන් කරන්න ඕනෑ. එතුමාගේ අභාවය වෙනුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ ජාතික ජන බලවේගය නියෝජනය කරන සියලුදෙනාගේ ශෝකය සහ අපගේ ශෝකය මේ අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුවටත්, ඒ වාගේම මේ අවස්ථාවට සම්බන්ධ වී සිටින කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ මව, පියා, මලණුවන් දෙදෙනා සහ ඥාතීන්ටත්, ඔවුන්ගේ හිතවතුන්ටත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 2.20]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා, ගරු මාවෙ සෝ. සේනාධිරාජා මැතිතුමා, ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා සහ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා සිව්දෙනාගේ අභාවය පිළිබඳව සමගි ජන බලවේගයේ ශෝකයත්, අපගේ පෞද්ගලික ශෝකයත් මේ අවස්ථාවේදී ප්‍රථමයෙන් මම ප්‍රකාශ කරන්න කැමැතියි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අභාවප්‍රාප්ත ගරු කෝසල නුවන් ජයවීර තරුණ මන්ත්‍රීතුමා විප්ලවකාරී දේශපාලන ව්‍යාපාරයක සාමාජිකයෙකු ලෙස ඉඳලා මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා, ඉතාම දක්ෂ විධියට තමන්ගේ වගකීම් ඉටු කරන්නට ආරම්භ කර ටික දිනකින්ම අප අතරින් වෙන් වී ගියා. එතුමා දක්ෂ තරුණ නායකයෙක් වීමට විශාල විභවයක් තිබුණු උගත් තරුණයෙක්. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් අපගේ බලවත් හෘදයංගම ශෝකය ඒ පවුලේ සියලුදෙනා වෙත පිරිනමන්න අවශ්‍යයි.

ඒ වාගේම, අභාවප්‍රාප්ත ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියටත්, ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් තිබුණු දේශපාලන ව්‍යාපාරයක සාමාජිකයකු හැටියටත් මේ රටට දැවැන්ත සේවයක් ඉටු කරපු, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයට විශාල සේවයක් ඉටු කරපු, ඒ වාගේම පෞද්ගලිකව විශාල දක්ෂකම් තිබුණු, ඒ දක්ෂතා රටේ දියුණුව වෙනුවෙන් කැප කරපු ගරු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ අභාවය වෙනුවෙනුත් මගේ බලවත් ශෝකය එම පවුලේ සියලුදෙනාට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම, අභාවප්‍රාප්ත ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා මේ රටේ දේශපාලනය තුළ සිටි ඉතා විචිත්‍ර චරිතයක්. 2010-2015 කාලසීමාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් එතුමා මා සමඟ මේ ගරු සභාවේ කටයුතු කළා. අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට ඉන්න කාලයේ ජාතික ලැයිස්තුවෙන් පත් වෙච්ච පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට එතුමා හිටියා. මම විපක්ෂයේත්, එතුමා ආණ්ඩු පක්ෂයේත් හිටියාට අපි නිරතුරුව මුණ ගැහුණා; කථා කළා. එතුමා උගතෙක්, වියතෙක්. ඒ වාගේම එවකට මේ පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍ය ධුරය දරපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ රාජකීය විද්‍යාලයේ ගුරුතුමා. ඒ වාගේම, හිටපු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේත්, රාජකීය විද්‍යාලයේ ගුරුතුමා. මේ රටේ දේශපාලනය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා හැටියට කිහිප වතාවක් කටයුතු කරමින්, අත්තනගල්ල, බටහිර කොළඹ හා කැලණිය වැනි ඉතා දුෂ්කර ප්‍රදේශවලදී රටේ ප්‍රධාන පෙළේ නායකයන් සමඟ ජයග්‍රහණය සඳහා නොව, පක්ෂයේ ගෞරවය වෙනුවෙන් තරග කරපු ධෛර්යවන්ත පුරුෂයකු හැටියට ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාව හඳුන්වන්න පුළුවන්.

එතුමා හා සම්බන්ධ විචිත්‍ර වූ කථා බොහොමයක් අපි අසා තිබෙනවා. එතුමාගේ පාර්ලිමේන්තු ජීවිතය වසර පහකට සීමා වුණත්, එතුමාගේ විචිත්‍ර ජීවිත අත්දැකීම් අනුව වැදගත් වූ මාතෘකා පිළිබඳව එතුමා සතු වූ දැනුම් සම්භාරයත්, ඉතිහාසය පිළිබඳ එතුමාගේ සුවිශේෂී විශ්ලේෂණයත් සමඟ මේ ගරු සභාවේ කරුණු ගෙන හැර දැක්වූවා. ඒ නිසා එතුමාගේ නම මේ රටේ පාර්ලිමේන්තුව තුළ වාගේම, පාර්ලිමේන්තුවෙන් පිටතත් දශක පහකට වැඩි දේශපාලන ඉතිහාසය තුළ අනිවාර්යයෙන්ම කියැවෙන නමක් බවට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාගේ අභාවය වෙනුවෙන්, එතුමාගේ පවුලේ සාමාජිකයන් සියලුදෙනාටත් අපගේ බලවත් වූ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඊළඟට මම කැමැතියි, මා පෞද්ගලිකව ඇසුරු කරපු, දේශපාලනිකව එක්ව බොහෝ කටයුතු කරපු, අභාවප්‍රාප්ත ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා ගැන කරුණු කිහිපයක් සඳහන් කරන්න. ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා 1966දී ද්‍රවිඩ විමුක්ති සංවිධානය සමඟ දේශපාලනයට ආවා. ඉන් පස්සේ 1999දී එතුමා පාර්ලිමේන්තු මැතිවරණයට තරග කළා. ඉන්පසුව, දෙමළ ජාතික සන්ධානය සහ ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ නායකයා හැටියට පත් වුණා. එතුමා 2001 සිට 2024 දක්වා අඛණ්ඩව මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා කිසිලෙසකින් අපට අමතක කරන්න බැරි දේහ පෞරුෂයකින් යුක්ත සුවිශේෂී පුද්ගලයෙක්. එතුමා ඕනෑම තැනක කැපී පෙනුණා. ඒ වාගේම, ජාති ආගම් භේදයක් නැතුව මුළු රට ගැනම හිතපු, බෙදුම්වාදය ප්‍රතික්ෂේප කරපු, ශ්‍රී ලාංකිකත්වය අගය කරපු නායකයකු හැටියට අපට එතුමා මතක් කරන්න පුළුවන්. එතුමා දේශපාලනය කළේ ජීවිතය හා මරණය සමඟ සටනක් තිබියදී. එක පැත්තකින් ත්‍රස්තවාදී සංවිධාන, තව පැත්තකින් රටේ ප්‍රජාතාන්ත්‍රවාදී පාලනය අතර දෝලනය වන සමාජ වටපිටාවක් තුළ. ඒ දුෂ්කර කාලයේ එතුමා නියෝජනය කරන ජනතාව ආරක්ෂා කර ගන්නත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරීත්වයටත් එතුමා දැක්වූ දායකත්වය අමතක කරන්න පුළුවන්කමක් නැහැ.

මට මතකයි, 2017 -2018 වසරවල මේ රටේ සියයට 100ක් ජනතාවට විදුලිය ලබා දීම සඳහා, හැම ගෙදරකටම විදුලිය ලබා දීම සඳහා "අඳුර දුරලයි" කියන වැඩසටහන විදුලිබල අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළා. ඒ වෙලාවේ රටේ සෑම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා ඒ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, දිසාපතිවරුන් මුණ ගැහිලා ඒ කටයුතු කිරීම මට පැවරුණා. ඉඩමේ අයිතිය කාට තිබුණත්, ඒ වෙනකොට රැහැන් පද්ධතිය ඇදලා තිබුණත් නැතත්, ගෙදර වයරින් කරන්න සල්ලි තිබුණත් නැතත්, මේ රටේ සෑම නිවසකටම විදුලිය ලබා දීම තහවුරු කිරීම සඳහා වූ සුවිශේෂී වැඩ පිළිවෙළක් යහ පාලන රජයෙන් අපි දියත් කළා. මම එතැනදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, රංජිත් සියඹලාපිටිය හිටපු අමාත්‍යතුමා. මොකද, මුළු රටටම විදුලිය දුන්නාය කිව්වාට, හැම ගමකම විදුලිය නැති පවුල් 10ක්, 15ක් හිටියා. විශේෂයෙන්ම උතුරේ සහ නැඟෙනහිර. ඒ වාගේම මඩකලපුව දිස්ත්‍රික්කයේ, අම්පාර දිස්ත්‍රික්කයේ ගම්මාන පිටින් විදුලිය නැති ප්‍රදේශ තිබුණා. එවකට මඩකලපුව දිස්ත්‍රික්කයේ සියයට 35කට පමණයි විදුලිය තිබුණේ. විදුලි සැපයුම සියයට 100ක් කියලා වාර්තාවල තිබුණත්, ජාතික පද්ධතිය සමඟ රැහැන් පද්ධති සම්බන්ධ කරන්න යන අධික වියදම නිසා මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ පවා හුදෙකලා නිවෙස්වලට -නිවාස දෙකකට තුනකට- විදුලිය ලබා ගැනීමට නොහැකි වුණා. ඒ අවස්ථාවේදී අපි ග්‍රාම නිලධාරිවරුත් සම්බන්ධ කරගෙන ලංකාව පුරාම ගිහිල්ලා, ගෙවල් වයරින් කරන්න වැය වන මුදල වසර 6කින් වාරික වශයෙන් ගෙවන්න අවස්ථාව ලබා දීලා, ප්‍රධාන පද්ධතියට රැහැන් සම්බන්ධ කිරීම සඳහා කිසිදු අය කිරීමක් නොකරන්නත් කටයුතු කළා. ඒ සුවිශේෂී ප්‍රතිපත්තිය අනුගමනය කරලා ඒ වාගේ හුදෙකලා නිවාසවලට විදුලිය ලබා දෙන්න කටයුතු කළා; ඉඩම් අයිතිය පිළිබඳ කාරණය සම්පූර්ණයෙන් නොතකා හැරියා. ඒ හරහා අපට පුළුවන්කම ලැබුණා, වතුකරයේ ජනතාවට, ඒ වාගේම ඈත දුෂ්කර ප්‍රදේශවල ජනතාවට විදුලිය ලබා දෙන්න.

ඒ ආකාරයට උතුරු පළාතේ නිවාසවලට විදුලිය ලබා දෙන්න කටයුතු කරද්දී ඇතැම් නායකයන් කියා සිටියා, "අපට මේකට සම්බන්ධ වෙන්න බැහැ. මොකද, නිවස වයරින් කරන්න වැය වන මුදල ආපසු අය කර ගන්නවා. අපි යුද්ධයෙන් බැට කාපු පිරිසක්. අපට ඒ මුදල ගෙවීමට නොහැකියි. ඒ නිසා දෙනවා නම් නිකම්ම දෙන්න, නැත්නම් අපට එපා" කියලා. එතැනදී ලොකු ප්‍රශ්නයක් මතු වුණා. නමුත් ඇත්තවශයෙන්ම ඒක අතිශය සහනදායී දීමනාවක්. අපි පාවිච්චි කළේ, විදුලිබල මණ්ඩලය සතු මුදල්. ආධාර ලබා ගැනීමක් කළේ නැහැ. නමුත් රුපියල් බිලියන 6ක්, 7ක් වාගේ වැය වන නිසා ඒ මුදල ආපසු ලබා ගත යුතුව තිබුණා. ඒ අවස්ථාවේදී මම මාවෛ සේනාධිරාජා මැතිතුමා පෞද්ගලිකව

මුණගැහිලා කථා කරලා එතුමාට පැහැදිලි කළා, ඒ කටයුත්තේ වැදගත්කම ගැන එතුමාගේ පක්ෂයේ බිම් මට්ටමේ නායකයන් දැනුවත් කරන්න, නැවත එහෙම ව්‍යාපෘතියක් නොඑන බවත්, ඒ වෙනකොටත් යුද්ධය අවසන් වෙලා වසර 7ක්, 8ක් ගතවෙලා තිබුණු නිසා නැවත වරක් සියල්ල නොමිලේ ලැබෙන අවස්ථාවක් නැති බවත් පැහැදිලි කරන්න කියලා. ඒ අවස්ථාවේදී මාවෛ සේනාධිරාජා මැතිතුමා මා එක්ක සෑහෙන වෙලාවක් කථා කරලා මා තුළ විශ්වාසය ඇති කළා, එතුමාගේ පක්ෂයේ බිම් මට්ටමේ ක්‍රියාකාරිකයන් සහ විශේෂයෙන්ම අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරලා ඒ ව්‍යාපෘතිය යාපනය ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන්න අවස්ථාව සලසා දෙනවා කියලා. මම එතුමාට කිව්වා, "යම් හෙයකින් ඔබතුමාගේ ප්‍රදේශයේ ජනතාවට ඒ වාරික මුදල් -රුපියල් 500ක, 600ක වාගේ වාරිකයක් එන්නේ- ගෙවා ගන්න බැරි වුණොත් අපි විශේෂ යෝජනාවක් සම්මත කරලා ඒක විසඳා දෙන්නම්. එහෙම නැතුව මුළු රටටම එක ලෙස ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් නිසා උතුරට විතරක් විශේෂයක් කරන්න බැහැ" කියලා. එතුමා ඒ වචනය භාර ගත්තා. ඒ අනුව උතුරේ හැම නිවසකටම -සියයට 100ක්- විදුලිය දීලා අවසන් කළා. ඊට වසර කිහිපයකට පසුව දවසක් එතුමා මේ පාර්ලිමේන්තුවේදී මා මුණගැහිලා කථා කරලා කිව්වා, "අජිත්, එදා ඔබ කියපු දේ මම සියයට 100ක් විශ්වාස කළේ නැහැ. ඔබට "බැහැ" කියන්න බැරි නිසා මම එකඟ වුණා. නමුත් අද මට සතුටුයි, උතුරේ හැම නිවසකටම විදුලිය තිබෙනවා. ඒ වාගේම හැම කෙනාම වාරික මුදල් ටික ටික ගෙවා අවසන් කළා. ඒක සතුටට කරුණක්. බොහොම ස්තුතියි, සත්‍ය වශයෙන්ම සියයට 100ක් විදුලිය ලබා දීම ගැන" කියලා.

ඒ වාගේම එතුමා සිරකරු අයිතිවාසිකම් ගැන, යුක්තිය හා සාධාරණත්වය ගැන කථා කළා. චෝදනා නැතුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ උතුරේ වාගේම රට පුරා ද්‍රවිඩ ජනතාව රඳවා ගෙන සිටීමට විරුද්ධව එතුමා දිගින් දිගටම සටන් කළා. එතුමා මේ පාර්ලිමේන්තුවේ කථා කළ හැම වෙලාවකම යුක්තිය පසිඳලීම පිළිබඳ කාරණය පළමුකොට සැලකුවා. පාර්ලිමේන්තුවෙන් එළියේ සාකච්ඡා කරන හැම වෙලාවකමත්, නඩු පවරන්නේ නැතුව, සාක්ෂි නැතුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ද්‍රවිඩ ජනතාව රඳවා ගෙන සිටීම පිළිබඳව එතුමා කථා කළා; ඔවුන්ට යුක්තිය ඉටු විය යුතු බව කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම එවැනි ශ්‍රේෂ්ඨ නායකයන්ගේ වැදගත්කම මතක් වන්නේ, අද අපට සිටින නායකයන් ගැන හිතනකොටයි. එතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව අද මේ සභාවට ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ ඇත්ත වශයෙන්ම එතුමාගේ පවුලේ සාමාජිකයන් මේ ගැලරියේ නැහැ. නමුත් එතුමා ගැන සඳහන් කිරීමේදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අනුරාධපුර මහාධිකරණයේ විභාග වුණු එච්සී/69/2018 දරන නඩුවේදී, දණ්ඩ නීති සංග්‍රහයේ 386 වැනි වගන්තිය යටතේ 2025.05.02වැනි දා අතුල සේනාරත්න නමැති අය වරදකරු ලෙස නම් කළා. මහාධිකරණ විනිසුරු ලක්මාලි හේවාවසම් මැතිනිය විසින් වරදකරු කරන ලද චෝදනාවට අමතරව ඔහුට මහෙස්ත්‍රාත් අධිකරණයේ තවත් චෝදනාවකුත්, මහාධිකරණයේ තවත් අධිචෝදනා 20කට වැඩි ප්‍රමාණයකුත් තිබෙනවා.

ඔහු වරදකරු කළේ 2025.05.02වන දා. 2025.05.12වන දා -වෙසක් පෝය දවසේ- වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති සමාවක් ලබා දීලා තිබෙනවා. ඒ, සිර දඬුවම් ලබපු තැනැත්තෙකුට. ඉතාම බරපතළයි, මේ තත්ත්වය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යුක්තිය ඉටු විය යුතු තැන්වල අයුක්තිය ඉටු වන, තවත් නඩු තිබෙන බරපතළ අපරාධකරුවන්ට ජනාධිපති සමාව ලැබෙන විධියක් අද ඇති වෙලා තිබෙනවා. ජනාධිපති සමාව ලබා දීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික ක්‍රමය අනුගමනය කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය දැනට නඩු කිහිපයකදීම අවධාරණය කළා; හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට වන්දි ගෙවන්නත් නියම කළා. ඒ පාඩම් ඉගෙන ගන්නේ නැතිව අද මේවා සිද්ධ වෙනවා. මෙන්න මෙවැනි අවස්ථාවක තමයි අභාවප්‍රාප්ත ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා වැනි යුක්තිය පසිඳලීම පිළිබඳ උනන්දු වෙච්ච, ජාති, ආගම් භේදයක් නැතිව සාධාරණය, යුක්තිය නායකයන්ගෙන් හැම වෙලාවේම ඉටු විය යුතු බව ප්‍රකාශ කරපු, කියන වචනය එලෙසම හසුරුවපු, ඒ අනුව ජීවත් වෙච්ච නායකයන් වැදගත් වන්නේ. එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති සමාව අයුතු විධියට පාවිච්චි කරන කොට ඒකට විරුද්ධ වෙච්ච නායකයන් අද ඒ විධියටම, ජනාධිපති සමාව දීමේ බලය පාවිච්චි කිරීම අතිශයින් කනගාටුදායකයි.

එම නිසා අභාවප්‍රාප්ත ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා වැනි යුක්තිය වෙනුවෙන් පෙනී හිටපු නායකයන් තව තවත් බිහි වේවා කියා පතමින් මම නතර වෙනවා.

බොහොම ස්තුතියි.

[பி.ப. 2.34]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய இந்த அனுதாபப் பிரேரணையிலே காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் நால்வருக்கும் எனது அஞ்சலியைச் செலுத்துவதுடன், அவர்களுடைய குடும்பத்தினருக்கு எனது ஆழ்ந்த அனுதாபங்களையும் தெரிவித்துக் கொள்கின்றேன். அந்த நால்வரில், நாங்கள் அனைவரும் அன்பாக 'மாவை. ஐயா!' அல்லது 'மாவை. சேனாதிராஜா' என்று அழைக்கும் அமரர் சோமசுந்தரம் சேனாதிராஜா அவர்களும் உள்ளடங்குகின்றார்.

முதலில் ஒரு சம்பவத்தைக் குறிப்பிட்டு, எனது உரையை ஆரம்பிக்கலாமென நினைக்கின்றேன். இது எங்களுடைய பெருந்தலைவர் மாவை. ஐயாவைப் பற்றி என்னுடைய மனதில் ஆழமாகப் பதிந்த சம்பவமென நான் நினைக்கின்றேன். ஒன்பதாவது பாராளுமன்றத்தில் இலங்கைத் தமிழரசுக் கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களாகிய எங்களுக்கும் அப்போதிருந்த சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹவுக்கும் இடையில் பல சந்திப்புகள் நடைபெற்றன. இந்தப் பாராளுமன்றக் கட்டிடத் தொகுதியில் நடந்த அவ்வாறானதொரு சந்திப்பின்பொழுது, ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் நாட்டின் சனாதிபதியாகப் பல விடயங்களை எங்களுடன் பேச முன்வந்தார். அப்பொழுது, எங்களுடைய கட்சியின் முன்னாள் தலைவர் மறைந்த மாவை. ஐயா அவர்கள் மிகத் தெளிவாகத் தனது நிலைப்பாட்டை வெளிப்படுத்தினார்.

இளம் வயதிலிருந்து அரசியலில் ஈடுபட்ட மாவை. ஐயா அவர்களின் அரசியல் வாழ்க்கையில் இரண்டு கட்டங்கள் இருந்தன. ஒன்று, இளவயதில் புரட்சிகரமான ஒரு வீரனாகத் திகழ்ந்து, இளைஞர்களைக் கவர்ந்து, பலரையும் அரசியலின்பால் உள்ளீர்த்த போராளியான மாவை. சேனாதிராஜாவின் அரசியல் வாழ்க்கை! அடுத்தது, பிரதான தமிழ் அரசியல் கட்சியொன்றின் தலைவராக இருந்த மாவை. சேனாதிராஜாவின் அரசியல் வாழ்க்கை!

[ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

நான் கூற வந்த சம்பவத்தைச் சொல்கின்றேன். மாவை. சேனாதிராஜா அவர்கள் எங்களை விட்டுப் பிரிந்து செல்வதற்கு இரண்டு ஆண்டுகளுக்கு முன்னர், அப்போது சனாதிபதியாக இருந்த ரணில் விக்கிரமசிங்ஹ அவர்களைப் பாராளுமன்றக் கட்டிடத்தொகுதியில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினராகிய நாங்கள் சந்தித்தபோது, அவர் எங்களுடைய தமிழ் மக்களுடைய அபிலாஷைகளுக்கு மாறாக அல்லது அவர்களுடைய அபிலாஷைகளைக் கருத்திற்கொள்ளாமல் தனது கருத்துகளை முன்வைத்தபோது, மாவை. சேனாதிராஜா அவர்கள் தான் இளம் புரட்சிகர இளைஞராக இருந்த காலத்தில் முன்னெடுத்த விடயங்கள் மூலமும் அதனைத் தொடர்ந்து ஓர் அரசியல் கட்சியின் தலைவராக முன்னெடுத்த விடயங்கள் மூலமும் பெற்றுக்கொண்ட அனுபவத்தின் அடிப்படையில், கடுந்தொனியில் சனாதிபதியை அச்சுறுத்தும் வகையில், தமிழ் மக்களின் அரசியல் அபிலாஷைகள் என்ன என்பதை எடுத்துச் சொன்னார். இந்தச் சம்பவம்தான் இன்றுவரை மாவை. சேனாதிராஜா ஐயா அவர்கள் பற்றி எனது மனதில் ஆழமாகப் பதிந்திருக்கிறது.

நாட்டின் சனாதிபதியாக இருக்கட்டும், வெளிநாட்டுத் தூதுவர்களாக இருக்கட்டும், நான் ஓர் இளம் பாராளுமன்ற உறுப்பினராக எனது முதலாவது பாராளுமன்ற பதவிக் காலத்தில் மாவை. சேனாதிராஜா ஐயாவுடன் அவர்களைச் சந்திக்கச் செல்லும்பொழுது, அவர்கள் பல்வேறு விடயங்களைச் சொல்வார்கள். குறிப்பாக, இணக்கப்பாட்டு அரசியலில் ஈடுபட்டு, அரசியல் தீர்வை அடையப் பார்க்க வேண்டுமெனச் சொல்வார்கள். அப்பொழுதுதெல்லாம் அவர், "வடக்கு, கிழக்கு இணைந்த மாகாணத்தில் தமிழ் மக்கள் தங்களைத் தாங்களே ஆளக்கூடிய வகையிலான ஓர் அரசியல் தீர்வு அல்லாத ஒரு தீர்வை நாங்கள் ஏற்றுக்கொள்ள மாட்டோம்" என்று உறுதியாகக் கூறுவார். அவர் அவ்வாறு கூறியது, தமிழ் மக்கள் சார்பில் இந்த அரசியல் போராட்டத்தை முன்னெடுக்கும் ஓர் இளம் பாராளுமன்ற உறுப்பினரான எனக்கும் நம்பிக்கையைத் தந்தது. தமிழ் மக்களின் பிரதிநிதிகளாகிய நாங்களும் இவ்வாறுதான் பேச வேண்டும், எங்களுடைய அடிப்படை உரிமைகளை விட்டுக்கொடுக்க வேண்டிய அவசியமில்லை என்ற விடயத்தை அவர் தனது செயற்பாட்டின்மூலம் எங்களுக்கு உணர்த்தினார். இவ்வாறு எங்களுக்கு நம்பிக்கையூட்டும் செயற்பாடுகள் அவர் கலந்துகொண்ட அனைத்துக் கூட்டங்களிலும் காணப்பட்டன.

நான் ஏற்கெனவே குறிப்பிட்டதுபோல, மாவை. சேனாதிராஜா அவர்கள் பாராளுமன்ற உறுப்பினராக 25 ஆண்டுகள் இருந்தாலும்கூட, அவருடைய அரசியல் பிரவேசம் புரட்சிகரமானதாக இருந்ததாக புத்தகங்களை வாசிக்கும் போதும் செய்திகளைப் பார்க்கும்போதும் பலரிடம் பேசும்போதும் அறியக்கூடியதாக இருக்கின்றது. அவர் தனது செயற்பாடுகளின் ஊடாகப் பல இளைஞர்களைப் புரட்சிகரமான அரசியலின்பால் ஈர்த்த ஒருவர். அவர் 25 வருடங்கள் பாராளுமன்ற உறுப்பினராக இருந்திருக்கிறார். அதில், 20 வருடங்கள் யாழ். மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்தும் பாராளுமன்ற உறுப்பினராகவும் 5 வருடங்கள் தேசியப்பட்டியல் உறுப்பினராகவும் இருந்திருக்கிறார். அவர் தேசியப்பட்டியல் உறுப்பினராக இருந்த காலத்தில் கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற பிரச்சினைகள் பற்றி அதிக கவனம் செலுத்தியிருக்கிறார். அதுமாத்திரமன்றி, அவர் அம்பாறை மாவட்டத்தில் பல பணிகளையும் செய்திருக்கிறார். அவர் கிழக்கு மாகாணத்துக்கு விஜயம் செய்தால், அம்பாறை மாவட்டத்தில் காண்பவர்களை இலகுவாக அடையாளம் கண்டு, சரளமாக அவர்களின் பெயர்களைக் குறிப்பிட்டுச் சொல்வார். அவர்கள் 1980-1990ஆம் ஆண்டு காலப்பகுதியில் அவருடன் செயலாற்றியவர்கள். அவர் பாராளுமன்ற உறுப்பினராக வருவதற்கு முன்னர், சிறிமாவோ பண்டாரநாயக்க அவர்களின் ஆட்சிக் காலத்தில் அவர் உட்பட 42 பேர் மிக நீண்ட காலம் அரசியல் கைதிகளாகச் சிறையில் அடைத்து வைக்கப்பட்டு இருந்தார்கள். பல சந்தர்ப்பங்களில் அவர்மீது தாக்குதல் நடத்தப்பட்டது. ஒரு தடவை அவர் உயிரிழந்துவிட்டார் என்று அவரை விட்டுச் சென்ற பிறகும், எத்தனையோ நாட்களுக்குப் பிறகு அவர் மீண்டும் தான் உயிரிழக்கவில்லை, உயிரோடு தான் இருக்கின்றேன் என்று சொல்லி போராட்டங்களை முன்னெடுத்திருந்தார். அவ்வாறான ஒரு பெரும் தலைவர்தான் எங்களுடைய தமிழரசுக் கட்சியின் தலைவராக இருந்த மறைந்த மாவை. சேனாதிராஜா ஐயா அவர்கள்!

என்னுடனும் என்னுடைய குடும்பத்தினருடனும் மிக நெருக்கமாகப் பழகியவர்தான் மாவை. சேனாதிராஜா ஐயா அவர்கள்! என்னுடைய பாட்டனாரான சி.மூ. இராசமாணிக்கம் ஐயா அவர்கள் இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைவராக இருந்த காலப்பகுதியில், மாவை. சேனாதிராஜா அவர்கள் அக்கட்சியின் இளைஞர் அணியில் ஓர் உறுப்பினராக இருந்து அவருடன் சேர்ந்து பணியாற்றியவர். என்னுடைய பாட்டனார் இறந்ததற்குப் பிறகு, எங்களுடைய குடும்பத்தினருடன் இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைவர்களுள் மிகவும் நெருக்கமாகப் பழகிய ஒருவர்தான் மாவை. சேனாதிராஜா ஐயா அவர்கள்! அவர் எங்களுடைய இல்லத்துக்கு அடிக்கடி வருவார். அவ்வாறானதொரு சந்தர்ப்பத்தில்தான் நான் அவரை முதன்முறை சந்தித்தேன். அவர் மிகவும் அன்பாகப் பழகக்கூடிய ஒருவர். இலங்கைத் தமிழரசுக் கட்சியில் நானும் இணைந்து செயற்பட வேண்டும் என்று விரும்பிய ஒருவர்தான் மாவை. சேனாதிராஜா ஐயா அவர்கள்!

நான் இலங்கைத் தமிழரசுக் கட்சியில் இணைவதற்கு முன்னர், சம்பந்தன் ஐயா அவர்கள் எதிர்க்கட்சித் தலைவராக இருந்த காலத்தில், இரவு 7.00 மணிக்குப் பிறகு என்னை அவருடைய அலுவலகத்துக்கு அழைத்துப் பேசுவார்; ஆலோசனைகளைச் சொல்லுவார். "நீங்கள் இந்தக் கட்சியில் இணைய வேண்டும். இந்தக் கட்சியுடன் சேர்ந்து பயணிக்க வேண்டும். உங்களைப் போன்றவர்கள் இந்தக் கட்சியின் எதிர்காலத்துக்கு அவசியம்" என்று பல ஆலோசனைகளைச் சொல்லி என்னை வழிப்படுத்தியிருக்கிறார். அந்த வகையில், அவருடைய இழப்பானது எனக்கு மாத்திரமல்ல, எங்களுடைய கட்சிக்கு மாத்திரமல்ல, இந்த நாட்டுக்கே பாரியதோர் இழப்பாகும். ஏனெனில், அவர் பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த தலைவர்களால் மதிக்கப்பட்ட ஒரு தலைவர்! 'மாவை. சேனாதிராஜா' என்று சொன்னால், பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த தலைவர்களுக்குத் தெரியும்! மாவை போன்ற தலைவர்கள் உருவாகுவது மிகவும் குறைவு! வடக்கு, கிழக்கை மாத்திரம் அல்லது ஒரு மாவட்டத்தை மாத்திரம் மையமாக வைத்துக்கொண்டு அவர் செயற்படவில்லை. அதனால்தான் அவர் நாடு முழுவதும் தெரிந்த ஒரு தலைவராகத் திகழ்ந்தார்.

யுத்தம் முடிவடைந்த பிறகு, இந்த நாட்டில் தமிழ் மக்களுக்கு நிரந்தரமான ஓர் அரசியல் தீர்வு வேண்டும். இந்த நாட்டில் தமிழ் மக்கள் கௌரவமான ஓர் இனமாக வாழ வேண்டும். ஆயுதப் போராட்டம் முடிந்துவிட்டது. ஆனால், எங்களுடைய அரசியல் விடுதலைக்கான போராட்டம் முடிவடையவில்லை. அதை நாங்கள் தொடர்ந்து முன்னெடுப் போம். ஒரு போராட்டம் மௌனிக்கப்பட்டுவிட்டது

என்பதற்காகத் தமிழ் மக்களை நசுக்க முடியாது என்று பல சந்தர்ப்பங்களில் அவர் சொல்லியிருக்கிறார். இந்த நாட்டில் தமிழ் மக்கள் இப்பொழுதும் அரசியல் தீர்வு பற்றி பேசக்கூடிய ஒரு சூழலை சம்பந்தன் ஐயா அவர்களுடன் இணைந்து உருவாக்கியதில் மாவை. சேனாதிராஜா அவர்களுக்கும் பெரும் பங்கு உண்டு. அவருடைய இறப்பு பற்றி அனைவருக்கும் தெரியும்! அப்போது நான் வெளிநாட்டில் இருந்தபடியால், அவருடைய இறுதிக்கிரியையில் கலந்துகொள்ள முடியாமல் போனது. இன்று இந்தப் பாராளுமன்றத்தில் நடைபெறும் அவர் தொடர்பான அனுதாபப் பிரேரணையில் கலந்துகொண்டு, அவர் பற்றி ஒருசில வார்த்தைகளையேனும் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மகிழ்ச்சியடை கின்றேன். அவரது இழப்பால் துயருறும் அவருடைய குடும்பத்தினருக்கும் உறவினர்களுக்கும் அவர்மீது மதிப்பு வைத்திருக்கும் ஒட்டுமொத்த தமிழ் இனத்துக்கும் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்து விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 2.44]

**ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කෝසල නුවන් ජයවීර අපේ මන්ත්‍රීතුමා, අපේ සහෝදරයා පිළිබඳව අද මේ පාර්ලිමේන්තුවේ ශෝකය පළ කරමින් කරන යෝජනාවේදී, මගේ ජීවිතය ඇතුළේ ඉතාම අසීරුතම අවස්ථාවලදී කථා කරන්න අවස්ථාවක් හම්බ වුණා නම්, ඒකෙන් එක් අවස්ථාවක් තමයි මේ අවස්ථාව කියලා මම විශ්වාස කරනවා. මොකද, අපේ ආදරණීය කෝසල සහෝදරයා කියන්නේ අපිත් එක්ක එකට අරගළ කරපු, අපිත් එක්ක සටන් කරපු, මේ සමාජය වෙනස් කරන්න පොර බදපු සහෝදරයෙක්. මම ඇතුළු අපි කවුරුවත් විශ්වාස කළේ නැහැ, මේ සභාව ඇතුළේ කෝසල සහෝදරයා නැතිව අපට ඔහු ගැන කථා කරන්න වෙයි කියලා. හැබැයි, අප මේ යථාර්ථයට දැන් මුහුණ දිය යුතුයි. මොකද, කෝසල සහෝදරයා දැන් අපෙන් වෙන් වෙලා ගිහිල්ලා ඉවරයි. ඒක නිසා මේ යථාර්ථයට අපි මුහුණ දිය යුතු වෙනවා. අපේ කෝසල සහෝදරයා බලාපොරොත්තු වෙච්ච අරමුණ, එතුමා තරුණයකු විධියට ලබා දුන්නු ආදර්ශය අපට ගොඩක් වටිනවා. මේ රටේ තරුණ පරම්පරාවටත්, ඒ වාගේම එතුමාට ආදරය කරපු අපේ ආදරණීය සහෝදර සහෝදරියනුත්, කෝසල සහෝදරයා අරමුණුසහගතව කරපු ඒ මැදිහත්වීම අපේ රට ඇතුළේ යථාර්ථයක් බවට පත් කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීමේ වගකීම දැන් අපි කාටත් තිබෙනවා.

විශේෂයෙන්ම කෝසල සහෝදරයා අපත් එක්ක වැඩිපුරම සමීප ගනුදෙනුව ආරම්භ වුණේ, එතුමා සමාජවාදී තරුණ සංගමයට සම්බන්ධ වෙලා, තරුණයකු විධියට කෑගල්ල දිස්ත්‍රික්කයට නායකත්වය දෙන්න අපත් එක්ක මැදිහත් වෙන කාලය ඇතුළේ. හැබැයි, ඊට පෙර කෝසල සහෝදරයා කියන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසලක, රත්නපුර දිස්ත්‍රික්කයේ පාසලක පාසල් දිවිය අවසන් කරලා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු උපාධිය පිළිබඳව හැදෑරීම කරන මොහොත තුළත්, එතුමාගේ විශ්වවිද්‍යාල ජීවිතය ඇතුළේ විශේෂයෙන්ම ශිෂ්‍ය සටන් තුළත් කැපී පෙනුණු ධෛර්යවත් නායකයෙක්. ඒ කාලයේ කෝසල සහෝදරයා විවෘත විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා බවට පත් වෙනවා. ඒ විතරක් නොවෙයි, එතුමා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටු සාමාජිකයකු බවටත් පත් වෙනවා. එම නිසා එතුමාගේ ජීවිතය ආරම්භයේ සිටම, ශිෂ්‍ය කාලයේ ඉඳන්ම සටන්කාමී විධියට කටයුතු කළ කෙනෙක්. ඒ වාගේම, මේ රටේ ඉන්න මිනිසුන්ට, මේ රටේ තරුණ පරම්පරාවට ආදරය කරපු සහෝදරයකු විධියට තමයි එතුමා සංකේතවත් වෙන්නේ. ඒ විතරක් නොවෙයි, සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජිකයකු වාගේම, කෑගල්ල දිස්ත්‍රික්කයේ තරුණ සංගමයේ දිස්ත්‍රික් සංවිධායකවරයා බවටත් එතුමා පත් වෙනවා.

විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ නායකත්වය දරන අපේ වෛද්‍ය දම්මික පටබැඳි ඇමතිතුමා කිව්වා වාගේම, කෑගල්ල දිස්ත්‍රික්කය කියන්නේ අනෙක් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව අපට අභියෝගාත්මක දිස්ත්‍රික්කයක්. මීට වසර ගණනාවකට පෙර කෑගල්ල දිස්ත්‍රික්කය ඇතුළේ අපට තිබුණු දුෂ්කරතා, අමාරුකම් අපි දන්නවා. ඒ දුෂ්කරතා, අමාරුකම් තිබියදීත් එතුමා ඒවාට කවදාවත් සැලුණු සහෝදරයෙක් නොවෙයි. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇති, අපේ ව්‍යාපාරය ඇතුළේ අපි හැමෝටම අමාරු, යම් බෙදීම් ලක්ෂ්‍යයක් එක මොහොතක සනිටුහන් වෙන බව. අපට අදත් ඒ මොහොත ගැන කථා කරද්දී සතුටු නැහැ. අපි කාටත් ඒක වේදනාබර හැඟීමක් දැනෙන කාලයක්, දවසක්.

හැබැයි, ඒ වෙලාවෙත් ශිෂ්‍යයකු විධියට හිටපු අපේ කෝසල සහෝදරයාට සහ අපේ කණ්ඩායමට පුළුවන් වුණා නිවැරදි පැත්ත තෝරා ගන්න; ජනතාවගේ පැත්ත තෝරා ගන්න; අපේ පක්ෂයේ අරමුණ තෝරා ගන්න. ඒ වෙනුවෙන් ශිෂ්‍ය අවධියේ ඉඳන්ම කෙළින් හිටපු සහෝදරයෙක් තමයි කෝසල සහෝදරයා කියන්නේ. ඒ බෙදීම ඇතුළෙත්, අප ඇතුළේ තිබුණු ඒ සංවාදය ඇතුළෙත් එතුමා තෝරා ගත්තේ නිවැරදි දේශපාලන දර්ශනයයි, ප්‍රතිපත්තියයි, පාවා නොදීමයි. අපේ කෝසල සහෝදරයා ඒ දේවල් පෙන්නුම් කරමින් තිබුණා. ඒ විතරක් නොවෙයි, තරුණ සංගමයෙත්, ජනතා විමුක්ති පෙරමුණෙත්, ජාතික ජන බලවේගය ඇතුළෙත් එතුමා වැඩ කරද්දී, ඒ වගකීම් දරද්දි කිසි වෙලාවක rest එකක් ගත්තේ නැති සහෝදරයෙක්. අපි කාටත් කෝසල සහෝදරයා මතක් වෙන්නේ එතුමාට තිබුණ සුන්දර හිනාවෙන්. කෝසල සහෝදරයාගේ ජීවිතය ඇතුළේ මම කිසි තැනකදී දැකලා නැහැ කේන්තියෙන් තවත් කෙනෙකුට කථා කරනවා. කොයි වෙලාවෙත් හැම දෙයක්ම සිනහවෙන් සුන්දරත්වයෙන්, සහෝදරත්වයෙන්, සහකම්පනයෙන් භාර ගත්ත සහෝදරයෙක් තමයි කෝසල සහෝදරයා කියන්නේ. අභියෝග එද්දී, ගැටලු එද්දී ඒවාට සැලෙන්නේ නැතිව, ඒවා අභියෝගයක් විධියට බාර ගත්ත කෙනෙක් තමයි කෝසල සහොදරයා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අපේ ජීවිත ඇතුළේ -විශේෂයෙන් තරුණ කාලයේ- ඕනෑම තරුණයෙකුට යම් තීරණාත්මක සන්ධිස්ථානයන් එනවා කියලා. අපේ රටේ තරුණ පරම්පරාවට ජීවිතයේ සන්ධිස්ථාන එන තැන් තිබෙනවා. අපේ ජීවිතයේ එක සන්ධිස්ථානයක් තමයි, එක පැත්තකින් පෞද්ගලික අභිමානය, පෞද්ගලික ජීවිතය වාගේම, තමන්ගේ ජීවිතය ගොඩනඟා ගන්න ඕනෑ කියන ඒ ආකල්පයත් අපේ රටේ තරුණ පරම්පරාවට එනවා. ඒක ඇත්ත. එහෙම සන්ධිස්ථානයක් එනවා. ඒ වාගේම තවත් මොහොතක් එනවා. ඒ මොහොත ඇතුළේම තවත් පාරක් අපට පෙන්වනවා. ඒ තුළින් පොදු අරමුණට, සාමූහිකත්වයට, සහෝදරත්වයට යන පාරක් පෙන්වනවා. අප කාගේත් ජීවිත ඇතුළේ එහෙම තීරණාත්මක තැන් එනවා. ඒ හැම

[ගරු එරංග ගුණසේකර මහතා]

තීරණාත්මක මොහොතක්ම ඇතුළේ කෝසල සහෝදරයා පෙන්නුවේ පොදු අරමුණ, සහෝදරත්වය සහ සහකම්පනයයි. ඒ අමාරු දුෂ්කර මාවත තමයි හැමදාම කෝසල සහෝදරයා තෝරා ගත්තේ. එහෙම නැතුව පුද්ගලික ආත්මාර්ථකාමීකම නොවෙයි. පුද්ගලිකත්වය තමන් ඇතුළේ ගොඩනගා ගැනීම, තමන් පිළිබඳව සිතීම, තමන්ගේ පවුල ගැන පමණක් සිතීම කියන ඒ සුන්දර මාර්ගය වෙනුවට අභියෝගාත්මක මාර්ගය තමයි හැමදාම කෝසල සහෝදරයා තෝරා ගත්තේ. විශේෂයෙන්ම අපේ තරුණ පරම්පරාවට කෝසල සහෝදරයාගෙන් ඉගෙන ගන්න බොහෝ දේවල් තිබෙනවා. මොකද, ඒ අමාරු මාවත් ඇතුළේ කෝසල සහෝදරයා ඒ අරමුණ හරියටම සාක්ෂාත් කළා. අධ්‍යාපන ක්‍රියාවලිය ඇතුළේ විශ්වවිද්‍යාල ජීවිතය අවසන් කරන මොහොතේ එතුමා තෝරා ගත්තේ මේ රටේ මහජනතාවට, මේ රටේ තරුණ පරම්පරාවට විමුක්තිය උදා කිරීමේ මාවතයි. ඒ වාගේම රැකියාව කියන කාරණයේදී රැකියාවක් සොයාගෙන පුද්ගලිකව කීයක් හරි සොයා ගන්නවා කියන අරමුණ පැත්තක තියලා එතුමා තෝරා ගත්තේ මේ රටේ තරුණයන්ගේ, මේ රටේ අම්මාගේ තාත්තාගේ ජීවිතය ගොඩ නඟන්න පුළුවන් ඒ දුෂ්කර මාවතයි. දේශපාලනයේදීත් එහෙම තමයි. මෙතැන ඉන්න අපි කවුරුත් ඒ ගැන දන්නවා. ඒ වාගේම දශක තුනකට හතරකට වැඩි පාලනයක් ඇතුළේ අපි දුෂ්කර මාවතක ආපු ව්‍යාපාරයක් බව පිටු පස පේළියේ ඉන්න ගොඩක් සහෝදර සහෝදරියන් දන්නවා. ඔබතුමා ඇතුළු අපි කවුරුත් ඒ ගැන දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක ඇතුළේ අපට වැඩිපුරම තිබුණේ මල් නොවෙයි, ගල්. අපට ප්‍රශංසා නොවෙයි, නින්දා තමයි තිබුණේ. හැබැයි, අප කාටත් අරමුණක් තිබුණා. ඒ තමයි, අපි සත්‍යය වෙනුවෙන් පෙනී ඉන්නවා, මහජනතාව වෙනුවෙන් පෙනී ඉන්නවා, හරි දේ වෙනුවෙන් පෙනී ඉන්නවා කියන ඒ අභියෝගාත්මක අරමුණ. ඒ අරමුණේ හිටපු සහෝදරයෙක් තමයි කෝසල සහෝදරයා කියන්නේ. ඒ නිසා තමයි අපේ තරුණ පරම්පරාවට කෝසල සහෝදරයා පිළිබඳව දුක වේදනාව දැනෙන්නේ. අපට කෝසල සහෝදරයා තව තවත් බදා ගන්න පුළුවන් වෙන්නේ. එතුමා තව තවත් මෙනෙහි කර ගන්නට පුළුවන් වෙන්නේ. ඒ නිසා කෝසල සහෝදරයාගේ ගුණාංග නැවත නැවත අප තුළට ලබා ගැනීම වැදගත්.

අවසාන වශයෙන් කියන්න කැමැතියි, විශේෂයෙන්ම 2022 වර්ෂයේ අපේ රටේ පැවැති මහජන නැඟිටීම ගැන. ඒ මහජන නැඟිටීම සිදුවෙච්ච වෙලාවේ ඉඳලා කෝසල සහෝදරයා එතුමාගේ ජීවිතය අවසාන වෙනතුරු අපත් එක්ක ඒ අභියෝගවලට මුහුණ දෙමින් ඉතාම දක්ෂ ලෙස මැදිහත් වෙච්ච සහෝදරයෙක්; සටන්කාමී ලෙස මැදිහත් වෙච්ච සහෝදරයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තීරණාත්මක දින කිහිපයක් ඒ අරගළය ඇතුළේ පැවතුණා. අපි ගන්න ඕනෑ තීරණය මොකක්ද, අපි කරන්න ඕනෑ මොකක්ද කියන ඒ අභියෝගයට මුහුණ දුන් වෙලාවක් තිබුණා. මට තවමත් මතකයි, ඒ අරගළය ඇතුළේ ඒ අවස්ථා ගණනාව ඇතුළේම කෝසල සහෝදරයා කණ්ඩායමක් විධියට අපි ගන්නා තීන්දුවලට පිරිසත් එක්ක ඉතාම දක්ෂ ලෙස එතුමාගේ කැපවීම තව තවත් පැහැදිලිව පෙන්නුම් කරන්න මැදිහත් වුණු බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කෝසල සහෝදරයා ගැන අද කථා කරද්දී, එතුමා පිළිබඳ මේ සභාවට කියන්නේ කොහොමද, ඌනපූරණ එකතු කරන්නේ කොහොමද කියලා කරුණු සොයා බලද්දී, විශේෂයෙන්ම ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ කියමනක් මට හම්බ වුණා. ඉතින්, කෝසල සහෝදරයා ගැන කථා කරද්දී, ෆ්‍රැන්සිස් පාප් වහන්සේ තබපු ඒ සටහන කෝසල සහෝදරයාගේ ජීවිතයටත් සැලකිය යුතු සම්බන්ධයක් තිබෙනවා කියලා මට හිතෙනවා. ෆ්‍රැන්සිස් පාප් වහන්සේ මේ ලෝකයට දීපු පණිවුඩය මොකක්ද? ඒ තමයි, "ගංගාවලට කිසිම දවසක තමන්ගේ වතුර බොන්න හම්බ වෙන්නේ නැහැ, ගස්වලට කවදාවත් තමන්ගේ පලතුරු කන්න හම්බ වෙන්නේ නැහැ, ඉරට කවදාවත් තමන් වෙනුවෙන් දිලිසෙන්න හම්බ වෙන්නේ නැහැ, මලට කවදාවත් තමන්ගේ සුවඳ විඳින්න හම්බ වෙන්නේ නැහැ, සොබා දහමේ නීතිය තමයි අනෙකා වෙනුවෙන් ජීවත් වීම, අපි හැමෝම ඉපදිලා ඉන්නේ එකිනෙකාට උදවු කරන්න, ඒක කොයිතරම් දුෂ්කරද කියන කාරණාව අදාළ නැහැ, ඔබ සතුටින් ඉන්න එක තමයි වැදගත්, ඒත් වැඩියෙන් වැදගත් වන්නේ ඔබ නිසා අනෙක් අය සතුටින් ඉන්න එක" කියලා. මම හිතනවා, කෝසල සහෝදරයාත් ඒ අරමුණට දැඩිව ආදරය කරපු, ඒක විශ්වාස කරපු සහෝදරයෙක්. කෝසල සහෝදරයා තමන්ගේ සතුට වෙනුවෙන් නොවෙයි වැඩ කළේ. කෝසල සහෝදරයා හැමදාම වැඩ කරමින් සිටියේ මේ රටේ ජනතාවගේ, මේ රටේ තරුණ පරම්පරාවගේ සතුට වෙනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජවාදී තරුණ සංගමයේ වගකීමක් දරන සහෝදරයකු විධියටත්, පාර්ලිමේන්තු කණ්ඩායමේ සහෝදරයකු විධියටත් මා මෙහෙම ප්‍රකාශ කරන්න කැමැතියි. කෝසලට ආදරය කරපු, ඒ වාගේම කෝසලගේ සිනහවට ආදරය කරපු, කෝසලගේ සහකම්පනයට ආදරය කරපු, කෝසලගේ ආදරයට ආදරය කරපු ඒ තරුණ පරම්පරාවටත්, ඒ වාගේම ඒ ආදරණීය අම්මා තාත්තා ඇතුළු ඒ පවුලේ සැමටත්, කෝසල එක්ක වැඩ කරපු, එතුමාගේ වියෝව නිසා දුක් වුණු, පසුගිය දින කිහිපය පුරාම ඒ අයත් එක්ක හඬපු, ඒ මැදිහත් වෙච්ච තරුණ තරුණියන් සියලු දෙනාටත් අපි දෙන පණිවුඩය තමයි, කෝසලගේ සිනහව වාගේම මේ රටත්, මේ ලෝකයත් සුන්දර කර ගැනීම සඳහා කෝසලගේ තිබුණු අරමුණ යථාර්ථයක් කිරීම වෙනුවෙන් අපි කටයුතු කරමු කියන එක. කෝසල සහෝදරයාට දෙන්න පුළුවන් උපරිම ගෞරවය තමයි ඒ අරමුණ මේ මිහිතලය තුළ යථාර්ථයක් බවට පත් කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම. අපි හැමදෙනාම එතුමාගේ ඒ අරමුණ යථාර්ථයක් බවට පත් කර ගැනීම වෙනුවෙන් වැඩ කරනවාය කියන පොරොන්දුව ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව වෙනුවෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් ගරු මන්ත්‍රීතුමා.

[பி.ப. 2.57]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் நால்வரின் மறைவையொட்டிய அனுதாபப் பிரேரணைகள்மீது உரைகள் இன்றைய தினம் இடம்பெற்றுக்கொண்டிருக்கிறது. பாராளுமன்ற உறுப்பினராக இருந்த காலஞ்சென்ற டொனல்ட் திசாநாயக்க அவர்கள் கம்பஹா மாவட்டத்தைச் சேர்ந்தவர். 1989இலே பாராளுமன்ற உறுப்பினராகத் தெரிவானவர். நகர

சபை உறுப்பினராகத் தனது அரசியலை ஆரம்பித்த அவர், பாராளுமன்ற உறுப்பினராக இருந்த காலத்திலே நிறைய நல்ல பணிகளைத் தனது மக்களுக்கு ஆற்றியிருந்தார். அதன்பிறகு அவரால் பாராளுமன்றம் வரமுடியாவிட்டாலும், தன்னுடைய பெயரிலே ஓர் அரச சார்பற்ற நிறுவனத்தை நிறுவி, தான் இறக்கும்வரை தனது மாவட்ட மக்களுக்குத் தன்னாலான நல்ல பணிகளைச் செய்துவந்த ஒருவர். அவரது இறப்பால் கவலையுறுகின்ற குடும்பத்தினருக்கு எங்களுடைய அனுதாபத்தை இந்த இடத்திலே நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம்.

அதேபோல, காலஞ்சென்ற ஜே.ஆர்.பி. சூரியப்பெரும அவர்கள் ஒரு மூத்த அரசியல்வாதி. அவர் 1970களிலே ஐக்கிய தேசியக் கட்சியினூடாகப் பாராளுமன்றத் தேர்தலிலே போட்டி யிட்டாலும் அதிலே தோல்வியடைந்திருந்த அதேவேளை, கட்சித் தலைமையோடு ஏற்பட்ட முரண்பாடு காரணமாக பின்னர் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியிலே சேர்ந்திருந் திருந்ததுடன், 1981 மற்றும் 1991ஆம் ஆண்டின் முக்கிய காலகட்டங்களிலே கட்சியினுடைய பொதுச் செயலாளர் என்றொரு பெரிய பதவியை வகித்தவர். தன்னுடைய தொழிலை ஆசிரியராக ஆரம்பித்த அவர், அரசியலிலே பாராளுமன்ற உறுப்பினராக வரும்வரை உயர்ந்து நின்று, நாட்டுக்கும் மக்களுக்கும் பல பணிகளை ஆற்றியவர். அந்த வகையில், அவரது இழப்பால் கவலை யுறுகின்ற அவருடைய குடும்பத்தினருக்கும் மற்றவர்களுக்கும் எங்களுடைய அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றோம்.

காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ கோசல நுவன் ஜயவீர அவர்கள் இந்தப் பாராளுமன்றத்திலே 4 மாதங்கள்தான் உறுப்பினராக இருந்தார். 1987இல் பிறந்த அவர் ஒரு பொறியியலாளராக, ஓர் இளம் அரசியல்வாதியாக இந்தப் பாராளுமன்றத்திற்குள்ளே நுழைந்திருந்தார். தான் பதவி வகித்த ஒரு குறுகிய காலத்திற்குள்ளே இந்தப் பாராளுமன்றத்தின் பல குழுக்களிலே உறுப்பினராக இருந்து தன்னாலான பணிகளை ஆற்றிய ஒருவர் அவர். பல்கலைக்கழகத்தில் இருந்தபோதும் அவர் மாணவ அமைப்புகளுடன் இணைந்து பல்வேறு போராட்டங்களில் ஈடுபட்டவர். இளம் வயதில் அவருடைய உயிர் பிரிந்துள்ளது. அவருடைய இழப்பினால் துயருறும் அவருடைய குடும்பத்தினருக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக்கொள்வதுடன், அவரது உறவினர்களும் கட்சிக்காரர்களும் ஆதரவாளர்களும் படுகின்ற வேதனையில் நாங்களும் பங்குபற்றிக்கொள்ளுகின்றோம்.

அதேபோல், காலஞ்சென்ற மாவை. சேனாதிராஜா அவர்கள் எங்களுக்கு மிக நெருக்கத்துக்குரியவர். அவர் தமிழ் பேசும் மக்களை நேசித்த தலைவர்; இந்த நாட்டை நேசித்த தலைவர். அவருடைய மறைவு இந்த நாட்டுக்குப் பேரிழப்பாகும். இந்த நாட்டில் தோன்றிய பல தலைவர்களுள் அவரையும் ஒரு நல்ல தலைவராகவே நாங்கள் பார்க்கின்றோம். அவர் மாணவனாக இருந்த காலத்திலிருந்தே நியாயத்திற்காக, மண்ணுக்காக, மக்களுக்காகப் பல போராட்டங்களை முன்னெடுத்தவர்; பல தியாகங்களைச் செய்தவர். அவ்வாறு நியாயத்திற்காகப் போராடியதால் அன்றைய ஆட்சியாளர்களால் கைது செய்யப்பட்டு 7 வருடங்கள் வரையில் சிறையில் இருந்தார். மாணவப் பருவத்தில் தனது அரசியலைத் தொடங்கிய காலத்திருந்து தான் மரணிக்கும்வரை இலங்கைத் தமிழ் அரசுக் கட்சியிலே இருந்தார். சவால் மிகுந்த காலங்களில், அதாவது யுத்தம் மற்றும் அதற்குப் பின்னைய காலங்களில் மிக நேர்மையான, மிகத் தூய்மையான அரசியல்வாதியாக பாராளுமன்றத்திற்கு உள்ளேயும் வெளியேயும் செயற்பட்டார்.

அனைவருடனும் மிகவும் நேசமாகவும், நெருக்கமாகவும் அவர் பழகுவதை நாங்கள் கண்டிருக்கின்றோம். என்னைக் காண்கின்றபொழுதெல்லாம் யாழ்ப்பாணத்திலிருந்து வெளியேற்றபட்ட முஸ்லிம்களுடைய பிரச்சினைகள் சம்பந்தமாகப் பேசுவதுடன், அவர்களுக்கு ஒரு நிரந்தரத் தீர்வு கிடைப்பதற்குத் தான் என்றும் ஒத்துழைப்பவனாக இருப்பேன் என்றும் அடிக்கடி என்னிடம் கூறுவார். அவ்வாறான ஒருவருடைய இழப்பை அவருடைய கட்சிக்கு மட்டுமல்ல, குறிப்பாக, தமிழ் பேசுகின்ற மக்களுக்கும், இந்த நாட்டுக்கும் பேரிழப்பாகவே நாங்கள் பார்க்கின்றோம். எனவே, அவரது இழப்பால் துன்பப்படுகின்ற அவருடைய பிள்ளைகள், உறவினர்கள், கட்சிக்காரர்கள், தமிழ்பேசும் மக்கள் அனைவருக்கும் எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தை அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சி சார்பாக தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා.

[අ.භා. 3.03]

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මාවෙ සෝ. සේනාධිරාජා මැතිතුමාගේ, ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමාගේ, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාගේ සහ ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙන අද දවසේදී අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින්, අප සමඟ එකට දේශපාලනය කරපු, අදට හරියටම මාස දෙකකට ඉහතදී අපෙන් සමු ගත් කෝසල නුවන් ජයවීර සහෝදරයා ගැන මුලින්ම වචන ස්වල්පයක් කථා කරන්න මම කැමැතියි.

හපුආරච්චිගේ ජයවීර ආදරණීය පියාණන් හා ලොකුහපුආරච්චිගේ චන්ද්‍රානි ආදරණීය මෑණියන්ට දාව 1987 වර්ෂයේ ජනවාරි 14වැනි දා පවුලේ වැඩිමහල් දරුවා හැටියට උපත ලැබූ අපේ කෝසල නුවන් ජයවීර සහෝදරයා ගුරුගල්ල කනිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනයත්, ඇහැලියගොඩ ජාතික පාසලෙන් ද්විතීයික අධ්‍යාපනයත් ලැබුවා. 2007 වර්ෂයේදී කෝසල සහෝදරයා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙලා ඉංජිනේරු පාඨමාලාව හැදෑරුවා. 2010 වසරේදී කෝසල සහෝදරයා මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා බවට පත් වුණා. ඒ එක්කම සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටු සාමාජිකයෙකු බවටත් පත් වුණා. එතැනින් තමයි කෝසල සහෝදරයා දේශපාලන ජීවිතය ආරම්භ කළේ. ඉන් අනතුරුව 2018 වර්ෂයේදී තමයි කෝසල සහෝදරයා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ක්‍රියාකාරී දේශපාලනයට එන්නේ. මුලින්ම එතුමා 2018 වර්ෂයේදී දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නියෝජනය කරමින් ප්‍රාදේශීය සභාවට තරග කරලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු බවට පත් වුණා. ඒත් එක්කම 2018 වර්ෂයේදීම අපේ කෝසල සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණේ රුවන්වැල්ල ආසනයේ සංවිධායකවරයා බවට පත් වුණා.

මට විශේෂයෙන් මතක් වෙනවා, කෝසල නුවන් ජයවීර සහෝදරයා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු හැටියට සිටියදී එවකට පැවැති ආණ්ඩුව කෑගල්ල දිස්ත්‍රික්කය පුරා කටුපොල් වගාව ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළ ආකාරය. පරිසරයට

[ගරු කංචන වැලිපිටිය මහතා]

හානිකර ඒ කටුපොල් වගාවට විරුද්ධව දැවැන්ත හඬක් නඟපු, ඊට විරුද්ධව සටන් කරන්න නායකත්වය දීපු අයෙක් තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා. 2019 වර්ෂයේදී දෙහිඕවිට ජන අයිතීන් සුරැකීමේ සංවිධානය ගොඩනඟලා, දෙහිඕවිට විතරක් නොවෙයි, දැරණියගල, යටියන්තොට, බුලත්කොහුපිටිය පමණක් නොවෙයි කෑගල්ල දිස්ත්‍රික්කය පුරාම ඒ සංවිධානය ව්‍යාප්ත කරලා, ජනතාව සංවිධානය කරලා, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කටුපොල් වගාව නතර කරනතුරුම අරගළ කරපු, ඒක නවත්වන්න නායකත්වය දීපු පුද්ගලයා තමයි, කෝසල නුවන් ජයවීර සහෝදරයා. ඒ වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයේ පන්සල්වලට ගිහිල්ලා ඒ හාමුදුරුවන් වහන්සේලා දැනුවත් කරලා, කටුපොල් වගාවට විරුද්ධව ආගමික නායකයන්ගේ දායකත්වය ලබා ගන්නත් කෝසල නුවන් ජයවීර සහෝදරයා සමත් වෙනවා. ඒ ආකාරයට කෑගල්ල දිස්ත්‍රික්කයට ප්‍රබල අභියෝගයක් බවට පත් වෙලා තිබුණු කටුපොල් වගාව සම්පූර්ණයෙන් නතර කිරීම වෙනුවෙන් කෝසල නුවන් ජයවීර සහෝදරයා දැවැන්ත හඬක් නැඟුවා.

ඉන් අනතුරුව ජාතික ජන බලවේගයේ අපේ දේශපාලන ව්‍යාපාරය ආරම්භ කළාට පස්සේ ජාතික ජන බලවේගයේ රුවන්වැල්ල ආසනයේ සංවිධායකවරයා බවටත් කෝසල නුවන් ජයවීර සහෝදරයා පත් වුණා. ඒත් එක්කම, එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ විධායක සභිකයෙකු හැටියට කටයුතු කරන අතරම, සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජිකයෙකු වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංවිධායක විධියටත් පත් වුණා. එහිදී කෝසල නුවන් ජයවීර සහෝදරයා කෑගල්ල දිස්ත්‍රික්කය පුරා ඉන්න සියලු තරුණයන් එකතු කර ගැනීම වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් කළා. විශේෂයෙන් මෑත ඉතිහාසයේ අප ලැබූ සියලු ජයග්‍රහණවල මූලික කොටස්කරුවෙක් තමයි, කෝසල නුවන් ජයවීර සහෝදරයා කියන්නේ. එක පැත්තකින් එතුමා පරිසර සංවිධාන එකතු කරනවා, අනෙක් පැත්තෙන් දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් එකතු කරනවා, ආගමික නායකයන් එකතු කරනවා. මෙන්න මේ වාගේ විශාල වැඩ කොටසක් කරපු, කෑගල්ල දිස්ත්‍රික්කයේ බලය ගොඩනැඟීමේදී මූලික දායකත්වයක් දීපු කෙනෙක් තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා.

2024 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයට දීපු නායකත්වයේ ප්‍රතිඵලයක් හැටියට දිස්ත්‍රික්කයේ දෙවැනියා විධියට මනාප 61,613ක් ලබාගෙන තමයි මේ පාර්ලිමේන්තුවට පිවිසුණේ. මට පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හමු වුණු හැම වෙලාවේම කිව්වේ කෝසල නුවන් කියන්නේ හොඳ මනුස්සයෙක් කියලායි. ඉහළ සිට පහළ දක්වා සිටින හැම කෙනා එක්කම එතුමා ගනුදෙනු කරලා තිබෙනවා. කැන්ටින් එකට ගියාම එහි වැඩ කරන අයත් කියන්නේ කෝසල මන්ත්‍රීතුමා කියන්නේ හොඳ මන්ත්‍රීවරයෙක් කියලායි. අදත් කැන්ටින් එකේදී එහි වැඩ කරන නිලධාරි මහත්වරු කිව්වේත් ඒකයි. හැමකෙනාත් එක්කම සුහදව ගනුදෙනු කරන්න පුළුවන් කෙනෙක්, එතුමා. අපේ සහෝදරවරුන් හැමකෙනාම කිව්වා වාගේ හිනා වෙලා හැම දේකටම ප්‍රතිචාර දක්වන කෙනෙක් තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා කියන්නේ. කෝසල සහෝදරයා හිනා වෙනවා වාගේම දැඩි තීන්දු තීරණත් ගන්නවා.

COPE එකේ සාමාජිකයෙකු හැටියට හිටපු ඒ මාස 4යි දවස් 21 ඇතුළත ඒ සහෝදරයාගේ මැදිහත්වීම, ඒ කැපකිරීම ගැන අපි අහලා දැකලා තිබෙනවා. එතුමා දිස්ත්‍රික්කය තුළත් කටයුතු කළේ ඒ විධියට. කෝසල නුවන් ජයවීර සහෝදරයා කාටත් හොඳින් සලකනවා වාගේම, අසාධාරණයට විරුද්ධව නැඟී සිටිමින් දැවැන්ත කාර්යභාරයක් කළ, දැවැන්ත හඬක් නැඟූ කෙනෙක්. කෑගල්ල දිස්ත්‍රික්කයටත්, මුළු රටටත්, අවුරුදු 38ක් ඇතුළත මිනිහෙකුට කරන්න පුළුවන් උපරිම දේ කළ තරුණ නායකයෙක් තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා. එතුමා අවුරුදු 38ක් තුළ කළ දේ සමහරු අවුරුදු 100ක් ජීවත් වුණත් කරන්න බැහැ. ඒ නිසා මා මෙය අවස්ථාවක් කර ගන්නවා, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින්, අපිත් එක්ක එකට දේශපාලනය කළ අපේ ආදරණීය කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය දෙමව්පියන්, ආදරණීය සහෝදරයන් දෙපළ ඇතුළු ඥාති හිතවතුන් සියලුදෙනාට ශෝකය ප්‍රකාශ කිරීමට; සාතිශය සංවේගය පළ කිරීමට.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා.

[பி.ப. 3.10]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் என்னுடைய அரசியல் வாழ்க்கையைத் தொடங்கிய காலத்தில்தான் தமிழ்த் தேசியக் கூட்டமைப்பு என்ற ஓர் அமைப்பு ஸ்தாபிக்கப்பட்டது. என்னுடைய அரசியல் வாழ்க்கை அந்தக் கூட்டமைப்பின் ஊடாகத்தான் ஆரம்பிக்கப் பட்டது. நான் முதற் தடவையாகப் பாராளுமன்றத் தேர்தலில் போட்டியிட்டபோது, தமிழ்த் தேசியக் கூட்டமைப்பில் முக்கியமானதொரு பதவியை வகித்த முன்னாள் பாராளுமன்ற உறுப்பினரான அமரர் மாவை. சேனாதிராஜா அவர்களை இன்று நாங்கள் நினைவுகூருகின்றோம். இன்று அவருக்கு அஞ்சலி செலுத்துவதற்காக இந்தச் சபையில் கொண்டுவரப்பட்டுள்ள அனுதாபப் பிரேரணையில் நாங்கள் பேசிக்கொண்டு இருக்கின்றோம்.

அமரர் மாவை. சேனாதிராஜா அவர்களின் நல்ல குணங்கள் மற்றும் அரசியல் பின்னணி பற்றி மாத்திரம் பேசுவதைத் தாண்டி, அவருடைய அரசியல் பாதை தொடர்பான ஒருசில ஆழமான கருத்துகளை நான் இங்கு சொல்ல விரும்புகின்றேன். நான் சார்ந்த அகில இலங்கைத் தமிழ் காங்கிரஸானது அப்போது அவர் சார்ந்திருந்த தமிழர் விடுதலைக் கூட்டணிக்குப் போட்டியாகச் செயற்பட்ட காலத்தில்தான் நான் முதற் தடவையாக மாவை. சேனாதிராஜா அவர்கள் பற்றி கேள்விப்பட்டேன். அதாவது, நான் அரசியலுக்குள் நேரடியாக இறங்குவதற்கு முன்னரே அவரைப் பற்றி கேள்விப் பட்டிருக்கிறேன். அந்தக் காலத்தில் எம்முடைய அமைப்புக்குப் போட்டியாக இருந்த ஒரு கட்சியின் முக்கிய தலைவர்கள் தொடர்பில் நாங்கள் வைத்திருந்த பார்வை வித்தியாசமானது. நாங்கள் கொள்கை அளவில் இணைந்து ஒன்றாகப் பயணிப்போம் என்று முடிவெடுத்த பிறகுதான், அதாவது, 2001ஆம் ஆண்டு தமிழ்த் தேசியக் கூட்டமைப்பு ஸ்தாபிக்கப்பட்டதற்குப் பிறகுதான் முதற் தடவையாக அமரர் மாவை. சேனாதிராஜாவுடன் மிகவும் நெருங்கிப் பழகுவதற் கான வாய்ப்பு எனக்குக் கிடைத்தது. அது என்னுடைய அரசியல் அனுபவத்தில் ஓர் ஆழமான இடத்தைப் பெற்றிருக்கின்றது. காரணம் என்னவெனில், நாங்கள் ஒன்றாகப் பயணித்த அந்தக் காலகட்டத்தில் அமரர் மாவை. சேனாதிராஜா அவர்கள் தன்னை கொள்கைப் பற்றாளராக அடையாளப்படுத்தி இருந்ததுதான். அவருடைய அரசியல்

பின்னணி, அரசியல் வரலாறு என அனைத்துமே விடுதலை அரசியலை விரும்பி, அதற்காகத் தன்னுடைய முழு வாழ்க்கையையும் அர்ப்பணிக்கும் ஒருவரின் பண்புகளையே வெளிப்படுத்துகின்றன.

2001ஆம் ஆண்டிலிருந்து 2008ஆம் ஆண்டு போர் நடைபெற்ற கடைசிக் காலப் பகுதி வரை அவர் என்னுடன் பேசிய எந்தவொரு சந்தர்ப்பத்திலும் கொள்கை ரீதியாக முரண்பட்டது கிடையாது. நாங்கள் பல்வேறு கட்சிகளின் பின்னணியில் இருந்து வந்தாலும், கொள்கை ரீதியாக இணைந்து இயங்குவதென முடிவெடுத்ததற்குப் பிற்பாடு, அனைத்து விடயங்களிலும் ஒன்றிணைந்தே பயணித்திருக் கின்றோம். சிலவேளை, அவருக்குத் தனது கட்சியில் இருக்கின்ற முக்கிய உறுப்பினர்களோடு கருத்து வேறுபாடு இருந்தாலும்கூட, எங்களுடன் எந்தவொரு சந்தர்ப்பத்திலும் அவ்வாறு அவர் இருந்ததில்லை.

நான் அறிந்த அளவுக்கு அவருடைய செயற்பாடுகள் அனைத்தும் தமிழ் மக்களுடைய உரிமைகளை மையப்படுத்தியதாகத்தான் இருந்தன. தன்னால் செய்யக்கூடிய அனைத்துப் பங்களிப்புகளையும் தமிழ் மக்களுக்காகச் செய்த ஒருவர். தானாக முடிவெடுக்கக்கூடிய நிலைமை அவருக்கு இருந்திருந்தால், தமிழ் மக்களுடைய நலன்களைப் பற்றி மட்டும் சிந்தித்து, அவர்களுடைய நலன்களுக்காக மட்டும் செயற்படக்கூடிய ஒரு தலைவராக நிச்சயமாக அவர் இருந்திருப்பார் என்பதில் எனக்கு எந்தவிதமான சந்தேகமும் கிடையாது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஓர் அரசியல் கட்சியில் பல்வேறு தரப்பினரின் கருத்துகள் இருக்கும் என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்! பொதுவாக கருத்து மோதல்கள் இடம்பெற்று, இறுதியில் ஒரு முடிவு எடுக்கப்பட்டு, அதன் அடிப்படையில்தான் ஒரு கட்சியின் செயற்பாடுகள் அமையும். சிலவேளை, இந்தக் கட்சி அரசியல் கலாசாரத்தால் மாவை. சேனாதிராஜா அவர்கள் உண்மையிலேயே பாதிக்கப்பட்டும் இருக்கலாம். ஏனென்றால், கட்சி எடுக்கின்ற ஒருசில முடிவுகளால் அவரும் அந்தச் செயற்பாட்டுக்குத் துணைபோனதாகச் சித்தரிக்கப் படும்பொழுது, அடிவாங்குகின்ற நிலைமையும் ஏற்படும்.

எனக்குத் தெரிந்த அளவுக்கு அவர், தமிழ்த் தேசிய நிலைப்பாட்டில் உறுதியாக இருந்தவர்; தமிழ்த் தேசிய விடுதலையை மிகவும் நேசித்து, அதற்கு விசுவாசமாக இருக்க வேண்டும் என்ற அடிப்படையில் பயணித்தவர். நான் அவரோடு மிகவும் நெருங்கிப் பழகிய காலப் பகுதியில் அவர் அதற்கு எந்தவிதத்திலும் மாறாகச் செயற்பட்டதாக அறியவில்லை. அவ்வகையான ஒரு நல்ல மனிதரை எங்களுடைய தமிழ்த் தேசம் இழந்திருப்பது மிகப் பெரிய இழப்பாகும். என்னைப் பொறுத்தவரையில், அவருடைய இழப்பை அவர் தலைமை வகித்த கட்சி எந்த விதத்திலும் ஈடுசெய்ய முடியாது. ஏனென்றால், அந்தளவுக்கு அவர் மிகவும் சிறந்த அரசியல் கலாசாரத்தை அந்தக் கட்சிக்குள் ஏற்படுத்தியவர். அவர் ஒரு தமிழ்த் தேசியவாதியாக இருந்தாலும்கூட, தமிழ்த் தேசத்தின் உரிமைக்காகப் பாடுபட்டவராக இருந்தாலும்கூட, இந்த நாட்டுக்கு எதிராக எந்தவோர் இடத்திலும் செயற்படவில்லை. அவர் தன்னுடைய மக்களின் உரிமைக்காக எந்தவோர் இடத்திலும் தயங்காமல் குரல்கொடுப்பதற்குத் தயாராக இருந்தவர். தன்னுடைய உயிருக்கு ஆபத்து ஏற்படக்கூடிய நிலையிலும், அவர் தனது இளமைக் காலத்தில் தமிழ் மக்களுக்காக ஒவ்வொரு கட்டத்திலும் தலையிட்டார். அதனால் அவருக்குப் பாரிய பாதிப்புக்கள்கூட ஏற்பட்டன. எனினும், அவர் இந்த நாட்டை வெறுக்கவில்லை. அவர் இந்த நாட்டில் கணிசமான அளவு பாதிக்கப்பட்டு இருந்தாலும்கூட, நாட்டை வெறுக்காமல், நாட்டு மக்களை வெறுக்காமல், ஏதோவொரு வகையில் தமிழ் மக்களும் இந்த நாட்டில் உரிய இடத்தைப் பிடிக்க வேண்டுமென்ற அடிப்படையில் போராடிய ஒருவர். அவ்வகையான ஓர் அரசியல் கலாசாரம்தான் இந்த நாட்டுக்கு அவசியம்!

இந்த நாடு அனைவருக்கும் சொந்தமான நாடு, அனைவருக்கும் இந்த நாட்டில் இடமிருந்தே ஆகவேண்டும் என்று மிகவும் இறுக்கமான நம்பிக்கையோடு செயற்படும் பட்சத்தில்தான் இந்த நாடு உண்மையிலேயே ஐக்கியப்படும். அதற்காக எல்லோரும் ஒரே சிந்தனையில் இருக்க வேண்டும் என்று இல்லை. நாங்கள் பல்வேறு சிந்தனையில் இருக்கலாம்; இருக்க வேண்டும். அப்படி இருக்கும்பொழுதுதான் இந்த நாடு முழுமையடையும். அவ்வகையான சிந்தனையுடைய ஒரு தலைவரின் இழப்பானது, உண்மையிலேயே இந்த நாட்டுக்குப் பேரிழப்பாகும் என்பதை நான் இங்கு சுட்டிக்காட்டி, அவருடைய குடும்பத்தினருக்கும் கட்சியினருக்கும் ஆதரவாளர்களுக்கும் என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். அத்தோடு, தமிழ்த் தேசிய மக்கள் முன்னணி சார்பாகவும் அகில இலங்கை தமிழ் காங்கிரஸ் சார்பாகவும் நான் அவருடைய குடும்பத்தினருக்கும் கட்சியினருக்கும் மக்களுக்கும் அனுதாபங்களைத் தெரிவித்து, எனக்கு இந்தச் சந்தர்ப்பத்தை வழங்கிய கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

[අ.භා. 3.20]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ ගරු කෝසල නුවන් ජයවීර හිටපු මන්ත්‍රීතුමා -සහෝදරයා- , ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා, ගරු ඩොනල්ඩ් දිසානායක මන්ත්‍රීතුමා සහ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙන්. එම ගරු මන්ත්‍රීවරු සිව්දෙනාගේ අභාවය වෙනුවෙන් මුලින්ම මගේ ශෝකය, කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. නමුත්, මුලින්ම මගේ අදහස් දක්වන්න බලාපොරොත්තු වෙන්නේ, අප අතරින් මෑතදී වියෝ වුණු ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමා -අපේ සහෝදරයා- වෙනුවෙන්. මොකද, මගේ දේශපාලන අත්දැකීම් තුළ, කෙටි කාලීන මගේ පාර්ලිමේන්තු ජීවිතය තුළ සහ ඊට කලින් මා සමඟ එකට වැඩ කරපු, එකට ජීවත් වුණු සහෝදරයෙක් තමයි, කෝසල නුවන් ජයවීර කියන්නේ. එතුමා මගේ සමකාලීනයෙක්.

මීට කලින් ඉදිරිපත් වුණු ශෝක ප්‍රකාශවලදී කියැවුණා, එතුමාගේ කාර්යභාරය, එතුමාගේ පසුබිම සහ එතුමා මොන වාගේ තත්ත්වයක් පසුකර ගෙනද, කොහොමද මෙතැනට ආවේ කියන එක. අපි එක පරම්පරාවක්. අපි මේ දේශපාලන වෙනස සිදු කිරීමට මුල් වුණු කාලයේ, මේ දේශපාලන පරිවර්තන කාලයේ තරුණ විය ගත කරපු පරම්පරාවක්. කෝසල නුවන් ජයවීර සහෝදරයා ගැන තිබෙන මතකය ගත්තොත්, මීට අවුරුදු 10ක්, 15ක් විතර එහාට යනවා. අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විධියට, ශිෂ්‍ය ක්‍රියාකාරින් විධියට එකම කාලයේ දේශපාලනය පටන් ගත්ත අය. මීට කලින් මෙතැනදී සඳහන් වුණා වාගේම එතුමා විවෘත

[ගරු නජිත් ඉන්දික මහතා]

විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ඉගෙනුම ලබද්දී එහි මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙසත් කටයුතු කළා. ඉන් පෙරත් අපි සියලුදෙනා එක අරගළයක, එක සටනක, එක ව්‍යාපාරයක වැඩ කරපු පිරිස්. අපි එකට කටයුතු කරපු පිරිස්. අපි එකට උද්ඝෝෂණය කරපු, එකට ගුටි කාපු, එකට ඉල්ලීම් ඉල්ලපු, එකට ඉල්ලීම් දිනා ගත්ත පිරිස්. එතකොට එක පරම්පරාවක මිනිස්සු විධියට අපි දන්නවා, මීට පෙර තිබුණු දේශපාලන යුගයේ සහ 2022 ජනතා අරගළයෙන් පසුව මේ රටේ පරිවර්තනය වෙච්ච දේශපාලන යුගයේ -ඒ දෙපැත්තේම- අපි එක වාගේ වැඩ කරපු පරම්පරාවක් බව.

අපි දේශපාලනය පටන් ගත්තේ එක කාලයක. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ අපි දේශපාලනය පටන් ගත්ත මර්දනීය දුෂ්කර කාලයේ කෝසල නුවන් ජයවීර සහෝදරයාත් ඉතාම කැපවීමෙන් මැදිහත්වීම ලබා දුන් බව. එතුමා 2014- 2015 කාල පරිච්ඡේදයේ විවෘත විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය නායකයෙක් වෙලා හිටියා. එතකොට මමත් ශිෂ්‍ය නායකයෙක් වෙලා හිටියා. ඒ කාලය ගැන කිව්වොත්, එතුමා දේශපාලනය කළේ ජීවිත තර්ජන පවා එල්ල වෙච්ච යුගයක. ඒක අපි සඳහන් කරන්න ඕනෑ. 2010 - 2015 කාලය අතරතුර, අපි අර රාජපක්ෂ යුගයේ අවසානය කියලා හඳුන්වන කාලය තුළ අපේ ශිෂ්‍ය ක්‍රියාකාරින්, අපිත් එක්ක හිටපු පිරිස් හදිසි අනතුරු වෙලා වාගේ හිටි ගමන් මහ මග නැති වෙච්ච අවස්ථා තිබුණා. ඒ වාගේම දිනෙන් දින ගෙවල්වලට බුද්ධි අංශවලින් යවන, අම්මලා තාත්තලා පවා බය කරන්න පිරිස් යවන, සිර ගෙවල්වල නිරන්තරයෙන් ඉන්න වෙන කාලයක තමයි එතුමා ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු විධියට වැඩ කළේ. එතුමා නොබියව, බොහොම නිර්භීතව විය යුතු දේ වෙනුවෙන්, ඉල්ලීම් වෙනුවෙන්, අධ්‍යාපන හා අනෙකුත් අයිතීන් වෙනුවෙන් ශිෂ්‍ය ක්‍රියාකාරියකු විධියට කටයුතු කළා. ඒ ගැන ඉතාම හොඳ මතකයක් අපට තිබෙනවා. ඒක හැමදාමත් අපේ මතකයේ තිබේවි.

ඇත්තටම, අපි හැමෝගෙම වාගේම කෝසල නුවන් ජයවීර සහෝදරයාගේත් අරමුණ වුණේ, ජනතාවගේ අයිතිවාසිකම් ලබා දීමයි. ලංකාවේ හැම දාම තැළිලා පොඩි වන මිනිසුන්ට, වඩා හොඳ ජීවිතයක් ලැබිය යුතුයි කියන පරමාර්ථයෙන් තමයි එතුමා වැඩ කළේ. එය අමුතුවෙන් ඉගෙන ගත යුතුව තිබූ දෙයක් නොවෙයි. මොකද, අපි හැමෝම වාගේම එතුමාත් සාම්ප්‍රදායික, ප්‍රභූ දේශපාලන පවුලකින් දේශපාලනයට ආපු කෙනකු නොවෙයි. අපි මේ සමාජයේ තැළෙන, පොඩිවන මිනිසුන් අතරින් දේශපාලනයට ආපු මිනිස්සු. මිනිසුන් විඳින දුක, මිනිසුන්ට තිබෙන ප්‍රශ්න සහ මිනිසුන්ට තිබෙන අභියෝග මොනවාද, ඒ අනුව වෙනස් වෙන්න ඕනෑ මොනවාද කියන දේ අත්දැකීමෙන් ඉගෙනගෙන, ඒ අත්දැකීම් හරහා දේශපාලනයට ආපු කෙනෙක් තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා. එතුමා ගත කළේ, කෙටි ජීවිත කාලයක්; කෙටි දේශපාලන ජීවිතයක්. එතුමා ජීවත්ව සිටියා නම් එය ඉතාම දිගු දේශපාලන ජීවිතයක් වෙන්න ඉඩ තිබුණා. එහෙම වුණා නම් සමහර විට අපට එකතු කරන්න බැරි බොහෝ දේවල් මේ සමාජයට, එතුමාගේ ප්‍රදේශයට එකතු කරන්න හැකියාවක්, විභවයක් තිබුණු සහෝදරයෙක්, ගරු මන්ත්‍රීතුමෙක් බව එතුමාගේ ඉතාම කෙටි මන්ත්‍රී ජීවිතය තුළ පවා පෙන්වුවා කියලා අපි හැමෝම දන්නවා. එතුමාගේ අභාවය ගැන අපි ඉතා කනගාටු වෙනවා; කම්පා වෙනවා. අපට තවමත් සිහිනයක් වාගේයි එතුමාගේ වියෝවීම. තවමත් මෙය යථාර්ථයක් කියලා දරා ගන්න බැරි තත්ත්වයක අප හැමෝම ඉන්නේ.

එතුමාගේ ඒ කෙටි ජීවිත කාලය තුළ, ඒ තරුණ ජීවිත කාලය තුළ, එතුමා දේශපාලනය තුළින් පෙනී සිටි දේවල් බැලුවාම, එතුමා අධ්‍යාපනයේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටියා. එතැනින් පසුව එතුමා ගම් පළාතට ගිහිල්ලා දේශපාලනය පටන් ගත්තා. අපේ ව්‍යාපාරයට පවා නායකත්වය දුන්නේ ටිකක් දුෂ්කර ප්‍රදේශ නියෝජනය කරමින්. අනික් පැතිවලට සාපේක්ෂව භූගෝලීයව ගත්තත්, පිරිස් අතින් ගත්තත් ඉතා දුෂ්කර ප්‍රදේශ වන, දැරණියගල, දෙහිඕවිට, රුවන්වැල්ල කියන ප්‍රදේශවලටයි එතුමා නායකත්වය දුන්නේ. එම ප්‍රදේශවලට එතුමා ඉතාම විශිෂ්ට කාර්යභාරයක් කළා. මට කලින් කථා කරපු කෑගල්ල දිස්ත්‍රික්කයේ අපේ සහෝදර මන්ත්‍රීතුමා ඒ ගැන කථා කළා. එතුමා ඒ ප්‍රදේශවලට විශිෂ්ට නායකත්වයක් දුන්නා. මගේ ගම් පළාත වන රුවන්වැල්ලේදී මම සජීවීව දැක්කා එතුමාගේ මැදිහත්වීම. රුවන්වැල්ලේ මන්ත්‍රීවරයා විධියට එතුමා පත් වෙන්න පසුගිය අවුරුදු කිහිපය ඇතුළත මේ ගමන ආවේ කොහොමද කියලා අපි දැක්කා. එතුමා ප්‍රදේශයේ ප්‍රශ්නවලට මැදිහත් වුණේ කොහොමද කියලා අපි දැක්කා. එතුමා පරිසර ප්‍රශ්නවලට මැදිහත් වුණු විධිය, කෑගල්ල දිස්ත්‍රික්කයේ තරුණ සංගමයේ නායකයා විධියට තරුණ තරුණියන් එකතු කිරීම සහ ඔවුන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වුණු විධිය, වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් මතු වෙච්ච ප්‍රශ්නවලට මැදිහත් වුණු විධිය, පාරිසරික ප්‍රශ්නවලට මැදිහත් වුණු විධිය ඉතා මෑත කාලයේ අපි දැක්කා. ඒ හැම තැනකදීම වෙහෙස මහන්සිය නොබලා, විවේක නොගෙන තමන්ගේ මතය, අදහස වෙනුවෙන් ඉතා කඩිසරව දවසට වැඩි පැය ගණනක් වැඩ කරපු කෙනකු විධියට කෝසල නුවන් ජයවීර සහෝදරයා අපි හැමෝම දන්නා කෙනෙක්.

දේශපාලනය හරහා දුෂ්කර පැතිවල මිනිසුන්ට අලුත් බලාපොරොත්තුවක් ගේන්නත්, හැම දාමත් සාම්ප්‍රදායික දේශපාලනයක ගිලිලා හිටපු, ප්‍රභූ පවුල් කිහිපයක දේශපාලනයකට හැම දාමත් නතු වෙලා තිබුණු ඒ ප්‍රදේශ ඉන් ගලවාගෙන වෙනත් දේශපාලන බලාපොරොත්තුවක් සඳහා මේ සමාජය පරිවර්තනය කිරීමට සාපේක්ෂව, කෑගල්ල දිස්ත්‍රික්කයේ තුන්කෝරළයේම ඒ පරිවර්තනයට මූලිකත්වය ගත්ත සහෝදරයෙක් තමයි එතුමා. ඒ නිසාම තමයි පසුගිය ඒ මැතිවරණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රීවරු හත්දෙනෙක් පත් වෙද්දී එතුමා මනාපවලින් -අපේ පක්ෂයේ මනාප අතර ලොකු තරගයක් නොතිබුණත්- දෙවන ස්ථානයට පත් වුණේ. එතුමා ඒ තරමට තරුණ නායකයෙකු විධියට කෑගල්ල දිස්ත්‍රික්කය පුරාම හඳුනාගෙන තිබුණා. ඒ නිසා එතුමාගේ වියෝව නිසා ඇති වූ අඩුපාඩුව අපට සම්පූර්ණයෙන් පියවන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ.

අවුරුදු 38ක් වැනි කෙටි ජීවිත කාලයක් තුළ, මාස පහක්, හයක් වැනි කෙටි පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර කාලයක් පමණක් උරුම කර ගනිමින් එතුමා ඉතාම අවාසනාවන්ත විධියට, හදිසියේ අප අතරින් වෙන් වුණා. ඒ ගැන නැවත නැවතත් අපි කම්පා වෙනවා. එතුමා කළ ඒ කාර්යභාරය කවදාවත් අමතක කළ යුතු එකක් නොවෙයි; කවදාවත් අමතක කරන්න පුළුවන් එකකුත් නොවෙයි. අපි දන්නවා සහ අපි විශ්වාස කරනවා, මේ සමාජයේ පසුගිය කාලයේ සිදු වුණු දේශපාලන වෙනස ඇතුළේ යහපත් සමාජයක් ගැන, වඩා හොඳ අනාගතයක් ගැන මේ රටේ මිනිසුන් තුළ බලාපොරොත්තු දලු දාලා තිබුණු බව. අපි බලයට ඇවිත් තවම මාස අටයි තමයි. නමුත්, දවසින් දවස අවුරුද්දෙන් අවුරුද්ද ගතවෙලා, අපි හිතන වෙනස ලංකාව තුළ සිද්ධ වන දවසට -අපි හිතන වෙනස සම්පූර්ණ කර ගන්නා දවසට- ප්‍රමාණවත් ලෙස කාලය ගතකරලා අදාළ වෙනස්කම් ටික කරලා, ඒ කටයුතු අවසන් කරලා, අපි ඒ වෙනස කළා කියලා ආඩම්බරයෙන් කථා කරන දවසට ඉතිහාසයේ ඉතාම ඉහළින් ලියැවෙන නමක් විධියට කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ නම ලියැවෙයි කියලා අපි හිතනවා. ඒ අවශ්‍ය වගකීම අරගෙන අපි ඒ කාර්යභාරය ඉටු කරනවා. මොකද, අවුරුදු 17, අවුරුදු 18 වාගේ තරුණ කාලයේ ඉඳලාම එතුමා බලාපොරොත්තු වුණු දෙයක් තිබුණා, එතුමා දැකපු

හීනයක් තිබුණා. ඒ වෙනුවෙන් තමයි එතුමා වැඩ කළේ. ඒ හීනය සැබෑ කරන්න අපි කැප වන ගමන්, ඒ පොරොන්දුව දෙන ගමන්, එතුමාගේ ඒ හීනය සැබෑ කරන දවසට එතුමාගේ නමත් ඒ හීනය සැබෑ කරන්න මුල් වුණු පිරිස් අතරේ ඉතාම ඉහළින්, ලොකු අකුරින් ලියැවෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

[பி.ப. 3.31]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் நால்வரது மறைவு குறித்த அனுதாபப் பிரேரணைகள் இன்றைய தினம் முன்வைக்கப்பட்டிருக்கின்றது. அந்த வகையிலே, குறித்த உறுப்பினர்களுடைய குடும்பத்தினருக்கு எனது ஆழ்ந்த அனுதாபங்களைத் முதலில் நான் தெரிவித்துக் கொள்வதுடன், அவர்களது ஆத்மா சாந்தியடையப் பிரார்த்தித்து நிற்கிறேன். இவர்களில் அண்ணன் மாவை. சோ. சேனாதிராஜா அவர்களுடைய அனுதாபப் பிரேரணைமீது இந்தக் கௌரவமான சபையிலே உரையாற்றுவதற்கு உரித்துடையவன் என்ற அடிப்படையிலே அவர் சம்பந்தமான எனது கருத்துகள் சிலவற்றை நான் சொல்ல விழைகின்றேன்.

உண்மையிலேயே மாவை. அண்ணணைப் பொறுத்தமட்டிலே அவர் தனது இளமைக் காலத்திலிருந்து இற்றைவரைக்கும் தன்னைப் பற்றியோ அல்லது தன்னுடைய குடும்பத்தைப் பற்றியோ சிந்திக்காமல் மக்களுக்காகச் சேவையாற்றிய ஒரு மாமனிதர்! அவருடைய வாழ்க்கையில் அவர் சென்ற கஷ்டமான, கரடுமுரடான பாதையைக் கடந்து இன்றைக்கு ஒரு தலைவனாகப் பேசப்படுகின்ற நிலைக்கு வந்திருக்கிறார் என்றால், அதற்குக் காரணம் கஷ்டப்பட்ட மக்களுடைய விடுதலைக்கான அவருடைய தியாகம் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். உண்மையிலே எங்களுக்கெல்லாம் ஒரு வழிகாட்டியாக அவர் திகழ்ந்திருக்கின்றார். எமது தமிழீழ விடுதலை இயக்கத்தின் தலைவர் சிறி சபாரத்தினத்தோடு சிறையிலே அவர் இருந்திருக்கின்றார். அவருடைய அந்தச் சிறை வாழ்க்கை என்பது வெறும் ஊழல்களுக்கானதோ அல்லது வேறு குற்றங்களுக்கானதோ அல்ல. எங்களுடைய மண்ணின் மீட்புக்காக, எங்களுடைய வடக்கு, கிழக்கு மக்களுடைய தியாகத்தை, துன்பங்களை எடுத்துக் கூறியதற்காகக் அவர் கைது செய்யப்பட்டுச் சிறையில் அடைக்கப்பட்டுச் சித்திரவதை செய்யப்பட்டார். இதைத்தான் மாவை. அண்ணனுடைய முக்கிய வரலாற்று நிகழ்வாக நாங்கள் பார்க்க முடியும்.

குறிப்பாக, அம்பாறை மாவட்டத்தை அவர் முழு மனதோடு நேசித்தார். அன்றைய நாளில் இலங்கைத் தமிழரசுக் கட்சியின் இளைஞர் அமைப்பில் இருந்துகொண்டு கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் நெடுந்தூரங்கள் நடந்து சென்று, பாதை அமைத்து, மக்களைக் குடியேற்றுகின்ற ஒரு தியாகத் தன்மையான வேலையைச் செய்தவர் எங்களுடைய அண்ணன் மாவை. சேனாதிராஜா அவர்கள். அவர் தமிழரசுக் கட்சியில் இருந்தவேளையிலும், தமிழ்த் தேசியக் கூட்டமைப்பு உருவாக்கப்பட்ட பின்பும் நான் அவருடன் பயணித்திருக்கின்றேன். தமிழ்த் தேசியக் கூட்டமைப்பின் உருவாக்கத்தின் பின்பு, மக்களுக்கான ஓர் இலட்சிய வாழ்க்கையை வாழ்ந்த மாவை. அண்ணனைக் கண்டு அவருக்குப் பின்னால் நாங்கள் பயணித்த காலங்கள் அதிகம். என்னைப் பொறுத்தமட்டில் அவர் தனது மனைவி, குழந்தைகளைவிட மக்களை, இந்த மண்ணை நேசித்த ஒரு மனிதர். நான் நினைக்கிறேன், அவருடைய மனைவி பிள்ளைகளுடைய வாழ்க்கையைக்கூட ஜேர்மன் நாட்டில் உள்ள அவருடைய தம்பிதான் கவனித்து, அவர்களை வளர்த்திருக்கக்கூடும். அந்தளவுக்குத் தனது குடும்பத்தைப் பற்றி சிந்திக்காது தன்னுடைய வாழ்க்கையை மக்களுக்காக அர்ப்பணித்துச் செயலாற்றிய மாமனிதன் மாவை. அண்ணன் அவர்கள்.

உண்மையில் அவருடைய அண்மைக் காலங்களில் அவரது மனதை நோகடிக்கின்ற வகையிலான சில செயற்பாடுகள் இடம்பெற்றுவந்த நிலையில் மனவருத்தங்களுடன் அவர் மிகவும் யோசனைக்கு உள்ளாக்கப்பட்டிருந்ததை நான் நினைத்துப் பார்க்கிறேன். ஆரம்பத்தில் தனது இளமைப் பருவத்தை மக்களுக்காகத் தியாகம் செய்த தியாகி அவர். சிறைக்குச் சென்ற தியாகி! விடுதலைப் போராட்டங்களை ஆதரித்துத் தானும் பல போராட்டங்களை முன்னெடுத்த ஒரு தியாகி! ஆயுதப் போராட்டத்தை மேற்கொண்ட தமிழீழ விடுதலை இயக்கமாக இருக்கலாம் அல்லது விடுதலைப் புலிகள் அமைப்பாக இருக்கலாம், ஏனைய ஆயுதம் தாங்கிய போராளிகளாக இருக்கலாம், மக்களுக்கான தியாகத்தை மேற்கொள்கின்றவர்களை அரவணைக்கின்ற, அவர்களுடைய இலட்சிய வாழ்க்கையை ஆதரிக்கின்ற தியாக நல்லுள்ளம் கொண்ட ஒருவராக இருந்த அவருடைய செயற்பாடுகளைப் பார்க்கின்றபோது, உண்மையிலே நாங்கள் எல்லோரும் அவருடைய வழியைப் பின்பற்றுபவர்களாக இன்றைக்கும் இருந்து கொண்டிருக்கின்றோம் என்பதை இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன்.

அவரோடு பல விடயங்களில் இணைந்து பயணித்தவன் என்ற அடிப்படையிலே, நான் அவருடைய வீட்டுக்குச் செல்கின்றபோதெல்லாம், அவரும், அண்ணியும் அவருடைய பிள்ளைகளும் என்னைத் தங்களுடைய குடும்பத்தில் ஒருவராகப் பார்த்ததை உண்மையிலே நான் உணர்ந்திருக்கிறேன். அவருடைய வீட்டுக்குச் சென்று அவருடன் பேசிவிட்டு, அங்கே சாப்பிடாமல் என்னால் வெளியில் வரமுடியாது. அந்தளவுக்கு அண்ணி அவர்கள் விருந்தோம்பலை மிகவும் சிறப்பாக மேற்கொள்வார். அவர்கள் என்மீது காட்டிய பற்று, பாசத்தின் காரணமாக அவர்களது குடும்பத்தில் நானும் ஒருவன் என்பதை என்னால் உணரக்கூடியதாக இருந்தது. அந்த வகையில், மக்களை நேசித்த, மண்ணை நேசித்த மாவை. அண்ணனை ஒரு தியாகியாக நாம் பார்க்கின்ற அதேநேரத்தில், அந்தக் குடும்பம் இன்றைக்குத் தலைவனை - கணவனை, ஒரு தகப்பனை - இழந்திருப்பது மிகவும் வேதனையான விடயம். இருந்தாலும் மாவை. அண்ணன் அவர்கள் விட்டுச் சென்ற பணியை அவருடைய குடும்பத்தில் யாராவது ஒருவர் முன்னெடுத்துச் செல்ல வேண்டும். அந்த அடிப்படையிலே, மண்ணை நேசித்த மாவை. அண்ணனுடைய தியாக சிந்தனையால் அவர் மேற்கொண்ட புனிதமான அரசியல் வாழ்க்கையை நாங்களும் பின்தொடர்ந்து, அவருடைய இலட்சியத்தைச் செயற்படுத்துகின்றவர்களாக, அந்தக் கஷ்டமான பணியை நடைமுறைப்படுத்துகின்றவர்களாக மாறுகின்றபோதுதான், அவருடைய தியாகத்தின் இலட்சியம் நிறைவேறுகின்றபோதுதான் அவருடைய ஆத்மா

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

சாந்தியடையும்! என்னைப் பொறுத்தவரையில், அண்ணனுடைய குடும்பத்தினருக்கு எனது அனுதாபத்தைத் தெரிவிப்பது மட்டுமல்லாமல், அவரது குடும்பத்தினர் அவருடைய இழப்பின் சோகத்திலிருந்து விடுபட்டு, மனநிலை மாற்றப்பட்டு, நாளாந்த வாழ்க்கைக்கு மாற வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்து விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා.

[අ.භා. 3.39]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු මන්ත්‍රීවරුන් හතරදෙනෙකුගේ අභාවය පිළිබඳව අපේ සංවේගය, අපේ ශෝකය පළ කරන වෙලාවේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, මේ පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් ජනතා නියෝජිතයන් විදියට තමන්ගේ යුග මෙහෙවර ඉෂ්ට කරමින් සිටියදී සමුගන්නා අවස්ථා තිබෙන බව. අපට හමු වන මේ චරිත හතරම ඇත්තෙන්ම සුවිශේෂයි. මේ සුවිශේෂ බව නිර්මාණය වන්නේ, ඒ හිටපු මන්ත්‍රීවරුන් අපේ හදවත්වල තබා තිබෙන සටහනේ ගැඹුර අනුවයි.

මම මුලින්ම ජේ.ආර්.පී. සූරියප්පෙරුම කියන චරිතය ගන්නම්. 1948දී ශ්‍රී ලංකාවට නිදහස ලැබෙනවා. නිදහස ලැබීමත් එක්ක 1950, 1960 දශකවල දැවැන්ත කතිකාවක් නිර්මාණය වෙනවා, අපේ රට ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන් සහ සංස්කෘතික වශයෙන් කවර දිශාවකට ගමන් කළ යුතු ද කියන එක ගැන. මේ කතිකාව තුළ පෝෂණය ලබමින් එහි ක්‍රියාකාරි භූමිකාවක් ඉෂ්ට කරපු පුද්ගලයෙක් තමයි, සූරියප්පෙරුම මැතිතුමා. එතුමා බුද්ධිමතෙක්, ප්‍රාමාණික උගතෙක්. විශේෂයෙන්ම ද්විභාෂක උගතුන්ගේ පරපුරේ එක් අයෙක්. අද මේ ශෝකප්‍රකාශ යෝජනා ඉදිරිපත් කළ මොහොතේ සිට කරපු කථාවලදී කියැවුණා එතුමා දේශපාලන වශයෙන් එක් එක් පක්ෂවල සිට ගත් බව; දේශපාලන වශයෙන් ඒ ඒ දේශපාලන ව්‍යාපාර තුළ සිට ගත් බව. හැබැයි එතුමා වාමගාමී සංකල්ප අතහැරපු පුද්ගලයෙක් නොවෙයි. එතුමා මුලින්ම දේශපාලනය පටන් ගන්නේ ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන්. එතුමා විවිධ පක්ෂ හරහා දේශපාලනික සැරිසරයක නිරත වෙච්ච කෙනෙක්. මගේ මිත්‍ර එක්තරා මහාචාර්යවරයෙක් එතුමා ගැන කිව්වේ, බුද්ධිමය වශයෙන් ගත්තාම එතුමා "බුද්ධිමය රස්තියාදුකාරයෙක්" කියන වචනය. මේක නරක අර්ථයෙන් ගන්න එපා. මේක මම ඉතාම පැහැදිලිව සද්භාවයෙන් කියන වචනයක්. "රස්තියාදුකාරයෙක්" කියන එකෙන් අදහස් කරන්නේ එතුමා සැරිසරන්නෙක් කියන එකයි. එතුමා ඒ ඒ දේශපාලන ආස්ථානවල ඉගෙන ගනිමින්, උකහා ගනිමින්, වර්ධනය කරමින් දේශපාලන චින්තනය පොහොසත් කරගත්තු අයෙක්. මේ සංවාදය 50, 60 දශකය පුරාවට පැවතිච්ච එකක්. එහි කදිම ප්‍රතිමූර්තියක් තමයි අපේ ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා. එතුමා ලේඛකයෙක්, දේශකයෙක්. එතුමාට පුළුවන් වුණා, උගත් දේ නියමාකාරයෙන් ලේඛන කෞෂල්‍යයෙන් සහ භාෂණ කෞෂල්‍යයෙන් ප්‍රකට කරන්න. අපි ඒක "දොරමඬලාව" වැඩසටහනේදී දැක්කා. අපි විවිධ විද්‍යුත් නාළිකා හරහා එතුමාගේ වචනවලට කන් දීපු මිනිස්සු. ඒ හඬ අපේ හදවත්වල තවමත් දෝංකාර දෙනවා. එතුමා තමන් එළඹගත්ත මතය, තමන් විශ්වාස කරන දැනුම් පද්ධතිය සම්ප්‍රේෂණය කරන්න ඉතාම ශූර කථිකයකු විධියට අවධාරණාත්මකව, ගැඹුරින් යමක් විශ්ලේෂණය කරපු පුද්ගලයෙක්. ඒ වාගේම එතුමා ඉතිහාසඥයෙක්, ජාත්‍යන්තර දේශපාලනය ගැන විග්‍රහ කරපු කෙනෙක්.

අපි දැන් ස්මාර්ට් දූරකථනය හරහා පුරුදු වෙලා තිබෙනවා, ඇඟිලිතුඩින් තොරතුරු ගන්න. අපි ඒකෙන් කරගෙන තිබෙන්නේ මොකක්ද? ඒකෙන් අපි මොළයට විරාමයක් දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ මොළය එහෙම එකක් නොවෙයි, විශ්ව කෝෂයක්, පුස්තකාලයක්. ඕනෑම දෙයක් ගැන ඕනෑම තැනකින් කරුණු එතුමාගේ මතකයට එනවා. එතුමා ඒ මතකය වචනවලට හරවනවා ලිඛිතව හෝ භාෂිතව. ඒක තමයි අපි දැක්කේ එතුමාගේ සුවිශේෂම ගුණාංගය ලෙස. විවාදයට ආවාම එතුමා ඉතාම චතුර කථිකයෙක්. ඒ වාගේම, එතුමා අවධාරණාත්මකව, ගැඹුරින් ශ්‍රාවකයා තුළ තමන්ගේ හඬ, මතය සටහන් කරන්න පුළුවන් වෙච්ච පුද්ගලයෙක්. එතුමා අවුරුදු අනූ ගණනක දිවි සැරිය තුළ ශ්‍රී ලංකීය ජනතාවගේ හදවත්වල සටහනක් තැබුවා, "ජේ.ආර්.පී. සූරියප්පෙරුම" කියන එතුමාගේ නමින්. ඒ ප්‍රාමාණික බුද්ධිමතාට, ඒ උගතාට එතුමා කරන ලද මෙහෙවර වෙනුවෙන් අපේ හෘදයාංගම කෘතඥතාව පළ කරමින් එතුමාගේ පවුලේ උදවියට අපි අවංකවම අපේ කනගාටුව, දුක ශෝකය පළ කරනවා. එතුමා විසින් ඇති කරන ලද හිඩැස පුරවාලීමේ අවශ්‍යතාව සමාජයක් විධියට අපට දැනෙනවා.

ඊළඟට මාවෙ සෝ. සේනාධිරාජා හිටපු මන්ත්‍රීවරයා ගැන මම කියන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා තමන් ජන්ම ලාභය ලබපු වාර්ගිකත්වය වෙනුවෙන් ගැඹුරින්, හදවතට එකඟව කටයුතු කරපු පුද්ගලයෙක්. දශක ගණනාවක් පුරා එතුමාගේ දේශපාලනෙ මතය වෙනුවෙන් ඉතා අවදානම්සහගත දේශපාලන ගමනක් ආපු පුද්ගලයෙක්. අන්න ඒ නිසායි මාවෙ සෝ. සේනාධිරාජා මැතිතුමාගේ නම අපේ හදවත්වල සටහන් වෙන්නේ. එතුමා පීඩිතභාවයට එරෙහි වුණු පුද්ගලයෙක්. පීඩිතභාවයේ වේදනාව තේරුම් ගත්ත පුද්ගලයෙක්, යාපනයේ ඉපදිලා යාපනය අත් නොහැර යාපනයේදීම ජීවිතය අත හැර ගියපු පුද්ගලයෙක්. එතුමා ජනතාවට නායකත්වය සැපයුවා. එතුමාගේ දේශපාලන සක්‍රියභාවය එම ජනතාවගේ හදවත්වල සටහන් වෙලා තිබෙනවා. එතුමාගෙන් අපට ගන්න පුළුවන් ආදර්ශ තිබෙනවා. ඒ, අපි යම් කිසි දේශපාලන මතයක් දරනවාද, එහි නිවැරදිතාව අප තුළ තහවුරුව පවතින තාක් ඒ වෙනුවෙන් පෙනී සිටීම. එතුමා ජීවිතයේ අවසාන කාලයේදී පක්ෂයේ නායකත්වය වෙනුවෙන් එල්ල වෙච්ච අභියෝග සත පහකට මායිම් නොකර තම ජනතාවගේ වුවමනා, අවශ්‍යතා වෙනුවෙන් පෙනී හිටපු, කලින් කථා කළ මන්ත්‍රී සහෝදරයා කියපු විධියටම වීරයෙක්. මේ වීරත්වය එන්නේ කොතැනින්ද? මේ වීරත්වය එන්නේ එතුමාගේ දේශපාලන දැක්ම, චින්තනය, ඉදිරිපත් වීම සහ කැපවීම හරහා. මාවෙ සේනාධිරාජා කියන නාමය අනිවාර්යයෙන්ම දෙමළ ජනතාවගේ හදවත් තුළ සටහන් වනවා වාගේම, සියලු ශ්‍රී ලාංකිකයන් විධියට අපගේ බුහුමනට, ගෞරවයට පාත්‍ර වනවා. එතුමාගේ සමු ගැනීමෙන් වේදනාවට පත් වෙච්ච හදවත් සහිත ශ්‍රී ලාංකිකයෝ පිරිසක් වන අප, එතුමාගේ ඥාතීන්ට අපේ බලවත් සංවේගය පළ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ශෝක ප්‍රකාශ කරන අනෙක් සහෝදරයා තමයි, අපිත් එක්ක එකම දවසේ මේ පාර්ලිමේන්තුව තුළ දිවුරුම් දුන් කෝසල නුවන් ජයවීර සහෝදරයා. එතුමා මන්ත්‍රී ධුරය දැරුවේ මාස ගණනාවක් පමණයි. හැබැයි, වසර ගණනාවක සටන්කාමී දේශපාලන නායකත්වයක්

තිබුණු කෙනෙක්. අදීන අදහස් ඉදිරිපත් කරමින් ප්‍රජාව වෙනුවෙන් උපරිම කැපවීම් කළ සහෝදරයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ දේහය ගෙනාපු මොහොතේ අපි එතැනයි හිටියේ. ශෝකයට පත් වෙච්ච රොද බැඳ ගත්ත ඒ ජනතාව අතර අපට ඉන්න සිද්ධ වුණා. ඒ ජනතාව කියපු දේ ඔබ ඉදිරියේ තබන්න ඕනෑ. දවසකට පැය 3ක විරාමයක් අරගෙන ඉතුරු පැය 21ම ජනතාව වෙනුවෙන් අභියෝගාත්මක දේශපාලන සටන් භූමියක සෙන්පතියෙකු විධියටයි අපේ සහෝදරයා කටයුතු කළේ. ඒ සහෝදරයා ජීවිතයෙන් සමු ගත්තත් මම කලින් කිව්වා වාගේම එතුමා අපේ හදවත් තුළ ඉතා ගැඹුරු තියුණු සටහනක් තබා තිබෙනවා, ඒ සහෝදරයාගේ නමින්. ඒ නමේ දීප්තිය, ඒ නමේ ආලෝකය අපේ හදවත් තුළ ආත්මය පුරා විහිදෙන්නේ ඒ සටන්කාමී සගයාගේ කැපවීම, අප්‍රතිහත ධෛර්යය සහ ජනතා ප්‍රේමීත්වයේ තීව්‍ර බව නිසායි. මම ඒ සහෝදරයා දැන හැඳින ගෙන මාස කිහිපයයි. දකින හැම වෙලාවේම ඉතාම උණුසුම් සහෝදරත්වයකින් අතින් අල්ලාගෙන ඒ කථා කරපු වචන මම හිතන්නේ, මරණ මංචකය දක්වා මට අමතක කරන්න බැරි වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මීට එහා කථා කරන්න බැහැ. අපෙන් සමු ගත් ඒ සියලුදෙනා අපේ හදවත් තුළ උත්තම තැනක, උස් අසුනක සටහන් වෙලා තිබෙනවා. බිතු සිතුවම් වාගේ ඒ චරිත අපට ලබා දුන් ආලෝකය සහ ශක්තියෙන් අපේ ඉදිරි දේශපාලන වැඩ පිළිවෙළ ජනතා ප්‍රේමීව ඉෂ්ට කරන බව ප්‍රකාශ කරමින්, එතුමන්ලා ලබා දුන් ආලෝකයට සහ ශක්තියට ප්‍රණාමය පුද කරමින්, ඒ වෙන් වී යෑම දරා ගන්න බැරි බව ඔබ ඉදිරියේ ප්‍රකාශ කරමින් මට නිහඬ වෙන්න අවසර.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමනි, මීළඟට ඔබතුමාට අවස්ථාව.

[අ.භා. 3.51]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කෝසල නුවන් ජයවීර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, ගරු මාවෙ සෝ. සේනාධිරාජා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, ගරු ඩොනල්ඩ් දිසානායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, ජේ.ආර්.පී. සූරියප්පෙරුම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා යන අභාවප්‍රාප්ත මන්ත්‍රීතුමන්ලා සිව්දෙනා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන මේ මොහොතේ, මට පෙර අදහස් දක්වපු ගරු සුගත් වසන්ත අපේ මන්ත්‍රීතුමාගේ -සහෝදරයාගේ- ඇඟට දැනිච්ච, හදවතට දැනිච්ච වේදනාව අපි සියලුදෙනාටම දැනෙන වෙලාවක් තමයි මේ. මා නම් සඳහන් කළ ඒ හැම මන්ත්‍රීවරයෙකුටම නියමිත පාර්ලිමේන්තු ජීවිතයක් තිබුණා. සැලකිය යුතු කාලයක් පාර්ලිමේන්තුවේ ගතකරන්න එතුමන්ලා වාසනාවන්ත වෙලා තිබුණා. ඒ අතරින් අපිත් එක්ක එකට මේ පාර්ලිමේන්තු භූමියට අඩිය තියපු, දිවුරුම් දීපු කෝසල නුවන් ජයවීර සහෝදරයා ගැන මේ විධියට ශෝක ප්‍රකාශ කරන්නට සිදුවීම අපේ අවාසනාවක් ලෙස අපි දකිනවා. හේතුව, එතුමා ඉතාම තරුණ වයසේ හිටියේ. අවුරුදු 38ක ජීවිතයක් එතුමාට තිබුණේ. අපි එතුමා වෙනුවෙන් කථා කරන්න නොවෙයි, එතුමා අපි වෙනුවෙන් කථා කළ යුතු පැත්තක තමයි එතුමාගේ ජීවිතය තිබුණේ.

1987 වර්ෂයේ මේ ලෝකයට ඇවිල්ලා 2025 වර්ෂයේදී අපෙන් සමුගන්නකොට එතුමාගේ වයස අවුරුදු 38ක්. එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට යන්තම් මාස පහක පමණ කාලයක් ගතවුණා විතරයි. ඒ සිනහව, ඒ සුහදකම, ඒ අන්‍යෝන්‍ය ගරුත්වය, ඒ මිත්‍රශීලී බව -ඒ සියල්ල- නිසා අපි හැමෝටම මේ කෙටි කාලය ඇතුළත වැඩිම වශයෙන් මතක තිබිච්ච කෙනෙකු බවට එතුමා පත් වෙලා තිබුණා. එතුමාගේ බාල සොහොයුරන් දෙදෙනාත් එක්ක එතුමාට කොයි තරම් සොඳුරු ළමා කාලයක් තිබෙන්න ඇද්ද? සිනහවෙන් පිරුණු, සොඳුරු හදවතක් තිබිච්ච ඒ වැඩිමහල් සොහෝදරයාත් එක්ක බාල සොහොයුරන් දෙදෙනා ගත කරපු ඒ ළමා කාලය කොතරම් සොඳුරු වෙන්න ඇතිද? අපේ සියලු මන්ත්‍රී සහෝදර සහෝදරියන් අදහස් ප්‍රකාශ කරද්දී පැහැදිලි කළා, එතුමා අධ්‍යාපනික වශයෙන් ජීවිතය ජයගත්තේ කොහොමද, ඒ කාලය තුළ මිනිස් සමාජය වෙනුවෙන්, තමන්ගේ පරම්පරාවේ මිනිසුන් වෙනුවෙන් කැපවීම් කළේ කොහොමද කියලා. තමන් එක්ක එකට විශ්වවිද්‍යාලයේ ජීවත් වෙච්ච සොහෝදර සහෝදරියන් වෙනුවෙන් ඕනෑම දුක් ගැහැටක් විඳදරා ගෙන අවශ්‍ය නායකත්වය ලබා ගනිමින් කටයුතු කරලා, ඊට පස්සේ ඒ ක්‍රියාවලියේ ඉදිරියක් බවට පත්වෙච්ච මේ දේශපාලන ව්‍යාපාරය තුළ කටයුතු කරමින්, රැකියාව කරන අතරතුරත් දේශපාලන ක්‍රියාකාරිත්වයේ නියැළුණු ආකාරය පිළිබඳව ගොඩක් අය කථා කළා. කෝසල නුවන් ජයවීර සහෝදරයා අපේ හදවතට දැනෙන තැන තමයි දේශපාලන ක්‍රියාවලියේදී එතුමා දක්වපු මානව හිතවාදී ගුණාංගය. ලෝකයේ මිනිස්සු ගොඩක් හිටියාට මානව හිතවාදී ගුණය සහිත, හදවතින්ම එන මානව හිතවාදී ගුණය සහිත මිනිස්සු හරි අඩුයි. එයින් කෙනෙකු විධියට තමයි අපේ කෝසල නුවන් ජයවීර සහෝදරයා අපි හඳුනා ගන්නේ.

එතුමා නායකත්වය දීපු ඒ සමාජය, එතුමා හඳුනාගෙන හිටපු ඒ සමාජය, එතුමාට ආදරය කරපු ඒ සමාජය එදා අවමංගල කටයුතුවලට සම්බන්ධ වූ අවස්ථාවල අපට කිව්වේ එකම කථාවක්. අපේ සුගත් වසන්ත මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේ ඒ හැමෝම කිව්වේ, " අනේ! එතුමා, එතුමා ගැන බැලුවේ නැහැ නේ" කියලායි. ඒක තමයි, හැමෝගේම කටින් පිට වුණේ. ඒ තැන්වලදී අප හඳුනා ගත්ත හැමෝම වාගේ කිව්වේ, අයියා, එහෙම නැත්නම් මල්ලී, සහෝදරයා, මන්ත්‍රීතුමා මීට වඩා තමන් ගැන හිතන්න ඕනෑ" කියන එකයි. එතුමා එවැනි ජීවිතයක් ගත කරපු බව ඒ මුළු සමාජයම දැනගෙන හිටියා. එතුමා තමන් ගැන දශමයක්වත් හිතන්නේ නැතුව, වැය කරන්න තිබෙන මුළු කාලය කොපමණද ඒ උපරිම කාලය තමන්ගේ රටේ ජනතාව වෙනුවෙන්, තමන්ගේ පරම්පරාවේ මිනිස්සු වෙනුවෙන්, මේ යුගයේ මිනිස්සු වෙනුවෙන් වෙන් කරලා තිබුණු කෙනෙක් කියලා ඒ හිටපු හැමෝම අදහස් ප්‍රකාශ කළා. ඒක තමයි එතැන තිබෙන විශේෂත්වය.

වර්තමානය කියන්නේ විශේෂයෙන් මේ යුගයේ දේශපාලනයට දැවැන්ත අභියෝග තිබෙන මොහොතක්. පසුගිය කාලය පුරාම මේ රටේ දේශපාලන ගමන් මඟ පිළිබඳ අදහසක් අපට තිබෙනවා. විශේෂයෙන්ම ජාතික ජනබලවේගයේ, එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ක්‍රියාවලියට, කලින් කිව්වා වාගේම මහා ආශීර්වාදයක් තිබුණේ නැහැ. ඒවා මල් මිටක් බවට පත් වුණේ නැහැ. හැබැයි, ඒ සියලු දුක්ගැහැට විඳ දරාගෙන සිනහවකින් සංග්‍රහ කරන්න සමත් හදවතක් එතුමාට තිබුණා. ඒක විශේෂම ලක්ෂණයක්. හැමෝටම ඒ තත්ත්වය නැහැ, ඒ හැකියාව නැහැ. එවැනි හැකියාවක් සහිත සහෝදරයෙක් තමයි අපි අතර අද නැත්තේ.

එතුමා ශිෂ්‍ය ව්‍යාපාරය ඇතුළේ කටයුතු කරපු, තරුණ සංවිධානයේ කටයුතු කරපු කෙනෙක් කියලා මම දන්නවා. නමුත් ඍජුව එතුමා එක්ක සම්බන්ධතාවක් ගොඩනැඟෙන්නේ මාත්

[ගරු නිශාන්ත සමරවීර මහතා]

එක්ක COPE එකේ සාමාජිකයෙකු බවට පත් වුණු වෙලාවේ. ඒ ගෙවිලා ගිය මාස දෙක, තුන ඇතුළත -ඒ කෙටි කාලය ඇතුළත- ඒ ක්‍රියාවලිය වෙනුවෙන් එතුමා තුළ තිබුණු උනන්දුව, කැපවීම අදටත් මගේ කන්වල රැව් දෙනවා. බොහෝ වෙලාවට එහි ඉදිරි කටයුතු කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කර ගන්න, ඒ වෙනුවෙන් හරිම දේ කරන්න, කාටවත් හිත රිදෙන්නේ නැතුව, කාටවත් හානියක් නොවී සමාජයට මේක හොඳම දේ කියලා ප්‍රතිඵලයක් ලබා දෙන්න කටයුතු කළ යුත්තේ කොහොමද කියන කාරණය ගැන ඒ කෙටි කාලය තුළ මාත් එක්ක කථා කරපු වාර ගණන ගොඩක් තිබුණා.

එතුමා සටන්කාමියෙක් තමයි. ඒ වාගේම දැවැන්ත කැපවීමක් කරන්න පුළුවන් කෙනෙක්. හැබැයි, ඒ කැපවීම ඇතුළේ එතුමාගේ චින්තනය ඉතා නිරවුල් ලෙස මානව සමාජයට ආදරය කරන කෙනෙකු ලෙස ලබා දුන්නා. ඒ විධියට තමයි එතුමා කථා කළේ. එතුමාට අදහසක් තිබුණේ නැහැ, මේ සමාජයේ තිබෙන නරක පාච්චි කරලා තව කෙනෙකුට රිදවන්න; එහෙම වුවමනාවක් එතුමාට තිබුණේ නැහැ. එතුමා හැම විටම මාත් එක්ක කිව්වේ, අපි කොහොමද COPE එකේ ක්‍රියාකාරිත්වය හරහා මේ සමාජය හොඳ පැත්තට ගන්නේ, මේ සමාජයේ හැමෝම යහපත් තත්ත්වයට පත් කරන්නේ කොහොමද කියන එකයි. එතුමාට තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස සේවය කරන්න ලැබුණා නම්, එතුමා අනිවාර්ය ලෙසම මානව හිතවාදී දේශපාලනයේ ආදර්ශයක් බවට පත් වෙනවා. ඒක වළක්වන්න කාටවත් බැහැ. එවැනි ගුණාංග සහිත සහෝදරයෙක් තමයි අද අපි අතර නැත්තේ.

කෝසල නුවන් ජයවීර සහෝදරයාගේ දෙමව්පියන්ටත්, ඒ සහෝදරයන් දෙපළ ඇතුළුව කෑගල්ල දිස්ත්‍රික්කයේ එතුමාට ආදරය කරපු, එතුමා බලාපොරොත්තුවෙන් හිටපු, එතුමාගේ දේශපාලනය, එතුමාගේ නායකත්වය අපේක්ෂා කරපු සමස්ත ජනතාව සහ රටේ සමස්ත ජන සමාජයටම එතුමා වෙනුවෙන් අපේ සංවේගය පළ කරනවා. එතුමා බලාපොරොත්තු වූ පරිදි එතුමා වෙනුවෙන් කළ යුතු හොඳම දේ මේ රටේ ස්ථාපිත කිරීම සඳහා අපි අනිවාර්යයෙන්ම කැප වෙලා කටයුතු කරන බවට සපථ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා.

[අ.භා. 4.01]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මාවෛ සෝ. සේනාධිරාජා මැතිතුමා, ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා, ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා යන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන්ගේ අභාවය වෙනුවෙන් එතුමන්ලාගේ පවුල්වලට ශෝකය ප්‍රකාශ කිරීමේ අවස්ථාවයි අද දිනට යෙදී තිබෙන්නේ. ඒ අනුව ඒ සියලු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආදරණීය පවුල්වලට මේ අවස්ථාවේදී අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරන්නට මා කැමැතියි.

කොහොම වුණත්, මට වැඩිපුරම අත්දැකීම් තිබෙන්නේ ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමා සම්බන්ධවයි. මොකද, පසුගිය කාලයේ අපේ රටේ ඇති වුණු දේශපාලන පරිවර්තන එක්ක තාරුණ්‍යය නියෝජනය කරන විශාල පිරිසක් දේශපාලන සක්‍රියභාවයට පත් වුණා. එවැනි පිරිසක් නිසා විශාල ජනතාවක්, විශාල ප්‍රජාවක් දේශපාලන වශයෙන් දැනුවත් වුණා. අපි දන්නවා, අපි ජීවත් වන ශ්‍රී ලංකාව දීර්ඝ කාලයක් මුහුණ දෙමින් සිටින ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒ අතර විශේෂයෙන්ම දීර්ඝ කාලයක සිට තරුණ ජනතාවගේ බලාපොරොත්තු, හීන බිඳ වැටෙමින් පැවතීම නිසාම ඔවුන් බොහෝදෙනා පාසල් වයසේ ඉඳලාම මේ රට අත්හැර වෙනත් රටකට යන්නේ කොහොමද කියලා හිතන තැනකට පත් වුණා. එවැනි අභාග්‍යසම්පන්න ඉරණමකට ලක්වීමට අපේ රටේ බොහෝ තරුණයන්ට -තරුණ ප්‍රජාවට- අපේ රටේ අනාගතය නියෝජනය කරන ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ඒ සියල්ල අතර තවත් බොහෝ සැලකිය යුතු පිරිසක් තමන්ටත් වඩා ඊළඟ පරම්පරාවලට යහපත් රටක් උදා කර දීම වෙනුවෙන් තමන්ගේ තරුණ ජීවිතය කැප කරපු ඉතිහාසයකුත් අපට තිබෙනවා.

පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ සිද්ධ වෙච්ච විශාල දේශපාලන පරිවර්තන එක්ක, දේශපාලන සංස්කෘතියේ පරිවර්තන එක්ක නොඉපදුණු පරම්පරාවට පවා අනාගතයේ යහපත් රටක් උරුම කර දීමේ ආරම්භය අපි අරගෙන තිබෙනවා කියලා මම හිතනවා. ඒ නිසා අපේ තරුණ දේශපාලන ව්‍යාපාරය තුළ, කෝසල සහෝදරයා නියෝජනය කරපු කෑගල්ල දිස්ත්‍රික්කයේ සමාජවාදී තරුණ සංගමයේ කෑගල්ල දිස්ත්‍රික් සංවිධායකවරයා ලෙසත්, ඒ වාගේම ඒ ප්‍රදේශයේ පොදු මහත් ජනතාව නියෝජනය කරපු මහජන නියෝජිතයෙකු ලෙසත්, ඊට පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙසත් එතුමා විශාල කාර්යභාරයක් කළා වාගේම, විශාල ආදර්ශයක් අපේ රටට ලබා දීලා තිබෙනවා. සමහර වෙලාවට අපට දීර්ඝ කාලයක් අපේ ජීවිතය ගත කරන්න අවස්ථාව ලැබෙන්න පුළුවන්. නමුත් සමහර විට අපේ ජීවිතය අපි නොහිතන තරම් කෙටි වෙන්නත් පුළුවන්. අපේ කෝසල සහෝදරයා අප සියලුදෙනාටම ලබා දීපු ආදර්ශ අතර අපට පෙන්වා දී තිබෙනවා, කෙතරම් කෙටි ජීවිත කාලයකදී වුවත් සාමූහික වගකීමක් ඇතුළේ, සාමූහික ක්‍රියාවලියක් ඇතුළේ තමන්ගේ කැපවීම් හරහා රටක වෙනසක් ඇති කරන්න කොයි තරම් දායකත්වයක් දෙන්න පුළුවන්ද කියලා. කෝසල සහෝදරයා අප සියලුදෙනා සමඟ පසුගිය කාලය පුරා මේ රට යහපත් තැනකට පත් කරන්න කරපු අරගළයේ ඒ සහෝදරයාගේ පරිච්ඡේදය අවසන් වුණත්, එතුමා ආරම්භ කරන ලද මේ සාමූහික ප්‍රයත්නය අවසන් වෙන්නේ නැහැ කියා මා හිතනවා. අද අපි ගොඩක් වෙලාවට සමාජය දකින්නේ තනි තනිවම, එහෙම නැත්නම් තමන් ගැනම විතරක් හිතන සමාජයක් විධියට. ඒකට වරදක් කියන්නත් බැහැ. අපේ රට වාගේ දේශපාලන වශයෙන්, ආර්ථික වශයෙන් පරිහානියට පත් වෙමින් ආපු රටක තාරුණ්‍යයට තිබෙන බලාපොරොත්තුත් ඉතාම සීමිතයි. එතුමා මිය යන විට වයස අවුරුදු 38ක්. වයස අවුරුදු 38-40 කියන්නේ අධ්‍යාපනය ලබා, විවිධ සමාජ අත්දැකීම් ලබා ජීවිතය අලුතින් පටන් ගන්නා වයසක්. සාමාන්‍යයෙන් කෙනෙක් අවුරුදු 40 වාගේ වයසකදී නැවත ඉපදුණා වාගේ අලුත් ජවයකින්, අත්දැකීම් සමඟ නව විධියකට ලෝකය දෙස බලමින්, ඒ අත්දැකීම් සමඟ ලෝකයට සම්බන්ධ වනවා. එවන් වයසකදී කෝසල නුවන් ජයවීර සහෝදරයාට අප අතරින් සමුගෙන යෑමට සිදුවීම අප ඉතා කනගාටුවට, ශෝකයට පත් කරන අවස්ථාවක් වුවත්, මා පෙර කී පරිදි මෙතැනින් එතුමාගේ කාර්යභාරය අවසන් වෙන්නේ නැහැ. එතුමා ගත් ප්‍රවේශය අනුව තාරුණ්‍යයට දීපු පණිවුඩයක් තිබෙනවා. තමතමන්ගේ ජීවිත යහපත් කර ගන්නවා හා සමානවම කැපවීමක් සහිතව මේ රටේ තමන් දන්නා නොදන්නා ජනතාව වෙනුවෙන් කැප වෙන්නට, වැඩ කරන්නට, තමන්ගේ තරුණ

දිවිය වැය කරන්නට හැකි බව එතුමා අපට පෙන්වා දී තිබෙනවා. කෙටි ජීවිත කාලයක් තුළ මේ රටේ සුවිශේෂී දේශපාලන පරිවර්තනයක සජීවී අත්දැකීම් ලබපු, ඒ පරිවර්තනය වෙනුවෙන් රට ඉදිරියට ගෙන යෑමට ඒ මතවාදය අනුව කටයුතු කළ සහෝදරයෙකු වාගේම, මහජන නියෝජිතයෙකු, මන්ත්‍රීවරයෙකු විධියට ගරු කෝසල නුවන් ජයවීර සහෝදරයා අප සියලුදෙනාටත්, ඉදිරි අනාගත පරම්පරාවලටත් ලබා දී ඇති ආදර්ශයට අපි සදා ණයගැතියි. ඒ නිසා එවැනි දක්ෂ, දැ හිතකාමී සහෘදයෙකු නිර්මාණය කළ දෙමව්පියන්ටත්, ඒ වාගේම එතුමා අහිමි වීමේ පාඩුව විඳදරා ගනිමින් උපේක්ෂාවෙන්, කෙටි ජීවිත කාලය තුළ එතුමා රට වෙනුවෙන් කරන ලද කැපවීම පිළිබඳව ආඩම්බර වෙමින් ශෝකය විඳදරා ගන්නා එතුමාගේ පවුලේ සියලුදෙනාටත් අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.08]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඔබ අපට සිදුව තිබෙන්නේ අපේ ජීවිත කාලය තුළ අපි අපේක්ෂා නොකරපු තරුණ මන්ත්‍රීවරයකුගේ අභාවය පිළිබඳවත්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු තවත් මහජන නියෝජිතයන් කිහිපදෙනෙකු පිළිබඳව සහ එතුමන්ලාගේ කාර්යභාරය පිළිබඳවත් යම් ඇගැයීමක් කරන්නයි.

අපි කවුරුත් වැඩිපුර කථා කරපු, ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමා මිය යන විට වයස අවුරුදු 38යි. කෙනෙකුගේ ජීවිතයේ බොහෝ වැඩ කටයුතු කළ හැකි, දුවන්න, පනින්න, ඇවිදින්න ශක්තිය තිබෙන, බොහෝ වැඩ ප්‍රමාණයක් පවරා ගෙන කළ හැකි වයසකදී, තවත් බොහෝ දේවල් කළ හැකිව තිබියදී, විශාල හිඩැසක් -රික්තයක්- ඇති කරමින් එතුමා අපගෙන් වියෝ වුණා. එතුමා නැති අඩුව සැපිරීමට නොහැකි තත්ත්වයක් තිබියදී අපි කාගෙනුත් සමු ගැනීමෙන් එතුමා අපට අහිමි වෙලා ගියා. එවැනි තරුණයෙකු පිළිබඳව, එවැනි මන්ත්‍රීවරයෙකු පිළිබඳව, මේ රටට බොහෝ දේවල් දායක කළ හැකි කෙනෙකු පිළිබඳව අප ජීවත්වන කාලය තුළ මේ පාර්ලිමේන්තුවේදී කථා කිරීමට ලැබීම නිසා එක් පැත්තකින් අපිත් අවාසනාවන්ත මිනිස්සු බවට පත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, වාමාංශික දේශපාලනය තෝරා ගැනීම ම අභියෝගයක් වූ කාලපරිච්ඡේදයක් තිබුණු බව. ඒ වාමාංශික දේශපාලනය තෝරා ගැනීම ඇතුළේම අපට අහිමි වන බොහෝ දේවල් තිබෙනවා. පෞද්ගලික අරමුණු වෙනුවෙන් වෙහෙසෙන සමාජයක, නියැළෙන සියලු කටයුතුවලින් පෞද්ගලිකව ධනය, බලය, භෞතික සම්පත් එකතු කර ගන්න පොරබදන සමාජයක, විශේෂයෙන්ම දේශපාලන ක්ෂේත්‍රය තුළ ප්‍රාදේශීය සභාවකට තේරී පත්වීම මඟින් පෞද්ගලික දේවල් එකතු කර ගන්න පහසු මාර්ගයක් විවරව තිබුණු මොහොතක වාමාංශික දේශපාලනය තෝරා ගැනීම කියන්නේ ම මහා කැප කිරීමක්. ඒ වාමාංශික දේශපාලනය කරන්නේ ලංකා සමසමාජ පක්ෂය සමඟ වෙන්න පුළුවන්, කොමියුනිස්ට් පක්ෂය සමඟ වෙන්න පුළුවන්. ඒ පක්ෂ දෙකටම වඩා, මීට දශක කිහිපයකට කලින් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය තෝරා ගැනීම කියන්නේ ම අභියෝගයක්. ඒක එක පැත්තකින් පෞද්ගලික අභිමතාර්ථ රහිත දේශපාලනයක්. ඒ වාගේම දුෂ්කරතාවලින් පිරුණු ජීවිතයක් ගත කරන්න වෙන කාලයක්. ඒ වාගේම තමයි ප්‍රශංසා වෙනුවට විවේචන, ගල්මුල් එන අවස්ථාවක්. ඒ දේශපාලනය පෞද්ගලික ජීවිතය තුළ මව්පියන්ගෙන් ඈත් වෙන්න සිද්ධ වෙන, බොහෝ සමීප සබඳතාවලින් දුරස් වෙලා විශාල කාලයක් පොදු සමාජය වෙනුවෙන්, මහ ජනතාව වෙනුවෙන් කැප කරන්න වෙන දේශපාලනයක්. ඒ නිසා ඒක ඉතා දුෂ්කර කටයුත්තක්. එය අධිෂ්ඨානසහගත මිනිස්සුන්ට පමණක් නියැළිය හැකි දේශපාලනයක්. මේ සමාජය වෙනුවෙන් වාගේම, සමාජයේ අනාගත පැවැත්ම වෙනුවෙන් කැප විය හැකි, තමන් ගැන නොව අනෙකා වෙනුවෙන් හිතන්න පුළුවන් මිනිස්සුන්ට පමණක් නියැළිය හැකි, එසේ සිතීමෙන් විතරක් නතර වෙන්නේ නැතුව ඒ වෙනුවෙන් කැප කිරීම් කළ හැකි, ඒ වෙනුවෙන් අධිෂ්ඨානසහගතව මැදිහත් විය හැකි මිනිස්සුන්ට පමණක් නියැළිය හැකි දේශපාලනයක් තමයි වාමාංශික දේශපාලනය කියන්නේ. ඒ දේශපාලනය තුළ අපි අද විධායක බලතල සහිතව, පාර්ලිමේන්තුවේ 2/3කට එහා ගිය බලය සහිතව, පළාත් පාලන ආයතන 341න්, 267ක බලය සහිතව ඉන්න දැවැන්ත දේශපාලන ව්‍යාපාරයක් බවට පත් වී තිබෙනවා. හැබැයි, කෝසල නුවන් ජයවීර සහෝදරයා මේ දේශපාලනය තෝරා ගත් කාලය කියන්නේ, අපට මෙවැනි ජයග්‍රහණයක් අපේ ජීවිත කාලය තුළ ලැබෙයිද කියන සැකය සහිත, එහෙම බලාපොරොත්තුවක් පමණක් ඉතුරු වුණු, ඒ බලාපොරොත්තුවත් ඈත ක්ෂිතිජයේ ඉතා කුඩා අංශුවක් විධියට දිස් වුණු කාලයක්. එවැනි කාලයක තමයි කෝසල නුවන් ජයවීර සහෝදරයා මේ දේශපාලනය තෝරා ගත්තේ. ඒ නිසා තමයි මේක මහා කැප කිරීමක් වන්නේ. ජයග්‍රහණයක් නොපෙනෙන මානයක තිබියදී, තමන්ගේ ජීවිත කාලය තුළ එවැනි ජයග්‍රහණයක් අත්පත් කර ගත හැකිද කියන අවිශ්වාසය තිබියදී, මේ සමාජය වෙනුවෙන් කළ හැකි යුතුකම, වගකීම තමන් වෙත පවරා ගෙන පුද්ගලයෙක් මේ දේශපාලනයේ නියැළෙනවා නම්, ඒ තුළ මහා කැප කිරීමක්, මහා අධිෂ්ඨානයක් ගැබ් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝසල නුවන් ජයවීර කියන්නේ එවන් මනුෂ්‍යයෙක්. ඒ ගුණය, දරා ගැනීම, මානවවාදී බව වාගේම සහකම්පනය මෙතෙකැයි කියලා අපට දැනින් පෙන්වන්න බැරි පරිමාණයෙන් එහා ගිය මනුෂ්‍යයෙක් තමයි කෝසල නුවන් මැතිතුමා.

අපි දන්නා ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා, ජීවත් වෙන කාලය තුළ සමාජයට දැනෙන්න ජීවත් වෙන්න කියලා. මේ දියවන්නා ඔය පරිශ්‍රය කිට්ටුවෙන් පාර්ලිමේන්තු පාරේ යද්දී ජපන් මිත්‍රත්ව පාරට ඇතුළු වන ස්ථානයේ එවැනි වාක්‍යයක් සහිත පුවරුවක් මීට පෙර සවි කර තිබුණා. කෝසල නුවන් ජයවීර කියන්නේ සමාජයට දැනෙන්න ජීවත් වූ මනුෂ්‍යයෙක්. එතුමා විශ්වවිද්‍යාලය තුළ සිටියදී මුළු විශ්වවිද්‍යාලයටම නායකත්වය දෙන මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළා. එතුමා විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දැනෙන්න ජීවත් වෙච්ච මනුෂ්‍යයෙක්. ඒ වාගේම එතුමා ශිෂ්‍යයන්ගේ පොදු ගැටලු වෙනුවෙන් මැදිහත් වෙච්ච මනුෂ්‍යයෙක්. විශ්වවිද්‍යාලය තුළ ගත කරන අවුරුදු 3-4 ඇතුළත උපාධිය සම්පූර්ණ කරලා, අහිංසක දෙමව්පියන්ගේ ඉල්ලීම් සම්පූර්ණ කරලා, රැකියාවක් කිරීම සඳහා වූ සහතිකය අරගෙන එළියට යෑමේ අරමුණ සහිතව දහස් ගණන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්වවිද්‍යාලයට ඇතුළු වෙද්දී, කෝසල සහෝදරයා කියන්නේ විවේක කාලය අත්හැර, පොත් පත් පාඩම් කරන්න තිබුණු කාලය අත්හැර, විශ්වවිද්‍යාලය තුළ සමස්ත ශිෂ්‍ය ප්‍රජාව වෙනුවෙන් මැදිහත් වෙච්ච, සටන් වැදිච්ච නායකයෙක්. ඒ වාගේම නිදහස් අධ්‍යාපනය රකින්න මැදිහත් වෙච්ච කෙනෙක්. එතුමා සීමාවෙන් එහා ගොස් බොහෝ දේවල් කරපු කෙනෙක්. ඒ නිසා එතුමා විශ්වවිද්‍යාල ජීවිතය තුළ දැනෙන්න ජීවත් වෙච්ච මනුස්සයෙක්.

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

එතුමා විශ්වවිද්‍යාලයෙන් දේශපාලන අත්පොත් තබා නැවත කෑගල්ල දිස්ත්‍රික්කයට ඇවිත් දේශපාලනයට සම්බන්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල කියන්නේ පරිසර පද්ධතිය අතින් ගත්තාම ඉතාම සංවේදී පරිසර පද්ධතියක් සහිත දිස්ත්‍රික්කයක්. පසුගිය කාලයේ හිටපු සමහර මහජන නියෝජිතයන් ඒ පරිසර පද්ධති විනාශ කරද්දී ගරු කෝසල නුවන් මන්ත්‍රීතුමාට අභියෝගයක් තිබුණා, එතුමා ජීවත් වන, එතුමා මේ ලෝකයට බිහි කරපු, එතුමා ගොඩනඟපු, එතුමාට හුස්ම දෙන, එතුමා වාගේම අනෙක් මනුෂ්‍යයන් ජීවත් වන මේ ලස්සන දිස්ත්‍රික්කය තුළ තිබෙන අවලස්සන සිදුවීම් පිටුදකින්න වාගේම, ඒවාත් එක්ක පොර බදන්න. එතුමා මේ ලස්සන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන අභියෝගයට භෞතිකවම මැදිහත් වෙච්ච කෙනෙක්. එතුමා කෑගල්ලට ආවාට පස්සේ පරිසරවේදියකු විධියට කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ නායක, පරිසර අමාත්‍ය අපේ දම්මික පටබැඳි මැතිතුමා කිව්වා, ගරු කෝසල නුවන් මන්ත්‍රීතුමා කියන්නේ වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000ක් දක්වා වැඩි කිරීම වෙනුවෙන් පැවති සටනේදී ඒ අහිංසක වතු කම්කරුවන් වෙනුවෙන් අරගළ කරපු, ඒ වෙනුවෙන් මැදිහත් වෙලා සටන් කරපු සටන්කාමී නායකයෙක් කියලා. එතුමා ඒ දිස්ත්‍රික්කය තුළ දැනෙන්න ජීවත් වෙච්ච මනුෂ්‍යයෙක්. ප්‍රාදේශීය සභාව තුළ සිදු වෙන වංචා, දූෂණ සහ අක්‍රමිකතා වැළැක්වීම වෙනුවෙන් එතුමා සටන්කාමී නායකයකු විධියට කටයුතු කළා. ඒ වාගේම එතුමා ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෙකු වශයෙන් ජනතාවගේ අරමුණු හා අපේක්ෂා වාගේම, ඔවුන්ගේ පෞරුෂය ගොඩනැඟීම වෙනුවෙන් ඉතා හොඳින් සටන් වැදුණු සටන්කාමී පුද්ගලයෙක්. එතුමා ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුරය තුළ දැනෙන්න ජීවත් වුණා.

අපේ COPE එකේ සභාපති නිශාන්ත සමරවීර සහෝදරයා කිව්වා, ගරු කෝසල නුවන් මැතිතුමා පාර්ලිමේන්තුව තුළ ගත කළ මාස පහක පමණ කෙටි කාලය තුළ COPE එක නියෝජනය කරමින් මේ රටේ මහජන මුදල් රුපියල් මිලියන ගණන්, බිලියන ගණන් වංචා කිරීම් හා නාස්ති කිරීම් ගැන සාකච්ඡා වෙනකොට, එතුමාට ලැබුණු අවස්ථාව තුළින් එවැනි දේ නිවැරදි කරන්න ඉතා සක්‍රියව සටන් වැදුණාය කියලා. පාර්ලිමේන්තුව නියෝජනය කළ ඉතා කෙටි කාලය තුළදීත් එතුමා දැනෙන්න ජීවත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ලෝක පරිසර දිනය. අපි ලෝක පරිසර දිනය සැමරීම නිමිති කොටගෙන ඊයේ කෑගල්ල නගර මධ්‍යයේ ඒ ජාතික උත්සවය පැවැත්වූවා. පරිසර අමාත්‍යාංශය තුළදී ලෝක පරිසර දිනය සැමරීම සඳහා වූ වැඩ පිළිවෙළ සකස් කරද්දී පරිසරවේදීන් විශාල ප්‍රමාණයක් ඒ සඳහා සහභාගි වුණා. අපේ පරිසර ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් එක්ක එතැනට වරකාපොළ ප්‍රදේශයේ සමීර කියන පරිසරවේදියා ආවා. අපි මෙවර පරිසර සතිය වෙනුවෙන් ඉතා වැදගත් යෝජනා ගණනාවක් සම්මත කරන්න තීන්දුවක් අරගෙන තිබුණා. ඒ යෝජනාවලින් එකක් තමයි, වනාන්තර පද්ධති පහක් රක්ෂිත ප්‍රදේශ බවට පත් කිරීම.

ඒ වාගේම වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලපිටමඩ කියන ප්‍රදේශයේ, රබ්බිඩිගල සිට හපුගොඩ දක්වා නික්කඳුපොළ ඇළ මාර්ගය ගලා බසිනවා. ලෝකයේ රටවල් අතුරින් ලංකාවේ පමණක් ජීවත් වන, ලංකාවේත් මේ නික්කඳුපොළ ඇළ මාර්ගයේ පමණක් ජීවත් වන "බන්දුල පෙතියා" කියන මත්ස්‍ය විශේෂය වෙනුවෙන් එම දොළ පහරේ හඳුනා ගන්නා ලද කිලෝමීටර දෙකහමාරක පමණ ප්‍රදේශය අභය භූමියක් බවට පත් කිරීම තමයි අපේ අනෙක් වැදගත් යෝජනාව වන්නේ. පරිසර අමාත්‍යාංශය තුළ පැවති ඒ සාකච්ඡාවේදී එම තීන්දුව ගනිද්දී ඒ පරිසරවේදියා කිව්වා, අපට අහිමි වෙච්ච කෝසල නුවන් සහෝදරයාට ඒ කාරණය සම්බන්ධයෙන් හීනයක් තිබුණා කියලා. ලෝකයේ රටවල් අතුරින් ලංකාවේ පමණක් සියයකට දෙසීයකට ආසන්න ප්‍රමාණයක් ජීවත් වන දුර්ලභම මත්ස්‍ය විශේෂයක් වන මේ "බන්දුල පෙතියා" කියන මත්ස්‍යයන් සඳහා ආරක්ෂිත බිමක් නිර්මාණය කිරීම වෙනුවෙන් පරිසරවේදීන් සටන් කළා. සමීර කියන පරිසරවේදියාට එක අවස්ථාවක ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා කියලා තිබුණා, "සමීර අයියේ, පොඩ්ඩක් ඉන්න. අපේ ආණ්ඩුවක් එනවා. අපේ ආණ්ඩුව ආවාට පස්සේ ඔයගොල්ලන් කරන සටන අපි යථාර්ථයක් බවට පත් කරනවා. අපි 'බන්දුල පෙතියා' මත්ස්‍යයාට සංරක්ෂිත බිමක් හදනවා" කියලා. ඒ නිසා ඔහු කිව්වේ, අපේ නුවන් මල්ලිට ගෞරවයක් විධියට මේ වැඩේ කළ යුතුම දෙයක් කියලායි. ඒ නිසා තමයි මම මුලින් කිව්වේ, එතුමා මේ සමාජයට දැනෙන්න ජීවත් වෙච්ච මනුෂ්‍යයෙක් කියලා. එතුමා එක්ක සම්බන්ධ වෙච්ච කවරෙකුවත් එතුමා අත්හැරියේ නැහැ. එතුමාගේ මහජන දිනයට එන වතු කම්කරු දෙමළ පුරවැසියෙක්, එතුමාගේ මහජන දිනයට යම් අපේක්ෂාවක් දරාගෙන එන පුද්ගලයෙක්, පරිසරවේදියෙක්, මේ කවර හෝ පුද්ගලයෙක් එතුමාගේ පැත්තෙන් අත්හැරපු කෙනෙක් නොවෙයි එතුමා. එතුමා අතිසංවේදී පුද්ගලයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ යැයි කියලා දැත් දිගු කරලා පෙන්වන්න බැරි මිනිස් ගුණයක් තිබුණු මනුෂ්‍යයෙක් තමයි කෝසල නුවන් ජයවීර කියන්නේ.

විශ්වයේ ආයු කාලය අවුරුදු බිලියන ගණනක් වෙනවා. විශ්වයේ ආයු කාලයත් එක්ක ගනිද්දී මිනිසා මේ මිහිමත පෙනී ඉන්නේ එක ක්ෂණයක් විතරයි. වසර 60, 70ක් කියන්නේ විශ්වයේ ආයු කාලයත් එක්ක ගනිද්දී එක ක්ෂණයක් පමණයි. ඒ නිසා මේ ලැබිච්ච ඉතාම කෙටි ජීවිතය අපි කොහොමද මේ මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් පාවිච්චි කරන්නේ, යොදවන්නේ, මේ ලෝකය වඩාත් යහපත් තැනක් බවට පත් කරන්නේ කියන එක තමයි මිනිසා තුළ තිබිය යුතු මූලික අපේක්ෂාව විය යුත්තේ. නමුත් අපි දන්නවා, මේ අතිපෞද්ගලික සමාජයක් ඇතුළේ එහෙම හිතන මනුෂ්‍යයෝ ඉතාම අල්ප යුගයකයි අපි ජීවත් වෙන්නේ කියලා. කෝසල නුවන් ජයවීර කියන්නේ එවන් අල්ප මිනිසුන් අතරේ එක්කෙනෙක්.

එතුමා මිය යන මොහොත වන විට රුවන්වැල්ල, දෙහිඕවිට සහ දැරණියගල කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3ටම නායකත්වය දෙමින් සිටියේ. නමුත්, එතැන ලොකු රික්තයක් ඉතිරි කරලා කෝසල සහෝදරයා අපෙන් සමු ගන්නවා. අවසාන වශයෙන් මම මෙහෙම කියන්න කැමැතියි. එතුමාගේ කෙටි ජීවිත කාලය ඇතුළේ, බොහෝ කාලයක් ජීවත් වෙච්ච මනුෂ්‍යයකුටත් කළ නොහැකි බොහෝ දේ ලාංකීය සමාජයට එකතු කරමින්, බොහෝ අයට ආදර්ශවත් ආකාරයේ ජීවිතයක් ගත කළ, වැඩ කළ, වෙහෙසුණු, එතුමාගේ ජීවිතය ගැන වෙනුවට පොදු මහත් සමාජයේ ජීවිත ගැන හිතපු ආදරණීය කෝසල නුවන් ජයවීර සහෝදරයා, ඔබගේ නාමය අද අපි මේ පාර්ලිමේන්තුවේ කථා කරලා අපට අමතක කරන්න පුළුවන් නාමයක් නොවෙයි. මෙහි ගත කරන ඕනෑ තත්පරයකදී, අපි ජීවිතය අතහැර යන තෙක්ම ඔබේ නම, ඔබේ භාවිතය, ඔබෙන් අපි දැකපු දේ, ඔබේ සිනහව වාගේම අපේ මතකයේ තිබෙයි. ඔබට සුබ ගමන් යනුවෙන් ප්‍රාර්ථනා කරමින්, ඔබට ආචාරය පුද කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.25]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

හිටපු මන්ත්‍රීවරුන් වන ගරු මාවෙ සෝ. සේනාධිරාජා මැතිතුමා, ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා, ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමා යන අයගේ අභාවය පිළිබඳව අද දවස පුරාම සාකච්ඡා කරන මොහොතක මටත් මේ ගරු සභාව ඇමතීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඒකට හේතුව තමයි, අද කථා වෙච්ච මේ වටිනා චරිත ඇතුළේ වටිනාම චරිතය හැටියට අද බොහෝ අයගේ මුවින් කියැවුණ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෝසල නුවන් ජයවීර ආදරණීය මන්ත්‍රී සහෝදරයා වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මම වීමයි. ඒ ඔක්කෝම කථා මම අහගෙන හිටියේ. ඉතාම හැඟුම්බරව, ඉතාම ලොකු වේදනාවක් දැනෙන මොහොතකයි මම මේ අදහස් ප්‍රකාශ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවන පාර්ලිමේන්තුවට පත් වෙච්ච මන්ත්‍රීවරු අතර ළාබාලම මන්ත්‍රීවරයෙක් තමයි කෝසල නුවන් ජයවීර අපේ මිය ගිය මන්ත්‍රීතුමා. එතුමා ගැන මේ උත්තරීතර සභාවේදී විශාල ලෙස පැති ගණනාවකින් ගුණ කථන ඉදිරිපත් වුණා. එතුමා මිය ගිහිල්ලා දැන් මාස දෙකකට ආසන්න කාලයක් වෙනවා. ඒ මාස දෙක තුළ ම මේ සමාජයේ විවිධ තැන්වල එතුමා ගැන කථා වෙනවා. මම මුලින්ම මේ පාර්ලිමේන්තුවට පය තබපු මොහොතේ ඉඳලා මේ දැනුත් සමහර තැන්වලදී මෙතැනට පැමිණෙන බොහෝ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, මන්ත්‍රීවරු එතුමා ගැන විමසනවා. පාරේ තොටේ ගියත් මගෙන් විමසනවා, ඔබතුමා නේද කෝසල මන්ත්‍රීතුමාගේ මන්ත්‍රී ධුරයේ පුරප්පාඩුව සම්පූර්ණ කළේ කියලා.

ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතරම් අඩු වයසක කෙනෙක් මෙතරම් ප්‍රතාපවත් වුණේ කොහොමද? වානේ පන්නරය ලබන්නේ ජලයෙන්, ගින්දරෙන්, මිටි පහරින් කියලා අපි දන්නවා; කියවා තිබෙනවා. කෝසල නුවන් ජයවීර සහෝදරයා ජීවත් වුණේ හද්දා පිටිසර ගමක. යන්න එන්න පාරක් නැති, හරියට විදුලිය නැති, ඉතාම අඩු පහසුකම් සහිත ගම්මානයක තමයි එතුමා ජීවත් වුණේ. එතුමාගේ අම්මාට, තාත්තාට හරිහමන් රැකියාවක් නැහැ. එතුමාගේ සහෝදරයන් දෙදෙනාට අදටත් හරියට රැකියාවක් නැහැ. එතුමාගේ කුඩා කාලයේ සිටම අම්මාගේ, තාත්තාගේ ජීවනෝපාය මාර්ගයෙන් හම්බ වෙච්ච ඒ ඉතා කුඩා මුදලින් ඉගෙන ගෙන විශ්වවිද්‍යාල ජීවිතයට පය තබනවා. මේ රටේ විශාල සමාජ ආර්ථික පරිවර්තන, කලකෝලාහල වෙච්ච වේලාවක තමයි එතුමා විශ්වවිද්‍යාල ජීවිතය ගත කරන්නේ. විශ්වවිද්‍යාල ජීවිතය ඇතුළේත් එතුමා දීප්තිමත් ශිෂ්‍යයකු හැටියට අපි හඳුනා ගන්නවා, එතුමාගේ භාවිතාවෙන්, එතුමාගේ කටයුතුවලින් මෙන්ම එතුමාගේ යහළු හිතමිත්‍රාදීන්ගෙන්.

එතුමා විශ්වවිද්‍යාල ජීවිතය තුළින් ලබපු පන්නරය එතැනින් එක දශමයක්වත් නතර නොකර, විශ්වවිද්‍යාලයෙන් පසුව පය තැබුවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කටයුතු සඳහා අපත් සමඟ එකට අත්වැල් බැඳ ගැනීමෙන්. විශ්වවිද්‍යාලයේ කටයුතු ඉවර වෙලා එක දවසක්වත් එතුමා ගෙදර හිටියේ නැහැ. ඇත්තටම මට මතකයි, 2015, 2016, 2017 වාගේ කාලවල අපේ දිස්ත්‍රික්කයේ විශාල දුෂ්කරතාවලට අපි මුහුණ දුන්නා. විශේෂයෙන්ම එතුමා ජීවත් වෙච්ච ආසනය ගත්තොත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයට කියන්නේ තුන් කෝරළය කියලා. මේ තුන් කෝරළයට විශාල අභියෝග ගණනාවක් තිබුණු වේලාවක තමයි එතුමා දේශපාලන නායකත්වයට පත් වෙන්නේ. මට මතකයි, 2017 අන්තිම කාලය ගැන. එතුමා ළඟ සුපුරුදු වචනයක් තිබෙනවා, "අයියේ, අයියේ" කියලා. එතුමා අපිත් එක්ක උරෙන් උර ගැටුණා. ඒ ප්‍රදේශය නියෝජනය කරපු බොහෝ දේශපාලන නායකයෝ ඒ ප්‍රදේශයේ ජනතාවට බොරු පොරොන්දු දීලා ඒ මිනිස්සු අමාරුවේ දාලා හිටපු වේලාවක තමයි මේ තරුණ ජව සම්පන්න නායකයා ජාතික ජන බලවේගය ගොඩනහන්න පය තබන්නේ. ඒ වෙලාවේ එතුමා මුහුණ දුන්නු ප්‍රශ්න ගණනාවක් තිබුණා.

විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ බොහෝ අය ජීවත් වුණේ රබර් කර්මාන්තයෙන් වාගේම තේ කර්මාන්තයෙන්. මේ තේ වගාව, රබර් වගාව ඉවත් කරලා එවකට හිටපු පාලකයෝ ඒ වෙනුවට කටු පොල් වගා කරන්න ලෑස්ති වුණා; කළා. ඒ වේදනාව ඒ ජනතාවට දැනුණා. ඒක කියන්න ඒ වෙලාවේ කෙනෙක් හිටියේ නැහැ. ඒකට ඇහුම්කන් දුන්නේ ඉතාම තරුණ වියේ හිටපු කෝසල නුවන් සහෝදරයා. එතුමා ඔය තුන් කෝරළයේ නොගිය වත්තක් නැහැ.

ඒ වාගේම ඒ ජනතාවගේ දෛනික ජීවිතයට විශාල ලෙස බලපෑ ඊළඟ ප්‍රශ්නය තමයි වනසතුන්ගේ ප්‍රශ්නය. විශේෂයෙන් රිළවුන්ගේ, ඌරන්ගේ, කැලෑ කොටියාගේ ප්‍රශ්නය ඒ ජන ජීවිතයට තදින් බලපාන වේලාවක මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු බොහෝ මන්ත්‍රීවරු, ඇමතිවරු ඉඳිද්දී, ඒ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න සිටියේ කෝසල නුවන් ජයවීර සහෝදරයා විතරයි.

ඔහු නොගිය ගෙදරක්, ඔහු නොගිය තැනක් නැහැ. ඒ වාගේම මට මතකයි, කොවිඩ් වසංගතය ආ වෙලාව. ඒ වෙලාවේ ඒ ප්‍රදේශයේ දිළිඳු ජනතාවට ප්‍රතිකාර ගන්න තැනක් තිබුණේ නැහැ. මට මතකයි කිතුල්ගල, තැලිගම රෝහලේ වසා දමපු වාට්ටුවක් තිබුණා. ඒ වෙලාවේ ප්‍රාදේශීය සභාවේ මාත් එක්ක මන්ත්‍රීවරු 12දෙනෙක් හිටියා. කොවිඩ් මරණ බිය පැත්තක දමලා ඒ ප්‍රදේශයට ගිහිල්ලා, අපේ දිස්ත්‍රික් නායක සහෝදරයාට කථා කරලා, අප 12දෙනාගේ වැටුප් එකතු කරලා තිබුණු අරමුදලෙන් යොදවලා, තමන්ගේ අතින් බදාම අනලා තැලිගම රෝහලේ ඒ වාට්ටුව භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කරලා රෝහලට භාර දුන්නා. එහෙම තරුණයෙක්, මේ කියන කෝසල සහෝදරයා.

අපේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ ප්‍රබල සන්ධිස්ථානයක් තමයි ගුරු විදුහල්පතිවරුන්ගේ අරගළය. දිස්ත්‍රික්කයේ ඒ අරගළය භාරව හිටියේ මම. ඒ වෙලාවේ කෝසල නුවන් සහෝදරයා ඒකට අවතීර්ණ වෙලා කටයුතු කළා. ලංකාවේ ලොකුම අධ්‍යාපන කලාපය තමයි එතුමා ජීවත් වුණු ප්‍රදේශයේ දෙහිඕවිට අධ්‍යාපන කලාපය. එහි පාසල් 218ක් තිබෙනවා. මා දන්නා තරමින් එතුමා පාසල් 150කට වඩා වැඩි සංඛ්‍යාවකට ගියා. ඔහු නායකත්වයක් දුන්නා. ඒ වාගේම තමයි පාසල් ගණනාවක විශාල අර්බුද විසඳන්න ඔහු මැදිහත් වුණා. අදටත්, මේ දැනුත්, මීට මොහොතකට කලිනුත් මට දුරකථන ඇමතුමක් ලැබුණා, කෝසල සහෝදරයා මැදිහත් වෙච්ච ප්‍රශ්නවලට උත්තර විමසමින්. ඔහු ජීවත් වෙච්ච පරිසරය ඔහු නායකයෙකු බවට පත් කළා; ඔහු ජව සම්පන්න සටන්කරුවෙකු බවට පත් කළා. මීට කලින් කථා කරපු අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ ආණ්ඩුවක්

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

එනකල් ඔහු බලාගෙන හිටියා, ජනතාවට සැනසුම් සුසුම් හෙළන්න පුළුවන් සමාජයක් ජනතාවත් එක්ක එකතු වෙලා ගොඩ නඟන්න.

ඔහු ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක සම්බන්ධීකරණ කමිටු සභාපති. උදේ පටන් ගත්තාම රෑ 12.00, 2.00, 3.00 විතර වනකල් ඔහු ඒ හැම සංවර්ධන වැඩක් ගැනම හෙව්වා; ආවා ගියා. ඔහුට සිහින තිබුණා. ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලා, අලුතින් කර්මාන්ත ප්‍රමාණයක් ආරම්භ කරලා, තුන් කෝරළය කියන ප්‍රදේශයේ ඓතිහාසික උරුමයන්, පරිසරය ආරක්ෂා කරලා, දිස්ත්‍රික්කයෙන් රටට හොඳ ආර්ථිකයක් අත්පත් කර දෙන්න ඔහු සිහින දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු තම අප්‍රතිහත ධෛර්යයයෙන් තමන්ගේ කාලය කැප කරමින් තමා දැකපු ඒ සිහිනය හඹාගෙන ගියා. හැබැයි අවාසනාව කියන්නේ, ඔහු තමන්ගේ ජීවිතය ගැන, තමන්ගේ සෞඛ්‍යය ගැන හිතුවේ නැහැ. අප කවුරුත් මෙය අවධානයට ගත යුතුයි කියලා මම හිතනවා. අප ඒ ගැන වරින් වර ඔහුට කිව්වා වුණත් ඔහු ඉතාම සැහැල්ලු හිනාවකින් කිව්වා, "නැහැ අයියේ, එහෙම අසනීපයක් නැහැ, අපි වැඩ කරමු" කියලා. වෙලාවකට රෑ 2.00යි කෝල් ගනිද්දී. උදේ පාන්දර එනවා අපව හම්බ වෙන්න. "අපි හරම කරමු, මෙහෙම කරමු" කියනවා. අන්න එහෙම දීප්තිමත් අනාගතයක් සහිත තරුණ නායකයෙක් තමයි අපට අහිමි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා වෙලාව ගන්නේ නැහැ. ඔහු වෙනුවෙන් බලාපොරොත්තු දල්වාගෙන හිටපු ජනතාවක් ඉන්නවා. ඔහුගේ නායකත්වය පිළිගෙන හිටපු බොහෝ අය ඉන්නවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ තරුණ පරම්පරාවටත් නිවැරදි නායකත්වය දුන්නේ, කෝසල නුවන් ජයවීර සහෝදරයායි. ඒ සියලුදෙනා අද දුකින් හඬා වැලපෙනවා. ඔහුගේ අම්මා තාත්තා, සහෝදර සහෝදරියන් ඇතුළු හැමදෙනාටම මගේ ශෝකය, අපේ පක්ෂයේ ශෝකය මම ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපි ඔවුන්ට පොරොන්දු වෙනවා, කෝසල නුවන් ජයවීර නමැති ඒ තරුණ නායකයා, තරුණ දේශපාලනඥයා, ඒ තාරුණ්‍යය දැකපු ඒ සිහිනය අප සැබෑ කරන බවට. කෝසල නුවන් ජයවීර සහෝදරයා වෙනුවෙන් එතුමාගේ ඒ සිහිනය සැබෑ කරන බව සපථ කරමින් මම නිහඬ වෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

[අ.භා. 4.36]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ශෝක යෝජනා ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන් අතර ඉලංගෙයි තමිල් අරසුකච්චි පක්ෂයේ නායකයකු වූ අභාවප්‍රාප්ත මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමා හෙවත් සෝමසුන්දරම් සේනාධිරාජා මැතිතුමා, ඩොනල්ඩ් දිසානායක මැතිතුමා, ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා සහ කෝසල නුවන් ජයවීර සහෝදරයා සිටිනවා.

අප දේශපාලනයේ බොහෝ කාලයක් සිටියා වුණත් මුලින් නම් කියැවුණු අය බොහෝ දෙනෙක් අපට මුහුණට මුහුණ හමු නොවුණු නමුත් ඒ අය මේ පාර්ලිමේන්තුවේත්, ලංකා දේශපාලනයේත් නම තියපු චරිත. ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා අප රූපවාහිනියෙන් දැකපු කෙනෙක්, ජාත්‍යන්තර තත්ත්වයන් ගැන බොහෝ දැනුම ඇතිව කථා කළ කෙනෙක්. ඒ වාගේම තමයි මාවෙයි සෝ. සේනාධිරාජා මැතිතුමාත්. එතුමා රාජවරෝදයම් සම්පන්දන් මැතිතුමා සේම තමන්ගේ ජනතාව නියෝජනය කරමින්, පීඩාවන් ඉවත් කර ගනිමින් ලාංකීය සමාජයක් ලෙස එකට එක්ව කටයුතු කිරීම පිළිබඳ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරමින් තමන්ගේ දේශපාලනය කළ කෙනෙක්. ඒ නිසා මම හිතනවා එතුමන්ලාගේ පවුලේ ඥාතීන් සහ හිතවතුන් වෙනුවෙන් අපගේ බලවත් ශෝකය පළ කළ යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝසල නුවන් ජයවීර සහෝදරයා ගැන කථා කරන කොට, ඒක වෙන කථාවක්. ලෝකයේ විවිධ වර්ගයේ නායකයන් ඉන්නවා. ඒ අය අතරින් ලෝකයේ ඉන්නවා unifying leaderලා, සමාජය හෝ රාජ්‍යය හෝ එක්සත් කළ නායකයන්. Alexander the Great, Salah al-Din Yusuf ibn Ayyub, ඒබ්‍රහම් ලින්කන්, ව්ලැඩිමීයර් ලෙනින් වැනි රාජ්‍ය පාලකයන්, රාජ්‍ය නායකයන්. කෝසල නුවන් ජයවීර සහෝදරයාත් ඔහුගේ ක්ෂේත්‍රය තුළ, ඔහු වැඩ කළ හැම තැනකම unifying leader කෙනෙක් බවට පත් වුණා. ඔහු තමා වැඩ කළ හැම ක්ෂේත්‍රයක්ම එක්සත් කළ නායකයෙක් බවට පත් වුණා.

ඔහුගේ සරසවි දිවිය කියන්නේ බෙදිලා විවිධ සටන්වල එකිනෙකාට විරුද්ධව හිටපු ශිෂ්‍ය කණ්ඩායම් පැවැති එකක්. ඔහු විවෘත සරසවිය ඇතුළේ ඒ සියලු දෙනා එකට එකතු කරපු, විවෘත සරසවිය බිහි කරපු පළමු නායකයායි. මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා හැටියට ඔහුට පුළුවන් වුණා විවිධ කණ්ඩායම් මහා ශිෂ්‍ය සංගමයේ නායකත්වය යටතට ගෙන එන්න, දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයත් එක්ක බද්ධ කරන්න. ඔහු ඒ වගකීම බොහොම ලස්සනට ඉටු කළා.

විවෘත සරසවිය තුළ කැරලි කොණ්ඩයක් සහිත, උඩ බොත්තම ඇරපු, ෂර්ට් එක උඩින් දාපු, මෙරූන් පාට දිලිසෙන ෂර්ට් එකක් ඇඳගෙන හැම සටනකම ඉදිරි පෙළ නායකයා විදියට, හැම පිය්යකම සටන් සගයා විදියට, හැම අරගළයකම තමන්ගේ නායකත්වයේ ලකුණ සටහන් කළ සහෝදරයෙක්, ඔහු. මට මතක් වන්නේ රුසියාවේ Yakov Mikhailovich Sverdlov සහෝදරයා, සමස්ත රුසියානු සෝවියට් විධායක සභාවේ සභාපතිවරයා. ඔහු ජීවිතය අත් හළේ Spanish flu එක හැදිලා වයස අවුරුදු 34න්. උණ හැදිලා සිටියදී තමන්ගේ නායකයා වූ ලෙනින් ඔහු බලන්න ගියා. ඔහු උණ වැලඳී තිබියදීත් වැඩ කරපු කෙනෙක්; තමන්ගේ වගකීම අත් නොහැර ඉටු කළ කෙනෙක්. කෝසල නුවන් ජයවීර කියන්නේත් එවැනිම Sverdlov පන්නයේ නායකයෙක්. ඔහු අත් හැරියේ නැහැ තමන්ගේ වගකීම, තමන්ගේ ක්ෂේත්‍රය මොක වුණත්. විටෙක ඔහු ශිෂ්‍ය ව්‍යාපාරයේ නායකයෙක්; විටෙක ආර්ථිකය පිළිබඳව, විටෙක පරිසරය පිළිබඳව හඬ නඟපු නායකයෙක්; විටෙක පාර්ලිමේන්තුවේ, විටෙක අපත් සමඟ COPE එකේ හොරු අල්ලන්න කටයුතු කළ කෙනෙක්. ඔහු fearless leader කෙනෙක් - භය නැති නායකයෙක්; ඕනෑම ක්ෂේත්‍රයක් අතැඹුලක් සේ ගෙන වැඩ කරන්න පුළුවන් බොහෝ ඉහළ සංවිධායකයෙක්. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි සමස්ත පක්ෂයටම, ආණ්ඩු පක්ෂයටම, රටටම අහිමි වුණේ Sverdlov පන්නයේ දක්ෂ සංවිධායකයෙක්; අතිදක්ෂ සංවිධායකයෙක්.

ඔහු 2024 නොවැම්බර් මාසයේ 21වන දා මේ සභා ගර්භයට අප සියලුදෙනා එක්ක පිවිසියා. අපි විවෘත සරසවියේ ආදි ශිෂ්‍යයෝ. මම ඔහුට වඩා අවුරුදු 2ක් විතර කලින් විවෘත සරසවියේ ශිෂ්‍ය ව්‍යාපාරය සමඟ සම්බන්ධ වෙලා මහා ශිෂ්‍ය සංගමයේ හිටියේ. ඔහු මට වඩා අවුරුදු 2කට පස්සේ හිටියේ. ඒ නිසා මම එතුමා ගැන පෞද්ගලිකව, ඉතා හොඳින් දන්නා කාරණා ගොඩක් තිබෙනවා. එතුමා අතිවිශිෂ්ට සටන් සගයෙක්. සටන අත්

නොහැර අඛණ්ඩව සටන් කරපු සහෝදරයෙක්. පාර්ලිමේන්තු, ජනාධිපතිවරණ සටන්වලදී -ඡන්ද සටන්වලදීත්- එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයටත්, මම කළුතර දිස්ත්‍රික්කයටත් සංවිධාන වැඩ කටයුතු කළා. එදා සරසවියේ දැකපු කෝසලම තමයි නැවත මේ පාර්ලිමේන්තුවේදීත් මුණ ගැහුණේ. එතුමා කිසිවිටෙක සංකීර්ණ හෝ පුම්බාගත් චරිතයක් බවට පත් වුණේ නැහැ. එතුමා "මන්ත්‍රීවරයා" කියන එක ඇඳගත්තේ නැහැ. එයින් පිම්බිලා සමාජය ඉදිරියේ වෙනම නාටකයක් රඟ දැක්වූයේ නැහැ. එතුමා විශිෂ්ටතම සහෝදරයෙක්. ඒ නිසා එතුමාගේ අවසන් කටයුත්ත බොහෝ සෙනඟින් -ගමේ හිතමිතුරන්, විශ්වවිද්‍යාල සහෝදර සහෝදරියන් ඇතුළු සියලුදෙනාගෙන්ම- පිරී ගිය එකක් බවට පත් වුණා. එවැනි සංවිධායකයෙක්, එවැනි විශිෂ්ට සටන් සගයෙක් අහිමි වීම පිළිබඳ ශෝකය තවමත් එලෙසම අප අතර තිබෙනවා; අපේ හිත් තුළ තිබෙනවා. අපි බලාපොරොත්තු නොවුණු, මේ පාර්ලිමේන්තුව කිසිවිටෙකත් බලාපොරොත්තු නොවුණු ආකාරයට අපේ සගයෙක් වෙනුවෙන් ශෝක පණිවුඩයක් -ශෝක ප්‍රකාශයක්- කරන්නට සිදු වීම පිළිබඳ බලවත් වේදනාවක් මා තුළ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ අහිමිවීම කිසි විටෙකත් පිරිමැසිය නොහැක්කක්. එතුමාගේ මවට, පියාට, සහෝදරයන් දෙදෙනාට මහජන ව්‍යාපාරයක් ලෙසත්, ආණ්ඩුවක් ලෙසත්, පක්ෂයක් ලෙසත්, විවෘත සරසවියේ සගයන් ලෙසත් අපේ බලවත් ශෝකය පළ කර සිටිනවා; කනගාටුව පළ කර සිටිනවා. නමුත්, එතුමාගේ හැර යෑමේ අඩුව කිසි දිනෙක පුරවාලිය නොහැකියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන අභාවප්‍රාප්ත ගරු කෝසල නුවන් ජයවීර මහතා, ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා, ගරු ඩොනල්ඩ් දිසානායක මහතා සහ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින්, එම ශෝක යෝජනාවලට ගරු කථානායකතුමා සමඟ මමද එකතුවීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල හැන්සාඩ් වාර්තාවේ පිටපත් ශෝකයට පත් එම පවුල්වල අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරියට මම නියෝග කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ මුදල් අමාත්‍යතුමාටයි.

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවය කරන කාර්ය මණ්ඩලවල වැටුප් පසුගිය දිනවල රජයේ වැටුප් වැඩි කිරීම අනුව ගැළපීමේදී අඩු වී ඇති බව අපට දැනගන්නට ඇති කරුණකි. 01/2025 චක්‍රලේඛයෙන් ඔවුන්ගේ වැටුප් කප්පාදු වී ඇති බව සඳහන් කරමින් ඔවුන් විසින් මේ වන විට දිගින් දිගටම විරෝධතා ව්‍යාපාරවල නිරතව ඇති බව ඔබතුමා දන්නවා ඇතැයි මම සිතමි.

1. දැනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි පවත්නා අරමුදල් ප්‍රමාණය කොපමණ ද?
2. මෙම අරමුදල යටතේ සේවා යෝජකයන් කොපමණ ප්‍රමාණයක් සිටිද?
3. මේ වන විට සේවා නියුක්තිකයන්ගේ අරමුදල මඟින් සුබසාධනය සපයන ලියාපදිංචි සාමාජිකයින් සංඛ්‍යාව කොපමණ ද?
   - ➢ මෙම කාර්ය මණ්ඩලවල වැටුප් නිසි ක්‍රමයකට සකස් කර නොමැති බවත්, සාධාරණ වැටුප් වැඩි කිරීමකට ඔබතුමා එකඟ වන්නේද, නැද්ද යන්නත් ප්‍රකාශ කළ හැකි ද?

ගරු අමාත්‍යතුමනි, රජය වැටුප් වැඩි කළාට පස්සේ රුපියල් 9,000 ගණනකින් - මම හිතන විධියට රුපියල් 9,010කින් - මේ සේවකයන්ගේ වැටුප අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රජය වැටුප් වැඩි කළාට පස්සේ, රුපියල් 22,000කින් පඩිය අඩු වෙලා තිබෙනවා. ETF එකේ රුපියල් බිලියන 560ක් තිබෙනවා. සේවකයන් ඉන්නේ 800 ගණනක්. මේ ගැටලුව තිබෙන්නේ සේවකයන් 560කට. ඒ ඉන්න සේවකයන්ට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලින් මේ රටට, රටේ ආර්ථිකයට විශාල වැඩ කොටසක් සිද්ධ වනවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථා ඇතුළු ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු සේවකයන්ට වාසියක් ලැබෙනවා.

ගරු ඇමතිතුමනි, අරමුදලේ සභාපතිතුමා වැටුප් ගන්නවා. ඔබතුමන්ලා පත් කරලා ඉන්න සභාපතිතුමා වැටුප් ගන්නවා. එම අරමුදලින් රුපියල් එක්කෝටි අසූලක්ෂයක් ITN එකේ විකාශනය වන "කෝපි කඩේ" ටෙලි නාට්‍යයට දීලා තිබෙනවා, සේවක වැටුප් කප්පාදු කරලා.

රජයෙන් පසුගිය කාලයේ හැම ආයතනයකම සේවකයන්ට සාධාරණ වැටුපක් දුන්නා. ජනාධිපතිතුමා රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීමේදී යෝජනා කළා, පෞද්ගලික අංශයේ ඉන්න

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

සියලුදෙනාගෙත් වැටුප් වැඩි කරන ලෙසට. ඒකෙන් ගැටලුවක් මතුව පවතින නිසා තමයි මම අද සභාව කල් තබන අවස්ථාවේදී ඇමතිතුමාට මෙය යොමු කරලා, ETF ආයතනයේ ඉන්න සේවකයන්ට සාධාරණ පිළිතුරක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරන්නේ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ඔබතුමා ප්‍රශ්නය ඉදිරිපත් කළ ප්‍රවේශය නිවැරදි නැහැ. ඒ දත්ත ඉදිරිපත් කිරීමේ ගැටලුවක් තිබෙනවා. මම ඒක පැහැදිලි කරන්නම්.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025ට අනුව කිසිදු රාජ්‍ය සේවකයෙකුගේ වැටුප් අඩුවීමක් සිද්ධවෙලා නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. දැනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි පවත්නා අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 564.3යි.
2. සේවා යෝජකයන් සංඛ්‍යාව 81,511යි.
3. මේ වන විට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල මඟින් ප්‍රතිලාභ ලබන ලියාපදිංචි, ක්‍රියාකාරී සාමාජික - active membersලා - සංඛ්‍යාව මිලියන 2.5යි.

ඇත්තෙන්ම මේ වැටුප් අඩුවීම කියන කථාව මතු වෙන්න බලපෑ හේතු කිහිපයක් තිබෙනවා, විශේෂයෙන්ම ETF එක සම්බන්ධයෙන්. කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025න් රජයේ සංස්ථා ඇතුළු ව්‍යවස්ථාපිත ආයතන සඳහා රජය විසින් සියයට 60ත්, සියයට 80ත් අතර විශාල ප්‍රමාණයකින් වැටුප් වැඩි කිරීමක් කළා. නමුත්, මෙම ප්‍රශ්නය පැන නඟින්නේ මෙන්න මේ කාරණය නිසා. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල විසින් මේ චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කරන්න යනකොට, ඊට පෙර නිකුත් කර තිබෙන කළමනාකරණ සේවා චක්‍රලේඛ 30/2006 සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 විධිවිධාන ප්‍රකාරව නිවැරදිව වැටුප් සකස් කර තිබීම අනිවාර්යය කාරණයක්. කෙසේ වෙතත්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ ඒ මොහොතේ තිබුණු කළමනාකාරිත්වය, ඒ මණ්ඩල විසින් සහ අභ්‍යන්තර කමිටු විසින් මෙන්න කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විධිමත් ආකාරයට කටයුතු කරලා නැහැ. අභ්‍යන්තර කමිටු හරහා ඉහතින් සඳහන් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ දෙක අනුගමනය නොකිරීම නිසා එම කාර්ය මණ්ඩල අතර විශාල වැටුප් විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ අනුව නිශ්චිතවම 2013.05.01 දිනට පෙර සේවයේ යෙදී සිටි සේවකයන් සහ 2013.05.01 දිනෙන් පසුව නව බඳවා ගැනීම් කළ අය අතර විශාල වැටුප් පරතරයක් නිර්මාණය වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, සහකාර ක්‍රියාත්මක කිරීමේ නිලධාරි, එකම කාණ්ඩය 2013.03.15 දින - ඒ කියන්නේ 2013.05.01 දිනට කලින් - බඳවාගෙන තිබෙන අයට දැනට ලැබෙන මූලික වැටුප, ඒ කියන්නේ 2025 මාර්තු 31 දිනට ලැබුණු වැටුප රුපියල් 57,616යි. එම කෙනාටම 2014.08.18 දින - ඒ කියන්නේ 2013.05.01 දිනට පසු - සේවයට බඳවා ගත් අයගේ වැටුප රුපියල් 42,500යි. ඒ කියන්නේ මාස 17කට රුපියල් 15,110ක වෙනසක් තිබෙනවා. ඒ වාගේ කාණ්ඩ කිහිපයක තොරතුරු මෙතැන තිබෙනවා. මම එකක් විතරයි කිව්වේ, අභ්‍යන්තර කමිටු විසින් ගන්නා ලද වැරදි තීන්දු නිසා මේ වැටුප් විෂමතාව නිර්මාණය කර තිබෙන බව පෙන්වීමට. ඒ අනුව 01/2025 නව චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමෙන් කලින් තිබුණු වැරදි නිවැරදි කරලා, විෂමතාවන් ඉවත් කිරීමෙන් තමයි සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ පවතින වැටුප් විෂමතාව අවම කරලා - සමහන් කරලා - තිබෙන්නේ.

01/2025 චක්‍රලේඛයට අනුව වැටුප් වැඩි වීමක් කළ බව අපි කවුරුත් දන්නවා. ඒ වැටුප් වැඩිවීම අපි අවස්ථා තුනකදී දෙන්නේ budget constraints නිසායි. කෙසේ වෙතත්, මේ ප්‍රස්තුත කාරණයේදී ඇත්තටම ඔය ප්‍රශ්නයට මුහුණ දෙන සේවකයන් 78දෙනෙක් ඉන්නවා. මම ඒක පැහැදිලි කරන්නම්. 2026 ජනවාරි 01වැනිදා වෙනකොට මෙන්න මේ වැටුප් විෂමතාවත් සමහන් වෙනවා.

ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා සඳහන් කළා, සේවක භාරකාර අරමුදලට සම්බන්ධ සේවකයින් අටසිය ගණනක් මෙතැන ඉන්නවා කියලා. හරියටම ගත්තොත්, සේවකයින් 820ක් ඉන්නවා. ඒ 820න් 560ක් මේ ප්‍රශ්නයට සම්බන්ධ වෙනවා. ඒ කියන්නේ, අර කලින් සඳහන් කළ වැටුප් විෂමතාව නිසායි. අනික් අය මේකට සම්බන්ධ වෙන්නේ නැහැ. ඒ 560දෙනාගෙනුත් 78දෙනෙක් හැර අනෙක් සියලුදෙනාගේ අප්‍රේල් මාසයේ වැටුප මාර්තු මාසයේ ලබා ගත් වැටුපට වඩා වැඩියි. මේ 78දෙනා සම්බන්ධයෙන් ප්‍රශ්නය පැනනඟින්නේ මම කලින් සඳහන් කළ විශාල වැටුප් විෂමතාව නැවත හරිගස්වපු නිසායි. කෙසේ වෙතත්, ඒ 78දෙනාගෙන් 74දෙනෙකුටම මාර්තු මාසයට සාපේක්ෂව අප්‍රේල් මාසයේ වැටුපෙන් අඩු වන වෙනස්කම රුපියල් 4,000ට වඩා අඩුයි. කිසිම තැනක රුපියල් 9,000කින්, රුපියල් 20,000කින් අඩු වීමක් සිදු වෙලා නැහැ. සිදුවෙලා තිබෙන්නේත් අඩු වීමක් නොවෙයි. ඒකයි මම කිව්වේ, මේක ඒ වැටුප් විෂමතාව හැදීම නිසා සිද්ධ වුණු කාරණයක් කියලා. අපි මේ විෂමතාවන් දිගින් දිගටම අරගෙන ගියොත්, ඒ කියන්නේ මේ විෂමතා තබාගෙන කලින් කරපු වැරැද්ද නිවැරදි නොකර ඉස්සරහට ගියා නම්, තවත් විශාල විෂමතාවක් හැදෙනවා. ඒ විතරක් නොවෙයි. අනෙකුත් ආයතනවලටත් මේ ප්‍රශ්නය ඇති වෙනවා. ඒක තමයි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර වශයෙන් මට ලබා දෙන්න තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු ඇමතිතුමනි, මම කෙටියෙන් මේ ප්‍රශ්නයත් අහන්නම්. මට තිබෙන ප්‍රශ්නය මම ඔබතුමාට ඉදිරිපත් කළා. ඔබතුමාගෙන් සෑහෙන පිළිතුරු ප්‍රමාණයක් ලැබුණා. නමුත් ඔබතුමා දකින්න ඇති, මේ අය දිගින් දිගටම උද්ඝෝෂණ කරනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්නය ගැන ඔබතුමා සභාපතිතුමා එක්කත් කථා කරලා, මේ අයත් එක්කත් කථා කරලා විසඳුමක් ලබා දෙන්න කියලා. ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය මට ලියුමක් ලබා දී තිබෙනවා. මම ඒක ඔබතුමාට ලබා දෙන්නම්. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන සොයා බලා විසඳුමක් ලබා දෙන්න. මොකද, ඔබතුමා යම් කිසි තේරුමක් ඇතිව කටයුතු කරන නිසා ඔබතුමාට මේක විසඳන්න පුළුවන්. නව සභාපතිතුමා එක්කත් මේ අර්බුදය තිබෙනවා වාගේ මට පෙනෙනවා. ඒ ගැන සොයා බලා කටයුතු කළා නම් හොඳයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඇත්තටම මම සඳහන් කළ විෂමතාව වෙනස් කිරීම නිසා තමයි සේවකයන් 78දෙනෙකුට මාර්තු මාසයට සාපේක්ෂව වැටුප් අඩු වීමක් සිද්ධවෙලා තිබෙන්නේ. අපි කවුරුත් දන්නවා, සාපේක්ෂව හෝ කීයක් හරි අඩු වීම ගැටලුවක් නිසා තමයි මේ ප්‍රශ්නය උද්ඝෝෂණ මට්ටමට ඇවිල්ලා සභාපතිතුමාත් එක්ක ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ කියලා. නමුත්, අපි ඉතා පැහැදිලිව ඔවුන්ට මේ කරුණු කාරණා පැහැදිලි කරලා දෙන්නම්. විශේෂයෙන්ම විෂමතාවන් අවම කරපු, වඩාත් හොඳ මට්ටමක වැටුප් ව්‍යුහයකට ගමන් කරන්න අපට අවශ්‍ය කරනවා. ඒ සඳහා තමයි 01/2025 චක්‍රලේඛයට අනුව පදනම දැමුවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දෙවන ප්‍රශ්නය, ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சபை ஒத்திவைப்பு வேளையின்போதான கேள்விகளைத் தொடுப்பதற்கான இச்சந்தர்ப்பத்திலே, முக்கியமான விடயமான பெண்களினுடைய தொழில் வாய்ப்பு வீதம் சம்பந்தமாகச் சில கேள்விகளை நான் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரிடம் கேட்க விரும்புகின்றேன்.

உலக வங்கியினுடைய 2024ஆம் ஆண்டு புள்ளிவிபரங்களின்படி, ஊழியர் படையிலே பெண்களின் பங்கேற்பு சதவீதமானது 31.6 ஆகக் காணப்படுகின்ற அதேநேரம், இலங்கையிலே இருக்கின்ற பெண்களில் பத்துப் பேரில் மூவர் மட்டுமே இவ்வாறு வேலைவாய்ப்புகளில் பங்குபற்றுகின்ற நிலைமை காணப்படுகின்றது. இன்னும் சொல்லப்போனால், பத்துப் பேரில் ஏழு பேர் எந்தவிதமான வேலைவாய்ப்புகளும் இல்லாதிருக்கின்ற அல்லது வேலைவாய்ப்புக்களில் பங்குபற்றாத ஒரு நிலைமைதான் காணப்படுகின்றது. எங்களுடைய இலங்கை நாட்டினுடைய சனத்தொகையை எடுத்துப் பார்த்தால், பெண்களின் தொகை 52 சதவீதமாக, ஆண்களின் தொகையைவிட அதிகமாகக் காணப்படுகின்றது. எனவே, நாங்கள் பெண்களை வேலைப்படையிலே ஈடுபடுத்துகின்ற சதவீதத்தை அதிகரிப்பதனூடாக, நிதி நிலைசார் அடிப்படையிலே, சுயாதீனமாகவும் சுதந்திரமாகவும் அவர்களை இருக்கவைப்பதன்மூலம் சமூகத்திற்கும் நாட்டுக்கும் பொருளாதார ரீதியிலே பங்களிப்பை வழங்க முடியும். குறிப்பாகச் சொல்லப்போனால், வளர்ச்சியடைந்த நாடுகளிலே வேலை செய்கின்ற பெண்களின் சதவீதமானது 48-50 வரையானதாகக் காணப்படுகின்றது. எனவே, எங்களுடைய அரசாங்கம், குறிப்பாகப் பெண்களை வேலையில் ஈடுபடுத்துகின்ற தன்மையை அதிகரிக்கவேண்டும் என்ற நோக்கில், பின்வரும் வினாக்களை விடுக்கின்றேன்:

1. கிராமப் புறங்கள் மற்றும் போரினால் பாதிக்கப்பட்ட பகுதிகளான வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் பெண் தொழிலாளர்களின் பங்கேற்பை உயர்த்துவதற்கான அரசாங்கத்தின் கொள்கைகள் மற்றும் திட்டங்களை விளங்கப்படுத்த முடியுமா?

2. வடக்கு மாகாணத்தில் சுமார் மூன்றில் ஒரு பகுதி குடும்பங்களைச் சேர்ந்தவர்கள் பெண் தலைமைத்துவக் குடும்பங்களாக இருப்பதை அமைச்சர் அறிவாரா? இப்பெண்களைப் பொருளாதார ரீதியாக வலுப்படுத்த என்னென்ன இலக்குவைக்கப்பட்ட ஆதரவுகள் வழங்கப்படுகின்றன?

3. பெண் தொழில்முனைவோரை ஊக்குவிக்கும் மற்றும் பெண்கள் தலைமையிலான நிறுவனங்களை ஆதரிக்கும் எந்தத் திட்டங்கள் வடக்கு, கிழக்கு மாகாணங்களிலும், பிற பின்தள்ளப்பட்ட பிரதேசங்களிலும் தற்போது உள்ளன அல்லது திட்டமிடப்பட்டுள்ளன?

4. போரினால் பாதிக்கப்பட்ட பகுதிகளில் பொருளாதாரத்தில் பெண்களின் பங்கேற்பை அதிகரிக்கவும் நிலையான வாழ்வாதாரத்தை உருவாக்கவும் ஏதேனும் திட்டங்கள் உள்ளனவா?

5. பெண்களின் பொருளாதாரத்தை உயர்த்த நிதி ஒதுக்கீட்டை மேற்கொள்ள அல்லது ஏதேனும் வேலைத்திட்டங்களை ஆரம்பிக்க அரசாங்கம் திட்டமிட்டுள்ளதா?

6. பெண்களின் வேலைவாய்ப்புத் திறனை மற்றும் பெண் தொழில்முனைவோரை மேம்படுத்தும் நோக்கில் அவர்களுக்கு ஏற்ப ஒரு பொறுப்பான சமூகப் பாதுகாப்பு மற்றும் தொழிற்பயிற்சித் திட்டங்களை விரிவுபடுத்தும் ஏதேனும் திட்டங்கள் அரசாங்கத்திடம் உள்ளதா?

7. பெண் தொழில்முனைவோருக்குச் சலுகை முறையில் இருசக்கர வாகனங்கள் அல்லது கடன்களை வழங்குவது பற்றியும், பகுதி நேர வேலை வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுப்பது பற்றியும் அமைச்சர் பரிசீலிப்பாரா?

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தக் கேள்விகளுக்குப் பதிலளிப்பதற்கு முன் கௌரவ பாராளுமன்ற உறுப்பினருக்கு நான் ஒரு முக்கியமான விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

2024ஆம் ஆண்டுக்குரிய உலக வங்கியின் தரவுப்படி, இலங்கையில் பெண்களின் தொழிற்றுறைப் பங்கேற்பு வீதம் 31.6% என்று குறிப்பிடப்பட்டுள்ளது. ஆனால், இது பெண்களின் உழைப்பினை முழுமையாகப் பிரதிபலிக்கவில்லை. இந்தக் கணக்கீடுகள் பெண்கள் நாள்தோறும் செய்கின்ற ஊதியமற்ற வீட்டு வேலைகள் மற்றும் பராமரிப்பு வேலைகளைக் காட்டுவதில்லை. அதுமட்டுமன்றி எத்தனையோ பெண்கள் தன்னார்வத் தொண்டர்களாக ஊதியமற்ற வேலைகளில் ஈடுபடுகின்றார்கள்.

பெண்களின் உழைப்பு பணம் சம்பாதிக்கும்போதுதான் மதிக்கப்பட வேண்டும் என்று கருதுவதால், இந்தக் கணக்குகள் பெண்களின் உண்மையான பங்களிப்பினை மறைத்து விடுகின்றன. பெண்கள் பொருளாதாரத்தில் பங்கேற்பதனை வெறும் வேலைவாய்ப்பு எண்ணிக்கைகளால் மட்டும் மதிப்பீடு செய்ய முடியாது.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

பெண்களின் ஊதியமற்ற உழைப்பை அடையாளம் காண்பதும் அங்கீகரிப்பதும் மதிப்பிடுவதும் பொருளாதாரத் திருத்தம் மட்டுமல்ல, பால்நிலை நீதிக்கான அடிப்படை அம்சமுமாகும். அதற்கு அவர்களின் உழைப்பை அங்கீகரிக்கும் மற்றும் மதிக்கும் வகையில் கொள்கைகள் மற்றும் சமூகக் கட்டமைப்புகளை மாற்ற வேண்டிய தேவைப்பாடு நீண்ட காலமாக உள்ளதைக் குறிப்பிட்டு, எனது பதிலை முன்வைக்கின்றேன்.

1. குறிப்பாக கிராமப்புறங்கள் மற்றும் யுத்தத்தால் பாதிக்கப்பட்ட வட மாகாணம் போன்ற பகுதிகளில், பெண்கள் தொழிற்றுறையில் பங்கேற்பதனை அதிகரிப்பதற்கான அரசாங்கத்தின் கொள்கைகள் மற்றும் திட்டங்கள்

   - அபிவிருத்தியடையாத மற்றும் யுத்தத்தால் பாதிப்புக்குள்ளாக்கப்பட்ட பகுதிகளில் பெண் தொழிலாளர்களது பங்கேற்பை அதிகரிப்பதற்குப் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சானது உரிமைகள் அடிப்படையிலான, அனைவரையும் உள்ளடக்கிய அணுகுமுறையினைக் கைக்கொள்கிறது.
   - எங்கள் கவனம் பின்வருவனவற்றை உள்ளடக்குகிறது:
   - ·பால்நிலைச் சமத்துவம் மற்றும் பெண்களை வல்லமைப்படுத்தலுக்கான தேசிய கொள்கை:
   - உள்ளூர் பொருளாதாரப் பங்களிப்பை வலியுறுத்தல். குறிப்பாக, கிராமப்புற மற்றும் யுத்தத்தால் பாதிக்கப்பட்ட பகுதிகளில் நாங்கள் இந்த வேலைத்திட்டங்களை முன்வைக்கின்றோம்.
   - மாவட்ட அளவிலான வாழ்வாதாரத் திட்டங்களைச் செயற்படுத்துதல். இதில் பின்வருவன அடங்குகின்றன:
     - o 'திரிய மன்பெத' எனும் திட்டத்தின்மூலம் திறன் மேம்பாடு மற்றும் நுண்தொழில் முனைவுகளுக்கான ஆதரவை வழங்கவுள்ளோம்.
     - o யாழ்ப்பாணம், கிளிநொச்சி மற்றும் வவுனியாவில் வர்த்தகக் கண்காட்சிகள், சந்தை இணைப்புக்கான ஆதரவு மற்றும் திறன்களுக்கான பயிற்சியளித்தல் போன்றவற்றை முன்வைக்கின்றோம்.

· உள்ளூர் தொடர்பு மற்றும் திட்ட வசதிக்காகப் பெண்கள் அபிவிருத்தி அலுவர்கள் (WDO) மற்றும் ஆலோசனை உதவியாளர்களை (CA) வேலையில் அமர்த்தல்.

· பயிற்சி மற்றும் வேலைவாய்ப்புக்கான அணுகலை மேம்படுத்த International NGOs (உதாரணமாக, UN பெண்கள்) உடன் இணைந்து செயற்படல்.

2. ஆம், யுத்தத்துக்குப் பின்னரான பின்னணியில் வடக்கு மாகாணத்தில் கிட்டத்தட்ட மூன்றில் ஒரு குடும்பம் பெண் தலைமைக் குடும்பம் என்பதனை அரசாங்கம் அங்கீகரிக்கிறது. அவர்களை இலக்குவைத்த பதிலிறுக்கைகளில் பின்வருவன உள்ளடங்குகின்றது:

· பெண் தலைமைக் குடும்பங்களுக்கான (FHHs) அரசாங்க அங்கீகாரம் மற்றும் இலக்குவைக்கப்பட்ட ஆதரவினை வழங்கல்: கிளிநொச்சியில் ஒரு பிரத்தியேகமான, பெண் தலைமைத்துவக் குடும்ப (FHHs) வள மையத்தினை உருவாக்கியிருக் கின்றோம். அது பின்வருவனவற்றை வழங்குகிறது:

   - o உளவளத்துணை ஆலோசனை மற்றும் உளவியல் ஆதரவு.
   - o தொழிற் பயிற்சி மற்றும் வாழ்வாதாரத் திட்டமிடல்.
   - o நிதி சேவைகள் மற்றும் கூட்டுறவுகளுடன் இணைப்புகளை ஏற்படுத்தல்.

· பிரதேச மட்டத்தில் பெண்கள் அபிவிருத்தி அலுவலர்கள் (WDOs) அப்பெண்களின் வீடுகளுக்குச் சென்று, விடயங்களை நிர்வகிக்க ஆதரவளித்தல்.

· மகளிர் பணியகத்தால் நிதியளிக்கப்பட்டு, அரசு சாரா நிறுவனங்களால் ஆதரிக்கப்படும் நிவாரணமளித்தல் மற்றும் வல்லமைப்படுத்தல் திட்டங்களில் FHHsஇற்கு முன்னுரிமை அளித்து உள்வாங்கல்.

3. பெண் தொழில்முனைவோர் மற்றும் பெண் தலைமையிலான தொழில்முனையங்களை ஊக்குவிப்பதற்கான முன்னெடுப்புகள்

   2024ஆம் ஆண்டில் அமைச்சு வடக்கு மாகாணத்தில் 400க்கும் மேற்பட்ட பெண்களுக்குத் தொழில்முனைவோர் முன்னெடுப்புக்கள்மூலம் ஆதரவளித்தது. அவையாவன:

   - உணவு பதப்படுத்துதல், தையல் மற்றும் கைவினைத் துறையில் நுண்தொழில்முனைவுக்கான மேம்பாடு.
   - குறிப்பாக முல்லைத்தீவு மற்றும் மன்னாரில் தொழிலை ஆரம்பிப்பதற்கான மானியங்கள் மற்றும் சந்தை இணைப்புக்கான ஆதரவு.
   - பெண் தலைமையைக் கொண்ட நிறுவனங்களின் உற்பத்திப் பொருட்களுக்கான வர்த்தகக் கண்காட்சி, பங்கேற்பு மற்றும் வர்த்தக அடையாள (branding) உதவிகள்.
   - ஆலோசனை உதவியாளர்களாலும் மாவட்ட ரீதியிலான பெண்கள் வலையமைப்புகளாலும் நிர்வகிக்கப்படுகின்ற வணிக வழிகாட்டுதல் மற்றும் சக ஆதரவு வலையமைப்புகளை உருவாக்குதல்.

4. முறையான பொருளாதாரத்தில் பெண்களின் பங்களிப்பை அதிகரிப்பதற்கும் நிலையான வாழ்வாதாரத்தை உருவாக்குவதற்குமான திட்டங்கள்

   பெண்களை முறையான பொருளதாரத்தில் ஒருங்கிணைப்பதற்கான முயற்சிகள் பின்வருமாறு:

   - TVECஉடன் இணைந்து முறையான சான்றிதழுடன்கூடிய தொழிற்பயிற்சி. அதேபோன்று, VTA போன்ற தொழிற் பயிற்சிகளை வழங்கக்கூடிய நிறுவனங்களையும் இதில் சேர்த்திருக்கின்றோம்.

- வீட்டு வன்முறைக்கு உள்ளாக்கப் பட்டவர் களுக்குப் பாதுகாப்பளிப்பது மட்டுமல் லாமல், தொழிற்பயிற்சி மற்றும் மறு ஒருங்கிணைப்பு ஆதரவையும் வழங்கும் 'பாதுகாப்பு இல்லங்கள்' யாழ்ப்பாணம் மற்றும் முல்லைத்தீவு போன்ற இடங்களில் இருக்கின்றன.

5. In addition to the financial allocations made directly to the Ministry of Women and Child Affairs, a number of other Ministries and institutions, mainly the Ministries of Fisheries, Agriculture and Industries - also allocate funds for the empowerment of women. The Ministry of Women and Child Affairs has observed that women's empowerment programmes are also being implemented on the ground through material and financial assistances provided by local and international non-governmental organizations. Therefore, from 2026, the Ministry of Women and Child Affairs, as the central institution formulating programmes, would ensure that funds provided to all these Ministries and institutions as well as by non-governmental organizations which intervene locally and internationally for economic empowerment of women would benefit women identified on a priority basis under a formal system, and we will intervene in the formulation of relevant policies. Women Development Officers and Advisory Assistants attached to each divisional secretariat and affiliated to Sri Lanka Women's Bureau are deployed to direct and monitor these projects.

6. Regarding social security, a focus area of the national policy framework is the introduction of a pension system for all citizens. It means that the proposed comprehensive pension policy would encourage all citizens including farmers and fishermen working in the informal sector to join the pension system. It is also proposed to use pension as an insurance system in the event of an emergency disaster. Furthermore, the empowerment of women-headed households would be given priority through the "Praja Shakthi" Programme, which has initiated livelihood and income-generating projects to empower poor families. Empowering women does not only mean empowering them economically, but such equitable measures would especially benefit female-headed households and women affected by violence.

   Then, vocational training and skills development. The courses conducted by government affiliated institutions such as the TVEC, the VTA, the German Tech, the Hotel School and a number of private sector institutions for vocational training and skills development of children who are not eligible for higher education, children who are to be socialized from detention centres as well as unemployed youth and adults are being further expanded to meet the local and foreign job demand. Many branches of those institutions are also concentrated in the Northern Province in order to alleviate economic hardships faced by high-potential groups in the region. The Government has paid special attention to them and taken a number of measures such as exempting children from relevant course fees, providing them discounts, introducing concessional loan schemes and reimbursing course fees through grants from development partners.

7. Lastly, as the Minister of Women and Child Affairs, I highly appreciate your proposal. I will give priority to the provision of two-wheelers to marginalized women in the Northern Province, loans to female entrepreneurs and planning projects which provide part-time employment opportunities especially for women engaged in higher education and those engaged in unpaid care work. I will also make necessary interventions in State policy planning and preparation of the future Budget Proposals.

உண்மையாகவே எங்களுடைய அரசாங்கத்தினூடாக முன்னெடுக்கப்படுகின்ற சில திட்டங்களின்மூலம் வட மாகாண அபிவிருத்திக்கு மட்டுமல்லாமல், இலங்கையில் வாழ்கின்ற அனைத்துப் பெண்களுக்கும் பாதுகாப்பளிப்போம். அதாவது, தொழில் வாய்ப்புகளை இழந்த பெண்களுக்கும் கணவனை இழந்து பெண் தலைமைத்துவக் குடும்பங்களாக வாழ்கின்ற பெண்களுக்கும் இந்தத் திட்டத்தினூடாக மதிப்பளித்து, அவர்களை ஊக்குவிப்பதற்கான நடவடிக் கைகளையும் நாங்கள் மேற்கொள்கின்றோம்.

இலக்கு வைக்கப்பட்ட முதலீடுகள், நிறுவனக் கூட்டாளுமைகள் மற்றும் களமட்டப் பங்கேற்புமூலம் வட மாகாணத்தில் பெண்களை வல்லமைப்படுத்துவதில் அமைச்சு தொடர்ந்தும் உறுதியாக உள்ளது. இது பொருளாதார சுதந்திரத்துக்கான முழுமையான மற்றும் நிலையான பாதையை உறுதிசெய்கின்றதெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

இன்று நாங்கள் பெண்களின் பாதுகாப்பு விடயம் குறித்துப் பேசுகின்றோம். அண்மையில் வடக்கு மாகாணத்தின் வவுனியாவிலே பெண் ஒருவர் தலைவெட்டப்பட்ட நிலையில் கொலை செய்யப்பட்டிருக்கிறார். அதேபோன்று, பெண் அரச உயரதிகாரி ஒருவர் தீப்பற்றி இறந்திருந்தார். இவ்வாறான பல சமூகப் பாதுகாப்பற்ற நிலைமைகள் தொடர்ந்து காணப்படுகின்றன. பெண்களை வலுவூட்டுவதனூடாக இந்த நாட்டினுடைய பொருளாதாரத்தில் வளர்ச்சியை ஏற்படுத்த வேண்டுமென்பதற்காகத்தான் என்னால் இந்தக் கேள்விகள் கேட்கப்பட்டன. பொருளாதாரத்தில் பெண்களை வளர்ச்சியடையச் செய்வதனூடாக அரசின் நிதிச் செலவை எங்களால் குறைக்க முடியும். அதேபோன்று, மானியங்கள் வழங்குவதைக் குறைப்பதனூடாகவும் பொருளாதாரத்தை வளர்க்க முடியும். எனது வினாக்களுக்கான உங்களுடைய answer தெளிவாக இருக்கின்றது. அதற்காக நான் என்னுடைய மக்கள் சார்பிலே உங்களுக்கு மீண்டும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
நன்றி, கௌரவ உறுப்பினர் அவர்களே!

எமது நாட்டில் பாதுகாப்பற்ற சம்பவங்கள் நடைபெறுகின்ற காரணத்தினால், நாங்கள் சட்டத்தை வலுப்படுத்த வேண்டிய கட்டாயத்தில் இருக்கின்றோம். அதற்குப் பொருளாதாரச் சீராக்கம் தேவைப்படுகின்றது. இவை இரண்டையும் தவிர்த்து, அதற்கு அப்பாற்பட்ட மனித நேயம் கொண்ட ஒரு சமுதாயத்தை உறுதிப்படுத்துவதிலும் நாங்கள் உறுதியாக இருக்கின்றோம். அவ்வாறு இல்லாதபடியால்தான் இன்று ஒருவர் அடுத்தவரைத் துஷ்பிரயோகத்துக்கு உள்ளாக் குகின்றார். ஆண்கள் ஆண்கள்மீதாக இருக்கலாம், பெண்கள் பெண்கள்மீதாக இருக்கலாம், பெண்கள் ஆண்கள்மீதாக இருக்கலாம். ஆண்கள் பெண்கள்மீதாக அல்லது சிறுவர்கள்மீதாக இருக்கலாம், இவ்வாறு துஷ்பிரயோகங்கள், அநியாயங்கள் நடக்கின்ற இந்தச் சமுதாயத்தை மாற்றுவதற்காக, ஒருவர் இன்னொருவரை உண்மையாக நேசிக்கின்ற மனிதாபிமானமிக்க ஒரு நாட்டைக் கட்டியெழுப்புவதற்காக எங்கள் அரசாங்கம் வேலைத்திட்டங் களினூடாகவும் சட்டத்தினூடாகவும் பொறிமுறைகள் மூலமாகவும் உரிய நடவடிக்கைகளை எடுக்குமென்பதை நாங்கள் உறுதியாக நம்பியிருக்கின்றோம். அதற்காக நாங்கள் அனைவரும் அணிதிரண்டு ஒன்றாகச் செயற்படுகின்றோம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු ඇමතිතුමියනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.16ට, 2025 ජූනි 17 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 5.16 மணிக்குப் பாராளுமன்றம், 2025 யூன் 17, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.16 p.m. until 9.30 a.m. on Tuesday, 17th June, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.